214 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 214 - இல. 7
**Volume 214 - No. 7**

2013 ජනවාරි මස 24 වන බ්‍රහස්පතින්දා
2013 சனவரி 24, வியாழக்கிழமை
**Thursday, 24th January, 2013**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ආගමික අන්තවාදය හා මූලධර්මවාදය

**වරප්‍රසාද:**
විවෘත වරෙන්තු නිකුත් කිරීම
කථාවේ ශ්‍රව්‍ය පටිගත කිරීම් නිකුත් නොකිරීම
2013 ජනවාරි 24වන දින "වීරකේසරි" වාර්තාව

**මෝටර් වාහන පනත :**
නියෝග

**කල් තැබීමේ යෝජනාව:**
රිසානා නෆීක් මරණ දඬුවමට ලක් කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
மதத் தீவிரவாதம் மற்றும் அடிப்படைவாதம்

**சிறப்புரிமை:**
திறந்த பிடியாணை பிறப்பிக்கப்பட்டமை
உரையின் ஒலிப்பதிவை வெளியிடாமை
2013 சனவரி 24ஆந் திகதிய "வீரகேசரி" அறிக்கை

**மோட்டார் வாகனச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
றிஸானா நபீக் மரணதண்டனைக்காளானமை

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Religious Extremism and Fundamentalism

PRIVILEGE:
Issuance of Open Warrant
Non-release of Audio Recording of Speech
"Virakesari" Report of 24th January 2013

MOTOR TRAFFIC ACT:
Regulations

ADJOURNMENT MOTION:
Execution of Rizana Nafeek

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2013 ජනවාරි මස 24 වන බ්‍රහස්පතින්දා***
*2013 சனவரி 24, வியாழக்கிழமை*
*Thursday, 24th January, 2013*

***අ.භා.1.00ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 ජනවාරි මස 24 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IX වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ IX සහ X වැනි කොටස් සහ 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VI වැනි කොටස සහ හතරවැනි කාණ්ඩයේ III වැනි කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2011 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්.- [ගරු දි.මු. ජයරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්.-[ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අංක 1747/10 හා 2012 පෙබරවාරි 29 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත පරිදි අංක 1681/3 හා 2010 නොවැම්බර් 22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් පැවරී ඇති බලය යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 36 වැනි වගන්තිය යටතේ නිකුත් කළ අංක 508/7 හා 1988 ජූනි 2 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සංශෝධනය කරමින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2012 අගෝස්තු 30 දිනැති අංක 1773/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග.-[ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009.04.01 සිට 2010.03.31 දක්වා වන වර්ෂය සඳහා මාන්තායි සෝල්ට් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009/2010 වර්ෂය සඳහා සී./ස. ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රීඩා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர் )
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Hon. Deputy Speaker, I present a petition received from Mr. I. Salahudeen of No. 284/25, Grandpass Road, Colombo 14.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළියන්දල, කැස්බෑව, ආවාස පාර, අංක 29/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.පී.ජී. ස්වර්ණලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා - පැමිණ නැත.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - පැමිණ නැත.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඌරුගමුව, මුරුතගස්පිටිය, අඹගහහේන පදිංචි ඩබ්ලිව්.ජී.සී.ප්‍රදීප් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ජයරත්න හේරත් මහතා - නැත.

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා - නැත.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කුමාරකට්ටුව, එලිවිටිය පදිංචි ටී.එම්.එස්.බී. කුරුඳුකුඹුර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා - පැමිණ නැත.

ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කෑගල්ල, මොලගොඩ, කිවුල්පන පදිංචි කේ.ජී.කේ.කේ. අබේනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය ගුරුවරුන් : ස්ථාන මාරුවීම්
### மாத்தறை மாவட்ட தமிழ் மொழிமூல ஆசிரியர்கள் : இடமாற்றம்
### TAMIL MEDIUM TEACHERS IN MATARA DISTRICT : TRANSFERS

1833/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන් වීමෙන් පසු මාරුවීම් නොලැබ දැඩි කලකිරීමට පත් ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් සිටින බවත්;

(ii) එසේ කලකිරීමට පත්වීම එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය පිරිහීමට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මාතර දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුවීම් ඉල්ලා සිටින දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් නියමිත සුදුසුකම් සපුරා ඇති ගුරුවරුන්ට ස්ථාන මාරු ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் தமிழ் மொழிமூல அரச பாடசாலைகளில் கஷ்டப் பிரதேச சேவைக் காலத்தை பூர்த்தி செய்த பின்னர் இடமாற்றம் கிடைக்காததனால் பெரும் விரக்திக்கு உள்ளாகியுள்ள ஆசிரியர்கள் பெருமளவில் இருக்கின்றார்கள் என்பதையும்;

(ii) இவ்வாறு விரக்திக்கு உள்ளாகியுள்ளமை இவ் வாசிரியர்களின் கற்பித்தல் செயற்பாட்டின் தரம் குறைவடைவதற்குக் காரணமாயமைந்துள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது மாத்தறை மாவட்டத்தில் இடமாற்றம் கோரியுள்ள தமிழ் மொழிமூல ஆசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவர்களில் உரிய தகைமைகளை பூர்த்தி செய்துள்ள ஆசிரியர்களுக்கு இடமாற்றம் வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், எத்தேதிகளில் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) there are many teachers in the Tamil medium Government schools in Matara District, who are deeply frustrated as a result of transfers not being granted after the completion of their difficult area service; and

(ii) such frustration has resulted in deterioration of the quality of teaching of such teachers?

(b) Will he inform this House-

(i) the number of Tamil medium teachers in Matara District who have applied for transfers;

(ii) whether measures will be taken to grant transfers to those who have met the requirements, out of the above-mentioned teachers; and

(iii) if so, the relevant dates for grant of transfers?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

(අ) (i) දැනට මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය රජයේ පාසල්වල සේවය කරනු ලබන දුෂ්කර සේවා කාලය සම්පූර්ණ කරන ලද ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති විශාල ගුරු භවතුන් ප්‍රමාණයක් නොමැත.

(ii) මාතර දිස්ත්‍රික්කයේ විභාග ප්‍රතිඵල දෙස අවධානය යොමු කිරීමේදී ඉගැන්වීම් ක්‍රියාවලියේ පිරිහීමක් දක්නට නොමැත.

(ආ) (i) මේ වන විට ස්ථාන මාරුවීම් ඉල්ලා සිටින දෙමළ මාධ්‍ය ගුරු භවතුන්ගේ සංඛ්‍යාව 10ක් පමණ වේ.

(ii) මේ වන විට දකුණු පළාත් සභාව විසින් නවක ගුරු භවතුන් බඳවා ගැනීමට අදාළව ඉල්ලුම්පත් කැඳවා ඇති අතර එකී නවක පත්වීම් ලබා දීමේ දී හෝ වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම්වලදී නිශ්චිත සුදුසුකම් සපුරා ඇති ගුරු භවතුන්ට ස්ථාන මාරු ලබා දීමට ක්‍රියා කරන බව දන්වමි.

(iii) නවක ගුරු භවතුන් බඳවා ගත් විගස මෙම ස්ථාන මාරුවීම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම වාගේ මැතිවරණ කොට්ඨාසවලටත් මේ කාරණය අදාළ වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන කාරණය හරි. වැඩි සංඛ්‍යාවක් නැහැ. ඒකට හේතුව අපේ දිස්ත්‍රික්ක දෙකේම දෙමළ දරුවන් ඉගෙන ගන්නා දෙමළ මාධ්‍ය පාසල් වැඩි සංඛ්‍යාවක් නැහැ. මුස්ලිම් දරුවන් ඉගෙන ගන්න පාසල් ගැන නොවෙයි මම මේ කියන්නේ. දෙමළ දරුවන් ඉගෙන ගන්නා පාසල් වැඩි සංඛ්‍යාවක් නැහැ. ඉතින් මෙතැන ගැටලුව වෙලා තිබෙන්නේ මෙයයි. ශ්‍රීපාද අධ්‍යාපන විද්‍යා පීඨය හරහා එන ගුරු භවතුන් අති බහුතරයක් නුවරඑළිය, බදුල්ල, බණ්ඩාරවෙල, රත්නපුර වාගේ ප්‍රදේශවලින් එන අයයි.

ඒ අයට සම්පූර්ණ කාලය ගෙවලත් තව අවුරුදු දෙක තුනක් සමහර වෙලාවට ඉන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශය මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු වෙනවා. ඔබතුමන්ලා විද්‍යා පීඨවලින් පිට වන අය හුඟක් වෙලාවට ජාතික පාසල්වලට දමනවා. නමුත් දෙමළ මාධ්‍ය, දෙමළ දරුවන් ඉගෙන ගන්නා ජාතික පාසල් සංඛ්‍යාව අඩුයි, අපේ දිස්ත්‍රික්ක දෙකේම. ඒ නිසා ජාතික පාසල්වලට සෘජුවම විද්‍යා පීඨ ගුරුවරු දානවාය කියන තීන්දුව ගන්නේ නැතිව මෙවැනි පාසල්වලට ඒ අලුතින් එන අය පත් කරන්න බැරි ඇයි?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු මන්ත්‍රීතුමනි, අවසානයේදී ඇහුවේ මොකක්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විද්‍යා පීඨවලින් පිට වන බොහෝ දෙනකුට පසු ගිය වකවානුවේ පත්වීම් දුන්නේ ජාතික පාසල්වලටයි. හැබැයි දෙමළ මාධ්‍ය, දෙමළ දරුවන් ඉගෙන ගන්නා ජාතික පාසල් ගාල්ල, මාතර වාගේ දිස්ත්‍රික්කවල නැති තරම්. තිබෙන්නේ බොහොම පොඩි ප්‍රමාණයක්. ඒ නිසා ජාතික පාසල්වලටම මේ අවුරුද්දේ, දෙකේ මේ කණ්ඩායම් දෙනවාය කියන කොන්ක්‍රීට් තීන්දුවකට යන්නේ නැතිව මෙවැනි පාසල් ගැන යම් කිසි විශේෂත්වයක් කරන්න බැරි ඇයි කියලා මා අහන්න කැමැතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කොන්ක්‍රීට් තීන්දු අරගෙන නැහැ. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව ගුරුවරු ලබා දෙන සංඛ්‍යාවක් තිබෙන බව. ඒ සංඛ්‍යාව අනුව තමයි පාසල් පද්ධතිය තුළ ගුරුවරු ස්ථානගත කරන්නේ. එම ස්ථානගත කිරීම් නියමානුකූල ලෙස කරනවා. හැබැයි යම් කිසි ආකාරයෙන් විශ්‍රාම යෑම හෝ මාරුවීම් ඉල්ලා ඇති අය වෙනුවෙන් දෙමළ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ අයිතිය පළාත් සභාව සතු වෙනවා. ඒ නිසා පළාත් සභාවටත් පුළුවන්කම තිබෙනවා, මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා ක්‍රියා කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය මේකයි. පළාත් සභාවට මේ ගුරුවරු පිළිබඳව තීන්දුවක් ගන්න බැරි වෙලා තිබෙන්නේ මේ ගුරුවරු සාතිශය -බහුතරය- ඇවිල්ලා තිබෙන්නේ එක්කෝ ඌව පළාතෙන්; නැත්නම් මධ්‍යම පළාතෙන්. ඒ ගොල්ලන් මේ පළාත් සභාව තුළ මාරුවීම් නොවෙයි ඉල්ලන්නේ. මේ අය කියන්නේ තමුන්ගේ පළාත්වලට යන්න ඉඩ දෙන්න කියලා. ඒ නිසා මේක පළාත් සභාවට විසඳන්න බැහැ. පළාත් සභා දෙක සහ මධ්‍යම අමාත්‍යාංශය එකතු වෙලායි මේක විසඳන්න ඕනෑ.

ඒ නිසා මේ තුන් ගොල්ලන්ම එකතු වෙලා එක තීන්දුවකට යන්න බැරි ඇයි කියන එකයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

කරුණු දෙකයි. පළමුවැනි කරුණ සිසු සංඛ්‍යාවට සාපේක්ෂව ගුරුවරු ලබා දීම. දෙවැනි කාරණාව කාලය සම්පූර්ණ කරන ලද ගුරුවරුන්ට ස්ථාන මාරු ලබා දීම. අපි ස්ථාන මාරු ලබා දෙන්නේ අවුරුදු පහක කාල සීමාවකට යටත්වයි. අවුරුදු පහ නොවෙයි, හැබැවටම අවුරුදු අටයි. නමුත් අවුරුදු පහකින් අපි ඔවුන් ගැන සලකා බලනවා. අවුරුදු පහකින් මාරු කරන්න පුළුවන්, හැබැයි ගුරුවරු බඳවා ගෙන. නැත්නම් අවුරුදු අට දක්වා තියා ගන්න පුළුවන්කම තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නිසා බදුල්ල, බණ්ඩාරවෙල වේවා වෙන කොහේ හරි වේවා රජයේ සේවකයෙක් පත්වීමක් ගත්තාම රජය කැමැති ලංකාවේ ඕනෑම තැනක සේවය කරන්න ඕනෑ. එම නිසා ඒ සේවයට ඔවුන් බැඳී සිටිනවා. එක වෙලාවකට ගුරුවරු මාරු කළා කියලා කෑ ගහනවා. තව වෙලාවකට ගුරුවරු මාරු කරන්න කියලා කෑ ගහනවා. කෙසේ නමුත් මේ ප්‍රශ්නය මතු කරපු එක ගැන ගරු මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වනවා. අපි මේ ගැන සොයා බලා සාධාරණය ඉෂ්ට කරන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දකුණේ එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම කාලය අවුරුදු අටයි. අවුරුදු අටට වඩා තවත් අවුරුදු තුන, හතරක් එකම තැන සේවය කරපු ප්‍රශ්නයක් තිබෙන නිසායි මම මේ ප්‍රශ්නය ඇහුවේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔය කී වෙනි අතුරු ප්‍රශ්නයද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. හැටන් ප්‍රදේශයේ තිබෙන ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යා පීඨය ආරම්භ කරද්දීම ඒ අනුග්‍රාහක ආයතනය සමඟ ඇති වුණු එකඟතාව අනුව ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යා පීඨය ඇති වන්නේ වතු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ලබපු අය ගුරු වෘත්තියට ඇතුළත් කර ගැනීම ඉලක්ක කර ගෙනයි. හැබැයි ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යා පීඨයට අභ්‍යාසලාභී ගුරු භවතුන් බඳවා ගැනීමේදී වතු ක්ෂේත්‍රයට වැඩි අවධානයක්, වැඩි බරක් තබන්නට එකඟතාව ඇති වුණත්, විශේෂයෙන්ම ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත්, හිනිදුම සහ දෙනියාය මැතිවරණ කොට්ඨාසවල උසස් පෙළ සමත් වන සිසුන්ට ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යා පීඨයේ ලැබෙන ඉඩ ප්‍රස්ථාව අඩුයි. ඒ දරුවන්ට එම අධ්‍යාපන විද්‍යා පීඨයේ ඉඩ ප්‍රස්ථාව ලැබිලා ගුරු භවතුන් බවට පත් වන්න පුළුවන් නම්, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක දෙකේ දෙමළ මාධ්‍ය පාසල්වල තිබෙන ගුරු ප්‍රශ්නය විසඳන්න පුළුවන්.

ඉතින් ඒ නිසා ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යා පීඨයට බඳවා ගැනීමේදී ගාල්ල, මාතර වාගේ දිස්ත්‍රික්කවල වතුවල සිටින දරුවන්ටත් යම් කිසි අවස්ථාවක් ලැබෙන යාන්ත්‍රණයක් සකස් කරන්න අමාත්‍යාංශය මැදිහත් නොවන්නේ ඇයි?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැබෑවටම මැදිහත් වෙලා තිබෙනවා. මේක දකුණේ ප්‍රශ්නයක් නොවෙයි. වතුකරයෙන් අ.පො.ස.(උ.පෙළ) සමත් දරුවන් සොයා ගැනීම බොහොම අසීරු කාරණාවක්. මොකද, මම ඌව පළාතේ මහ ඇමති හැටියට ඉන්න කොට, පළාත් අධ්‍යාපන ඇමති හැටියට ඉන්න කොට මේ ප්‍රශ්නවලට අපි මුහුණ දුන්නා. හැබැයි, මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබෙන ක්‍රමය තමයි මේ පාසල් පද්ධතිය දියුණු කිරීම සහ ඔවුන්ට අනෙකුත් යටිතල පහසුකම් ලබා දීම. ඒ තුළ තමයි පාසලක් දියුණු වෙන්නේ. එතකොට තමයි දෙමව්පියන් තුළ විශ්වාසය ඇති වෙන්නේ. ඉතින් ඒ විශ්වාසය ඇති වන පරිදි අවශ්‍ය මූලික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ අනෙකුත් බාහිර සමාජ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවතිනවා. අනාගතයේදී ඒ ප්‍රශ්නය ඉතාම කෙටි කාලයක් තුළ විසඳන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

බොහොම ස්තුතියි.

## ඇඟලුම් කර්මාන්තශාලා නඟා සිටුවීම : ලබා දුන් මුදල
## ஆடைத் தொழிற்சாலைகளை மேம்படுத்தல் : வழங்கப்பட்ட நிதி
## UPLIFTMENT OF GARMENT FACTORIES : FUNDS PROVIDED

2134/'11

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2007 අය වැය යෝජනා යටතේ පාඩු ලබන ඇඟලුම් කර්මාන්ත නඟා සිටුවීම සඳහා රජය වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලබා දුන් ඇඟලුම් කර්මාන්තශාලාවල නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් කර්මාන්තශාලාව සඳහා ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඇඟලුම් කර්මාන්තශාලා සඳහා මුදල් ලබා දුන් මූල්‍ය ආයතන කවරේද;

(v) එම එක් එක් මූල්‍ය ආයතනය විසින් ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මුදල් ලබා ගත් ඇඟලුම් කර්මාන්තශාලා විසින් මේ වන විට ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) මේ වන විට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද;

(viii) එම මුදල් ලබා ගැනීමෙන් පසු එක් එක් කර්මාන්තශාලාව විසින් උත්පාදනය කර ඇති රැකියා අවස්ථා ගණන කොපමණද;

(ix) එම කර්මාන්තශාලා අතරින් මේ වන විට ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2007ஆம் ஆண்டின் வரவு செலவுத் திட்ட முன்மொழிவுகளின் கீழ், நட்டத்தில் இயங்கு கின்ற ஆடைக் கைத்தொழிலை மேம்படுத்து வதற்காக அரசாங்கம் ஒதுக்கிய பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) அவ்வாறு நிதி வழங்கப்பட்ட ஆடைத் தொழிற் சாலைகளின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு தொழிற்சாலைக்கும் வழங் கப்பட்ட பணத்தொகைகள் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iv) ஆடைத் தொழிற்சாலைகளுக்கு நிதி வழங்கிய நிதி நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு நிதி நிறுவனத்தினாலும் வழங்கப்பட்டுள்ள பணத்தொகைகள் தனித் தனியே எவ்வளவு என்பதையும்;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(vi) நிதியைப் பெற்றுக்கொண்ட ஆடைத் தொழிற் சாலைகளினால் இதுவரை செலுத்தப்பட்டுள்ள பணத்தொகைகள் எவ்வளவு என்பதையும்;

(vii) தற்போது செலுத்த வேண்டியுள்ள பணத் தொகைகள் எவ்வளவு என்பதையும்;

(viii) மேற்படி பணத்தொகைகளைப் பெற்றுக் கொண்ட பின்னர் ஒவ்வொரு தொழிற்சாலையும் உருவாக்கியுள்ள தொழில்வாய்ப்புகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ix) மேற்படி தொழிற்சாலைகளில் தற்போது இயங்கி வருகின்ற தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state-

(i) the amount of money set aside by the Government under the Budget Proposals of 2007 for the purpose of uplifting the garment factories that incurred losses;

(ii) the names and addresses of the garment factories that received such funds; and

(iii) separately, the amounts given to each factory;

(iv) the finance institutions that made funds available for garment factories;

(v) separately, the amount of money made available by each such finance institution;

(vi) the amount paid back by the garment factories that received such funds by now;

(vii) the outstanding amount as at present;

(viii) the number of employment opportunities generated by each factory after obtaining such funds; and

(ix) out of those factories, the number of factories operational at present?

(b) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රුපියල් මිලියන 2,000කි.

(ii)

| | **කර්මාන්තශාලාවේ නම** | **ලිපිනය** |
|---|---|---|
| 1. | ඔසාකා ගාමන්ට්ස් | නැඳුන්ගහහේන - වැලිවේරිය. |
| 2. | කීන් වෙයා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම | වැලිගමුව - රඹුක්කන. |
| 3. | නිපුන ගාමන්ට් (පුද්ගලික) සමාගම | නුවර පාර, කුරුණෑගල. |
| 4. | ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්ගලික) සමාගම | අංක 25, මාලිගාව පාර - රත්මලාන. |

(iii)

| | **කර්මාන්තශාලාවේ නම** | **ලබා දුන් මුදල රු.** |
|---|---|---|
| 1. | ඔසාකා ගාමන්ට්ස් | 8,834,091.00 |
| 2. | කීන් වෙයා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම | 10,000,000.00 |
| 3. | නිපුන ගාමන්ට් (පුද්ගලික) සමාගම | 7,000,000.00 |
| 4. | ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්ගලික) සමාගම | 700,000,000.00 |
| එකතුව | | 725,834,091.00 |

(iv) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව.

(v) මෙම වැඩසටහන ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව මඟින් පමණක් ක්‍රියාත්මක කළ බැවින් රු. 725,834,091.00ක මුළු මුදල එම බැංකුව මඟින් ලබා දී ඇත.

(vi)

| | කර්මාන්ත ශාලාවේ නම | ගෙවා ඇති මුදල රු. |
|---|---|---|
| 1. | ඔසාකා ගාමන්ට්ස් | 0.00 |
| 2. | කීන් වෙයා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම | 645,965.00 |
| 3. | නිපුන ගාමන්ට් (පුද්ගලික) සමාගම | 5,333,280.00 |
| 4. | ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්ගලික) සමාගම | 139,080,631.17 |

(vii)

| | කර්මාන්ත ශාලාවේ නම | ගෙවීමට ඇති මුදල රු. |
|---|---|---|
| 1. | ඔසාකා ගාමන්ට්ස් | 8,834,091.00 |
| 2. | කීන් වෙයා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම | 9,354,035.00 |
| 3. | නිපුන ගාමන්ට් (පුද්ගලික) සමාගම | 1,666,720.00 |
| 4. | ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්ගලික) සමාගම | 560,919,368.83 |

(viii)

| | කර්මාන්ත ශාලාවේ නම | රැකියා අවස්ථා ප්‍රමාණය |
|---|---|---|
| 1. | ඔසාකා ගාමන්ට්ස් | වසා දමා ඇත |
| 2. | කීන් වෙයා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම | වසා දමා ඇත |
| 3. | නිපුන ගාමන්ට් (පුද්ගලික) සමාගම | වසා දමා ඇත |
| 4. | ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්ගලික) සමාගම | 500 |

(ix) ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්ගලික) සමාගම පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කිරීම ගැන ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. අපේ ඇඟලුම් ක්ෂේත්‍රයට අත් වෙලා තිබෙන ඉරණම දැන් පැහැදිලියි. මුලින් ආණ්ඩුවට වුවමනා වෙලා තිබුණා, ඇඟලුම් ක්ෂේත්‍රයට උදවු කරලා රක්ෂා තවත් වැඩි කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න. දැන් සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව හැදුවේ ග්‍රාමීය බැංකුවල එහෙම තිබුණු අහිංසක දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි ටික අර ගෙන රුපියල් මිලියන 2500ක් එකතු කරලාය කියලා ඔබතුමා දන්නවා. දැන් ඒ සල්ලි ටික දීලා, ලැබුණු මුදල ගැන යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද? මොකද, වෙලා තිබෙන දේ ඔබතුමාම දන්නවා. රුපියල් මිලියන 8යි , රුපියල් මිලියන 9යි දුන්න ඒවා වහලා. ඒ විතරක් නොවෙයි, දැනට වැඩ කරන්නේ ට්‍රයිස්ටාර් ඇපරල් එකේ එකම එක ආයතනයයි. ට්‍රයිස්ටාර් ඇපරල් එකට රුපියල් මිලියන 700ක් දීලා තිබෙනවා. ඒ ගොල්ලෝ ආපසු ගෙවලා තිබෙන්නේ රුපියල් මිලියන 139යි. මේකෙන් බැංකුවට සිද්ධ වෙන පාඩුව පියවා ගන්න සහ නොගෙවා ඇති මුදල් එකතු කර ගන්න ඔබතුමන්ලාට යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මමත් ඔබතුමා එක්ක එකඟ වෙනවා, මෙතැනදී ඒ බැංකුව කල්පනාකාරීව වැඩ කර නැති බවට. නමුත් මේවා non-performing loans හැටියට තිබෙන නිසා අපි දැන් ඒ ගැන නීති මාර්ගයෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ලංකාවේ ඇඟලුම් කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ට්‍රයිස්ටාර් ඇපරල් කියන ආයතනයට විතරක් රුපියල් මිලියන 700ක් දීලා තිබෙනවා. මොකක්ද මේ සම්බන්ධකම. මේ තරම් මුදල් ප්‍රමාණයක් දීලා හදලා තිබෙන්නේත් රැකියා 500යි. රැකියා 500ක් හදන්න එක කර්මාන්තශාලාවකට රුපියල් මිලියන 700ක් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්තශාලා හතරකට තමයි මේ රුපියල් මිලියන 2000න් රුපියල් මිලියන 725ක්ම දීලා තිබෙන්නේ. සමහර ඒවාට කිසිම ඇපයක්වත් නැහැ. සමහර ඒවා ඒ ගොඩනැඟිල්ලම තියලා බැංකු තුන, හතරකින් මුදල් අරගෙන තිබෙනවා. මම අහන්නේ එක කොම්පැනියකට විතරක් රුපියල් මිලියන 700ක් - රුපියල් කෝටි 70ක්- දෙන්න තරම් තිබෙන සම්බන්ධය මොකක්ද කියායි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒකෙන් රුපියල් මිලියන 139ක් දැනට ගෙවලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා ඉතින් ඒවා දන්නවා නේ. 2007 ඉඳලා අවුරුදු පහකට පසුවයි ගෙවා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මේක 2007 දී වෙච්ච වැඩක්. මමත් හිතනවා, නීති මඟින් කටයුතු කරලා අපි ආපසු ඒ මුදල් ගන්න ඕනෑ කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමා සමඟ එකඟ වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

බොහොම ස්තුතියි, ඔබතුමා එහෙම එකඟ වෙච්ච එක ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ආයෝජන ගැන කථා කරනවා. දැනට සතියකට දෙකකට කලින් මල්වත්තේ තිබුණු Crystal Sweater Lanka (Pvt) Limited කියන ඇඟලුම් කර්මාන්තශාලාව වැහිලා ගියා. ඒක ළමයින් 3000ක් සේවය කරපු ආයතනයක්. ඔබතුමන්ලා එක එක රටවල්වලට වණ්ඩි පාට් දමන්න ගිහින් ඇති වුණු විවිධ ප්‍රශ්න ගණනාවක් නිසා අපට තිබුණු GSP Plus සහනය ලැබුණේත් නැහැ. දැන් අවසාන වශයෙන් ඒවාත් වැහිලා යනවා. අලුත් රැකී රක්ෂා අවස්ථා ඇති කරන වැඩ පිළිවෙළකුත් ආණ්ඩුවට නැහැ. අපට තිබෙන මුදල් ටිකත් කොම්පැනි තුන හතරකට දීලා කාබාසිනියා කරනවා. අවුරුද්දකට අපේ රටේ දරුවන් ලක්ෂ හතරක් පමණ රක්ෂා සොයා ගෙන එනවා. රැකියා අවස්ථා ඇති කරන්න අලුත් ආයෝජන අවස්ථා ඇති කරනවාය කියා තමුන්නාන්සේලා කියනවා. අලුත් රැකියා අවස්ථා ඇති කරන්න ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ මේකද කියා මම අහනවා. මේක රට සම්පූර්ණයෙන් විනාශ කරන වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ සඳහා පිළිතුරක් තිබෙනවා. ඔබතුමා ඒ ප්‍රශ්නය නඟපු එක හොඳයි. ඇත්ත වශයෙන්ම අද විදේශ රටවලට අපි විකුණන භාණ්ඩ සියල්ලම එක්තරා විධියක පසු බෑස්මකට ලක් වෙලා තිබෙනවා. මොකද, ඒ වෙළෙඳාමට ඉල්ලුම තිබුණේ ඇමෙරිකාවෙන් සහ යුරෝපීය රටවලින්. GSP විතරක් නොවෙයි, කරුණාකරලා GSP මතම මේක දාන්න එපා. මොකද, ඇමෙරිකාවෙන් අපට තිබුණු ඒ සහනයත් ඒ විධියටම තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ, දැන් ඒවා නැතිවත් කරන්න පුළුවන් කිව්වා නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

පොඩ්ඩක් ඉන්න. මම පිළිතුර දෙන්නයි හදන්නේ. ඇත්ත වශයෙන්ම අපේ රටේ විතරක් නොවෙයි මුළු ලෝකයේම භාණ්ඩ සඳහා, ඒ රටවලින් පිට රටවලට යවන භාණ්ඩ සඳහා ඉල්ලුම අඩු වෙලා තිබෙනවා. අපේ රටේ භාණ්ඩවලට විතරක් නොවෙයි ලෝකයේම භාණ්ඩවලට ඉල්ලුම අඩු වෙලා තිබෙනවා. ඒගොල්ලන්ට සල්ලි අඩුයි. ආර්ථිකය තව දියුණු වන විට එය හොඳ පැත්තට හැරෙන්නට පුළුවන්. නමුත් ඇත්ත වශයෙන් අපි කියන්නට ඕනෑ මේ නිසා ඉතා හොඳට කළමනාකරණය නොකළ හුඟක් ආයතන වැහිලා ගියා. ඒක නැහැ කියන්න බැහැ. ඒක අනිවාර්යයෙන් සිදු වන දෙයක්. නමුත් අනෙක් පැත්තට- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම පිළිතුරු දෙන තුරු ඉන්න. අනෙක් පැත්තට හොඳ කළමනාකරණයක් තිබුණු කර්මාන්තශාලා දියුණු වෙලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේ කියන විධියට ඉතාම භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා මම කල්පනා කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාට කියන්නට හැදුවේ මෙයයි. මේ GSP Plus සහනය තිබුණා නම් අපට ඒ සහනයත් ලැබුණායින් පසුව competitive price එක බොහොම අඩු වෙනවා. ඔබතුමාට දැන් මේ කියන්නේ Crystal Group එකේ වැහිලා තිබෙන එක ආයතනයක් ගැන විතරයි. තව මාස තුන හතරක් යන විට ඒ Crystal Group එකට අයිති සියලු ආයතන ටික වැහිලා යනවා. විශාලම ඇඟලුම් කර්මාන්තශාලාවක් තමයි මේ වැහිලා යන්නේ. ඒ නිසා මම කියන්නේ-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ තමුන්නාන්සේ හිතන හැටි නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමන්ලාට කියන්නේ මේ සල්ලි ටික අන්න ඒ වාගේ ආයතන ගොඩ ගන්න දෙන්න කියලායි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ප්‍රශ්නය ඒක නොවෙයි. තමුන්නාන්සේ මේක කෙළින්ම GSP එකට සම්බන්ධ කරන්නයි හදන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම මම එක කාරණාවක් කියන්නට ඕනෑ.

ඔබතුමා මේ ප්‍රශ්නය නඟපු එක හොඳයි. මොකද, රටත් මේ ගැන දැන ගන්න ඕනෑ. අපේ රට දැන් මධ්‍යම ගණයේ ආර්ථිකයක් පවතින රටක්. මධ්‍යම ගණයේ ආර්ථිකයක් පවතින රටවලට GSP ඇතුළුව තිබෙන සහන ක්‍රම- [බාධා කිරීමක්] නිකම් හිනා වෙලා හරි යන්නේ නැහැ නේ. මේ කරුණු දැන ගන්න. GSP ඇතුළු සහන අපට ලැබෙන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සහන ලැබෙන්නේ නැත්තේ, අග විනිසුරුතුමිය ඉවත් කරන විධිය, මේ කරන අපරාධ- [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඕවාද ප්‍රශ්න?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ කරන මානව හිමිකම් උල්ලංඝනය කිරීම්- [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේලා ප්‍රශ්න අහනවා. ප්‍රශ්නවලට සාධාරණ උත්තර දුන්නාම වෙනත් track එකකට යනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4, ගරු අනුර දිසානායක මහතා. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්, ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එතුමිය අයින් වෙලා සතියකුත් ගිහිල්ලා දැන්. තමුන්නාන්සේගේ තර්කය හරි නම්- [බාධා කිරීම්] ඕවා ලකුණු දාගන්න කියන කථා. [බාධා කිරීම්] මම පිළිගන්නවා ආර්ථිකයේ පසු බෑස්ම නිසා අපට මුහුණ දෙන්න සිදු වන යම් යම් ප්‍රශ්න තිබෙනවා කියලා. ඒවාට මුහුණ දෙන්න අපට පුළුවන්.

## ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගමේ නිලධාරින් : විදෙස් සංචාර

## விமான நிலைய மற்றும் விமான சேவைகள் கம்பனி உத்தியோகத்தர்கள்: வெளிநாட்டுப் பயணங்கள்

## OFFICIALS OF AIRPORT AND AVIATION COMPANY: FOREIGN TRIPS

2540/'12

4. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව එක් එක් පුද්ගලයාට අදාළව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරයට අදාළ වූ රටවල්, සංචාරයේ අරමුණු හා ලැබුණු ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් සංචාරය සඳහා සහභාගි වූ එක් එක් පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சிவில் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விமான நிலைய மற்றும் விமான சேவைகள் (ஸ்ரீ லங்கா) கம்பனியின் தலைவர் மற்றும் பணிப்பாளர் சபை அங்கத்தவர்கள் 2009 ஆம் ஆண்டு தொடக்கம் இற்றை வரை மேற்கொண்டுள்ள வெளிநாட்டு பயணங்களின் எண்ணிக்கை ஒவ்வாரு நபருக்கும் ஏற்ப தனித் தனியே எவ்வளவென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு பயணத்திற்குமுரிய நாடுகள், பயணத்தின் நோக்கம், பெற்றுக்கொண்ட பெறு பேறுகள் தனித்தனியே யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பயணத்திலும் பங்கு கொண்ட ஒவ்வொரு நபருக்காகவும் செலவிடப் பட்ட தொகை தனித்தனியே எவ்வளவென் பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Civil Aviation:

(a) Will he inform this House-

(i) separately and in relation to each individual, the number of foreign trips made by the Chairman and the members of the Board of Directors of the Airport and Aviation Company of Sri Lanka from the year 2009 up to now;

(ii) separately and in relation to each trip, the names of the countries visited, the objectives and the outcome achieved; and

(iii) separately, the amount of money spent on each individual who took part in each of the above-mentioned tours ?

(b) If not, why ?

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

(අ) (i) ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව:

ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ විස්තරයක් තිබෙනවා. එම නිසා පිළිතුරේ ඉතිරි කොටස සභාගත කරන්නද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
(අ) (iii) පිළිතුර කියන්න. එම මුදල්වල එකතුව කියන්නකෝ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
එක් එක් පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙනුයි සඳහන් කර තිබෙන්නේ. ඒ එකින් එක මං කියන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එකතුව කියන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
එකතුව සඳහන් කරලා නැහැ. සංචාරයෙන් සංචාරය තමයි සඳහන් කර තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දළ අදහසක් ගන්න කියන්න. (අ) (iii) පිළිතුර කියන්නකෝ. වික්‍රමසිංහ මහත්මයා 2011 වර්ෂයේ දහතුන් වතාවක් පිට රට ගිහින් තිබෙනවා නේ.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
** Rest of the Answer tabled:*

(අ) (i) (ii) (iii)

| සහභාගීවූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | වර්ෂය | සංචාරයට අදාළවූ රට | සංචාරයේ අරමුණු හා ලැබුණු ප්‍රතිඵල | වැය කළ මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| ප්‍රසන්න වික්‍රමසූරිය මහතා - සභාපති | 2009 | ජර්මනිය | ගුවන්තොටුපළේ අළෙවි ප්‍රවර්ධන සහ ව්‍යාපාර සංවර්ධන සමුළුවට සහභාගී වීම සඳහා<br><br>හම්බන්තොට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළට විදේශ ගුවන්සේවා ආකර්ෂණය කරගැනීම. | 9,99,565/-<br>(නව ලක්ෂ අනූ නවදහස් පන්සිය හැට පහයි.) |
| | 2010 | සිංගප්පූරුව | සිවිල් ගුවන්සේවා විධායක නිලධාරීන්ගේ වැඩසටහනට සහභාගීවීම සඳහා<br><br>සිවිල් ගුවන්සේවාවේ නායකත්වයට ඇති අභියෝග, සිවිල් ගුවන් සේවාවේ හදිසි සූදානම්භාවය, ගුවන් ප්‍රවාහනය, ගුවන්තොටුපළ කළමනාකරණය සහ සංවර්ධනයට අදාළ නව වර්ධනයන් , සුරක්ෂිතභාවය, ආරක්ෂාව සහ හදිසි අවස්ථා සැලසුම්කරණය පිළිබඳ සාකච්ඡා කිරීමට ලැබීම. | 6,86,488/-<br>(හය ලක්ෂ අසූ හය දහස් හාරසිය අසූ අටයි.) |
| | 2010 | කැනඩාව | 16 වන ලෝක ගුවන් මාර්ග සංවර්ධන සංසදය සහ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා ආයතනයෙහි 37 වන සැසියට සහභාගීවීම සඳහා<br><br>මෙම සැසියට සහභාගීවීම අනිවාර්ය වන අතර එහිදී ගෝලීය සැලසුම් උදෙසා අනාගත සිවිල් ගුවන්සේවා සම්බන්ධ පත්‍රිකා සාකච්ඡා කිරීම සිදුවේ. | 1,402,337/-<br>(දහතර ලක්ෂ දෙදහස් තුන්සිය තිස් හතයි.) |
| | 2011 | සිංගප්පූරුව සහ ඩුබායි | ගුවන්තොටුපළ පිළිබඳ අධ්‍යයනය/ සමීක්ෂණය සඳහා සිංගප්පූරුව සහ ඩුබායි යන ගුවන්තොටුපළවල් නැරඹීමට ගරු සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා සහ අනෙකුත් සාමාජිකයින් සමඟ සම්බන්ධවීම. | 6,90,900/-<br>(හය ලක්ෂ අනූ දහස් නවසියයයි.) |
| | 2011 | ජර්මනිය | 17 වන ලෝක ගුවන් මාර්ග සංවර්ධන සංසදයට සහභාගීවීම.<br><br>හම්බන්තොට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළට විදේශ ගුවන්සේවා ආකර්ෂණය කරගැනීම. | 6,24,800/-<br>(හය ලක්ෂ විසි හතර දහස් අටසියයයි.) |
| | 2012 | ජපානය | ජපානයේ ගුවන්තොටුපළවල් අධ්‍යයන චාරිකාවට සහභාගීවීම.<br><br>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනයේ දෙවන අදියරට අදාළ කර ගත හැකි නව අදහස් පිළිබඳ අධ්‍යයනය කිරීම. | 4,64,100/-<br>(හාර ලක්ෂ හැට හතර දහස් එකසියයි.) |
| | 2012 | කොරියාව | අතිගරු ජනාධිපතිතුමා සමඟ ජාත්‍යන්තර නියෝජිතයෙකු වශයෙන් සහභාගීවීම. | 3,51,000/-<br>(තුන් ලක්ෂ පනස් එක් දහසයි.) |
| | 2012 | අබුඩාබිය | 18 වන ලෝක ගුවන් මාර්ග සංවර්ධන සංසදයට සහභාගීවීම.<br><br>හම්බන්තොට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා නව ගුවන්සේවා සඳහා අවස්ථාව ලබාදීමට හම්බන්තොට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළට විදේශ ගුවන්සේවා ආකර්ෂණය කරගැනීම. | 3,51,591/-<br>(තුන් ලක්ෂ පනස් එක් දහස් පන්සිය අනූ එකයි.) |
| කමල් එස්.රත්වත්ත මහතා - උප සභාපති | 2011 | ඉන්දියාව | ගරු සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගේ ආරාධනයෙන් බුද්ධගයාව සහ වරනාසි සඳහාවූ රාජකාරිමය සංචාරය | 94,050/-<br>(අනූ හතර දහස් පනහයි.) |
| | 2011 | ඉන්දියාව | ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සලයේ 06 වන ආසියා පැසිපික් කලාපයෙහි සමුළුව සහ ප්‍රදර්ශනයට සහභාගීවීම.<br><br>ජාත්‍යන්තර විෂය ප්‍රවීණයන්ගෙන් ගුවන් සේවයේ උපක්‍රම පිළිබඳ දැනුම ලබාගැනීම, ගුවන්තොටුපළ සාමාජිකයින් සහ ගෝලීය ව්‍යාපාරික ප්‍රජාව අතරවූ සාර්ථක ජාල ගතවීමේ අවස්ථා තුළින් ප්‍රතිලාභ ලබාගැනීම. | 4,21,730/-<br>(හාර ලක්ෂ විසි එක් දහස් හත්සිය තිහයි.) |
| | 2011 | ඕස්ට්‍රේලියාව | අතිගරු ජනාධිපතිතුමා සමඟ රාජ්‍ය නියෝජිතයෙකු වශයෙන් CHOGM -2011 සඳහා සහභාගීවීම. | 3,490/-<br>(තුන් දහස් හාරසිය අනූවයි.) |
| | 2012 | ජපානය | සිවිල් ගුවන්සේවා අමාත්‍යවරුන්ගේ ප්‍රවර්ධන සංචාරය සඳහා ගරු පා.ම. නාමල් රාජපක්ෂ මහතා සමඟ රාජ්‍ය නියෝජිතයෙකු වශයෙන් සහභාගීවීම. | 8,49,786/-<br>(අට ලක්ෂ හතළිස් නව දහස් හත්සිය අසූ හයයි.) |
| | 2012 | කොරියාව | ගරු සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා සමඟ රාජ්‍ය නියෝජිතයෙකු වශයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ දැනුම් සංසදයට සහභාගීවීම. | 5,16,500/-<br>(පන් ලක්ෂ දහය දහස් පන්සියයි.) |
| ජොහාන් ජයරත්න මහතා - විධායක අධ්‍යක්ෂ | 2010 | ඩුබායි | ඩුබායි නිදහස් කලාපය අධ්‍යයනය කිරීම<br><br>හම්බන්තොට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළේහි නිදහස් කලාපයක් පිහිටුවීමට අවශ්‍ය දැනුම ලබාගැනීම. | 1,75,015/-<br>(එක් ලක්ෂ හැත්තෑ පස් දහස් පහළොවයි.) |

[ගරු අනුර දිසානායක මහතා]

| | | | | |
|---|---|---|---|---|
| | 2011 | තායිලන්තය | සිවිල් ගුවන් සංතරණ සේවා ආයතනය - ගුවන් සංතරණ සේවා සපයන්නන්ගේ සමුළුවට සහභාගීවීම.<br><br>ඉදිරි දශකය තුළ සිය කොටස්කරුවන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ගුවන්සේවා සපයන්නන් විසින් ආමන්ත්‍රණය කළ යුතු තීරණාත්මක කරුණු පිළිබඳ තක්සේරුව, වැය කරන මුදලට වටිනාවුන් කාර්යක්ෂමවූත් ගෝලීය ගුවන් ගමන් කළමනාකරණ ක්‍රමවේදයන් උදෙසා රාජ්‍යයන් විසින් ඉදිරි දශකය තුළ කළ යුතු කාර්යයන් පිළිබඳ සාකච්ඡා කිරීම. | 1,96,520/-<br>(එක් ලක්ෂ අනූ හය දහස් පන්සිය විස්සයි.) |
| | 2011 | සිංගප්පූරුව | ව්‍යාපාරික සම්මන්ත්‍රණයට සහභාගී වීම.<br><br>රට තුළට සෘජු විදේශ ආයෝජනයන් ආකර්ෂණය කරගැනීම. | 2,28,940/-<br>(දෙලක්ෂ විසි අට දහස් නවසිය හතළිහයි.) |
| කෝසල ආර්. වික්‍රමනායක මහතා - අධ්‍යක්ෂ | 2012 | කොරියාව | අතිගරු ජනාධිපතිතුමා සමඟ ජාත්‍යන්තර නියෝජිතයෙකු වශයෙන් සහභාගීවීම. | 3,51,000/-<br>(තුන් ලක්ෂ පනස් එක් දහසයි.) |

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

(ආ) පැන නොනඟී

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමාට මාසිකව ලැබෙන වැටුපටත් වඩා වැඩි මුදල් ප්‍රමාණයක් එතුමාට පිට රට යෑම සඳහා මෙම ආයතනය වියදම් කරනවා. හැබැයි ඒ රට ගිහින් ප්‍රතිලාභ අරගෙන ඇවිත් ඇති; ගුවන් කර්මාන්තය දියුණු කිරීම සඳහා ඥානය අරගෙන ඇවිත් ඇති. ඒ ප්‍රතිඵල ඇති.

හැබැයි සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? 2011 වර්ෂයේ එයාර් ලංකා ආයතනයේ පාඩුව රුපියල් කෝටි 1900යි. එතකොට ගරු ඇමතිතුමනි, සභාපතිවරයා වන වික්‍රමසිංහ මහතා, ඔබතුමා දන්නවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමා, මේ ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. ඒ සභාපතිවරයා රට යන එකත්, ඊට පස්සේ ඒ සමාගමේ ඇති වී තිබෙන පාඩුවත් විශාල ප්‍රමාණයකින් වර්ධනය වී තිබෙනවා. එම නිසා ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි, මේ ගොල්ලෝ රට ගිහින් මොකවත් අර ගෙන එන්නේ නැද්ද, නිකම් සංචාරය ආලා එනවාද කියා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමාට මම කියන්නට කැමතියි, ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම ගිය වර්ෂයේත් අවසාන භාගයේ බිලියන තුනක ලාභයක් ලබා තිබෙනවාය කියන එක. මේ සෑම ගමනක්ම ගිහින් තිබෙන්නේ රජයේ අවසරය ඇතිවයි. විශේෂයෙන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ market කිරීමේ -ප්‍රවර්ධනය කිරීමේ- වැඩසටහනක් අනුව තමයි ඔහු මේ ගමන්වලට සම්බන්ධ වී තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සභාපතිවරයා 2011 වසරේ දහතුන් වතාවක් රට ගිහින් තිබෙනවා. ගරු ඇමතිතුමා එච්චර වතාවක් ගිහින් ඇති කියා මා හිතන්නේ නැහැ. නැතිව ඇති නේ? ඔබතුමාට මතක ඇති නේ. එතකොට අමාත්‍යවරයාටත් වඩා සභාපතිවරයා රට යනවා. ඔබතුමා කියන්නේ මත්තල ගුවන් තොටුපළේ තාක්ෂණික කටයුතු සඳහා එතුමා රට ගියාය කියායි. නමුත් අප දන්නා විධියට එතුමාට එහෙම තාක්ෂණික දැනුමක් නැහැ. එතුමාට තිබෙන්නේ, වෙන ඥාතිත්වයක් විතරයි. මා ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි -[බාධා කිරීමක්] හරි කරදයක් නේ. [බාධා කිරීමක්] එම නිසා මත්තල ගුවන් තොටුපළ ඉදි කිරීමට -[බාධා කිරීමක්] මෙතුමාට කියන්නට ඕනෑ වෙලා තිබෙන්නේ කාගේ ඥාතියෙක් ද කියලායි. ආර්යාවගේ අයියා. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක මතක් කර දුන්නාට බොහොම ස්තුතියි. මට අමතක වුණා, ඥාතිත්වය කියන්න. [බාධා කිරීමක්] කිච්චා දැන්. ඇහුණා ද? හරි? [බාධා කිරීමක්]

ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමැතියි - [බාධා කිරීමක්] හරි කරදරයක් නේ. වාඩි වෙන්න කෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! අස්වර් මන්ත්‍රීතුමනි, කරුණාකරලා බාධා කරන්න එපා. [බාධා කිරීමක්]

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, මට ප්‍රශ්නය ඇහෙන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා හරි හොඳින් උත්තර දෙනවා. මේ කොහේවත් සිටින පනින කෙනෙක් තමයි දහලන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එතකොට ඒ ගුවන් තොටුපොළ ඉදි කිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා තාක්ෂණවේදීන් ගියේ නැතිව එහි සභාපතිවරයා ගියේ ඇයි? ඒකට යවන්නට ඕනෑ, ඉංජිනේරුවරුන් නේ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු මන්ත්‍රීතුමනි, සමහර තාක්ෂණ නිලධාරිනුත් ගිහින් තිබෙනවා. අපේ ගුවන් සේවා පිළිබඳව වැඩමුළු, සම්මන්ත්‍රණ සහ marketing programmes පැවැත්වෙන අවස්ථා තිබෙනවා. ඒ සඳහා සහභාගි වන්නට අවශ්‍ය කණ්ඩායම් සමහර අවස්ථාවල දී -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමන්ලාගේ airline එක සම්බන්ධයෙන් marketing programmes පැවැත්වෙන අතර, ගුවන් තොටුපොළ සම්බන්ධයෙනුත් වෙනම marketing programmes තිබෙනවාද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ඔව්. මොකද, අපි දැන් අලුතෙන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ market කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතකොට දැනට මත්තල ගුවන් තොටුපොළ market කිරීමේ ප්‍රතිඵල අනුව ගුවන් සමාගම් කීයක් එකඟතාව පළ කරලා තිබෙනවාද? ඒ එකඟතාවන්වල කොන්දේසි කවරේද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

දැනට ගුවන් ආයතන හතරක් එකඟ වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මාර්තු මාසයේ 18වැනි දා එය විවෘත කරන්නට අපි බලාපොරොත්තු වනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බොහොම ස්තුතියි.

## සේවය හැර ගිය ත්‍රිවිධ හමුදා සෙබළු : විස්තර
### சேவையை விட்டுத் தப்பிச்சென்ற முப்படை வீரர்கள் : விபரம்
### DESERTERS OF THE THREE FORCES: DETAILS

2557/'12

5. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2006 සිට මේ දක්වා යුද, නාවික සහ ගුවන් හමුදාවන්හි සේවය අතහැර පලාගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හමුදා අත්හැර පලාගිය පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට නීතිමය බලය සතු බලධාරීන් කවුරුන්ද;

(iii) 2006 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අත් අඩංගුවට ගත්, පලාගිය ත්‍රිවිධ හමුදා සමාජිකයින් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා කාලය තුළ ත්‍රිවිධ හමුදාවෙන් පලාගිය පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදු කරන ලද ප්‍රදේශ කවරේද;

(v) එම වැටලීම් මගින් අත් අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන්ගේ නාමලේඛනය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2006 முதல் இற்றைவரை தரைப்படை, கடற் படை மற்றும் வான்படைச் சேவைகளை விட்டுத் தப்பிச் சென்றுள்ளவர்களின் எண்ணிக் கைகளை வருடாந்த அடிப்படையில் வெவ்வேறாக யாதென்பதையும்;

(ii) இவ்வாறு படைகளை விட்டுத் தப்பிச் சென்றுள் ளவர்களை கைதுசெய்வதற்கு சட்ட ரீதியான அதிகாரத்தைக் கொண்ட அதிகாரிகள் யாவ ரென்பதையும்;

(iii) 2006 முதல் 2011 டிசம்பர் 31 ஆம் திகதி வரை கைதுசெய்யப்பட்டுள்ள, தப்பிச்சென்ற முப்படை களினதும் அங்கத்தவர்களின் எண்ணிக்கை வருடாந்த ரீதியில் வெவ்வேறாக யாதென் பதையும்;

(iv) 2012 சனவரி 01 முதல் மார்ச் 31ஆம் திகதி வரையிலான காலப்பகுதியில் முப்படைகளை விட்டுத் தப்பிச் சென்றவர்களை கைதுசெய்வ தற்கு சுற்றிவளைப்புகள் மேற்கொள்ளப்பட்ட பிரதேசங்கள் யாவையென்பதையும்;

(v) மேற்படி சுற்றிவளைப்புகளின் மூலம் கைது செய்யப்பட்ட ஆட்களின் பெயர்பட்டியலை சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) separately, the number of soldiers who deserted the Army, Navy and Air Force in each year from the year 2006 up to now;

(ii) the authorities who have the legal power to take those deserters into custody;

(iii) separately, the number of deserters of the three forces who were taken into custody in

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

each year from the year 2006 to 31st December, 2011;

(iv) the areas where the operations were carried out from 01st January, 2012 to 31st March, 2012 to take the deserters of the three forces into custody; and

(v) whether he will submit the list of names of the deserters who were taken into custody in those operations ?

(b) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ආරක්ෂක හේතූන් මත ලබා දිය නොහැක.

(ii) යුද හමුදාව :- 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 (උ) වගන්තිය ප්‍රකාරව සහ 1949 අංක 17 දරන යුද හමුදා පනතේ 150 වගන්තිය ප්‍රකාරව යම් පොලිස් නිලධාරියෙකු විසින් හෝ යම් නිලධාරියෙකු/සෙබළෙකු හෝ වෙනත් තැනැත්තෙකු විසින් අත් අඩංගුවට ගැනීම සිදු කළ හැක.

නාවික හමුදාව:- ශ්‍රී ලංකා නාවික හමුදා විනායාරක්ෂක අංශය සහ ශ්‍රී ලංකා පොලීසිය

ගුවන් හමුදාව:- ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි.

(iii) ආරක්ෂක හේතූන් මත ලබා දිය නොහැක.

(iv) යුද හමුදාව:- යුද හමුදා පොලිස් සේවා බළකාය විසින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක යුද හමුදා භට පිරිස් යොදවා ඇති ස්ථානවල හා නවාතැන් පහසුකම් ලබා සිටින ස්ථානවල සිටින යුද හමුදා සේවය අතහැර පලා යන අය අත් අඩංගුවට ගැනීම සිදු කරනු ලබයි.

නාවික හමුදාව:- ලග්ගල, තලාතුඔය, දොඩංදූව, මහනුවර, ගාල්ල යන ප්‍රදේශ.

ගුවන් හමුදාව:- මතුගම, ඇල්පිටිය, බලපිටිය, බේරුවල, පුත්තලම, කරාපිටිය, මින්නේරිය, රාජයාල, හිඟුරක්ගොඩ, වල්පොල, ඉපලෝගම, මැදිරිගිරිය,පොළොන්නරුව, මීගමුව, කුරුණෑගල, මිනුවන්ගොඩ,කඩවත, වෙන්නප්පුව, කුලියාපිටිය, කොච්චිකඩේ, වෙයන්ගොඩ, සීදූව, හලාවත, වරකපොළ, දේවාලේගම, මාදම්පේ, ඌරාපොළ, ආනමඩුව, මාවතගම, අලව්ව, බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ, අහංගම, හබරාදූව, ත්‍රිකුණාමලය, කන්තලේ, ගම්පහ, නිට්ටඹුව, ජා ඇල, කටුගස්තොට, වැලිවේරිය, මීරිගම, මාදලගම, කුහියාව, එප්පාවෙල, ගලෙන්බිඳුනුවැව, කහටගස්දිගිලිය, තබාව, අනුරාධපුර, මැදවච්චිය, මාමඩුව, කැබිතිගොල්ලෑව, කැලණිය, අම්පාර, දමන, උහන, ගිරාදුරුකෝට්ටේ.

(v) ආරක්ෂක හේතූන් මත ලබා දිය නොහැක.

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් අපට මාධ්‍යවලින් නිරන්තරව අහන්න ලැබෙනවා, රටේ සිදු වන අපරාධ, මං කොල්ලකෑම් වැනි දේවලට හමුදාවෙන් පැන ගිය අය සම්බන්ධයි කියලා. ඇත්තටම අපි විශ්වාස කරන විධියට උත්තරීතර පාර්ලිමේන්තුවට ලබා දිය නොහැක්කේ හමුදාවේ ඉන්න ගණන පිළිබඳ තොරතුරු. ඒක ආරක්ෂාවට හානිකර ප්‍රශ්නයක් විධියට හිතන්න පුළුවන්. හැබැයි, හමුදාවෙන් පලා ගිය ගණන කීමෙන් තමයි ඒ අය අත් අඩංගුවට ගන්න පුළුවන් වන්නේ. ඒ තොරතුර ලබා දීමෙන් රටට හානියක් වන්නේත් නැහැ; මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ප්‍රශ්නයක් වන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඒ ප්‍රමාණය කියන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය එනවා. මොකද රටේ හැම තැනින්ම මතු වන්නේ හමුදාවෙන් පැන ගිය අය යම් යම් සිදුවීම්වලට සම්බන්ධයි කියන එක. මාධ්‍යවලත් මේවා පළ වෙනවා. ඔබතුමන්ලා ආරක්ෂක හේතු මත බව සඳහන් කරමින් හමුදාවෙන් පලා ගිය මේ අයගේ තොරතුරු උත්තරීතර පාර්ලිමේන්තුවට ලබා නොදෙන්නේ ඇයි කියලා දැන ගන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන ආකාරයට විස්තර ලබා දීමට ආරක්ෂක හේතු මත හැකියාවක් නැහැ. ඒ වැටලීම් කළ බලයලත් ස්ථානවල සම්පූර්ණ ලේඛනය මා ඉදිරිපත් කළා. රටේ සිදු වන සියලු අපරාධ පිළිබඳව හමුදාවේ භටයන්ට චෝදනා කිරීමෙන් වැළකී සිටින ලෙස මා ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. එය වැරැදි මතයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, අප නොවෙයි නේ ඒ චෝදනා නගන්නේ. මාධ්‍යවල වාර්තා වෙලා තිබුණා හමුදාවේ අහවල් තැන, අහවල් තැන හිටපු සෙබළුන් කියලා. ඔවුන් ඒ අපරාධවලට හවුල් වූ බවට පොලිස් මාධ්‍ය ප්‍රකාශක් විටින් විට කියන අවස්ථා තිබෙනවා. ඒ නිසා ඒ චෝදනා නඟන්නේ ආණ්ඩුවම තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තේරෙන්නේ නැත්තේ මෙකයි. දැනට හමුදාවේ ඉන්න සොල්දාදුවන් ප්‍රමාණය, අවි ආයුධ ප්‍රමාණය, ඔවුන්ගේ පුහුණුවේ තත්ත්වය අහනවා නම් ඒක රටක ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. හැබැයි මේ අහලා තිබෙන්නේ හමුදාව හැර ගිය අයගේ ප්‍රමාණය. ඇත්තටම හමුදාව හැර ගිය මේ පිරිස රටේ ආරක්ෂාවට තර්ජනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා රටට සහ මේ පාර්ලිමේන්තුවට ඒ හැර ගිය අය පිළිබඳ නාම ලේඛනයක් ඉදිරිපත් නොකිරීම කිසි සේත්ම පිළිගත හැකි කාරණයක් නොවෙයි. ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්න

කැමැතියි, ඒ තොරතුරු ලබා දීම ආරක්ෂාවට බලපාන්නේ කෙසේද කියලා. මේ ආරක්ෂාවට බලපාන නිසා ඒ තොරතුරු දෙන්න බැහැ කියලා කියන්න බැහැ. ඒ තොරතුරු ලබා දීම ආරක්ෂාවට බලපාන්නේ කෙසේද කියලා ඔබතුමා මේ පාර්ලිමේන්තුවට කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මා කලින් කියපු ස්ථාන මඟින් වැටලීම් කරලා හමුදාවෙන් පැන ගිය අය විශාල පිරිසක් දැනට අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ පිළිබඳ පරීක්ෂණ සිදු වෙමින් පවතිනවා. හමුදාවේ අයට-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

1,000ක්ද, 2,000ක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ආරක්ෂක හේතු මත ඉලක්කමක් දීම හෝ නම් දීම අප පිළිගන්නේ නැහැ. මා ඒ හේතුව කිව්වා. ඒක බරපතළයි. මොකද ඒ පරීක්ෂණ කෙරෙන අතර ඒවාට සම්බන්ධ සිවිල් පුරවැසියන් සිටිනවාද වැනි කරුණු හොයා ගනිමින් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කටයුතු කරන්නේ. පුවත් පත්වල පළ වූ පළියට ඒ සියල්ල සත්‍ය නොවෙයි. ඒක පුවත් පතට ලැබුණු ප්‍රවෘත්තියක්. ඒ ඔවුන් තනියම සොයා ගත්ත වාර්තා නොවෙයි. මාධ්‍ය ප්‍රකාශ කියන ඒවා එකතු කරලා බැලුවොත් ඇඟිලිවලින් ගණන් කරන්න පුළුවන් තරම් ඉතාම ස්වල්පයක්. මට පුදුමයි, තමුන්නාන්සේලා මේ අපරාධ ගැන වෙන අයට චෝදනා නොකරපු එක ගැන. නමුත් හමුදාවෙන් පැන ගිය සෙබළුන්ට මේ වාගේ චෝදනා කරන්න එපා.

ඒ අය විවිධ හේතු මත පැන ගිහිල්ලා තිබෙනවා. සමහර අය ඉවත් වෙලා යන්න ඉල්ලීම් කර තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඉල්ලන තොරතුරු ආරක්ෂක හේතු මත ලබා දෙන්න අමාරුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පැන ගිය සංඛ්‍යාව, 1,000ද, 2,000ද, 1,100ද, 1,365ද ආදී වශයෙන් සංඛ්‍යාවක් දීම ආරක්ෂාවට බලපානවාය කියලා එතුමා ඉදිරිපත් කළ තර්කය කිසි සේත්ම මේ සභාට පැහැදිලි වුණේ නැහැ. සැබැවින්ම මේ සිදු වෙමින් තිබෙන්නේ මේකයි. හමුදාවේ දැන් සේවයේ නිරත වන සෙබළුන් විශාල පිරිසක් ආණ්ඩුවේ විවිධ ව්‍යාපෘතිවල ශ්‍රමිකයන් විධියට වැඩ කරමින් සිටිනවා. එය දරා ගන්න බැරිව, යුද්ධය පැවැති කාලයට වඩා වැඩි පිරිසක් හමුදාවෙන් පැන යැමේ තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මේ සංඛ්‍යා ඉදිරිපත් නොකරන්නේ ඒ හේතුව නිසා. මේ සංඛ්‍යා ඉදිරිපත් කළා නම්, යුද වකවානුවේ හමුදාව අත් හැරලා ගිහින් තිබෙන ප්‍රමාණයට වඩා වැඩියි, දැන් කුලී වැඩ කරන කොට හමුදාව අත් හැරලා ගිහින් තිබෙන ප්‍රමාණය කියලා සැබවින්ම හෙළිදරවු වනවා. ඒක වැළැක්වීම තමයි තමුන්නාන්සේගේ ඔය තර්කයේ අදහස. ඒක අපට තේරෙනවා. ඒ නිසා, දැන් හමුදාවේ සොල්දාදුවන්ට පැවරී තිබෙන කාර්යයට අමතරව, ගඩොල් ඇල්ලීම, පස් පිඩැලි ඇල්ලීම, පිට්ටනි කැපීම ආදී කාර්යයන් වෙනුවෙන් අමතර දීමනාවක් ලබා දෙනවාද කියන කරුණ මා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කරන සේවය පිළිබඳව, ලැබෙන දීමනා ආදිය පිළිබඳව වෙනම ප්‍රශ්නයක් අහන්න. එය මෙයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි.

## සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල : විස්තර
## சமுர்த்தி உத்தியோகத்தர் நலனோம்புகை நிதியம் : விபரம்
## SAMURDHI OFFICERS' WELFARE FUND : DETAILS

2950/'12

6\. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භයේ සිට මේ දක්වා එම අරමුදලට බැරවී ඇති මුළු මුදල කොපමණද;

(iii) 2012 ජුනි 30 දිනට එම අරමුදලින් ගෙවීම් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව, ඔවුන්ට ගෙවා ඇති මුළු මුදල සහ අරමුදලේ ශේෂය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම අරමුදලෙහි,

(i) මුදල් භාවිත කළ හැකි කාර්යයන්;

(ii) නීතිමය තත්ත්වය විග්‍රහ කරන පනත් හා රෙගුලාසි;

(iii) සාමාජිකයෙකුගේ සුබසාධක ඉල්ලීමකට අදාළ ගෙවීම සිදු කිරීමට ගතවන කාලය;

(iv) සාමාජිකයෙකුට හිමි ගෙවීම සිදු කිරීමේදී නියමිත කාලය ඉක්ම යන්නේ නම්, ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල භාවිත කර වෙනත් ආයෝජන සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ආරම්භයේ සිට මේ දක්වා සිදු කළ ආයෝජනයන්ගෙන් උපයාගෙන ඇති ලාභය කොපමණද;

(iii) එම ලාභ බෙදීයන පාර්ශ්ව කවරේද;

(iv) එම එක් එක් පාර්ශ්ව වෙත බෙදීයන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை சமுர்த்தி அதிகாரசபையின் சமுர்த்தி உத்தியோகத்தர் நலனோம்புகை நிதியம் ஆரம்பிக்கப்பட்ட திகதி யாது;

[ගරු අජිත් කුමාර මහතා]

(ii) ஆரம்பத்திலிருந்து இற்றைவரை மேற்படி நிதியத்தில் வரவு வைக்கப்பட்டுள்ள மொத்தப் பணத்தொகை யாது;

(iii) 2012 ஆம் ஆண்டு ஜுன் 30 ஆம் திகதிக்கு, மேற்படி நிதியத்திலிருந்து கொடுப்பனவுகள் மேற்கொள்ளப்பட்டுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை, இவர்களுக்குச் செலுத்தப் பட்டுள்ள மொத்தப் பணத்தொகை மற்றும் நிதியத்தின் மீதி என்பன வெவ்வேறாக யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி நிதியத்தின்,

(i) நிதியைப் பயன்படுத்தக் கூடிய கருமங்கள்;

(ii) சட்ட நிலைமையை விபரிக்கின்ற சட்டங்கள் மற்றும் ஒழுங்குவிதிகள்;

(iii) அங்கத்தவர் ஒருவரின் நலனோம்புகை வேண்டு கோளுக்கு ஏற்ப கொடுப்பனவை மேற்கொள்வ தற்கு எடுக்கும் காலம்; மற்றும்

(iv) அங்கத்தவர் ஒருவருக்கு உரித்தான கொடுப் பனவை மேற்கொள்கின்றபோது குறிப்பிட்ட காலத்தைத் தாண்டுவதாயிருப்பின், அதற்கான காரணம்;

யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) சமுர்த்தி உத்தியோகத்தர் நலனோம்புகை நிதியத் தைப் பயன்படுத்தி ஏனைய முதலீடுகள் மேற்கொள்ளப்படுகின்றனவா;

(ii) ஆமெனில், ஆரம்பத்திலிருந்து இன்றுவரை மேற் கொள்ளப்பட்டுள்ள முதலீடுகளிலிருந்து ஈட்டப் பட்டுள்ள இலாபம் எவ்வளவு;

(iii) மேற்குறிப்பிடப்பட்ட இலாபம் பகிர்ந்தளிக்கப் படும் தரப்பினர்கள் யாவர்;

(iv) மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு தரப் பினரிடை யிலும் பகிர்ந்தளிக்கப்படும் பணத்தொகை வெவ்வேறாக யாது;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state-

(i) the date on which the Samurdhi Officers' Welfare Fund of the Sri Lanka Samurdhi Authority was established;

(ii) the total amount credited to that Fund from its inception up to now; and

(iii) the number of officers who have been paid by the aforesaid Fund, the total amount paid to them and the balance in the Fund separately, as at 30th June 2012?

(b) Will he inform this House -

(i) the purposes for which the money of that Fund can be used;

(ii) the Acts and Regulations that construe the legal status of that Fund;

(iii) the time taken to make the payments relevant to a members' welfare request; and

(iv) the reasons for delays in making payment for a member's request, if such delays take place ?

(c) Will he also state-

(i) whether any other investment has been made using the money of the Samurdhi Officers' Welfare Fund;

(ii) if so, the profit made through such investment from its inception up to now;

(iii) the parties among whom that profit would be divided; and

(iv) the amount that goes to each party, separately ?

(d) If not, why ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன )
(The Hon. Lakshman Yapa Abeywardena )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1998.03.01 දින මෙම අරමුදල සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත. 2006.04.18 වන දින ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට පවරා ඇත.

(ii) ආරම්භයේ සිට 2012 ජූනි 30 දින දක්වා එම අරමුදලට බැර වී ඇති මුළු මුදල රුපියල් මිලියන දෙසිය විසිඑකයි දශම හතරයි නවයකි. (රු.මි. 221.49)

(iii) ආරම්භයේ සිට 2012 ජූනි 30 දින දක්වා එම අරමුදලින් ගෙවීම් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව 22,488කි.

ගෙවා ඇති මුළු මුදල රුපියල් මිලියන දෙසිය දහඅටයි දශම නවයයි අටකි. (රු.මි. 218.98)

2012 ජූනි 30 දින අරමුදලේ ශේෂය රුපියල් මිලියන දෙකයි දශම පහයි එකකි. (රු.මි.2.51කි)

(ආ) (i) අරමුදල භාවිත කළ හැකි කාර්යයන්

ස්වාභාවික හේතුවක් නිසා සාමාජිකයා මිය යෑම වෙනුවෙන් - රු. 25,000

හදිසි අනතුරක් නිසා සාමාජිකයා මිය යෑම වෙනුවෙන් - රු. 100,000

සාමාජිකයාගේ පූර්ණ අකර්මන්‍යතාවක් සඳහා - රු. 100,000

සාමාජිකයාගේ අර්ධ අකර්මන්‍යතාවක් සඳහා - රු. 50,000

හදිසි අනතුරක් නිසා සාමාජිකයා රෝහලට ගෙන යෑම වෙනුවෙන් ප්‍රවාහන ගාස්තු - රු. 1,000

සාමාජිකයා රෝහල් ගතවීම වෙනුවෙන් දිනක රු. 200 බැගින් දින 30ක උපරිමයකට යටත්ව වසරක් සඳහා - රු. 6,000

සාමාජිකයාගේ මව/ පියා මිය යෑම වෙනුවෙන් - රු. 25,000

සාමාජිකයාගේ කලත්‍රයා හෝ අවිවාහක දරුවෙකු මියයෑම වෙනුවෙන් - රු. 25,000

සාමාජිකයාගේ දරුවකුගේ අධ්‍යාපන කටයුතු සඳහා පළමුවරට ඇතුළත් කිරීමට එක් දරුවකුට - රු. 500

ශල්‍යකර්ම හා නිර්වින්දන ගාස්තු සඳහා - රු. 1,000

(ii) **නීතිමය තත්ත්වය විග්‍රහ කරන පනත් හා රෙගුලාසි නම්, චක්‍රලේඛ උපදෙස්.**

සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල මාර්ගෝපදේශ අංක 98/1- ස.ආ.අ. 8-1

සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල මාර්ගෝපදේශ අංක 2000/1- ස.ආ.අ. 8-2

සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල මාර්ගෝපදේශ අංක 2000/1 - ස.ආ.අ. 8-3 සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල මාර්ගෝපදේශ අංක 2004/1

සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල ස.කො.ජ. චක්‍රලේඛ 2004/02

සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදල සමෘද්ධි චක්‍රලේඛ අංක 2006/26

(iii) සමෘද්ධි නිලධාරි සුබසාධක අරමුදලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිවැරදි අයදුම්පත් අවශ්‍ය ලේඛන සමඟ ඉදිරිපත් කළ පසු චක්‍රලේඛ උපදෙස් පරිදි ගෙවීම් කරනු ලැබේ.

(iv) එම ගෙවීම් ප්‍රමාද වනුයේ අඩු පාඩු සහිතව අයදුම්පත් ඉදිරිපත් කරන ලද අවස්ථාවලදී සහ ගෙවීම් කිරීමට අරමුදලේ මුදල් ප්‍රමාණවත් නොවූ අවස්ථාවලදීය.

ආරම්භයේ සිට මේ දක්වා සාමාජිකයන්ගෙන් අය කරනු ලබන සාමාජික මුදල රු.50කි. නමුත් 2006/26 චක්‍රලේඛය මඟින් ගෙවන ප්‍රතිලාභ මුදල වැඩි කිරීමත්, ප්‍රතිලාභ ඉල්ලුම් කිරීම් වැඩිවීමත්, සුබසාධන අරමුදලට නිලධාරීන්ගෙන් අය වන වාරික මුදල් වැඩි නොවීමත් නිසා මෙම අරමුදලේ මුදල් නොමැති වීමෙන් ඉල්ලුම් කරන අයදුම්පත් සඳහා මාසිකව ලැබෙන අයවීම් ප්‍රමාණය මත ගෙවීම් කිරීමට සිදුව ඇත. සංශෝධිත ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | 1998 සිට 2006 දක්වා ගෙවීම් කළ ආකාරය (රුපියල්) | 2006 සිට සංශෝධිත ගෙවීම් (රුපියල්) |
|---|---|---|
| ස්වාභාවික හේතුවක් නිසා සාමාජිකයා මිය යෑම වෙනුවෙන් | 25,000 | 25,000 |
| හදිසි අනතුරක් නිසා සාමාජිකයා මිය යෑම වෙනුවෙන් | 75,000 | 100,000 |
| සාමාජිකයාගේ පූර්ණ අකර්මන්‍යතාවක් සඳහා | 75,000 | 100,000 |
| සාමාජිකයාගේ අර්ධ අකර්මන්‍යතාවක් සඳහා | - | 50,000 |
| හදිසි අනතුරක් නිසා සාමාජිකයා රෝහලට ගෙන යෑම වෙනුවෙන් ප්‍රවාහන ගාස්තු | - | 1,000 |
| සාමාජිකයා රෝහල් ගතවීම වෙනුවෙන් දිනක රු. 200 බැගින් දින 30ක උපරිමයකට යටත්ව වසරක් සඳහා | 3,000 | 6,000 |
| සාමාජිකයාගේ මව/ පියා මිය යෑම වෙනුවෙන් | 5,000 | 25,000 |
| සාමාජිකයාගේ කලත්‍රයා හෝ අවිවාහක දරුවකු මිය යෑම වෙනුවෙන් | 5,000 | 5,000 |
| සාමාජිකයාගේ දරුවකුගේ අධ්‍යාපන කටයුතු සඳහා පළමුවරට ඇතුළත් කිරීමට එක් දරුවකුට | - | 500 |
| ශල්‍යකර්ම හා නිර්වින්දන ගාස්තු සඳහා | 5,0000 | 10,000 |

(ඇ) (i) සමෘද්ධි නිලධාරි සුභසාධන අරමුදල භාවිතා කර මේ වන විට කිසිදු ආයෝජනයක් සිදු නොකරයි.

(ii) වර්ෂ 1998 සිට 2012 දක්වා මෙම අරමුදලේ මුදල් ආයෝජනය කර උපයාගෙන ඇති ලාභය රුපියල් මිලියන විසිනවයයි දශම හතයිදෙකකි. (රු.මි. 29.72කි)

(iii) එම ලාභ බෙදී යන පාර්ශ්වයන් නම්, මෙහි සාමාජිකත්වය ලබා ඇති සමෘද්ධි අධිකාරියෙන් වැටුප් ලබන සියලු සේවකයන් වේ.

(iv) එසේ ලාභ බෙදීමක් වෙන් වෙන් වශයෙන් සිදු නොකරයි. පොදුවේ ප්‍රතිලාභ ගෙවීම් සඳහා යොදා ගනු ලැබේ.

දැනට සියලු වෘත්තීය සමිති කැඳවා නව ව්‍යවස්ථාවක් සකස් කර මෙම සුභසාධන අරමුදල, සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවකට පැවරීමට කටයුතු කර ගෙන යනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය දැන ගන්න කැමැතියි. සමෘද්ධි අරමුදලේ මුදල් විවිධ අවස්ථාවල උද්ඝෝෂණයන් සඳහා කැඳවන පිරිස්වලට ආහාර, බනිස්, වතුර ලබා දීම සඳහා වියදම් කළ හැකිද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

එසේ වියදම් කළ නොහැක. ඒ මුදල් එසේ පාවිච්චි කර නැත.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බොහොම හොඳයි. ඔබතුමාට මම දවසක් රූපවාහිනී වැඩසටහනකදීත් මේ කියන කාරණය පෙන්වා දුන්නා. පසු ගිය 8වැනි දා සහ 9වැනි දා පාර්ලිමේන්තුව අවට උද්ඝෝෂණයක් පැවැත් වුණා. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලියුමක් යවලා තිබෙනවා, ජනකලා කේන්ද්‍රයේ වැඩ මුළුවක් තිබෙනවා කියලා. ජනකලා කේන්ද්‍රයේ වැඩ මුළුවකට මුවාවෙන්- එතැන වැඩ මුළුවක් තිබුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

වැඩ මුළුවක් තිබුණා. මම ගිහිල්ලා කථා කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ජනකලා කේන්ද්‍රයේ තිබෙන වැඩ මුළුවකට ගෙන එන මුවාවෙන් -මේ කිට්ටුම ජනකලා කේන්ද්‍රයට මීටර් 100ක් වාගේ දුරක් තිබෙන්නේ.- බනිස් 2,000ක්, වතුර බෝතල් 2,500ක්, දිවා ආහාරය 460 බැගින් 500 දෙනෙකුට වියදම් කරලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඕනෑම අමාත්‍යාංශයක වැඩ මුළු තිබුණාම ඒ වැඩ මුළුවලට සම්බන්ධවන අයට කෑම දෙනවා. නිලධාරින් ඊට පස්සේ ගිහිල්ලා උද්ඝෝෂණයක් කළාම අපි මොනවා කරන්නද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ අම්පාර දිස්ත්‍රික් ලේකම්, මොනරාගල දිස්ත්‍රික් ලේකම් යවපු receipts තමයි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

තමුන්නාන්සේලා කරන වැඩවලට උද්ඝෝෂණ කරනවා ඇති.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

වැඩ මුළුව තමයි, ශ්‍රේෂ්ඨාධිකරණ අග්‍ර විනිශ්චයකාරතුමිය නෙරපා දැමීම සඳහා දියත් කරපු මෙහෙයුමේ වැඩ කොටස. ඒ වැඩ කොටස වෙනුවෙන් තමයි ඒවා කළේ. හරියටම ඒ දිනවලට එක වැඩ මුළුවක් තියනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

දෙපාර්තමේන්තුවක් කිරීම සම්බන්ධයෙන් සමෘද්ධි නිලධාරින් දැනුවත් කිරීම සඳහා වැඩ මුළුවක් තිබුණා. ඊට පස්සේ ඒ අය කොහේ ගියාද කියලා අපි හොයන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟ වැඩ මුළුව තිබෙනවා, දිවි නැගුම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු දිනයේ. ඒ දිනයේත් හරියටම වැඩ මුළුවක් තිබෙනවා, ජනකලා කේන්ද්‍රයේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔව්. අපි වැඩ මුළුවක් තිබ්බා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතකොට ඒ වැඩ මුළුව?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඇයි, තමුන්නාන්සේලා ඒකට විරුද්ධව වැඩ කරන කොට අපි සමෘද්ධි නිලධාරින් දැනුවත් කරන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ සමෘද්ධි අධිකාරියේ සල්ලි අලුත් ප්‍රශ්නයක් වෙලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

අපි ඒ දවස් දෙක, තුනේ සමෘද්ධි නිලධාරින් දැනුවත් කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, අලුත් අග්‍ර විනිශ්චයකාරතුමා දිවුරුම් දුන් දිනයේත් වැඩ මුළුවක් තිබුණාද කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මොකක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අලුත් අග්‍ර විනිශ්චයකාරතුමා දිවුරුම් දීපු දිනයේත් වැඩ මුළුවක් තිබ්බාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ.

## නිෂ්පාදනය සහ ආනයනය කළ සහල් : බදු
### அரிசி உற்பத்தி மற்றும் இறக்குமதி: வரிகள்
### PRODUCTION AND IMPORT OF RICE : TAXES

1742/'11

7. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී හා එක් එක් මාසයේදී,

(i) මුළු සහල් පරිභෝජනය සහ ඒක පුද්ගල සහල් පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය සහල් නිෂ්පාදනය සහ ඒක පුද්ගල සහල් නිෂ්පාදනය යල සහ මහ කන්නවලදී, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආනයනය කළ සහල් ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ සහල් ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් සහල් ආනයනකරුවන්ට සහ වී වගාකරුවන්ට රජය විසින් ලබා දී ඇති සැබෑ සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාව තුළ සහල් කිලෝවක නිෂ්පාදන වියදම කොපමණද;

(ii) වී වගාවේ නියුතු පවුල් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ආනයනය කළ සහ දේශීයව නිෂ්පාදිත සහල් කිලෝවක් සඳහා පනවා ඇති සියලුම බදු (සෘජු සහ වක්‍ර) කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010 யூலை முதல் இற்றை வரை மாதாந்த/ வருட வாரியாக,

(i) அரிசியின் மொத்த நுகர்வு மற்றும் தலா நுகர்வையும்;

(ii) சிறுபோகம் மற்றும் பெரும் போகங்களின் போது அரிசியின் உள்ளூர் மொத்த உற்பத்தி மற்றும் தலா உற்பத்தியை வெவ்வேறாகவும்;

(iii) இறக்குமதிசெய்யப்படும் அரிசியின் அளவையும்;

(iv) இறக்குமதி செய்யப்படும் அரிசியின் பெறுமதியையும்;

(v) அரசாங்கத்தினால் அரிசி இறக்குமதியாளர்கள், நெற்பயிற்செய்கையாளர்கள் ஆகியோருக்கு வழங்கப்படும் உண்மையான மானியத்தை ஒப்புறுதிப்படுத்தும் சான்றுகளுடனும்

அவர் கூறுவாரா?

(ஆ) (i) இலங்கையில் 2010 மற்றும் 2011 ஆகிய வருடங்களில் ஒரு கிலோகிராம் அரிசிக்கான உற்பத்திச் செலவையும்;

(ii) நெற்பயிர்ச் செய்கையில் ஈடுபட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கையையும்;

(iii) இறக்குமதி செய்யப்பட்ட மற்றும் உள்ளூரில் உற்பத்தி செய்யப்பட்ட ஒரு கிலோகிராம் அரிசிக்கு விதிக்கப்பட்ட சகல (நேரடி மற்றும் மறைமுகமான)வரிகளையும்

அவர் வெவ்வேறாகக் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he state from July 2010 to date on per month/ per year basis-

(i) the total consumption and the per capita consumption of rice ;

(ii) the total local production and the per capita production of rice in Yala and Maha seasons separately ;

(iii) the import content of rice;

(iv) the value of the import content of rice; and

(v) the real subsidy given to rice importers and paddy growers by the Government with corroborative evidence?

(b) Will he also state separately-

(i) the cost of production per 1 Kg rice in Sri Lanka for the years 2010 and 2011;

(ii) the number of families involved in paddy cultivation; and

(iii) all the taxes (direct and indirect) imposed on 1 Kg of imported and locally produced rice ?

(c) If not ,why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(අ) (i) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තොරතුරු අනුව,

* 2009 ජූලි සිට 2010 ජූනි දක්වා සමස්ත සහල් පරිභෝජනය

කිලෝ ග්‍රෑම් 2.221,580.368

* 2009 ජූලි සිට 2010 ජූනි දක්වා සාමාන්‍ය මාසික ඒක පුද්ගල සහල් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 9.008

(ii) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තොරතුරු අනුව,

**යල, මහ කන්නවලදී සමස්ත දේශීය සහල් නිෂ්පාදනය සහ ඒක පුද්ගල සහල් නිෂ්පාදනය**

| | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | යල | මහ | යල | මහ | යල | මහ |
| සමස්ත දේශීය සහල් නිෂ්පාදනය මෙ.ටො. | 1,308,398 | 1,634,992 | 1,165,589 | 1,224,875 | 731,817 | 1,684,870 |
| සමස්ත දේශීය සහල් නිෂ්පාදනය මෙ.ටො. | 129 | | 115 | | 119 | |

(iii) සහ (iv) සඳහා පිළිතුර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(v) සහල් සඳහා සහනාධාර ලබා දී නොමැත.

(ආ) (i) හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි කාර්මික පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ලබා දී ඇති තොරතුරු අනුව, නිෂ්පාදන වියදම පහත දැක්වේ.

**2010 සහ 2011 වර්ෂවලදී නාඩු සහල් කිලෝවක් නිෂ්පාදනය සඳහා වියදම**

| | 2010 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම | 15.35 | 19.60 |
| වී කිලෝග්‍රෑම් එකක සහතික මිල | 28.00 | 28.00 |
| සහල් කිලෝග්‍රෑම් එකකට අවශ්‍ය වී ප්‍රමාණය සඳහා වියදම (කි.ග්‍රෑ.1.60) | 44.80 | 44.80 |
| සහල් කිලෝග්‍රෑම් එකක සැකසීමේ වියදම | 5.85 | 6.36 |
| සහල් කිලෝග්‍රෑම් එකක මුළු වියදම | 50.65 | 51.16 |

(ii) 2002 පැවති කෘෂිකර්ම සංගණනයට අනුව වී වගාවේ නියුතු ගොවිකාරකයින් සංඛ්‍යාව 897,076යි.

(iii) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළෙඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තොරතුරු අනුව, බදු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**2010 සහ 2011 වර්ෂවල සහල් ආනයනයේදී පනවා තිබූ බදු**

| බදු වර්ගය | 2010 | 2011 |
|---|---|---|
| ආනයන තීරු බදු (CID) | කිලෝග්‍රෑමයට රුපියල් 20/- | කිලෝග්‍රෑමය ට රුපියල් 20/ - |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු (PAL) | 3% | 5% |
| සමාජ ආරක්ෂණ බදු (SRL) | 1.5% | - |
| ජාතිය ගොඩ නැඟීමේ බදු (NBT) | - | 2% |

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

අ(iii) සහ (iv)
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තොරතුරු අනුව,

<u>ආනයනය කරන ලද සහල් ප්‍රමාණය සහ වටිනාකම</u>

| | | | | Values | |
|---|---|---|---|---|---|
| Year | Month | HSCode | DESCRIPTION | CIF Value(Rs.) | Supp Units(Kg.) |
| 2010 | Jul-2010 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 334,483,757 | 6,831,593 |
| | | **10064000** | Broken rice | 128,043 | 1,700 |
| | **Jul-2010 Total** | | | **334,611,8[illegible]** | **6,833,293** |
| | Aug-2010 | **10062000** | Husked (brown) rice | 7,761 | 110 |
| | | **10063000** | Semi-milled or wholly milled rice, whe | 158,175,538 | 2,932,592 |
| | | **10064000** | Broken rice | 244,066 | 5,200 |
| | **Aug-2010 Total** | | | **158,427,36[illegible]** | **2,937,902** |
| | Sep-2010 | **10062000** | Husked (brown) rice | 225,836 | 2,000 |
| | | **10063000** | Semi-milled or wholly milled rice, whe | 128,879,700 | 2,232,134 |
| | | **10064000** | Broken rice | 1,108,989 | 24,540 |
| | **Sep-2010 Total** | | | **130,214,525** | **2,258,674** |
| | Oct-2010 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 21,270,783 | 222,075 |
| | | **10064000** | Broken rice | 186,121 | 2,500 |
| | **Oct-2010 Total** | | | **21,456,904** | **224,575** |
| | Nov-2010 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 20,626,183 | 221,057 |
| | | **10064000** | Broken rice | 6,467,208 | 94,080 |
| | **Nov-2010 Total** | | | **27,093,391** | **315,137** |
| | Dec-2010 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 28,596,597 | 402,653 |
| | | **10064000** | Broken rice | 113,775 | 2,500 |
| | **Dec-2010 Total** | | | **28,710,372** | **405,153** |
| **2010 Total** | | | | **700,514,357** | **12,974,734** |
| **2011** | Jan-2011 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 55,381,690 | 681,553 |
| | | **10064000** | Broken rice | 537,712 | 6,000 |
| | **Jan-2011 Total** | | | **55,919,402** | **6[illegible]7,553** |
| | Feb-2011 | **10061000** | Rice in the husk (paddy or rough) | 2,415,133 | 25,000 |
| | | **10063000** | Semi-milled or wholly milled rice, whe | 235,563,138 | 2,807,020 |
| | **Feb-2011 Total** | | | **237,978,271** | **2,832,020** |
| | Mar-2011 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 369,336,092 | 4,246,249 |
| | | **10064000** | Broken rice | 861,237 | 20,790 |
| | **Mar-2011 Total** | | | **370,197,329** | **4,267,039** |
| | Apr-2011 | **10061000** | Rice in the husk (paddy or rough) | 19,463 | 34 |
| | | **10062000** | Husked (brown) rice | 131,425 | 100 |
| | | **10063000** | Semi-milled or wholly milled rice, whe | 42,694,166 | 462,928 |
| | | **10064000** | Broken rice | 20,741 | 482 |
| | **Apr-2011 Total** | | | **42,865,795** | **463,544** |
| | May-2011 | **10062000** | Husked (brown) rice | 533,902 | 2,933 |
| | | **10063000** | Semi-milled or wholly milled rice, whe | 85,633,052 | 933,788 |
| | | **10064000** | Broken rice | 794,831 | 18,800 |
| | **May-2011 Total** | | | **86,961,785** | **955,520** |
| | Jun-2011 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 79,888,081 | 875,236 |
| | | **10064000** | Broken rice | 984,137 | 5,000 |
| | **Jun-2011 Total** | | | **80,872,218** | **880,236** |
| | Jul-2011 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 185,832,698 | 3,381,468 |
| | | **10064000** | Broken rice | 3,130,223 | 44,574 |
| | **Jul-2011 Total** | | | **188,[illegible]2,92[illegible]** | **3,426,042** |
| | Aug-2011 | **10063000** | Semi-milled or wholly milled rice, whe | 191,397,573 | 3,656,461 |

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

| Year | Month | HSCode | DESCRIPTION | CIF Value(Rs.) | Supp Units(Kg.) |
|---|---|---|---|---|---|
| 2011 | Aug-2011 | 10064000 | Broken rice | 1,063,557 | 25,000 |
| | Aug-2011 Total | | | 192,461,130 | 3,681,461 |
| | Sep-2011 | 10063000 | Semi-milled or wholly milled rice, whe | 120,016,960 | 1,655,042 |
| | | 10064000 | Broken rice | 798,759 | 19,803 |
| | Sep-2011 Total | | | 120,815,719 | 1,674,845 |
| | Oct-2011 | 10062000 | Husked (brown) rice | 5,694 | 12 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 191,034,363 | 2,717,869 |
| | | 10064000 | Broken rice | 556,142 | 10,503 |
| | Oct-2011 Total | | | 191,596,199 | 2,728,383 |
| | Nov-2011 | 10061000 | Rice in the husk (paddy or rough) | 1,000 | 1 |
| | | 10062000 | Husked (brown) rice | 366,469 | 1,800 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 221,187,308 | 3,674,983 |
| | | 10064000 | Broken rice | 745,369 | 19,555 |
| | Nov-2011 Total | | | 222,300,146 | 3,696,339 |
| | Dec-2011 | 10061000 | Rice in the husk (paddy or rough) | 22,787 | 53 |
| | | 10062000 | Husked (brown) rice | 1,500 | 6 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 185,525,332 | 2,295,988 |
| | | 10064000 | Broken rice | 1,698,026 | 19,741 |
| | Dec-2011 Total | | | 187,247,645 | 2,315,787 |
| 2011 Total | | | | 1,978,178,560 | 27,608,770 |
| 2012 | Jan-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 721,423 | 19,625 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 196,694,928 | 2,584,686 |
| | | 10064000 | Broken rice | 788,372 | 18,425 |
| | Jan-2012 Total | | | 198,204,723 | 2,622,736 |
| | Feb-2012 | 10063000 | Semi-milled or wholly milled rice, whe | 559,841,410 | 7,669,014 |
| | | 10064000 | Broken rice | 1,994,101 | 26,525 |
| | Feb-2012 Total | | | 561,835,511 | 7,695,539 |
| | Mar-2012 | 10063000 | Semi-milled or wholly milled rice, whe | 410,784,338 | 4,838,342 |
| | | 10064000 | Broken rice | 431,652 | 10,000 |
| | Mar-2012 Total | | | 411,215,9[illegible] | 4,848,342 |
| | Apr-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 38,500 | 45 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 141,197,325 | 1,552,177 |
| | Apr-2012 Total | | | 141,235,825 | 1,552,223 |
| | May-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 1,895,989 | 25,075 |
| | | 10062000 | Husked (brown) rice | 606,079 | 3,203 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 154,672,073 | 1,797,596 |
| | | 10064000 | Broken rice | 48,488 | 900 |
| | May-2012 Total | | | 157,222,6[illegible] | 1,826,774 |
| | Jun-2012 | 10063000 | Semi-milled or wholly milled rice, whe | 67,307,255 | 790,404 |
| | | 10064000 | Broken rice | 3,325,945 | 35,000 |
| | Jun-2012 Total | | | 70,633,200 | 825,404 |
| | Jul-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 1,000 | 2 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 234,940,241 | 2,449,142 |
| | | 10064000 | Broken rice | 44,659 | 200 |
| | Jul-2012 Total | | | 234,985,900 | 2,449,344 |
| | Aug-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 4,000 | 31 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 344,255,583 | 3,852,746 |
| | | 10064000 | Broken rice | 4,118,674 | 50,250 |
| | Aug-2012 Total | | | 348,378,257 | 3,903,027 |

| Year | Month | HSCode | DESCRIPTION | CIF Value(Rs.) | Supp Units(Kg.) |
|---|---|---|---|---|---|
| 2012 | Sep-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 3,000 | 5 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 112,878,282 | 1,114,936 |
| | | 10064000 | Broken rice | 56,047 | 505 |
| | Sep-2012 Total | | | 112,937,329 | 1,115,446 |
| | Oct-2012 | 10061000 | Rice in the husk (paddy or rough) | 2,000 | 22 |
| | | 10063000 | Semi-milled or wholly milled rice, whe | 144,322,699 | 1,600,421 |
| | | 10064000 | Broken rice | 1,086,801 | 14,070 |
| | Oct-2012 Total | | | 145,411,500 | 1,614,513 |
| | Nov-2012 | 10063000 | Semi-milled or wholly milled rice, whe | 126,836,937 | 1,313,162 |
| | | 10064000 | Broken rice | 20,620 | 325 |
| | Nov-2012 Total | | | 126,857,557 | 1,313,487 |
| 2012 Total | | | | 2,508,918,421 | 29,766,833 |
| Grand Total | | | | 5,187,611,338 | 70,350,336 |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, අංග සම්පූර්ණ උත්තරයක් ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සහල් මෙට්‍රික් ටොන් 2,220ක් පරිභෝජනය සඳහා ගන්න කොට තවත් වැඩිපුර මෙට්‍රික් ටොන් ලක්ෂ හතක් නිෂ්පාදනය කර තිබෙනවාය කියලා ඔබතුමා පෙන්වා දුන්නා. ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් හෝ, රජය තුළින් හෝ ඒ අතිරික්තයට මොකක්ද කරන්නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නියඟයන් ගණනාවක් පැමිණියත් අද වන තුරුත් කිසි හිඟයකින් තොරව වෙළෙඳ පොළට සහල් නිකුත් කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙන්නේ සහල් අතිරික්තයක් තිබුණු නිසායි. රජයක් හැටියට අපි ඒ ගැන සතුටු වන්න ඕනෑ. හැබැයි තිබුණු අතිරික්තය එක වතාවකදී ගොඩක් පැරණි වූ නිසා අපි සහල් අපනයනය කරන්න තීරණය කළා. ඒ නිසා අපි සහල් අපනයනය කළා. ගිය වතාවේ නියඟය ආවාම, සහල් අපනයනය කරන එකත් නැවත වාරයක් අපි නතර කළා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, අතිරික්තයක් තිබුණත්, ලබන මාසය තුළදී සහල් හිඟයක් ඇති වන බවට පසු ගිය සුමානයේ පත්තරවල පළ කර තිබුණා. සහල් තොග නැහැයි කියලා සඳහන් කර තිබුණා. අතිරික්තයක් තිබෙනවා නම්, හිඟයක් ඇති වන්නේ කොහොමද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මාධ්‍යයෙන් මොනවා පෙන්වුවත් සහල් හිඟයක් ඇති වෙලා නැහැ.

ඒක මම ඉතාමත් වග කීමෙන් කියනවා. ඒ වාගේම තව දවස් තුන හතරක් යන කොට අම්පාර දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය වෙළෙඳ පොළට එනවා. ඒ නිසා කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ වාගේම වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල තවත් ටොන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් තොග තිබෙනවා. ඒවා නිකුත් කරන්නත් අපි තීන්දු කළා. ගිය සතියේ අපි තීන්දුවක් ගත්තා, වහාම ගබඩා ටික හිස් කරලා අලුතින් එන නිෂ්පාදනය වෙළෙඳ පොළට නිකුත් වෙද්දී ඒවා මිලදී අරගෙන මිල ස්ථාවර කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරය තුළ තිබුණා සහල් නිෂ්පාදනය කිරීමේ වියදම රුපියල් 23ක් වෙනවා කියලා. ගොවීන්ට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන වියදම රුපියල් 37ක්, 38ක් කියලා කියනවා. ඒ දෙක අතර පරතරයක් තිබෙනවා. ගෙවියා එක මිලක් කියනවා, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය තව මිලක් කියනවා. ගොවියෝ තිහක්, හතළිහක් විතර වහ බීලා මැරිලා තිබෙනවා. ඒ නිසා එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
කොහේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අසත්‍ය කියන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
"අසත්‍ය කියන්න එපා" නෙමෙයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මට ඔබතුමාට මොකුත් කියන්න බැහැ. ඔබතුමාගේ,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා හිතන්නේ අපි කොළඹ 7 ගොවියෝ ගැන කියනවා කියලාද? අනුරාධපුරයේ, අම්පාරේ, මඩකලපුවේ ඉන්න ගොවියෝ දැකලා තමයි අපි මේ කියන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මම ඔබතුමාට ඉතාමත් වග කීමෙන් කියනවා, ගොවියෝ වහ බීලා නම් මැරිලා නැහැ කියලා. එහෙම වහ බිව්වේ යූඑන්පී ආණ්ඩුව කාලයේ. [බාධා කිරීම්] මොකද, මීට කලින්ත් මම ඔබතුමාට කිව්වා කොහේ හරි වී ගොවියෙක් වී ගොවිතැන සම්බන්ධ ප්‍රශ්නයක් නිසා වහ බීලා මැරිලා තිබෙනවා නම් ඒ කවුද කියලා නම් කියන ලෙස. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට නම් වශයෙන් ඕනෑද? අනුරාධපුරයේ සෝමදාස මැතිතුමා,-[බාධා කිරීමක්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි දෙදෙනාම කථා කළොත් හවසට ඔබතුමාගේ කථාව TV එකේ විකාශය වෙන්නෙත් නැහැ, මගේ කථාව විකාශය වෙන්නෙත් නැහැ. ඒකටනේ මේ අහන්නේ. ඒ නිසා ඔබතුමා ප්‍රශ්නය අහන්න, උත්තර දීම සඳහා මට ඉඩ දෙන්න. එහෙම නැතුව TV star වෙන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා රූපවාහිනියට රඟපෑවාට අපි රඟපාන්නේ අපට ඡන්ද දුන් ජනතාවත්, ශ්‍රී ලාංකික ජනතාවත් ආරක්ෂා කරන්නයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එහෙම නැත්නම් TV star වෙන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට අවශ්‍යත් නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ, ඒක තමයි වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට අවශ්‍ය වෙන්නේ අප පත් කරලා තිබෙන ජනතාව වෙනුවෙන්,-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ප්‍රශ්න අහන්නේ ඒකට. ඒක මාධ්‍යයේ පළ වුණාට කමක් නැහැ. ඒක තමයි ඇත්ත වශයෙන්ම වෙන්නේ. දැන් මම ඔබතුමාට කියනවා, වී ගොවියෙක් වහ බීලා මැරිච්ච තැනක් කියන්න කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නොවැම්බර් මාසයේ 18වැනිදා අනුරාධපුරයේ සෝමදාස මැතිතුමා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මොකක්ද හේතුව?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිෂ්පාදනය, වැය වූ මිලට විකුණා ගන්න බැරි වීම නිසා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පවුල් ප්‍රශ්නයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ණය ගෙවන්න බැරි නිසා වහ බීලා මැරුණා කියලා තමයි වාර්තා වෙලා තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මොකේද වාර්තා වෙලා තිබෙන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
"දිනමිණ" පත්තරේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මොන පත්තරේද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නොවැම්බර් මාසයේ 17වැනිදා "දිනමිණ" පත්තරේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපට නම් එහෙම දෙයක් වාර්තා වෙලා නැහැ. මම ඉතාමත් වගකීමෙන් කියනවා, ගොවීන්ට මඩ ගහන්න එපා කියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මමත් වගකීමෙන් කියන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගොවීන්ට මඩ ගහන්න එපා. මේ ආණ්ඩුව ගොවීන්ට සහනාධාර ලබා දීලා තිබෙනවා. පොහොර මිටියක මිල රුපියල් 7,000ක්, රුපියල් 9,000ක් වෙද්දී රුපියල් 350 ගණනේ අවුරුදු 7ක් එක දිගට අඛණ්ඩව ගොවීන්ට ලබා දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක නිසා තමයි වකුගඩු ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි වකුගඩු ප්‍රශ්න උග්‍ර වශයෙන්ම ඇති වෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එහෙම පොහොර සහනාධාරය දීලා වීවලට සහතික මිලක් දුන් එකම ආණ්ඩුව තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කියන එක මතක තියා ගන්න. ඒ නිසා තමයි තමුන්නාන්සේලා පසු ගිය නියඟය පැවැති කාලයේ ගිහිල්ලා ගොවීන්ව පාවිච්චි කරලා ඔවුන්ගේ ඡන්දය ගන්න හැදුවාම, මහා නියඟය නිසා බොන්න වතුර නැතුව සිටියදීත් ඔවුන් බුලත් කොළයට ඡන්දය දුන්නේ. ඒ වාගේම තමුන්නාන්සේලාගේ බොරුව පිළිගන්න මේ රටේ ගොවීන් සූදානම් නැහැ කියන එකත් මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි.

හැම දාම ඕක කථා කරනවා. නමුත් හැම දාම විපක්ෂයේ. ගොවීන්ගේ ඡන්දය ගන්න ගියාම ශුද්ධ පරාජයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක අපි කියමු ඡන්දදායක-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් සෑහෙන වෙලාවක් දෙදෙනා එක්ක කථා කළා. ඒ බොහොම ඇති.

## තංගල්ල, හාල්පන්දෙණිය රත්න විද්‍යාලය : වසා දැමීම
## தங்காலை, ஹால்பந்தெனிய ரத்ன வித்தியாலயம்: மூடப்படல்
## HALPANDENIYA RATHNA VIDYALAYA, TANGALLE : CLOSURE

1878/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල අධ්‍යාපන කලාපයේ, හාල්පන්දෙණිය රත්න විද්‍යාලය වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් යොදා ගෙන රජයේ කර්මාන්ත ශාලාවක් හෝ වෙනත් කටයුත්තක් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iii) එම සැලසුම් අනුව පාසලේ ආරම්භ කිරීමට අපේක්ෂිත කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக்கேட்ட வினா:

(அ) அம்பாந்தோட்டை மாவட்டத்தில் தங்காலை கல்வி வலயத்தில் ஹால்பந்தெனிய ரத்ன வித்தியாலயத்தை மூடிவிடுவதற்குத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருவதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வாறாயின், இப்பாடசாலையின் வளங்களைப் பாவித்து அரச தொழிற்சாலையொன்றை அல்லது வேறு நடவடிக்கையினை ஆரம்பிக்க நடவடிக்கை மேற்கொள்வாரா;

(ii) அவ்வாறாயின், அதற்காகத் திட்டமிடப் பட்டுள்ளதா;

(iii) அத்திட்டத்தின்படி பாடசாலையில் ஆரம்பிக்க உத்தேசிக்கப்பட்டுள்ள நடவடிக்கை யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that necessary action is being taken to close down the Halpandeniya Rathna Vidyalaya, which is situated in the Tangalle Education Zone in Hambantota District?

(b) Will he inform this House -

(i) if so, whether action will be taken to start a government factory or any other activity using the resources of the aforesaid school;

(ii) if so, whether plans have been made for that; and

(iii) of the activity which is expected to be commenced in the aforesaid school according to the plans mentioned above?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානයකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) තංගල්ල කලාපයේ හාල්පන්දෙණිය රත්න විද්‍යාලය දකුණු පළාත් සභාවට අයත් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පාසලකි.

එම පාසලේ සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් පහත වැටී සිසුන් නොමැති වීම නිසා නිරායාසයෙන්ම පාසල දැනටමත් වැසී ඇති බව වාර්තා කොට ඇත.

(ආ) (i) පාසලක් වැසී ගොස් ඇති විට එම පාසලේ ඉඩම හා ගොඩනැඟිලි අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමත්, චංචල දේපළ අනෙකුත් පාසල් වෙත ලබා දීමත් පවතින ක්‍රමවේදයයි. තවම එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළාත් සභා පාසල් සමහර ඒවා මෙහෙම වැසෙමින් තිබෙනවා. ඒක අමුතු කාරණයක් නොවෙයි. පසු ගිය කාලයේම අපි ඒක දිගින් දිගටම දැක්කා. මෙහෙම වැහෙන පාසල්වල භෞතික සම්පත් අනිකුත් පාසල්වලට පැවරෙනවා. ගොඩනැඟිලි සහ ඒ භූමිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත් පැවරෙනවා. හැබැයි ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාවලට පැවරෙන බොහෝ පාසල්වල ගොඩනැඟිලි කඩා වැටෙමින් ඒ ආකාරයෙන්ම තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට මේ පවරා දීමෙන් එහා ගියපු අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බැරිද, ඒ පාසල් වෙනත් කාරණා සඳහා යොදවන්න? මොකද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත් අවසානයේ දී කරන්න දෙයක් නොමැති අවස්ථා තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

අධ්‍යාපන අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න පුළුවන්කම තිබෙනවා, පළාත් සභාවෙන් ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරීමක් කරනවා නම්. එය වෘත්තීය පුහුණු වැනි නව වැඩ පිළිවෙළක් විය යුතුයි. විශේෂයෙන්ම අද අමාත්‍යාංශ පහක් ඒකාබද්ධ වෙලායි අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියා කරන්නේ. අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් ගත්තොත් අමාත්‍යාංශ හයක් වෙනවා. ඒ නිසා අපිට එකතුවෙලා ඒ වැඩ කටයුතු කරන්න පුළුවන්. එහෙම වැඩසටහනක් දැනට සකස් වෙමින් පවතිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අධ්‍යාපන අමාත්‍යාංශය තවත් අමාත්‍යාංශ හයක් එක්ක එකතු වෙලා එහෙම වැඩක් සිදු කරන්න බලාපොරොත්තු වනවා, සැලසුම් තිබෙනවා, ඉදිරියේ දී කෙරෙනවාය කියලා දිගින් දිගටම ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියනවා. නමුත් අද දවසේත් පාසලක් ලැබුණොත් ඒක යන්නේත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔබතුමන්ලා හදපු දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපට කඩ කරන්න බැහැ. තේරුණාද? මෙතුමා දන්නේ නැහැ,.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

Thirteen Plus.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

රේඛීය අමාත්‍යාංශයට තමයි ජාතික මට්ටමින් අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීන්දු ගන්න පුළුවන්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

අපි අරගෙන තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඔබතුමා කියන අමාත්‍යාංශ හය එකතු වෙලා ඒ වෙනුවෙන් වූ වැඩ පිළිවෙළක් රේඛීය අමාත්‍යාංශයට ක්‍රියාත්මක කරන්න බැරි ඇයි ?

එහෙම නැති වුණොත් හෙට දවසේත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලට මේ වැහෙන පාසල් පවරන්න වෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෙදන ලද බලය ආපසු උදුරා ගන්න අපට පුළුවන්කමක් නැහැ. ඔබතුමා ඒක නායකතුමාගෙන් අහ ගන්න. එතකොට මේ සම්බන්ධයෙන් සැබෑ තොරතුරු මොනවාද කියලා නායකතුමා කියලා දෙයි.

## දේශීය හා විදේශීය ආයෝජකයන්ට ඉඩම් ලබා දීම : විස්තර
### உள்நாட்டு மற்றும் வெளிநாட்டு முதலீட்டாளர் களுக்குக் காணிகள் வழங்கப்படல் :விபரம்
### PROVISION OF LAND TO LOCAL AND FOREIGN INVESTORS : DETAILS

2155/'11

9. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2011 වර්ෂය තුළදී දේශීය හෝ විදේශීය ආයෝජකයන්ට ලබා දීමට තීරණය කළ හෝ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පිහිටි ස්ථාන සහ එක් එක් ඉඩමේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආයෝජකයින්ට එම එක් එක් ඉඩම ලබා දීමට හේතු කවරේද;

(iv) එම ඉඩම් ලබා දෙන කාල සීමාව සහ ඉඩම් ලබා දීමේ පදනම කවරේද;

(v) ලබා දුන් හෝ ලබා දෙන එක් එක් ඉඩම වෙනුවෙන් ලැබුණු මුදල හෝ ලැබීමට අපේක්ෂිත මුදල කොපමණද;

(vi) ඉඩම් ලබා දීමෙන් ලැබෙන මුදල යොදාගනු ලබන කටයුත්ත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டினுள் உள்நாட்டு அல்லது வெளிநாட்டு முதலீட்டாளர்களுக்கு வழங்குவ தாக தீர்மானிக்கப்பட்ட அல்லது வழங்கப் பட்டுள்ள காணிகளின் அளவு எவ்வள வென்பதையும்;

(ii) மேற்படி காணிகள் அமைந்துள்ள இடங்கள் மற்றும் காணியின் அளவு தனித்தனியாக யாதென்பதையும்;

(iii) முதலீட்டாளர்களுக்கு மேற்படி ஒவ்வொரு காணியையும் வழங்குவதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(iv) மேற்படி காணிகள் வழங்கப்படும் கால எல்லை மற்றும் காணிகள் வழங்கப்படும் அடிப்படை யாதென்பதையும்;

(v) வழங்கப்பட்ட அல்லது வழங்கப்படும் ஒவ்வொரு காணிக்காகவும் கிடைத்த பணம் அல்லது கிடைப்பதாக எதிர்பார்க்கப்படும் பணம் எவ்வளவென்பதையும்;

(vi) காணிகள் வழங்குவதன் மூலம் கிடைக்கப்பெறும் பணம் எத்தகைய பணிகளுக்காக பயன்படுத்தப்படும் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) the extent of lands provided or decided to be provided to local or foreign investors in the year 2011;

(ii) separately, the location of the aforesaid land and the extent of each land;

(iii) the reasons for providing each of the aforesaid land to investors;

(iv) the period of time for which the aforesaid lands will be provided and the basis on what it is done;

(v) the amount of money received or expected to be received on behalf of each land provided or to be provided; and

(vi) the purpose for which the money received from providing lands will be used?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
| | | 16041500 | Mackerel (prepard or preserved) | 447,089,237 | 1,508,703 |
| | | 16041600 | Anchovies (prepared or preserved) | 425 | 10 |
| | | 16042000 | Prepared or preserved fish, other than HS 160411 - 160420 | 9,611 | 8 |
| | | 16043010 | Carviar | 1,716 | 2 |
| | Jul - 2012 Total | | | 462,015,132 | 1,554,780 |
| | Aug-2012 | 16041300 | Sardines, sardinella, brisling or sprats, prepared or preserved | 43,208 | 286 |
| | | 16041400 | Tuna, skipjack and bonito (sarda spp.)(prepared or preserved) | 53,846,810 | 195,625 |
| | | 16041500 | Mackerel (prepard or preserved) | 442,125,184 | 1,564,656 |
| | | 16041600 | Anchovies (prepared or preserved) | 122,515 | 260 |
| | | 16042000 | Prepared or preserved fish, other than HS 160411 - 160420 | 9,554 | 11 |
| | Aug - 2012 Total | | | 496,147,271 | 1,760,839 |
| | Sep-2012 | 16041300 | Sardines, sardinella, brisling or sprats, prepared or preserved | 4,360 | 52 |
| | | 16041400 | Tuna, skipjack and bonito (sarda spp.)(prepared or preserved) | 46,693,732 | 170,961 |
| | | 16041500 | Mackerel (prepard or preserved) | 338,161,352 | 1,078,699 |

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

| Year | Month | HSCode | DESCRIPTION | CIF Value(Rs.) | Supp Units(Kg) |
|---|---|---|---|---|---|
| 2012 | Sep-2012 | 16041600 | Anchovies (prepared or preserved) | 127,657 | 596 |
| | | 16042000 | Prepared or preserved fish, other than HS 160411 - 160420 | 4,621,405 | 13,627 |
| | Sep - 2012 Total | | | 389,608,506 | 1,263,934 |
| | Oct-2012 | 16041200 | Herrings, prepared or preserved | 14,139 | 21 |
| | | 16041300 | Sardines, sardinella, brisling or sprats, prepared or preserved | 211,121 | 1,275 |
| | | 16041400 | Tuna, skipjack and bonito (sarda spp.)(prepared or preserved) | 11,991,752 | 55,721 |
| | | 16041500 | Mackerel (prepard or preserved) | 507,974,736 | 1,759,328 |
| | | 16041600 | Anchovies (prepared or preserved) | 133,562 | 606 |
| | | 16042000 | Prepared or preserved fish, other than HS 160411 - 160420 | 58,766 | 16 |
| | | 16043010 | Carviar | 2,558 | 7 |
| | Oct - 2012 Total | | | 520,386,634 | 1,816,975 |
| | Nov-2012 | 16041100 | Salmon, prepared or preserved | 4,420 | 5 |
| | | 16041400 | Tuna, skipjack and bonito (sarda spp.)(prepared or preserved) | 9,613,628 | 37,668 |
| | | 16041500 | Mackerel (prepard or preserved) | 341,418,699 | 1,277,885 |
| | | 16042000 | Prepared or preserved fish, other than HS 160411 - 160420 | 1,158,941 | 1,729 |
| | Nov - 2012 Total | | | 352,195,688 | 1,317,287 |
| 2012 Total | | | | 5,143,766,604 | 18,183,485 |
| Grand Total | | | | 12,869,577,251 | 47,370,769 |

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා දේශීය වශයෙන් මාළු ටින් කරන්න පටන් ගෙන තිබෙනවා. එය මුළු ආනයනයෙන් සියයට 2.3ක් වෙනවා. මේ තත්ත්වය තවත් වැඩිදියුණු කරන්න මොන වාගේ වැඩ පිළිවෙළක් ද ඔබතුමන්ලාගේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් ධීවර ඇමතිතුමා තමයි ඒ අමාත්‍යාංශයේ වගකීම දරන්නේ. මා හිතන විධියට තවත් ටින් මාළු කර්මාන්තශාලා දෙකකට ආයෝජනය කරන්න ආයෝජකයෝ ඇවිල්ලා තිබෙනවා. එහි වැඩ කටයුතු නිර්මාණය වෙමින් යනවා. ඔබතුමා ඒ ගැන ගරු ධීවර ඇමතිතුමාගෙන් ඇහුවොත් නිවැරැදි උත්තරයක් දැන ගන්න ඔබතුමාට පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවන අතුරු ප්‍රශ්නය මෙකයි ගරු ඇමතිතුමනි. ඔබතුමා ඉදිරිපත් කළ උත්තරයේදී කියැවුණා ඒක පුද්ගල පරිභෝජනය ග්‍රෑම් 55යි කියලා. ඒ කියන විධියට මාළු පරිභෝජනය කරන්නේම නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. මිලියන 21ක ජනගහනයක් සිටින රටක අවුරුද්දක ඒක පුද්ගල පරිභෝජනය ග්‍රෑම් 55යි කියන්නේ බහුතරයක් මාළු පරිභෝජනය කරන්නේ නැහැ කියන එකයි. මොනවාද මේ සම්බන්ධයෙන් කරන්න පුළුවන් වන්නේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ටින් මාළු පරිභෝජනය ගැනයි ඔබතුමා අහලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඉතින්. ටින් මාළු තමයි වැඩියෙන්ම පරිභෝජනය කරන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ, නැහැ. කොහේද ටින් මාළු වැඩියෙන්ම පරිභෝජනය කරන්නේ? මොන තරම් දේශීය නිෂ්පාදනයක් තිබෙනවාද මාළුවල. ඔබතුමා ටින් මාළු ගැන විතරක් කථා කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ටින් මාළු තමයි වැඩියෙන්ම පරිභෝජනය කරන්නේ. මේ රටේ හිටපු වෙළඳ ඇමතිවරයකු වශයෙන් මමත් දන්නවා-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒ, ඔබතුමාගේ කාලයේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ දෙක අතර වෙනසක් නැහැ. වැඩියෙන් ආනයනය කිරීම විතරයි වෙනසකට තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා හිටපු වෙළඳ ඇමති වශයෙන් සතුටු වන්නට ඕනෑ, අද ලංකාවේ ටින් මාළු නිෂ්පාදනය කිරීම ගැන. ඔබතුමාගේ කාලයේ කවදාවත් මේ වාගේ තත්ත්වයක් ඇති වුණේ නැහැ. ටින් මාළු නිෂ්පාදනය පටන් ගත්තේ නැහැ. ඒ තබා ඔබතුමාගේ කාලයේ මුණ්ඩා ගෑස් ගේනවා කිව්වා. ගෙනාපු මුණ්ඩා ගෑස් එකකුත් නැහැ. අදටත් ඒ ගෑස් ඇවිත් නැහැ. මේ ඇත්ත කතන්දරය කියන්නට එපායැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මේ හැම දෙයක්ම කරනවා. දේශීය නිෂ්පාදකයා, දේශීය නිෂ්පාදන කරන ව්‍යාපාරිකයන්ව දිරි ගන්වනවා. මේ වාගේ විශාල වැඩ පිළිවෙළක් කරගෙන යනවා. ඒ වාගේම ධීවර අමාත්‍යතුමා මහා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අද මාළු මිල සම්පූර්ණයෙන්ම ස්ථාවර වී තිබෙනවා. ඒ වාගේමයි මේ ටින් මාළුවලට අප බදු අඩු කරනවා; වැඩි කරනවා. දේශීය මාළු මිල අඩු වුණාම ටින්මාළුවලට බදු වැඩි කර ධීවරයාව රකිනවා. එම නිසා මා ඉතාමත් වගකීමෙන් කියනවා, ඔබතුමා මොන තරම් ඔය දත්ත ගැන කථා කළත් ඇත්ත කතන්දරය මේකයි කියා. ඔබතුමා මොන තරම් කථා කළත් අන්තිමට ඡන්දය ඉල්ලන්න ගියාම එක්සත් ජාතික පක්ෂය ඡන්දයෙන් පරාදයි. [බාධා කිරීම්]

## මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලය: ගොඩනැගිලි සහ ගුරු හිඟය

மித்தெனிய முதல்நிலைப் பாடசாலை : கட்டிட மற்றும் ஆசிரியர் பற்றாக்குறை

MIDDENIYA PRIMARY SCHOOL: SHORTAGE OF BUILDINGS AND TEACHERS

1880/'11

11.**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල අධ්‍යාපන කලාපයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලයේ පවතින ගොඩනැගිලි හා ගුරු හිඟය නිසා සිසුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බවත්;

(ii) එම විදුහලේ ගොඩනැගිලි හිඟය සහ ගුරු හිඟය පිළිබඳව බලධාරීන්ට දන්වා සිටියත් මේ දක්වා විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) මුදල් වෙන් කර තිබේ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தின் வலஸ்முல்ல கல்வி வலயத்திற்குரிய கட்டுவன கோட்டக் கல்வி அலுவலகத்தினால் நிர்வகிக்கப்படுகின்ற மித்தெனிய முதல்நிலைப் பாடசாலையில் நிலவுகின்ற கட்டிட மற்றும் ஆசிரியர் பற்றாக் குறையினால் மாணவர்கள் பெரும் கஷ்டங்களை எதிர்நோக்கியுள்ளனர் என்பதையும்;

(ii) மேற்படி பாடசாலையின் கட்டிட மற்றும் ஆசிரியர் பற்றாக்குறை பற்றி அதிகாரிகளுக்கு அறிவித்துள்ள போதிலும் இற்றைவரை தீர்வு கிடைக்கவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பாடசாலைக்காக புதிய கட்டிடங்களை நிர்மாணிப்பதற்கு திட்டமிடப்பட்டுள்ளதா என்ப தையும்;

(ii) ஆமெனில், அதற்கான நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) நிதி ஒதுக்கப்பட்டிருப்பின், கட்டிடங்களை நிர் மாணிக்கும் பணிகள் எத்திகதியில் ஆரம்பிக்கப் படுமென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) due to the shortage of buildings and teachers that exists at Middeniya Primary School administered by the Katuwana Divisional Education Office in Walasmulla Education Zone in Hambantota District, the students have faced severe difficulties; and

(ii) even though the authorities have been informed of the shortage of buildings and teachers at that school, no solution has been provided up to now?

(b) Will he inform this House-

(i) whether plans have been formulated to construct new buildings for that school;

(ii) if so, whether allocations have been made for that purpose; and

(iii) the date on which the construction of the buildings will be started, if funds have been allocated?

(c) If not, why?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලවේලාව ගිහින් තිබෙන නිසා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. පිළිතුර සභාගත කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දකුණු පළාත් අධ්‍යාපන ලේකම්තුමාගේ ලිපියට අනුව ගුරු හිභය පිළිබඳව දුෂ්කරතාවක් නොමැති අතර පන්ති දෙකක් සඳහා පමණක් පන්ති කාමර අවශ්‍යව ඇත.

(ii) ගුරු හිභය - අදාළ නොවේ. (දකුණු පළාත් අධ්‍යාපන ලේකම්ගේ ලිපියට අනුව)

ගොඩනැඟිලි හිභය - ඔව්.

(ආ) (i) මෙම වසර තුළ එසේ සැලසුම් කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) දකුණු පළාත් අධ්‍යාපන ලෙක්ම්තුමාගේ ලිපියට අනුව මෙම ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැති බවත් 2012 වසර සඳහා ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි පහසුකම ලබා දීමට පියවර ගන්නා බව දන්වා ඇත.

## හෙට්ටිපොල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය : බහුකාර්ය තෙමහල් ගොඩනැඟිල්ල

ஹெட்டிபொல மாதிரி முதல் நிலைப்பாடசாலை: பலநோக்கு மும்மாடிக் கட்டிடம்

HETTIPOLA MODEL PRIMARY SCHOOL: THREE-STOREY, MULTI-PURPOSE CONSTRUCTION

2158/'11

12.**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ, පඩුවස්නුවර අධ්‍යාපන කොට්ඨාසයේ හෙට්ටිපොල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ බහුකාර්ය තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරන්නේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන සපයාගත් ආකාරය කවරේද;

(iv) එකී ඉදිකිරීම් රජයේ ප්‍රතිපාදන මත සිදු නොකරන්නේ නම්, ප්‍රතිපාදන ලබා දුන් අයගේ නම සහ ලිපිනය කවරේද;

(v) එම ඉදිකිරීම ආරම්භකරන ලද දිනය කවරේද;

(vi) ගිවිසුම් අනුව එහි ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය කවරේද;

(vii) මේ වනවිට එකී ඉදිකිරීම් අවසන්කර තිබේද;

(viii) ඉදිකිරීම් අවසන්කර නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குளியாப்பிட்டிய கல்வி வலயத்தில் பண்டு வஸ்நுவர கல்விக் கோட்டத்தில் ஹெட்டிபொல மாதிரி முதல் நிலைப்பாடசாலையில் பலநோக்கு மும்மாடிக் கட்டிடமொன்று அமைக்கப் படுகின்றதா என்பதையும்;

(ii) இதற்கான மதிப்பீட்டுத் தொகை யாதென் பதையும்;

(iii) இதற்கான நிதி ஏற்பாடுகளைப் பெற்றுக் கொண்ட முறை யாதென்பதையும்;

(iv) இந்நிர்மாணப் பணிகள் அரச நிதி ஏற்பாட்டில் செய்யப்படாவிடின் நிதி ஏற்பாடுகளை வழங்கி யவர்களின் பெயர்கள், முகவரிகள் யாவையென் பதையும்;

(v) இந்நிர்மாண வேலைகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(vi) உடன்படிக்கையின் படி நிர்மாண வேலைகள் முடிவடைய வேண்டிய திகதி யாதென்பதையும்

(vii) இப்போது இந்நிர்மாண வேலைகள் முடிவடைந் துள்ளதா என்பதையும்;

(viii) நிர்மாணப்பணிகள் முடிவடையவில்லையெனின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) whether a three-storey, multi-purpose building is being constructed at Hettipola Model Primary School in Panduwasnuwara Education Division of Kuliyapitiya Education Zone;

(ii) the estimated cost for the aforesaid construction;

(iii) the manner in which the provisions required for the aforesaid construction were obtained;

(iv) the name and address of the person who provided funds, if the aforesaid construction is not carried out using the allocations made by the Government;

(v) the date of commencement of the aforesaid construction work;

(vi) the date by which the construction work should be completed as per the agreement;

(vii) whether the aforesaid construction has been completed by now; and

(viii) the reasons for not completing the construction work, if the construction work has not been completed?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයටත් පිළිතුර සභාගත කරන්නද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. අප දෙන්නා ටිකක් පැටලෙන්න ඕනෑ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පැටලෙන්නට ඕනෑ නේද? Very good, very good.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට මා පිළිතුර දෙනවා.

(අ) (i) නැත. (වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ලිපියට අනුව)

(ii) ඇස්තමේන්තුවක් නැත.

(iii) ආදි ශිෂ්‍යයකුගේ පෞද්ගලික ධන පරිත්‍යාගයකි.

(iv) එම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වූ ජාලිය කුලසේකර මහතා, මහ නැගුම සභාපති.

ලිපිනය- හලාවත පාර, හෙට්ටිපොළ.

(v) 2009.02.10.

(vi) අනුග්‍රාහක පදනම මත කෙරෙන ඉදිකිරීමක් බැවින් ස්ථිර දිනයක් දක්වා නොමැත.

(vii) නැත. (වයඹ පළාත්අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ලිපියට අනුව)

(viii) වයඹ පළාත් අධ්‍යාපන ලේකම්ගේ 2012.12.03 දිනැති ලිපියට අනුව මෙම ඉදිකිරීම් ආරම්භ කර අත්තිවාරම් වැඩ කර ගෙන යාමේදී එයට යොදා ගත් කම්බිවල ප්‍රමිතිය නොගැළපෙන බව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. තවද, ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ අනුමැතිය නොගැනීම හා පළාත් ආයතනවල විරෝධතාවය නිසා ඉදිකිරීම් නවතා ඇත. මේ වන විට දීර්ඝ කාලයක් මෙසේ තිබීම නිසා අත්තිවාරම් කම්බි දිරායාම හේතුවෙන් එය ඉවත් කර එම භූමිය සමතලා කර තිබේ. ඒ අනුව මෙම ස්ථානයේ ගොඩනැගිල්ලක් සෑදීම සිදු නොවන බව තවදුරටත් වයඹ පළාත් ලේකම් (ප්‍රධාන අමාත්‍යාංශය) විසින් සඳහන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එම බහුකාර්ය ගොඩනැගිල්ලේ ගණන කීයද? ඒ ගණන පොඩ්ඩක් කියන්න බැරිද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අතුරු ප්‍රශ්නය මෙය නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වෙලාව පිළිබඳව ප්‍රශ්නයකුත් තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
එහි මිලක් සඳහන් කර නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හෙට්ටිපොල කණිෂ්ඨ විද්‍යාලයේ බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදි කරන්නට හිටපු මහ නැගුම සභාපති ජාලිය කුලසේකර මහත්මයා ක්‍රියා කළාය කියලා සඳහන් කරලා තිබෙනවා. මෙහි මුල් ගල් තැබුවේ අපේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ජනාධිපති ලේකම් කුමාරසිරි හෙට්ටිගේ මහත්මයායි. හැබැයි දැන් වෙලා තිබෙන්නේ මෙය ප්‍රමිතියකට නැහැයි කියන එකයි. මෙය වෙනත් කෙනකුට ඉදි කරන්නට ඉඩ දුන්නෙත් නැහැ. ලක්ෂ ගණනක් ළමයින් එකතු වෙලා ගිහින් එහි මුල් ගල තබලා, උත්සව පැවැත්තුවා. අන්තිමට බලද්දී ඒකට යොදලා තිබෙන්නෙත් බාල කම්බියි. ඒ කරපු වැඩවල ප්‍රතිඵලය තමයි ඔය තිබෙන්නේ. "මහ නැගුම" සඳහාත් ඕකම තමයි කරලා තිබෙන්නේ. බාල කම්බි වෙන්න ඇති යොදලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි, ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වාගේ එක එක්කෙනාගේ උපදෙස් අනුව ගිහිල්ලා බහුකාර්ය ගොඩනැඟිලි හදන්න එක එක පුද්ගලයන්ට අවසර දෙන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි. ඉස්සෙල්ලාම මුල් ගල තබන්න කලින් මෙය හදන්න මොකක් හෝ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න තිබුණා නේ. එහෙම නැතිව මේ වාගේ ක්‍රියා කිරීම තුළින් ඇති වෙලා තිබෙන තත්ත්වය ඔබතුමාටම තේරෙනවා නේ. දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? දැන් බහුකාර්ය ගොඩනැගිල්ලකුත් නැහැ, ඒක සමතලා කරලා දමලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පිළිතුර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය, මෙහෙම ඉඩ දෙන්නේ ඇයි කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මෙවැනි ඉදිකිරීම් සිදු කිරීමේ දී, විශේෂයෙන් පාසල් භූමියක් තුළ ඉදිකිරීම් කිරීමේ දී ඒ සඳහා මූලික අවසරය පළාත් ඉංජිනේරුවරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය වෙනවා. එතකොට ඒ ඉංජිනේරුවන්ගේ අධීක්ෂණය යටතේ තමයි එම කටයුතු සිදු කරන්නේ. මොකද, යම් හෙයකින් අසාර්ථක ඉදිකිරීමක් නිසා

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

ළමයින්ගේ ජීවිතවලට තර්ජනයක් වුණොත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ඇතුළු අප සියලු දෙනාටම ඒ වගකීම සම්පූර්ණයෙන්ම භාර ගන්නට සිදු වෙනවා. ඒ නිසා නියමිත ප්‍රමිතියෙන් යුතු ඉදිකිරීම් සිදු කිරීම විශේෂයෙන්ම අවශ්‍ය වනවා. නමුත් ඒ දේ නොකෙරුණාම යම් හෙයකින් එය ඉවත් කිරීමට නියෝග කිරීමට සිදු වනවා. ඒක තමයි තත්ත්වය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. මේ බහුකාර්ය ගොඩනැගිල්ල එක අවුරුද්දක දී ඔබතුමන්ලාගෙන් හරි, පළාත් සභාවෙන් හරි, යම් කිසි විධියකින් මේ පාසලට ලැබෙන්නට තිබුණා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. හැබැයි ඒක නතර කරලා මේ එක පුද්ගලයෙක් ගිහින් "රයිට්, මම මේක හදන්නම්" කියලා භාර අරගෙන අන්තිමට දැන් මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? මේ පාසලට බහුකාර්ය ගොඩනැගිල්ලක් නැති වීමයි. ඒ නිසා මා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා දැන්වත් අඩුම තරමේ මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් මේ පාසලට බහු කාර්ය ගොඩනැගිල්ලක් ලබා දෙනවාද කියලා.

මේ වාගේ හොරුන්ට මේවා ඉදි කරන්න ඉඩ දෙන්නේ නැතුව මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් මේ පාසලට බහු කාර්ය ගොඩනැගිල්ලක් ලබා දෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් කිසි කෙනෙක් පෞද්ගලික පරිත්‍යාගයක් කරන විට අපට ඒක වළක්වන්න පුළුවන්කමක් නැහැ. මොකද, අපේ රටේ පාසල් පද්ධතිය තුළ දැවැන්ත ජන සහභාගිත්වයක් තිබෙනවා. ඒක මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇති. ඔබතුමන්ලාත් සමහර විට ගේට්ටුව හදනවා. අපි මහින්දෝදය තාක්ෂණ මධ්‍යස්ථානය හැදුවාම ඔබතුමාට විමධ්‍යගත අය වැයෙන් ගේට්ටුව හදන්න පුළුවන්. හැබැයි, ඒකට නම ගහන්නත් පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. ගේට්ටුව ඇරලා අපි ඇතුළට යනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
වැසිකිළි හදන්න පුළුවන්. හැබැයි, නම ගහන්නේ නැහැ. ඒ නිසා පෞද්ගලික ආයෝජනයන් අපට නවත්වන්න පුළුවන්කමක් නැහැ. සුබ පතන්නන් සහ ඒ ආයෝජනයන් ලබා දෙන්නන්ට අපි අවස්ථාව දෙනවා. හැබැයි, ප්‍රමිතියෙන් ඉදි කළ යුතුයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා. මේ දවස්වල කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ ඇති වෙලා තිබෙන අර්බුදය සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

උත්තර දුන්නා. වහාම මේක නතර කරනවාය කියා ඔබතුමා කිව්වා. දැන් මහරගම සංවර්ධන කමිටුවෙනුත් මේකට විරුද්ධව - කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ 1-5 වසර දක්වා වෙනත් ප්‍රදේශයකට ගෙන යන්න එපාය කියා- තීන්දුවක් අරගෙන තිබෙනවා. මම ඊයෙත් මේක ඇහුවා. දිගින් දිගටම මේක අහන්නේ පාසල්වල ඉන්න අයගේ තිබෙන වැදගත්කම නිසායි. ඔබතුමා මේ අර්බුදය සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ? එක එක පුද්ගලයින්ට ඕනෑ විධියට, පළාත් සභාවල ඇමතිවරුන්ට ඕනෑ විධියට පාසල්වල කොටස් කොටස් ගලවා අරගෙන යනවා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සිටින මහරගම සංවර්ධන කමිටුවේදී එතුමා තීන්දුවක් අරගෙන තිබෙනවා, මෙහෙම ගෙන යන්න දෙන්නේ නැහැ කියා. කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ ඇති වෙලා තිබෙන අර්බුදය ළමයි 135 දෙනෙකුගේ අර්බුදයක්. ඒ නිසා කරුණාකර ඔබතුමා ඒකට දෙන උත්තරය මොකක්ද කියා කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිංහයා කියපු වචනය පළමුවෙන් ඉවත් කරන්න. මොකද, සිංහයා වුණොත් කකුල් හතරයිනේ. මම සිංහලයෙක්. මට කකුල් දෙකයි. ඒ නිසා සිංහයා කියන කොටස මට අවශ්‍ය නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හිටපු ගමන් රට හතරෙනුත් යනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වහාම ඒ කොටස කපා ඉවත් කිරීමට තීරණය කරන ලදි. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම හතරෙන් යන්නේ නැහැ. මම හතරෙන් යන කෙනෙක් නොවෙයි. මම දෙකෙන් යන්නේ. [බාධා කිරීමක්] නැහැ. කවදාවත් නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ තමුන්නාන්සේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේට මම එක කාරණයක් කියන්නම්. මම කිසි තැනක හතරෙන් ගිය මිනිහෙක් නොවෙයි. අන්න ඒක මතක තියා ගන්න. මම හරියට කෙළින් ඉඳලා තිබෙනවා. හරියට කෙළින් වැඩ කර තිබෙනවා. තමුන්නාන්සේගේ කාරණාව පිළිබඳව හොයලා මම තමුන්නාන්සේට පිළිතුරක් දෙන්නම්. පෞද්ගලිකව හමු වෙන්න. අද උපදේශක කාරක සභාවට එන්න පුළුවන්.

## ශ්‍රී ලංකාවේ සිටින පවුල් : ඉපයීම් ප්‍රමාණය
## இலங்கைக் குடும்பங்கள் : சம்பாதிக்கும் இயலுமை
## FAMILIES IN SRI LANKA: EARNING CAPACITY

1710/'11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකික පවුලක ඉපයීම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාව තීරණය කරන සාධකය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள குடும்பங்களின் எண்ணிக்கையையும்;

(ii) இலங்கைக் குடும்பம் ஒன்றின் சம்பாதிக்கும் இயலுமையையும்;

அவர் கூறுவாரா?

(ஆ) வறுமைக் கோட்டுக்கு கீழே உள்ள குடும்பங்களின் எண்ணிக்கையை மாவட்ட அடிப்படையில் அவர் கூறுவாரா?

(இ) இலங்கையில் வறுமைக்கோட்டுக்குள் வருவதை தீர்மானிக்கும் காரணி என்ன என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the number of families in Sri Lanka; and

(ii) the earning capacity of a Sri Lankan family?

(b) Will he also state on per district basis the number of families which exist below the poverty line ?

(c) Will he inform this House the determining factor in arriving at the poverty line in Sri Lanka?

(d) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) "පවුල" යන සංකල්පය ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන ක්‍රියාකාරකම් සඳහා භාවිතා නොකරන නමුත් "ගෘහ ඒකක" යන සංකල්පය භාවිතා කරනු ලැබේ. එබැවින් පවුල් ගණන පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු වෙනුවට ගෘහ ඒකක සංඛ්‍යාව ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සිටින ගෘහ ඒකක සංඛ්‍යාව 5,079,362ක් වේ.

(ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10 - මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර)

(ii) ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකයක ඉපයීම් ප්‍රමාණය රුපියල් 36,451ක් වේ.

(ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10 - මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර)

(ආ) වගුවේ දක්වා ඇත. **සභාගත*** කරමි.

(ඇ) 1. ආහාර දරිද්‍රතා රේඛාව : දිනකට එක පුද්ගලයකු සඳහා කිලෝ කැලරි 2030ක ශක්තියක් ලබා ගැනීමට ආහාර සඳහා වැය වන මාසික වියදම, සාමාන්‍ය කැලරි වියදමේ අනුපාතයක් ලෙස ගැනීමෙන්.

2. ආහාර නොවන දරිද්‍රතා රේඛාව : ඉහත ගණනය කරන ලද ආහාර දරිද්‍රතා රේඛාවට ආසන්නව වියදම් කරනු ලබන පුද්ගලයකුගේ ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වැය වන මාසික වියදම.

3. නිල දරිද්‍රතා රේඛාව = ආහාර දරිද්‍රතා රේඛාව + ආහාර නොවන දරිද්‍රතා රේඛාව

4. ආසන්න ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයකදී ගණනය කරනු ලබන District Spatial Price Index : මෙම දර්ශකය, දරිද්‍රතා රේඛාව දිස්ත්‍රික්ක මට්ටමින් ඇස්තමේන්තු කිරීම සඳහා යොදා ගනී.

5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය : මෙම දර්ශකය, පාද වර්ෂයේ සිට දරිද්‍රතා රේඛාව යාවත්කාලීන කිරීම සඳහා යොදා ගනී.

(ඈ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද වගුව:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை:*
** Chart tabled:*

| දිස්ත්‍රික්කය | දිළිඳු ගෘහ ඒකක සංඛ්‍යාව | දිළිඳු ගෘහ ඒකක ප්‍රතිශතය % |
|---|---|---|
| කොළඹ | 14,642 | 2.5 |
| ගම්පහ | 17,923 | 3.0 |
| කළුතර | 12,128 | 4.1 |
| මහනුවර | 28,889 | 8.3 |
| මාතලේ | 11,913 | 9.3 |
| නුවර එළිය | 13,490 | 7.1 |
| ගාල්ල | 21,995 | 7.9 |
| මාතර | 16,848 | 8.3 |
| හම්බන්තොට | 7,814 | 5.4 |
| යාපනය | 15,907 | 12.4 |
| වව්නියාව | 759 | 2.0 |
| මඩකලපුව | 22,601 | 17.0 |
| අම්පාර | 14,324 | 10.0 |
| ත්‍රිකුණාමලය | 7,083 | 9.0 |
| කුරුණෑගල | 36,360 | 8.6 |
| පුත්තලම | 15,936 | 7.5 |
| අනුරාධපුරය | 9,956 | 4.6 |
| පොළොන්නරුව | 4,838 | 4.5 |
| බදුල්ල | 24,046 | 10.9 |
| මොණරාගල | 16,699 | 13.9 |
| රත්නපුර | 24,398 | 8.5 |
| කෑගල්ල | 19,285 | 9.0 |
| **එකතුව** | **357,834** | **7.0** |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දීපු දත්ත අනුවයි මා මේ කාරණය අහන්නේ. ගෘහස්ථ ඒකකයක අවුරුද්දකට තිබෙන ආදායමද ඔබතුමා ඒ කිව්වේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අවුරුද්දකට.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. ගරු ඇමතිතුමනි, එය අවුරුද්දකට නොවෙයි මාසයකට වන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මෙහි තිබෙන්නේ රුපියල් 36,451ක් කියලායි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
That is, per month.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ලංකාවේ ගෘහ ඒකක ඉපයීම් ප්‍රමාණය රුපියල් 36,451යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අවුරුද්දකටද, මාසයකටද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මාසයකට විය යුතුයි. ගරු ඇමතිතුමාට වැරැදීමක් වෙලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මාසයකට කියලා ගනිමු. මේ පිළිතුරේ එය සටහන් වෙලා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා දිළිඳු ගෘහ ඒකක සංඛ්‍යාව 357,834ක් කියලා. එසේ වෙන්න බැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
357,834යි. ඔබතුමාට ඕනෑ නම් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට අදාළ සංඛ්‍යා කියවන්නද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවශ්‍ය නැහැ.

ගරු ඇමතිතුමනි, මගේ දැනුවත්භාවය පිණිස මා මේ කරුණ අහන්නේ. සමෘද්ධිලාභී පවුල් -ගෘහස්ථ ඒකක- විසිඑක් ලක්ෂයක් අද ඉන්නවා. මේ අය දිළිඳු අය යටතට නොවෙයිද වැටෙන්නේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මෙහි සඳහන් කර තිබෙන්නේ නිර්ණායක අනුවයි. ඒ අයගේ නිර්ණායක අනුවයි මේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය කළේ. ඒ හරහා අපට ලැබී තිබෙන සංඛ්‍යාලේඛන අනුව දිළිඳු ගෘහ ඒකක සංඛ්‍යාව 357,834යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හිටපු මුදල් ඇමතිතුමා වශයෙන් ඔබතුමාට තේරෙනවා ඇති. මෙතැන පරස්පරයක් තිබෙනවා. කරුණාකරලා මීට වැඩිය සෝදිසි කරලා බලලා මේ සම්බන්ධයෙන් අපට උත්තරයක් දුන්නොත් වඩා හොඳයි. මොකද, ගෘහස්ථ ඒකක විසිඑක් ලක්ෂයක් සමෘද්ධිලාභීන් වශයෙන් ඉන්නවා නම්, දිළිඳු ගෘහ ඒකක සංඛ්‍යාව 357,834ක් වෙන්න බැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මෙතැන අහලා තිබෙන්නේ absolute poverty line පිළිබඳව. There are definitions like that.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, but you had taken it to the very extreme of the spectrum.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
What you have asked about is the Absolute Poverty Index.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ආගමික අන්තවාදය හා මූලධර්මවාදය
### மதத் தீவிரவாதம் மற்றும் அடிப்படைவாதம்
### RELIGIOUS EXTREMISM AND FUNDAMENTALISM

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ වන විට රට තුළ

මහත් ආන්දෝලනයට තුඩු දී තිබෙන මතභේදාත්මක ප්‍රවණතාවක් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

අපගේ ආදරණීය මව් බිමත්, එහි වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලුම ජනතාවන් මේ වන විට ඉතාම බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදයක අනිසි ප්‍රතිවිපාකවලට මුහුණ දී සිටී.

දිනපතා වර්ධනය වන මෙම අර්බුදවලින් පීඩාවට පත්ව සිටින්නේ පොදු ජනතාවය.

එක් අතකින් බඩු මිල වැඩි වීම නිසා ජීවන බර වැඩි වෙද්දී වැටුප් වැඩි නොවීම, ආදායම් පහළ වැටීම නිසා පොදු ජනයා ආර්ථික වශයෙන් පීඩාවට පත්ව තිබේ. අනෙක් අතින් ආර්ථිකය බහුජාතික සමාගම්වලට ගිල ගැනීමට ඉඩ සලසා දීම නිසා දේශීය නිෂ්පාදකයන් හා ව්‍යාපාර කඩා වැටෙමින් තිබේ. තවත් අතකින් ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට පත් කරමින් අධිකරණයට පවා අත තබද්දී මානව හිමිකම් ප්‍රශ්න හා අභ්‍යන්තර ගැටුම් දඩමීමා කර ගනිමින් අධිරාජ්‍යවාදී විදේශ බලවේග අපේ රටට එරෙහිව ක්‍රියාත්මක වෙමින් තිබේ. එසේම රට තුළ අපරාධ වැඩි වෙමින් තිබේ. මෙම තත්ත්වය තුළ අපේ රටේ සියලු ජනතාව පීඩාවට හා දුෂ්කරතාවන්ට පත්ව තිබේ. ඒ අතර රට තුළ යළිත් ජාතිවාදී හා ආගම්වාදී ගැටුම් ඇවිළවීමේ ප්‍රවණතාවක්ද මතු වෙමින් තිබේ.

රටක් ලෙස, ජනතාවක් ලෙස අප මුහුණ දී සිටින සැබෑ අර්බුදවලට අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා පීඩාවට පත් සියලු ජනයා සමඟියෙන් කටයුතු කළ යුතු මොහොතක, කුමන හෝ හේතුවක් මත ජනතාව අතර භේද හෝ ගැටුම් නිර්මාණය වන්නේ නම් එවැනි ගැටුම් හෝ භේද නිර්මාණය කිරීම සඳහා කුමන හෝ පාර්ශ්වයකින් කවුරුන් හෝ කටයුතු කරන්නේ නම් එය මුළු සමාජයටම ඉතාමත් හානිකර වනු ඇත.

අපේ රටේ දශක ගණනාවක් තිස්සේ බලය ලබා ගැනීම හා බලය පවත්වා ගැනීම වෙනුවෙන් සිංහල-දෙමළ ජාතිවාදය ඇවිස්සීමත්, ජාතිවාදී ගැටුම් හා කෝලාහල විටින් විට නිර්මාණය කිරීමත් නිසා අවසානයේදී ජාතිවාදී හා බෙදුම්වාදී යුද්ධයකට පාර කැපුණු ආකාරය අප කිසිවෙකුටත් අමතක විය යුතු නැත. වසර 30කට වැඩි කලක් පැවැති එම බෙදුම්වාදී යුද්ධයෙන් පීඩාවට පත් වූයේ තම බලය වෙනුවෙන් ජාතිවාදය වැපිරූ අය නොව, සිංහල, දෙමළ, මුස්ලිම් සියලු පොදු ජනතාවය. එම බෙදුම්වාදී යුද්ධයෙන් මිනිස් ජීවිත දහස් ගණනක් අහිමි වූ අතර, විනාශ වූ දේපළ ප්‍රමාණය ගණන් බැලිය නොහැකි තරම්ය. එම බෙදුම්වාදී යුද්ධය ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත්වීමට ඉන්දියාවත්, අධිරාජ්‍යවාදී විදේශ බලවේග හා රාජ්‍යයනුත් යොදා ගත් හැටි කිසිවෙකුට රහසක් නොවේ. විටෙක ඉන්දියානු ආක්‍රමණයක් පවා සිදු වීමට එය හේතු විය. වර්තමානයේදීත් අධිරාජ්‍යවාදී බලවේග ලංකාවට එරෙහිව මැදිහත් වීමට යොදා ගනිමින් තිබෙන්නේ එම බෙදුම්වාදී යුද්ධයේ සිදුවීම්ය.

එවැනි ඛේදවාචකයකට මුහුණ දී එහි විනාශකාරී අත් දැකීම් සහිතව සිටින ජනතාවක් ලෙස යළිත් එවැනිම වූ ගැටුමකට ඉඩ නොදීම අප කාගේත් වගකීමය. ජාතිවාදය වැපිරීම නිසා නිර්මාණය වූ බෙදුම්වාදී යුද්ධයක අමිහිරි මතකය මැකී යෑමටත් පෙර, නැවත ජාතිවාදී හෝ ආගම්වාදී ගැටුමක් රට තුළ මතු වන්නේ නම් එය ඉතාම විනාශකාරී ප්‍රතිඵල ගෙන දෙනු ඇත. කුමන වර්ගයේ ආගමික අන්තවාදයකට හෝ මූලධර්මවාදයකට හෝ ඉඩ නොතැබීමට සියලු ආගම් අදහන ජනතාව වග බලා ගත යුත්තේ ඒ නිසාය. ජනතාව අතර සමඟිය බිඳින, ගැටුම් හා කෝලාහල නිර්මාණය වීමට ඉඩ සලසන ආගමික හෝ වෙනත් ඕනෑම ප්‍රතිවිරෝධයකින් වාසි ලබා ගන්නේ අධිරාජ්‍යවාදී විදෙස් බලවේග, ප්‍රතිගාමී බලවේග මිස, ජනතාව පෙළන පාලක කණ්ඩායම් මිස අන් කවරෙක්වත් නොවේ.

මෑත කාලයේ ලෝකය පුරා බොහෝ සිදුවීම් කියා පාන්නේ ආගමික හෝ ජාතිවාදී හෝ මූලධර්මවාදී ක්‍රියා කිසිසේත් මෙම ආගමට හෝ ජාතියට කිසිදු වැඩදායී කාර්යයක් ඉටු කොට නොමැති බවයි. මෑත කාලයේ මුස්ලිම් මූලධර්මවාදීන් විසින් ඇෆ්ඝනිස්ථානයේ ඓතිහාසික බාමියන් බුදු පිළිම විනාශ කිරීමෙන්ද, බුරුමයේ බෞද්ධ ආගම මුවාවෙන් සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා මඟින්ද, හින්දු ආගමික මූලධර්මවාදීන් විසින් අයෝධ්‍යා මුස්ලිම් පල්ලිය විනාශ කිරීමෙන්ද, බෞද්ධ ආගමට එරෙහිව බංග්ලාදේශයේ සිදුවීම්ද, එම ජාතීන්ට හෝ ආගම් ලබ්ධිකයන්ට එම ක්‍රියා මඟින් සිදුව ඇත්තේ අප්‍රසාදය හා දැඩි පිළිකුළයි.

ඒ නිසා මෙවැනි ක්‍රියා මාර්ග කිසිසේත් බෞද්ධාගමට හෝ සිංහල ජනතාවට හෝ වෙනත් කවර හෝ ජන කොට්ඨාසයකට හිතකර තත්ත්වයක් ඇති කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇති කරන්නේ අතිශය විනාශකාරී, ප්‍රචණ්ඩකාරී භයානක තත්ත්වයන්ය. මේ මතු වෙමින් තිබෙන ප්‍රවණතාව මේ රට තවත් අඳුරු යුගයකට, ඉතාම භයානක ප්‍රතිවිපාක ගෙනත් දෙන යුගයකට ඇද දැමීමේ අනතුරක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගරු සභාව නියෝජනය කරන අප කාගේත් වග කීමක් තිබෙනවා.

එහෙයින් අප ඉදිරියේ ඇති මෙම සැබෑ ප්‍රශ්න හඳුනා ගෙන ඒවා පරාජය කරනවා වෙනුවට, ඒවා දෙස නොබලා විවිධ ආගම් අතර හෝ ජන කණ්ඩායම් අතර හෝ භේද නිර්මාණය වන ලෙස, ගැටුම් නිර්මාණය වන ලෙස කවුරුන් හෝ කටයුතු කරන්නේ නම් එහි වාසිය ලැබෙන්නේ ජනතාවට නොව ප්‍රතිගාමීත්වයටය. ඉන් සැබෑ ප්‍රශ්න අමතක කරවීම හා ඒවායේ සැබෑ වගඋත්තරකරුවන් ආරක්ෂා කිරීම ද සිදු වනවා.

එබැවින් ජනතාව අතර සමඟිය බිඳින, ආගම්වාදී හෝ ජාතිවාදී ගැටුම්වලට හා කෝලාහලවලට මඟ සලසන, අධිරාජ්‍යවාදී බලවේගවලට හා ප්‍රතිගාමීත්වයට වාසි සලසන කුමන හෝ වර්ගයක ආගම්වාදී, ජාතිවාදී අන්තවාදයට ගොදුරු නොවීමටත් ඒවා පරාජය කරමින් සියලු ජනතාව අතර සමඟිය ගොඩනැඟීමටත් අප කටයුතු කළ යුතුය.

දශක තුනකට වැඩි ජාතිවාදී බෙදුම්වාදී යුද්ධයකින් බැටකා සිටින ජනතාවක් ලෙස තවත් එවැනිම ආගම්වාදී, මූලධර්මවාදී ගැටුමකට ඉඩ නොතබා, හැඟීම්බරව නොව බුද්ධියෙන් කල්පනා කරමින්, ජනතාව මුහුණ දෙන සැබෑ අභියෝග හඳුනා ගෙන ඒවා ජය ගැනීම සඳහාත්, ඒ වෙනුවෙන්ම ජනතාව අතර සමඟිය ගොඩ නැඟීම සඳහාත්, සක්‍රියව දායක වීම සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සහ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි, කතෝලික ඇතුළු සියලුම ශ්‍රී ලාංකේය ජනතාවගේ වග කීමක් වනු ඇත.

මෙම තත්ත්වය පිළිබඳව පැන නඟින පහත ප්‍රශ්නවලට ගරු ඇමතිතුමාගෙන් පිළිතුරු අපේක්ෂා කරමි.

01. කවර ආගමකින් හෝ වර්ධනය වෙමින් පවතින ආගමික අන්තවාදයන් හා මූලධර්මවාදී ක්‍රියා ආණ්ඩුව හඳුනා ගෙන තිබේද?

මෑත කාලයේත් බොහෝ විට එවැනි ප්‍රවණතාවන්ගේ වර්ධනයක් අත්පත් කොට ගෙන තිබෙනවා.

02. එවැනි ක්‍රියාවන් මැඩ පැවැත්වීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

තවමත් එවැනි ක්‍රියාමාර්ග තැනින් තැන සිදු වුණාට, අපි කිසි සේත්ම දකින්නේ නැහැ ආණ්ඩුව පැත්තෙන් එය පාලනය කිරීම සඳහා හෝ ඒ ඇති වෙමින් තිබෙන ප්‍රවණතාවන් වැළැක්වීම සඳහා හෝ ක්‍රියාමාර්ග ගනු ලබනවා. ඒ ඇති වෙමින් තිබෙන

[ගරු අනුර දිසානායක මහතා]

ප්‍රවණතාවන් කිසි සේත්ම අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන ජන කොට්ඨාසයන්ට හෝ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්ත්‍රියානි, කතෝලික ආගමික ලබ්ධිකයන්ට හෝ කිසිදු සෙතක් වන්නේ නැහැ. එය ප්‍රතිගාමීත්වයට පාර කැපීමක් විතරයි. ඒ මතු වන තත්ත්වය පිළිබඳව මීට වඩා ගැඹුරින් මේ ගරු සභාව කල්පනා කළ යුතුයි; ඒ සඳහා ආණ්ඩුව පිළියම් යෙදිය යුතුයි කියලා අප අපේක්ෂා කරනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, පිළිතුරක් දෙනවාද?

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආගමික-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෞද්ධාගම සහ මේ ප්‍රකාශය අතර ගැටුමක් නොවෙයි මා මේ කියන්නේ. මා ඇත්තට බලාපොරොත්තු වුණේ-

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
නැහැ, නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩ්ඩක් ඉන්න. මා හිතන්නේ වඩාත් හොඳයි ආණ්ඩුවක් ලෙස අග්‍රාමාත්‍යතුමා හෝ සභානායකතුමා ප්‍රකාශයක් කරනවා නම්.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ ආගමික කටයුතු සම්බන්ධයෙනුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දීමට තීරණය කර තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා පිළිතුරු දෙන්න.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි ප්‍රශ්නය හැටියට අහලා තිබෙන්නේ, කවර ආගමකින් හෝ වර්ධනය වෙමින් පවතින ආගමික අන්තවාදයන් හා මූලධර්මවාදී ක්‍රියා ආණ්ඩුව හඳුනා ගෙන තිබේද කියලායි. එයට පිළිතුර තමයි, ආගමික අන්තවාදී හා මූලධර්මවාදී ක්‍රියා රට තුළ ක්‍රියාත්මක වන බවට වාර්තා වී නොමැත යන්න. ජාත්‍යන්තරයේ පැතිරිලා තිබෙනවාය කියා ආරංචි තිබෙනවා. නමුත් රට තුළ පැතිරිලා තිබෙනවාය කියා වාර්තා වෙලා නැහැ.

ඊළඟ ප්‍රශ්නයෙන් අහනවා, එවැනි ක්‍රියාවන් මැඩ පැවැත්වීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද කියලා. ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති වුණොත්, සර්ව පාක්ෂික හා සර්ව ආගමික නියෝජනයක මාර්ගයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරලා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න බලාපොරොත්තු වෙනවා. එපමණයි පිළිතුර.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හොඳයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කළා. ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳව අපේ රජයේ අවධානයත්, අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයත් යොමු වෙලා තිබෙනවා. අපි විශ්වාස කරන්නේ ඒ ඇති වී ගෙන යන විවිධ ප්‍රවණතාවන් පිළිබඳව පක්ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනාම ඒක රාශී වෙලා යම් ක්‍රමවේදයන් හා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියන එකයි. [බාධා කිරීම්] ඉතින් ඉන්න කෝ පොඩ්ඩක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, ජාත්‍යන්තරයේ තිබෙනවා කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
රජය බලාපොරොත්තු වෙනවා, ඒවා ජාත්‍යන්තරව එන ඒවාද, රට ඇතුළෙන් එන ඒවාද, කොහොමද ඒවා එන්නේ කියා සොයා බැලීමට. ඒවා සොයා බැලීම සඳහා සියලු පක්ෂවල එකතුවෙන් ඉතා ඉක්මනින් විශේෂ කාරක සභාවක් පත් කිරීමට රජය කටයුතු කරන බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.

එහිදී මේ කරුණ ගැන පක්ෂවල දෘෂ්ටි කෝණයෙන් බලනවාට වඩා, අපේ රටේ තිබෙන තත්ත්වය පිළිබඳව ඉතා ගැඹුරින් සාකච්ඡා කරලා, ජාතිවාදී අරගළ, ආගම්වාදී අරගළවලට මේ රට යටපත් කරන්නේ නැතුව, අපි දිනා ගත් සාමය රැක ගනිමින් ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීමට සහභාගි වන ලෙස අපි මේ පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂවල මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මී ළඟට ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය.

## වරප්‍රසාද : විවෘත වරෙන්තු නිකුත් කිරීම
## சிறப்புரிமை : திறந்த பிடியாணை பிறப்பிக்கப்பட்டமை
## PRIVILEGE: ISSUANCE OF OPEN WARRANT

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙම මස 22වැනි දින මට සහ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1804/12බී දරන නඩුවට පෙනී සිටීමට නියමිතව තිබුණා. නමුත් එදින පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයක් බැවින් එදිනට පාර්ලිමේන්තුමේ රැස්වීම්වලට සහභාගී වීමට අවශ්‍ය නිසාත්, වැඩ බලන ඇමතිවරයා හැටියට වාචික ප්‍රශ්නවලට පිළිතුරු දීමට හා සවස් භාගයේ ඡන්දයක් පවතින නිසා ඡන්දයට මුහුණ දීමට අවශ්‍ය නිසාත් මම ඒ නඩුවට පෙනී නොසිට ඒ බව මගේ නීතිඥවරුන් හරහා අධිකරණයට දැනුම් දීමක් කළා. එදින පක්ෂ, විපක්ෂ සියලුම පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් -කිසිම කෙනෙකුගෙන් අඩුවක් නොමැතිව- එම නඩුවට පෙනී සිට තිබෙනවා. ඒ නඩුව විභාගයට ගත් අවස්ථාවේ මහෙස්ත්‍රාත්වරයා විසින් මට විවෘත වරෙන්තුවක් නිකුත් කර තිබෙනවා. එය විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මඟින් ප්‍රචාරය වීම නිසා මේ රටේ ජනතාව අතරටද ගොස් තිබෙනවා. [බාධා කිරීමක්] තිබෙනවා. ඒ ගැන තමයි මේ කථා කරන්නේ. එයින් මට ඉතාම අසාධාරණයක් සිදු වෙලා තිබෙන බවත්, මගේ වරප්‍රසාද කඩවීමක් සිදු වෙලා තිබෙන බවත් මා මේ ගරු සභාවට දැනුම් දීමට කැමතියි. ඒ නිසා මේ ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වන ලෙසට මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනවා. ගරු සුජීව සේනසිංහ මහතා.

## වරප්‍රසාද : කථාවේ ශ්‍රව්‍ය පටිගත කිරීම් නිකුත් නොකිරීම
## சிறப்புரிமை : உரையின் ஒலிப்பதிவை வெளியிடாமை
## PRIVILEGE: NON-RELEASE OF AUDIO RECORDING OF SPEECH

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Hon. Deputy Speaker, on the 23rd of January, 2013, I had occasion to participate in the Debate on the Order under the Strategic Development Projects Act. However, I find that the audio recording of my speech had not been released in spite of my request to do so. Sir, this is not the first time it had happened. There had not been any order either to withhold, delete or expunge any part of my speech. So, this would amount to a breach of my Privileges as a Member of Parliament. Therefore, I seek your indulgence to raise this matter in the House.

Sir, this is not the first time it had happened, but the fifth time. They have said that I had used unparliamentary language in that. I do not know what unparliamentary language I had used because I had not used any filth or any other language. This is not the first time that my speeches had not been released to the media. Therefore, Sir, it is a breach of my Privileges.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I believe it was released this morning. Is it?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

This is the fifth time where it had not been released on the same day. There had not been any objections to my speech and still, they had not released it to the media.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I will look into that and attend to it. - [*Interruption*.] Yes, Hon. Leader of the Opposition.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Sir, every Member who participates in a Debate would like to see his speech appear in the newspapers. So, we have to check and if there is a problem, let him know what section would be left out. Otherwise, it needs to be released on the same day because the newspapers are not going to publish it on the following day when there is some other matter going on. What the Hon.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Member said on the Divineguma Bill was published two days later. But, as far as the electronic media is concerned, it is different. So, there is a duty and a procedure has to be laid down. We know that Standing Order Nos. 78 to 84 deals with the Rules of Debate and there are certain other conventions to be followed. So, if an issue arises, the Hon. Member should be informed immediately saying, "We are holding it back" or that someone has complained about it. Then, he knows what it is. Sometimes, you may agree to let the whole thing go, taking that relevant portion off. Sometimes, it maybe just a crosstalk between the two of them, which is not relevant to the argument that was presented by the Hon. Member. I think this amounts more to a censorship. We have to sit down and look at what happened during his speech. But, I also think the Party Leaders must lay down a criteria, enabling the Hon. Members to get at least part of their speeches released if you are leaving the rest out. - [*Interruption*.]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. Leader of the House.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි මාධ්‍ය ආයතවලින් ඉතාම කාරුණික ඉල්ලීමක් කරනවා. බොහෝ විට සභාව කල් තබන අවස්ථාවේදී කෙරෙන විවාදයන්වලදී කිසිම මාධ්‍ය ආයතනයක මාධ්‍ය නිලධාරියෙක් මාධ්‍ය ගැලරියේ දකින්න ලැබෙන්නේ නැහැ. ඒවා වාර්තා වෙන්නේත් නැහැ. මම හිතන්නේ, බොහෝ විට එය, මේ විවිධ ප්‍රශ්න නඟන සහ සභාව කල් තබන අවස්ථාවේදී යෝජනා ගෙන එන මන්ත්‍රීවරුන්ට කෙරෙන එක්තරා අසාධාරණයක්ය කියලායි. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ජන මාධ්‍ය ආයතන ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරාවිය කියලා බලාපොරොත්තු වෙනවා. Then, I call upon the Hon. Alhaj A.H.M. Azwer to raise his matter of Privilege.

## වරප්‍රසාද : 2013 ජනවාරි 24වන දින "වීරකේසරී" වාර්තාව
## சிறப்புரிமை : 2013 சனவரி 24ஆம் திகதிய "வீரகேசரி" அறிக்கை
## PRIVILEGE: "VIRAKESARI" REPORT OF 24TH JANUARY 2013

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Thank you, Sir, for giving me permission to raise this Privilege issue. There is a newspaper report distorting my speech made yesterday in the House, and published in today's "Virakesari".

> "நாட்டின் அபிவிருத்திப் பணியில் பஷில் கடவுளாகச் செயற்பட்டு வருகிறார்" என்ற தலைப்பின்கீழ்,
>
> "நாட்டை அபிவிருத்தியில் இட்டுச்செல்லும் பணியில் அமைச்சர் பஷில் கடவுள் போன்று செயற்பட்டு வருவதாக ஆளும் கட்சி எம்.பி.யான ஏ.எச்.எம். அஸ்வர் நேற்று சபையில் தெரிவித்தார்..." என்று அந்த செய்தி தொடர்கின்றது.

இது என்னுடைய ஈமானுக்கு விடுக்கப்பட்ட ஒரு சவாலாகும். சர்! "சக்ரயா" என்றுதான் நான் சிங்களத்தில் சொன்னேன். "சக்ரயா" போன்று வேலைசெய்கிறார் என்பது சிங்கள மொழி வழக்கிலுள்ள ஒரு பிரயோகமாகும். இதன் கருத்து அதிசயிக்கத்தக்க விதத்தில் மிகக் குறுகியதொரு காலத்தில் வேலைசெய்தல் என்பதாகும்.

The phrase "to work like *Shakra*", which is figuratively used in Sinhala, denotes that someone is achieving impossible and unbelievable tasks within an astonishingly short period of time. This is a phrase unique to the Sinhala language and should not be confused with the concept of Almighty God.

சர்! நான் ஒரு முஸ்லிம் என்றவகையில், "லாஇலாஹ இல்லல்லாஹு முஹம்மதுர் ரஸூலுல்லாஹ்" என்ற கலிமாவை மொழிந்தவன். என்னுடைய ஈமானுக்குக் களங்கம் ஏற்படுத்தும் விதத்தில் யாரும் எதையும் எழுத முடியாது. என்னுடைய ஈமானைப் பாதுகாக்குமாறு நான் அல்லாஹ் விடத்தில் துஆச் செய்கின்றேன்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That matter will be looked into and attended to.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. අපට විරුද්ධව මේ වාගේ දේවල් තමයි එන්නේ. අපි කියන හොඳ දේවල් එන්නේ නැහැ. මේ පිළිබඳව තමුන්නාන්සේ වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සුදුසු පරිදි කටයුතු කිරීමට ක්‍රියාත්මක වෙනවා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. අ. භා. 4.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**II**

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2013 පෙබරවාරි මස 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා.

Order, please! Before that, will an Hon. Member propse the Hon. (Mrs.) Thalatha Atukorale to the Chair?

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,"ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව** නියෝජ්‍ය කථානායකතුමා **මූලාසනයෙන් ඉවත් වුයෙන්,** ගරු තලතා අතුකෝරල මහත්මිය **මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல அவர்கள் *தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (MRS.) THALATHA ATUKORALE *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා.

## මෝටර් වාහන පනත : නියෝග
## மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT: REGULATIONS

[අ.භා. 2.45]

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 140,141 සහ 164 වැනි වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2012 ජූනි 22 දිනැති අංක 1763/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සහ 2012 ඔක්තෝබර් 10 දිනැති අංක 1779/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද 298/2008 දරන පෙත්සම විභාග කිරීමෙන් පසු වේග සීමා පනවන ලෙස හා එයට අදාළ පුවරු සවි කරන ලෙස දුන් නියෝගයෙන් මෙම වේග සීමා නියෝග පනවා තිබෙනවා. ඊට අමතරව, මෙම වේග සීමාවලට අදාළ සංඥා පුවරු හා මාර්ග සලකුණු පිළිබඳ නියෝගයද සකස් කර ඇති අතර, එය ඉතා ඉක්මනින් ප්‍රකාශයට පත් කිරීමටද අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා.

ශ්‍රී ලංකාවේ පසු ගිය වසර තුළ සිදු වී ඇති මුළු අනතුරු සංඛ්‍යාව 42,088ක් වන අතර මාරක අනතුරු සංඛ්‍යාව 2,300ක් වෙනවා. ඉන් මිය ගිය සංඛ්‍යාව 2,425ක් ලෙස ගණන් බලා තිබෙනවා. අධික වේගයෙන් රිය පැදවීම මෙම අනතුරු සිදු වීමට ප්‍රධාන හේතුවක් වන අතර වාහනයක් පදවන ලද වේගය වැඩි වූ විට එයට සාපේක්ෂව අනතුරින් සිදු වන අලාභය වැඩි වෙනවා. ඒ අනුව මාර්ග තත්ත්වයන් හා එක් එක් මාර්ගවල වේගයෙන් ධාවනය වීමේදී හැසිරෙන ආකාරය හා ජනාකීර්ණ තත්ත්වය අනුව මාර්ගයේ අවශ්‍ය ස්ථානවල වේග සීමා පනවා වේගය පාලනය කිරීම ඉතා අත්‍යවශ්‍ය කාරණයක් වන අතර, එමඟින් සිදු වන මාර්ග අනතුරු අවම කර ගන්න පුළුවන්. තවද, එසේ සිදු වන මාර්ග අනතුරුවල බරපතළ තත්ත්වයන්ද අඩු කර ගන්න හැකි වෙනවා.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කර ඇති සමීක්ෂණ හා එක් එක් මාර්ගවල තත්ත්වයන් අනුව, ඔවුන්ගේ නිර්දේශයන් සමඟ පත් කරන ලද මණ්ඩලයක් විසින් සකස් කරන ලද වේග සීමා ප්‍රකාශයට පත් කර තිබෙනවා. එම මණ්ඩලය මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රවාහන අමාත්‍යාංශය, කොළඹ නගර සභාව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මහා මාර්ග අමාත්‍යාංශය හා පොලීසිය යන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විතයි.

මෙම නියෝගයට අමතරව, වියනා සම්මුතියට අනුව දැනට ප්‍රකාශයට පත් කර ඇති 1987 මාර්තු මස 13 දින අංක 444/18 මාර්ග පුවරු, මාර්ග සලකුණු හා සංඥා නියෝග සංශෝධනය කර ඉතා මෑතකදී ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සූදානම් කර තිබෙනවා. මෙම වේග සීමා පැනවීමේදී 'ඒ' පන්තියේ මාර්ග, 'ඒබී'

[ගරු කුමාර වෙල්ගම මහතා]

පන්තියේ මාර්ග, 'බී' පන්තියේ මාර්ග හා නගර සීමා සඳහා වේග සීමාවන් පනවා තිබෙනවා. එලෙස වේග සීමාවන් පැනවීමේදී, එම මාර්ග ඉදි කරන ලද ප්‍රදේශ හා ඉදි නොකරන ලද ප්‍රදේශ ලෙස සඳහන් වෙනවා. මෙම වේග සීමා සියලුම පන්තිවලට අදාළව ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග පනවා ඇති අතර, එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයේ සෑම රටකම වේග සීමාවන් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමඟින් සියලුම මාර්ගවල නීත්‍යානුකූල පරීක්ෂණ නිරන්තරයෙන් ඉටු කිරීම මඟින් ආරක්ෂාව සැලසෙනවා. දියුණු වන රටවල මිනිසුන් පා පැදි, බස් රථ සඳහා වෙන් වෙන්ව ධාවන තීරු හා පදික වේදිකාවන් සකස් කර සියලු මාර්ගවල ආරක්ෂාව තහවුරු කර තිබෙනවා. ඒ අනුව අනතුරක් වීමේ ප්‍රවණතාව අඩුයි. නමුත් ශ්‍රී ලංකාවේ ඇති සීමිත ඉඩකඩ නිසා මාර්ග එලෙස නිර්මාණය වී නොමැති හෙයින් අනතුරු වැඩි වීමේ ප්‍රවණතාව සාපේක්ෂව වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම නිසා මේ නියෝග තුළින් රථ වාහන ගමනා ගමනය පාලනය කිරීමට හැකි වන අතර, සිදු වන අනතුරු සංඛ්‍යාව අඩු කර ගන්න පුළුවන්. එමෙන්ම වේගය නිසා සිදු විය හැකි බරපතළ තත්ත්වයන් අවම කර ගන්නත් පුළුවන්. වේග සීමාවන් දීලා තිබෙනවා. මම මේ සභාවට ඒවා ඉදිරිපත් කරනවා. ඉදි කරන ලද ප්‍රදේශ හා ඉදි නොකරන ලද ප්‍රදේශවල ත්‍රිරෝද, ත්‍රිරෝද රථ වෑන්, විශේෂ කාර්ය වාහන හා ඉඩම් වාහන රථ පැයට කිලෝ මීටර් 40යි. ඉදි කරන ලද ප්‍රදේශවල -ඒ කියන්නේ නගර- මෝටර් රථ, මෝටර් කෝච් රථ හා මෝටර් ලොරි පැයට කිලෝ මීටර් 50යි. ඉදි නොකරන ලද - townවලින් පිට- ප්‍රදේශවල මෝටර් කෝච් රථ හා මෝටර් ලොරි පැයට කිලෝ මීටර් 60යි. ඉදි නොකරන ලද ප්‍රදේශවල අනෙකුත් මෝටර් වාහන පැයට කිලෝ මීටර් 70යි. ඉතින් මේක තමයි විශේෂයෙන්ම මා ඉදිරිපත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මම මේ අවස්ථාවේදී සභාවට දැනුම් දෙන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් අපි තවත් තීන්දුවක් අරගෙන තිබෙන බව. ඩිමෝ බට්ටා වාගේ පොඩි ලොරිවල දැන් ප්‍රශ්නයක් තිබෙනවා කියලා තමුන්නාන්සේලාත් දන්නවා. ඩිමෝ බට්ටා වාගේ පොඩි ලොරිවල උඩ වහල ගැහුවොත් රුපියල් 25,000ක් අය කරනවා. ඒ කියන්නේ එහෙම කළොත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවට - RMV එකට- රුපියල් 25,000ක් ගෙවන්න ඕනෑ. නැත්නම් පොලිසියෙන් අල්ලනවා. ඒ නිසා මේ ගැන අතිගරු ජනාධිපතිතුමාට කරුණු ඉදිරිපත් කරලා ඒ තීන්දුව වෙනස් කරන්න අපි දැන් තීරණයක් අරගෙන තිබෙනවා. ඩිමෝ බට්ටා, මහේන්ද්‍රා, මිට්සුබිෂි මිනි ට්‍රක්, මහේන්ද්‍රා ට්‍රක්, මිට්සුබිෂි මිනි බස් වැනි වාහනවල බඳෙහි නිර්මාණය වෙනස් කිරීම වෙනුවෙන්, ඒ කියන්නේ ඒ වාහනවල පිටුපස වෙනස් කළොත් අය කරන මුදල අඩු කරන්න අපි තීරණය කරලා තිබෙනවා. මොකද මේ වාහනය හුඟක් පාවිච්චි කරන්නේ පොඩි මනුස්සයායි. මොරටුව ප්‍රදේශයේ ලී බඩු ප්‍රවාහනයට ඒ වාගේ වාහන පාවිච්චි කරනවා. ඒ වාගේම ස්වයං රැකියා සඳහාත් මේ වාගේ වාහන පාවිච්චි කරනවා. ඒ අයට රුපියල් 25,000ක් ගෙවන්න අමාරුයි. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් මේ මුදල රුපියල් 500කට අඩු කරලා තිබෙනවා. ඉතාම ඉක්මනින් මේ සංශෝධනය ගැසට් කරලා ක්‍රියාවට නංවනවා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරමින් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 2.51]

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද 2012 අංක 1 දරන මෝටර් රථවාහන (වේග සීමා) නියෝග ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් වැඩි වන මෝටර් රථ වාහන අනතුරු අවම කිරීම සඳහා ගරු ප්‍රවාහන අමාත්‍යතුමා ගත් ඉතා වැදගත් පියවරක් වශයෙන් අපි සලකනවා. දියුණු වන රටවල් සමඟ සංසන්දනය කරන විට අද ශ්‍රී ලංකාවේ සිදු වන මාරක රිය අනතුරු ප්‍රමාණය අඩු වී තිබෙනවා. නමුත් සංඛ්‍යා ලේඛනවලින් පෙනෙන ආකාරයට ජපානය, කොරියාව, යුරෝපය වැනි රටවලට සාපේක්ෂව බලන විට මෙය බරපතළ ප්‍රශ්නයක් වී තිබෙනවා. ගරු ප්‍රවාහන ඇමතිතුමා කිව්වා වාගේ 2009 දී මාරක අනතුරු 2,263කුත්, 2010 දී 2,579කුත්, 2011 දී 2,498කුත් සිදු වෙලා තිබෙනවා. 2012 දී ඒ ප්‍රමාණය 2,300කට අඩු වෙලා තිබෙනවා. මම හිතන හැටියට මෙයට හේතු කාරණා කීපයක් තිබෙනවා. 2012 දී මේ අනතුරු ප්‍රමාණය 2,300 වුණත්, විශේෂයෙන්ම හෘදයාබාධවලින් මිය යන ප්‍රමාණය සමඟ සංසන්දනය කරලා බැලුවොත් ඊ ළඟට විශාල ප්‍රමාණයක් මැරෙන්නේ මෝටර් වාහන අනතුරුවලිනුයි. ඩෙංගු රෝගයෙන් එච්චර මැරෙන්නේ නැහැ. රටේ තිබෙන වාහන ප්‍රමාණය සලකා බලන විට එය විශාල ප්‍රමාණයක්. පසු ගිය වර්ෂ කීපය තුළ රථ වාහන අනතුරුවලින් මරණ විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. කෙසේ වුවත්, පසු ගිය වර්ෂ කීපය ඇතුළත අපේ රටේ පාරවල්වලට වාහන විශාල සංඛ්‍යාවක් එකතු වෙලා තිබෙනවා. 2009 ඉඳලා බැලුවොත් 2009 දී වාහන 240,075ක් අලුතින් එකතු වී තිබෙනවා. 2010 දී 359,243ක්, 2011 දී 525,000ක්, 2012 දී 397,000ක් අලුතින් එකතු වී තිබෙනවා. 2012 දී ටිකක් අඩු වෙලා තිබෙනවා. මේ වාහන ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වෙලා දැන් සම්පූර්ණ වාහන ගණන 4,800,000ක් පමණ වනවා. සමහර විට එයින් 800,000ක් දැනට ක්‍රියාත්මක නොවන ඒවා වන්න පුළුවන්. වාහන 4,000,000ක් අපේ පාරවල්වල තිබෙනවා කියන්නේ විශාල ප්‍රමාණයක්. ඉතින් මෙය අනතුරු වැඩි වීමට හේතුවක් වනවා. පාරවල්වල තත්ත්වය අද දියුණු වී තිබෙනවා. පසු ගිය වර්ෂයේ හුඟක් දුරට අනතුරු අඩු වීමට එක්තරා හේතුවක් හැටියට අපට එය සලකන්නට පුළුවන්.

ඊට අමතරව මේ වාහන අනතුරු සම්බන්ධයෙන් අද පොලිසිය විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. පසු ගිය කාලය තුළ ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේදී අපි මේ ගැන සාකච්ඡා කළා. මේ ගැන කටයුතු කරන්න කියලා පොලිසියෙන් අපි ඉල්ලා සිටියා.

පසු ගිය කාලය තුළ වාහනවල ආසන පටි පැළඳීම සඳහා ගරු ඇමතිතුමා නියෝග ඉදිරිපත් කළා. විශේෂයෙන්ම වාහන අනතුරු සිදු වීමට ප්‍රධාන හේතු කිහිපයක් තිබෙනවා. රාත්‍රියේදී වේගයෙන් එන වාහනයකට ඊට ඉස්සරහින් යන බයිසිකලයක් පෙනෙන්නේ නැහැ. මොකද, ඒ බයිසිකලයට tail lamp එකක්, නැත්නම් reflector එකක් නැහැ. අද බොහෝ බයිසිකල්වල ඒ වාගේ දෙයක් නැහැ. ට්‍රැක්ටර් යනවා, reflector එකක් නැහැ. රෝද දෙකේ පුංචි ට්‍රැක්ටර්වල ඇදගෙන යන ට්‍රේලරයටත් ඒ වාගේ එකක් නැහැ. මේ වාගේ දේවල් නිසා රාත්‍රියේදී අනතුරු සිදු වුණු අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා පොලිසිය ගත් ක්‍රියා මාර්ගය ගැනත් අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

අද සභාගත කර ඇති නියෝග අනුව මහා මාර්ග වර්ග කර ඇති ආකාරය පිළිබඳව ගරු ඇමතිතුමා කිව්වා. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ සීමාවන් තිබෙනවා. ඒ වාගේම දිවයින පුරා A, AB සහ B ශ්‍රේණියේ මාර්ග ඉදි කරන ලද ප්‍රදේශ තිබෙනවා.

ඇත්ත වශයෙන්ම ඉදි කරන ලද ප්‍රදේශ කියලා කිව්වාට ඒකේ තේරුම නම් ඒ තරම් පැහැදිලි වෙන්නේ නැහැ. සාමාන්‍ය අයට built-up areas කියලා කිව්වොත් ඊට වඩා හොඳට තේරෙනවා. ඒ built-up areasවල වාහන ගමන් කළ යුත්තේ මොන වේගයකින්ද කියලා එක ඒ උප ලේඛනවල පැහැදිලි කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ ආකාරයට කොළඹ නගරයේත් A, AB සහ B ශ්‍රේණියේ පාරවල්වල සාමාන්‍ය බස් රථ, ඉඩම් වාහන, three-wheelers, ඒ වාගේම විශේෂ කාර්ය වාහන යනාදී හැම එකකටම අදාළ වේග සීමාවන් මොනවාද කියලා පැහැදිලි කරලා තිබෙනවා. නමුත් C සහ D ශ්‍රේණියේ මාර්ගවල මොන වාගේ වේගයකින් යා යුතුද කියන එක එහි පැහැදිලි කරලා නැහැ. ඒක සඳහන් වෙලා නැහැ. නමුත් ඒ වේග සීමාවන් පනවන්න C සහ D ශ්‍රේණියේ මාර්ගවල ඒ තරම් වේගයෙන් යන්න පුළුවන්ද කියන එක මම දන්නේ නැහැ. එහෙම සඳහන් කරන්න පුළුවන් නම් වඩා හොඳයි කියලා මම හිතනවා. සමහර විට ඒක ඉදිරියේදී සිදු වෙන්නට පුළුවන්.

ඉදි නොකළ ප්‍රදේශ වශයෙන් සඳහන් ඉතිරි වන අනෙකුත් මාර්ගවල පැයට කිලෝමීටර් 70ක වේග සීමාවකුත්, motor coaches සහ ලොරිවලට පැයට කිලෝමීටර් 60කුත්, ඒ වාගේම ඉඩම් වාහන හා ත්‍රිරෝද රථවලට පැයට කිලෝමීටර් 40කුත් වශයෙන් ලකුණු කර තිබෙනවා. ඉදි නොකළ සීමාවන් කියන්නේ, built-up areas නොවන ග්‍රාමීය ප්‍රදේශ හරහා යන ප්‍රධාන මාර්ග. විශේෂයෙන්ම අද එම පන්තියේ පාරවල්වල පැයට කිලෝමීටර් 70ක වේගයෙන් යන්න පුළුවන්.

එතකොට මේ අවස්ථාවේදී අපි කියන්න ඕනෑ, මාර්ග ආරක්ෂාව පිළිබඳව ප්‍රධානම සාධකය වන්නේ වේගය බව. වේගය වැඩි වෙන්න වැඩි වෙන්න අනතුරු වැඩි වෙන්න ඉඩ තිබෙනවා. මාරක රිය අනතුරු පිළිබඳව දියුණු රටවල් හුඟක් දුරට පර්යේෂණ කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මාර්ග අනතුරු පිළිබඳව කරන විශේෂ පර්යේෂණ ආදියෙන් අපි තවම ප්‍රාථමික මට්ටමකයි ඉන්නේ. අනතුරුවලින් සියයට 30ක් පමණ වැඩි වේගය නිසා සිදු වන බව සංවර්ධිත රටවල් කරන ලද පර්යේෂණවලින් අපට පැහැදිලි වෙනවා. නියමිත වේග සීමාවන් ඉක්මවා යාම සහ ඒ ඒ අවස්ථාවන්හිදී මාර්ගවල ඇති තදබදය, නැත්නම් වෙනත් බාධක නොසලකා රිය පැදවීම නිසා තමයි හුඟක් දුරට අනතුරු සිදු වෙන්නේ. අපි වේග සීමාවන් පනවලා boards ගහලා තිබුණත්, සමහර රියැදුරන් ඒවා ගැන කිසි තැකීමක් නොමැතිව ගමන් කරනවා. වේග සීමාවන් පැනවීම අවස්ථානුකූලව හොඳ ක්‍රියා මාර්ගයක් කියන එක අපි පිළිගන්නවා. මට කථා කරන්න තව හුඟක් දේවල් තිබෙනවා. නමුත්, මට ලබා දී තිබෙන කාලය සීමිත නිසා මා මෙතෙකින් නවතිනවා. ස්තුතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க )
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. පොඩි වාහන සම්බන්ධයෙන්,-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇහෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. පොඩි වාහන සම්බන්ධයෙන් අය කළ ගාස්තුව අඩු කිරීම පිළිබඳව අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක කාරණයක් පිළිබඳව මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. දැනටමත් සමහර අය බොහොම අමාරුවෙන් ඒ සඳහා වැඩි මුදලක් ගෙවලා තිබෙනවා. එසේ වැඩිපුර ගෙවපු මුදල ආපසු ලබා ගන්න පුළුවන් වෙයිද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම ඒ පිළිබඳවත් කටයුතු කරන්නම්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
වැඩිපුර ගෙවපු අයට වාහනයට තව කැල්ලක් පිටිපස්සෙන් සවි කර ගන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.00]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්න එක පිළිබඳව මම බොහොම ආඩම්බර වෙනවා. ඔබතුමිය ගැන අප තුළ ලොකු ගෞරවයක් තිබෙනවා.

ඒ කොහොම වෙතත් ප්‍රවාහන ඇමතිතුමා ප්‍රමාද වෙලා හෝ මේ මෝටර් වාහන පනත යටතේ නියෝග ඉදිරිපත් කිරීම ගැන අපි සතුටු වෙනවා. මොකද මේ මාර්ග සංඥා පුවරු වාගේම මාර්ග සංඥා ලකුණු ඇති කරලා වේග සීමාවන් පනවන්න කියා අධිකරණයෙන් කියලා දීර්ඝ කාලයක් වෙනවා. ඒ කාල සීමාව තුළ දී ඒකෙන් වැඩි ප්‍රයෝජන ගත්තේ ආරක්ෂක අංශයේ නිලධාරින් කියන එකයි මට නම් පෙනෙන්නේ. විශේෂයෙන්ම ප්‍රවාහන ඇමතිතුමා අද කථාව ඉදිරිපත් කරන කොටම කිව්වා, ඩීමෝ බට්ටා පිළිබඳව. ලලිත් දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමාත් දැන් පැහැදිලි කළේ ඒ ගැනයි. ඩීමෝ බට්ටාවල පිටි පස්සේ කුඩුව හයි කරන එකට රුපියල් 25,000ක් අය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඔබතුමියගෙන් අහනවා, ඒ ඩීමෝ බට්ටාවල පිටි පස්සේ කුඩුව හයි කරන්න මුදල් ගෙවපු අයට ආපසු ඒ මුදල ලබා දෙනවා ද කියලා. අපේ නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී ඒ ගැන පැහැදිලි කර ගන්න කැමැතියි. වෙල්ගම ඇමතිතුමා හිටියා නම් එතුමාගෙන් මේ කාරණය ගැන අහන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම් පරීක්ෂාව ගැන අදහසක් ඉදිරිපත් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. තමුන්නාන්සේලා, අපි දන්නවා මේ රටේ මහ ජනතාව වාහනවල දුම් පරීක්ෂාව සිදු කිරීම සඳහා විශාල මුදලක් රජයට ගෙවනවාය කියලා. මේ ගැන පැහැදිලිවම මම ගරු ඇමතිතුමාගෙන් තොරතුරු දැනගන්න කැමැතියි. RMV එකෙන් මම අද ගත්ත තොරතුරක් අනුව එහි

[ගරු පී. හැරිසන් මහතා]

කියලා තිබෙනවා, මෝටර් සයිකලයකින් දුම් පරීක්ෂාව සඳහා අය කරන්නේ රුපියල් 355යි කියලා. ඒ වාගේම ඩීසල් මෝටර් සයිකලයකිනුත් අය කරන්නේ රුපියල් 355යි. ත්‍රිරෝද රථ සඳහා අය කරන්නේ රුපියල් 435යි. Motorcarsවලින් රුපියල් 950යි කියලා තිබෙනවා. මම අපේ ඇමතිතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවන්න කැමැතියි. ඒ වාගේම මේ වාහනවල දුම් පරීක්ෂාව කරන ප්‍රධාන ආයතන දෙකක් තිබෙනවා. ඒ තමයි ලාෆ් එකෝ ශ්‍රී ආයතනය සහ ක්ලීන්කෝ ලංකා ආයතනය. ඒ ආයතන දෙකට අනුව දුම් පරීක්ෂාව සඳහා මෝටර් සයිකලයකින් අය කරන්නේ රුපියල් 415යි. ත්‍රී වීලර්වලට මේ ගොල්ලෝ රුපියල් 505ක් අය කරනවා. මම දන්නේ නැහැ, මේ විධියට පරස්පර සංඛ්‍යා දෙකක් තිබෙන්නේ ඇයි කියලා. මේ රටේ වග කිව යුතු ආයතනයක් වන RMV එකෙන් කියනවා, රුපියල් 300 ගණනක් අය කරන්න කියලා.

හැබැයි අද වන කොට මේ ආයතන දෙක ඊට වැඩි මුදලක් අය කරනවා. විශේෂයෙන්ම ලාෆ් එකෝ ශ්‍රී ආයතනය සහ ක්ලීන්කෝ ලංකා ආයතනය කියන මේ ආයතන දෙකට තමයි මෝටර් වාහනවල දුම් සහතික ලබා දීම බාර දීලා තිබෙන්නේ. තමුන්නාන්සේලා කියන ගණනට මේ ආයතන දෙක කටයුතු කරන්නේ නැද්ද, එහෙම නැත්නම් මේ වාගේ අමතර ගාස්තුවක් මහ ජනතාවගෙන් අය කරනවා ද කියන කාරණය පිළිබඳව තමුන්නාන්සේගේ කථාවේදී මම පිළිතුරු බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දුම් සහතික ලබා දීමේ දී පුදුමාකාර නාස්තියක් හා වංචාවක් සිදු වෙනවාය කියන කාරණය මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මම එහෙම කිව්වේ මේකයි. 2011 වර්ෂයේ දී වාහන 2,230,265ක් දුම් සහතික ලබාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2011 දුම් පරීක්ෂාවෙන් උපයා ගත් මුදල රුපියල් 10,52,11,997යි. මේකෙන් රජයට අය වුණ මුදල කොපමණද? ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා මේ ප්‍රශ්නයට දුන්න පිළිතුරක් මා ළඟ තිබෙනවා. මේ දස කෝටි ගණනින් -රුපියල් 10,52,11,997න්- රජයට අයිති වෙලා තිබෙන්නේ සියයට 10යි. ඉතිරි සියයට 90ම ගිහිල්ලා තිබෙන්නේ ඒ කොම්පැනිවලටයි. මේක මොන තරම් අපරාධයක්ද කියලා බලන්න. අද තමුන්නාන්සේලා දුම් සහතිකය කියලා අහිංසක මිනිස්සුන්ගේ මෝටර් සයිකලයෙන් රුපියල් 450කට 500කට කිට්ටු වෙන මුදලක් ගන්නවා. ඒ වාගේම කාර්වලින් ගන්නවා. අනෙකුත් සියලු වාහනවලින් ගන්නවා.

හැබැයි, ඒකෙන් රජයට ලැබෙන්නේ සියයට 10යි. 2011 වර්ෂයේ රුපියල් කෝටි ගණනක ආදායමක් ගත්තාම එයින් නව කෝටියක් පමණ ගිහිල්ලා තිබෙන්නේ ලාෆ් ආයතනයට සහ දුම් සහතික ලබා දෙන අනෙක් ආයතනයටයි. මේ වරප්‍රසාද දීලා තිබෙන්නේ කාටද? මේ කොම්පැනි දෙක උදවු කරන්නේ කාටද? මෙතැන සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා මේ අවස්ථාවේ මේ සභාවේ හිටියා නම් හොඳයි. මේ කාර්යය ගමනාගමන මණ්ඩලයෙන් කරන්න පුළුවන් කියලා මම එතුමාට කියන්න කැමැතියි. ගමනාගමන මණ්ඩලය රජයේ ආයතනයක්. ඇයි, ඒ කාර්යය ගමනාගමන මණ්ඩලයෙන් කරන්න බැරි? කරුණාකරලා මෙහෙම අපරාධ කරන්න ඉඩ දෙන්න එපා. අහිංසක මිනිස්සුන්ගෙන් සියලු දෙයින් බදු ගන්න ගමන් මේ වාගේ නාස්තියක් දූෂණයක් කරමින් දුම් සහතිකය ලබා දෙමින් කරන්නේ අමු බොරුවක්. ඒ නිසා කරුණාකරලා මේ ගැන සොයා බලන්න කියලා ආණ්ඩුවට මම කියනවා. ඒ විතරක් නොවෙයි, මෙහෙම කරන්න දුන්නේ කාගේ අවසරයක් පිටද කියලාත් සොයා බලන්න කියලා මම කියනවා. මේවා මහජනතාවගේ සල්ලි.

මේ වෙලාවේ ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. දුම් සහතිකය ලබා දෙන හැටි මම කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දුම් සහතිකය දෙන එක අමු ප්‍රෝඩාවක් කියන එක මම කියනවා. අද දුම් සහතිකය දෙන තැනට රුපියල් 1000ක් දුන්නා නම් දුම් සහතිකය ගන්න පුළුවන්. වෙන මොකක්වත් අවශ්‍ය නැහැ. වාහනය අර ගෙන යන්නේ නැතිව දුම් සහතිකය ගන්න පුළුවන්. ගන්න ක්‍රමය මොකක්ද කියලා මම ඇමතිතුමාට කියන්නම්. මේ තිබෙන්නේ එතැන වැඩ කරන කට්ටිය දුන්න විස්තරයි. ඒකට හොඳම උදාහරණය මම කියන්නම්. මගේ මිත්‍රයෙක් ගිය සතියේ දවසක බේස්ලයින් රෝඩ් එකේ තිබෙන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයට වාහනය අර ගෙන ගියා. එතැනින් වාහනය fail වුණා. එන්ජිම හදා ගෙන එන්න කිව්වා. එදා දවල් 2.00ට බේස්ලයින් රෝඩ් එකට ගියේ. පසුවදා උදේ කඩුවෙල දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයට ගියාම රුපියල් 1000ට වාහනය පාස් වුණා. මෙන්න දුම් සහතික දෙන ක්‍රමය. දුම් සහතික දෙන ක්‍රමය දන්නේ නැත්නම් මම තමුන්නාන්සේට කියා දෙන්නම්. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාවේ දී උත්තර දෙන්න. මගේ වෙලාව අවසාන වෙලායි තිබෙන්නේ. ඒක කරන්නේ කොහොමද කියලා මම ඔබතුමාට කියන්නම්. අපි ගිහිල්ලා වාහනයේ පොත computer එකට feed කරනවා. ඊට පස්සේ වෙනත් අලුත් වාහනයක් එතැනට දමලා ඒකට සවි කරලා අපේ වාහනයේ number plate එකේ පින්තූරය විතරක් අර ගෙන ඒකට feed කරන්න පුළුවන්. එහෙම නැත්නම් තවත් ක්‍රමයක් මම තමුන්නාන්සේට කියා දෙන්නම්. පෙට්‍රල් කාර් එකක් නම් ඒ කාර් එකේ පොත අර ගෙන ගිහිල්ලා computer එකට feed කරනවා. අලුතින් ගෙනැල්ලා අවුරුද්දකට අඩු කාලයක් දුවපු මෝටර් සයිකලයක් තිබෙනවා නම් ඒ මෝටර් සයිකලය ඒ පරීක්ෂා කරන තැනට දමලා ඒ මැෂින් එක සයිලන්සර් එකට සවි කළාම පෙට්‍රල් වාහනයේ ගානට එනවා. මොකද, ඒ වාහන දෙකේම සියයට හතරයි ගණනක් තමයි කාබන් මොනොක්සයිඩ් තිබෙන්න ඕනෑ. අලුතින් ගන්න මෝටර් සයිකල්වල ඒ ගණන තිබෙනවා. ඒක නිසා මේ කරන්නේ අමු බොරුවක්. මහජනතාවගේ සල්ලි ගසා කන එකක් තමයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි අපේ ගරු පී. දයාරත්න ඇමතිතුමා කිව්වා මේ රටේ වාහන හතළිස්හත් ලක්ෂයක් ලියා පදිංචි කර තිබෙනවාය කියලා. හැබැයි, ඒ හතළිස්හත් ලක්ෂයෙන් 2011 දී දුම් සහතිකය ගත්තේ වාහන විසිදෙලක්ෂයකට විතරයි. ඉතිරි ඒවාට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා මම අහනවා. අද CTB එකේ බස්වලට දුම් සහතික නැහැ. අරක්ෂක අංශයේ වාහනවලට දුම් සහතික නැහැ. තවත් රජයේ ආයතන ගණනාවක් තිබෙනවා. ඒවාට අයත් වාහනවලට දුම් සහතික නැහැ. ඒවායින් යන්නේ දුම් නොවෙයිද කියලා මම අහනවා. එහෙම නම් කරුණාකරලා මේ බොරුව කරන්න එපා. එක්තරා පිරිසකට, එක්තරා කොටසකට මුදල් ගසාකෑමේ ජාවාරමක් කරන්න දීලා තිබෙනවා. සමහර නායකයින්ගේ සමහර පක්ෂවලට උදවු උපකාර කරපු එක එක කොම්පැනිකාරයින්ට මුදල් ගසා කන්න අවස්ථාවක් දීලා තිබෙනවා. දුම් සහතික දීමෙන් ලැබෙන ලාභයෙන් සියයට 90ක් කොම්පැනිකාරයන්ටයි. රජයට ලැබෙන්නේ සියයට 10යි.

කෝටි දහයක් ඉපයුවොත් කෝටි නවයක් කොම්පැනිකාරයන්ට; කෝටි එකක් රජයට. ඉතින් මේකටද මේ දුම් සහතිකය ගන්නේ? ඒ නිසා මා ආණ්ඩුවට කියනවා, මේ අහිංසක මිනිසුන්ගේ සල්ලි මේ වාගේ දූෂිත ආයතනවලට ගන්න ඉඩ තියන්න එපා කියලා.

දූෂණය ගැන කියනකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මට මතක් වෙනවා, 22 වැනි අඟහරුවාදා "දිනමිණ" පත්තරේ පළ වුණු කාරණයක්. මේක ආණ්ඩුවේ පත්තරය. "දිනමිණ" පත්තරේ පොල් ගෙඩි අකුරින් මේ විධියට දමා තිබෙනවා..

"වැව් හදන්න දුන්නු කෝටි 8ක් පිල්ලි ගහලා"

කවුද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මේ පිල්ලි ගහලා තිබෙන්නේ? උතුරු මැද පළාතේ වැව් හදන්න දුන්නු සල්ලි කෝටි අටක් පිල්ලි ගහලා. ඒක කියන්නේ ආණ්ඩුවේ "දිනමිණ" පත්තරේ මුල් පිටුවෙන්. අපි නොවෙයි කියන්නේ. මේක "ලංකා" පත්තරයේ දමලා තිබුණා නම්, එහෙම නැත්නම් වෙන පත්තරයක දමලා තිබුණා නම් කමක් නැහැ.

ඒ විතරක් නොවෙයි, උතුරු මැද පළාතේ සිදු වෙච්ච වංචා, දූෂණවලට සම්බන්ධ files 10ක්, 15ක් විතර ජනාධිපති විමර්ශන ඒකකයේ තිබෙනවා. උතුරු මැද පළාතේ දූෂණයෙන් හම්බ කර ගත්තු ඒවා කොහේද තිබෙන්නේ කියලා බලා ගන්න පුළුවන්, පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා දියවන්නා ඔයේ දෙපැත්ත බැලුවා නම්. උතුරු මැද පළාතේ පාරවල් හදන්න දුන්නු සල්ලි, උතුරු මැද පළාතේ වැව් හදන්න දුන්නු සල්ලි, උතුරු මැද පළාතේ අහිංසක වකුගඩු රෝගීන් වෙනුවෙන් දුන්නු සල්ලිවලට වෙච්ච දේවල් බලා ගන්න පුළුවන්, පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා බැලුවා නම්. දියවන්නා ඔයේ දෙපැත්තේ තිබෙන මාලිගාවලින් බලා ගන්න පුළුවන් උතුරු මැද පළාතේ දුප්පත් අහිංසක මිනිසුන්ට දුන්නු සල්ලි කොහේද තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ආණ්ඩුවට අභියෝග කරනවා. තමුන්නාන්සේලාගේ පැත්තේ ඉන්නවා කලින් අපේ පැත්තේ හිටපු අර්ල් ගුණසේකර මන්ත්‍රීතුමා. එතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුව අවටින් ගෙයක් හොයා ගන්න දහ පොළකට විතර ගියා, ඒ සල්ලිවලින් ගත්තු ගෙවල් දහයක් විතර මේ පාර්ලිමේන්තුව අවට තිබෙනවා කියලා. ඒවා පරීක්ෂා කරන්න. මා ජනාධිපති කොමිසමට මේ ටික කියනවා. අර්ල් ගුණසේකර ඇමතිතුමාගෙන් ඇහුවා නම් කියයි, ඒ ගෙවල් තිබෙන තැන්, ඉඩම් ගත්තු තැන්. මේවා උතුරු මැද පළාතේ අහිංසක මිනිසුන්ගේ සල්ලි. අශ්වයා ගියාට පස්සේ දැන් ඉස්තාලය වහලා වැඩක් නැහැ. උතුරු මැද පළාතේ වැව් හදන්න දුන්නු සල්ලිවලින් කෝටි අටක් පිල්ලි ගහලා තිබෙනවා. ජනාධිපති විමර්ශන ඒකකයෙන් ගිහින් උතුරු මැද පළාතේ යන්ත්‍රෝපකරණ වැඩ පොළේත් විමර්ශනයක් කළා.

තමුන්නාන්සේලාට කියන්න මීට වැඩිය හාස්‍යජනක කථාවක් තිබෙනවා. උතුරු මැද පළාතේ, අනුරාධපුර ශුද්ධ නගරයේ අරිප්පු පාරේ කිලෝ මීටර් තුනක් තිබෙනවා. ඒ කිලෝ මීටර් 3 හදන්න කෝටි 8ක් වියදම් කරලා තිබෙනවා. කෝටි අටක්! ගරු ඇමතිතුමා මේවා ගැන සොයා බලන්න. ජනාධිපති විමර්ශන ඒකකයෙන් ගිහින් මේ ගැන පරීක්ෂා කරලා තිබෙනවා. කෝටි අටක් වියදම් කරලා දවස් දොළහෙන් පාර හදලා ඉවරයි. කිලෝ මීටර් තුනක පාර, කෝටි අටක් වියදම් කරලා දවස් දොළහෙන් හදලා ඉවරයි. [බාධා කිරීමක්] තාර දමලා නොවෙයි, කාපට් කරලා. දවස් දොළහෙන් කාපට් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ජනාධිපති විමර්ශන ඒකකයෙන් කියලා තිබෙනවා, අඩි තුනක් කොන්ක්‍රීට් කරන්න ඕනෑ, පස් දමන්න ඕනෑ, තලන්න ඕනෑ කියලා. නමුත් ඒවා මොකක්වත් කෙරිලා නැහැ. [බාධා කිරීමක්]දවස් තුනෙන් කරන්න පුළුවන් නම් මා තමුන්නාන්සේට තවත් එකක් කියන්නම්. ඇටබගස්වැව, ඇතාකඩ පාරට එක පස් කැටයක් දමන්නේ නැතිව, එක ගල් කැටයක් දමන්නේ නැතිව හොරට බිල් දමලා ලක්ෂ 200ක් -කෝටි 2ක්- අරගෙන තිබෙනවා. වෙන කොම්පැනියකින් හදාපු පාරට, හොරට බිල් දමලා උතුරු මැද පළාත් ගණකාධිකාරිවයා ඇතුළු නිලධාරින් සල්ලි අරගෙන තිබෙනවා. කරුණාකරලා මේවා ගැන සොයන්න. මේවා තමයි නාස්තිය, දූෂණය කියන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාට මා විශේෂයෙන් කියනවා, මේ වාගේ දූෂණ, නාස්ති ගැන වහාම පරීක්ෂා කරන්න කියලා. විශේෂයෙන්ම මේ නියෝග පිළිබඳව විවාද කරන අවස්ථාවේදී මා කියන්න ඕනෑ, රියැදුරු පාසල් ගැන.

දයාරත්න ඇමතිතුමා මේ සභාවේදී කිව්වා හැම අවුරුද්දේම බෝ වන රෝගවලට වඩා accidentsවලින් මිනිස්සු මැරෙනවා කියලා. එහෙම නම් අපිට ඒ ගැන බලන්න වෙනවා. තමුන්නාන්සේ දන්නවා රියැදුරු පාසලක් පවත්වා ගෙන යන්න තිබෙන අවම සුදුසුකම් මොනවාද කියලා. දැන් හතු පිපෙනවා වාගේ ලංකාවේ හැම තැනම රියැදුරු පාසල් ඇරලා තිබෙනවා. එක අවුරුද්දකට හත් ලක්ෂයකට වඩා රියැදුරු බලපත්‍ර නිකුත් කරනවා. අද ඒ නිසා මොකක්ද වෙන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

Order, please! ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු පී. හැරිසන් මහතා**
**(மாண்புமிகு பீ. ஹரிசன்)**
(The Hon. P. Harrison)

අද මොකක්ද වෙන්නේ? හතු පිපෙන්නා වාගේ රියැදුරු පාසල් ඇරලා තිබෙනවා; නිවැරදි පුහුණුවක් නැති උපදේශකලා ඉන්නවා; licence එක දෙනවා. වේග සීමාව දාලා තිබෙන්නේ 60යි, 70යි. හැබැයි මේ අය පාගනවා 150ට. එතකොට මොකක්ද වෙන්නේ? මහ මඟදී සිය ගණනකගේ ජීවිත විනාශ වෙනවා.

වාහන පරීක්ෂකවරු ඉන්නවා හැම තැනම. ඒ අය අනිවාර්යයෙන්ම පගාවට තමයි වැඩ කරන්නේ. Examinersලා සිටින හැම දිස්ත්‍රික්කයම බලන්න. ඒ examinerට ගණනක් දුන්නේ නැත්නම් pass කරන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේ ගැන පරීක්ෂණයක් තියන්න. කොළඹින් ගිහින් වුණත් කමක් නැහැ පරීක්ෂා කරන්න. මොකද, නිවැරදි පුහුණුවක් නැති අය නිසා සහ මේ licence ලබා දීම සම්බන්ධ ක්‍රමවත් වැඩ පිළිවෙළක් නැති නිසා අද මිනිසුන්ගේ ජීවිත හානි වෙනවා, විශාල වශයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රියැදුරු පුහුණු පාසල්වල අඩු පාඩුකම් විතරක් නොවෙයි, නුපුහුණු අය විවිධ විධියට රියැදුරු උපදේශක licence එක ගන්නවා. දැන් රියැදුරු පුහුණු උපදේශකවරු විධියට රජයේ සේවකයන් licence එක ගන්නවා; පොලිසියේ අය ගන්නවා; වෙනත් රජයේ කාර්යාලවල නිලධාරින් ගන්නවා. අරගෙන රියැදුරු පුහුණු පාසල් දමනවා. නමුත් ඔහු කාර්යාලයේ වැඩ කරන ගමන් ඒ licence එක කාට හෝ විකුණනවා. මා දන්නා විධියට අනුරාධපුර දිස්ත්‍රික්කයේ රියැදුරු පුහුණු පාසල් 15ක් තිබෙනවා. ඒ අතුරින් සියලු නීතිරීතිවලට අනුව පිහිටුවා ඇති රියැදුරු පුහුණු පාසල් පහක්වත් නැහැ. අර pharmacies වාගේ තමයි. Pharmacy එකට licence එක තිබෙන එක්කෙනා ආණ්ඩුවේ ඉස්පිරිතාලයක වැඩ කරනවා; වෙනත් කෙනෙක් pharmacy එකේ ඉන්නවා. ඒ ආකාරයට මේ රියැදුරු පාසල්වල වැඩ කටයුතු කිරීමත් ඒ තුළින් නිවැරදි පුහුණුවක් නොමැති පුද්ගලයන් රියැදුරන් විධියට ඇතුළත් වීමත් නිසා මාර්ග අනතුරු වැඩි වෙලා තිබෙනවාය කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මා දුම්රිය ගැනත් වචනයක් දෙකක් කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඇමතිතුමා කියලා තිබෙනවා රට පුරා අනාරක්ෂිත දුම්රිය මාර්ග 900ක් පමණ තිබෙනවා කියලා. ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවකදී පුවත් පත්වලට නිකුත් කරලා තිබෙන නිවේදනයක එහෙම කියලා තිබෙනවා. දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මේ සඳහා වැඩ පිළිවෙළක් හැදුවා. අහිංසක දුප්පත් මිනිසෙක් රේල් පාර මුර කළාම එක පැත්තකින් ඒ පුද්ගලයාට ආදායමක් ආවා. ඒ වැඩ පිළිවෙළ සාර්ථක ක්‍රියාත්මක වුණා. නමුත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවාට පසුව මොකද කළේ? අඩුම තරමින් ඒ උණ බම්බු වැඩ

[ගරු පී. හැරිසන් මහතා]

පිළිවෙළවත් හරියට ක්‍රියාත්මක කළේ නැහැ. ඒක අතර මහ නතර කරලා දැම්මා. අද තමුන්නාන්සේලා අභ්‍යවකාශයට ගිහින් ලෝකයේ තොරතුරු සොයන්න හදන ආණ්ඩුවක්. නමුත් අඩුම ගණනේ තව වෙන තුරු තමුන්නාන්සේලාට බැරි වුණා අනාරක්ෂිත දුම්රිය ගේට්ටුවලට විසඳුමක් දෙන්න. ඒ නිසා අහිංසක මිනිසුන් පාරවල් ගණනේ මැරෙනවා. 70ක්, 80ක් විතර දුම්රිය අනතුරුවලට ලක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ඔබතුමියට කියන්නට කැමැතියි, මේ ආණ්ඩුවට දුම්රිය ගේට්ටුවකට උණ බම්බුවක්වත් දා ගන්න බැහැ කියලා. නමුත්, අභ්‍යවකාශය ගැන තමයි කථා කරන්නේ; ආසියාවේ ආශ්චර්යයට යන්නේ. අඩුම ගණනේ rail gate එකට උණ බම්බුවක් දාන්න බැරි ආණ්ඩුව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගහනවාද කියලා මා අහන්න කැමැතියි. ඇමතිවරු රොත්ත බුරුත්තක් ඉන්නවා. ඇමතිවරු එකසිය ගණනක් ඉන්නවා. නමුත් අඩුම ගණනේ මේ වාගේ වැඩක්වත් කර ගන්න බැහැ. පසු ගිය අවුරුද්දේ දුම්රිය අනතුරුවලින් සිදු වුණ මරණ ගණන කීයද කියලා තමුන්නාන්සේ බලන්න.

ඒ විතරක් නොවෙයි. CTB එක භාරව ඉන්න ඇමතිවරයා හැටියට, මා ගරු ඇමතිතුමාට කියනවා තවම CTB එකේ EPF ටික ගෙවලා නැති බව. ඒ වාගේම ඒ අයගේ පාරිතෝෂික දෙන්නේ නැහැ. ඒ මිනිස්සු අහිංසක මිනිස්සු. මහන්සි වෙලා වැඩ කළ අය. ඒ අය දැන් උසාවියට ගිහින් තිබෙනවා. කරුණාකරලා ඒ මිනිසුන්ගේ EPF, ETF ගෙවන්න. ඒ අය මේ රටට වැඩ කළ මිනිස්සු. ඒ මුදල් ලබා දීලා ඒ අයට නිදහසේ මැරෙන්න දෙන්න කියා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 3.19]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කරන ලද නියෝග විවාදයට ගන්නා මේ අවස්ථාවේදී වචන කීපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම බෙහෙවින්ම සතුටු වෙනවා. මේ පිළිබඳව කරුණු සඳහන් කිරීමට පෙර කිව යුතු කාරණයක් තිබෙනවා. අපේ ගරු හැරිසන් මන්ත්‍රීතුමාගේ කථාවේදී ඉදිරිපත් වුණා දුම් පරීක්ෂාව කිසිදු ඵලදායී නොවන කාර්යයක් කියන කරුණ. [බාධා කිරීමක්] ගරු හැරිසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කරුණු පිළිබඳ අවධානය යොමු කරනවා වාගේම මම ඉතාම කාරුණිකව කාරණයක් මතක් කරනවා. දුම් පරීක්ෂාව පිළිබඳ වැඩ පිළිවෙළක අවශ්‍යතාවක් රටක් විධියට ඇති වුණේ අපේ රටේ පාරිසරික වශයෙන් ඇති වූ තත්ත්වයන් මතයි. පෙණහලු ආශ්‍රිත රෝග හේතුවෙන් රෝහල්ගත වන, මිය යන රෝගීන් සංඛ්‍යාව දිනෙන් දිනම වැඩි වූ නිසා පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම රජයක් විධියට අපට තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දුම් පරීක්ෂා වැඩ පිළිවෙළ ආරම්භ කිරීමට පෙර, රාජකාරියේ නිරත වූ රථ වාහන පොලීසියේ නිලධාරීන් සම්බන්ධයෙන් කොළඹ නගරයේ වෛද්‍ය පරීක්ෂණ ඒකකය විසින් සමීක්ෂණයක් කරනු ලැබුවා. එසේ දුම් පරීක්ෂණ කටයුතු කිරීමට පෙර කරන ලද සෞඛ්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵලත්, වර්තමානයේදී කරන ලද සෞඛ්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵලත් සංසන්දනාත්මකව බලා වාර්තාවක් එළි දක්වා තිබෙනවා, කොළඹ නගර සභාවේ වෛද්‍ය විජයමුනි මහතා. ඒ වාර්තාව අනුව තහවුරු වෙලා තිබෙනවා දුම් පරීක්ෂාව නිසා ජීවිත හා සම්බන්ධ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ විශාල දියුණුවක් ඉතාම පැහැදිලිව ලබා තිබෙන බව. රථ වාහනවල දුම නිසා වැලඳෙන පෙණහලු ආශ්‍රිත රෝග හේතුවෙන් මිය යන ජීවිත මිල කරන්න කිසිම කෙනකුට මොනම ආකාරයකින්වත් පුළුවන්කමක් නැහැ.

ගරු හැරිසන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිබඳව අප අවධානය යොමු කරනවා වාගේම, ජීවිත පිළිබඳ වගකීමක් තිබෙන රජයක් විධියට කොපමණ මුදලක් වියදම් වුණත් මෙම වැඩ පිළිවෙළේ සාර්ථකත්වය සැලකිල්ලට ගෙන, තිබෙන අඩු පාඩුකම් නිවැරදි කරගනිමින්, තවතවත් ශක්තිමත් කරමින් මෙම වැඩසටහන අනිවාර්යයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු බවයි මා පෞද්ගලිකව යෝජනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වේග සීමා පිළිබඳ නියෝග අපේ රටේ පාර්ලිමේන්තුවට අද ඉදිරිපත් කරලා තිබෙන්නේ 1951 මෝටර් වාහන පනතට අනුවයි. මේ පනතේ ඉතිහාසය දිහා බැලුවොත් 1981 එයට ප්‍රධාන සංශෝධනයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඊට පසුව මේ පනතට විශාලතම සංශෝධනයක් ඉදිරිපත් කළේ 2009 අවුරුද්දේයි. මේ පනතට අනුව නියෝග දෙකක් තමයි අද ඉදිරිපත් කරන්නේ. මේ නියෝග ඉදිරිපත් කරන්න හේතුව මොකක්ද? 2008 අවුරුද්දේ, කිසියම් පුද්ගලයකු අධික වේගයෙන් රිය ධාවනය කළා කියලා අධිකරණයට ඉදිරිපත් කළාට පස්සේ අධික වේගයෙන් රිය ධාවනය කළා කියලා ඒ පුද්ගලයාට දඩයක් ගහලා, ඊට පසුව අධිකරණය නියෝගයක් නිකුත් කළා මේ පිළිබඳව තිබෙන අපැහැදිලි තැන් නිවැරදි කරන්න කියලා.

පෙර පැවැති තත්ත්වය අනුව 1995 වන කල් අපේ රටේ නීතිය වෙලා තිබුණේ නගර සීමාවල උපරිම වේග සීමාව පැයට කිලෝමීටර 56ක් සහ ඉන් බැහැර උපරිම වේග සීමාව පැයට කිලෝමීටර 72ක් වශයෙනුයි. 1995 දී මේ වේග සීමා පිළිවෙළින් පැයට කිලෝමීටර 70ක් සහ 50ක් වශයෙන් සංශෝධනය කළා. නමුත් පැයට කිලෝමීටර 50 සහ 70 කියන වේග සීමා අනුගමනය කළ යුතු තැන් මොනවාද කියන එක පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගන්න පාරේ ගමන් ගන්නා මඟීන්ට අවස්ථාව උදා වෙලා තිබුණේ නැහැ. ඒ නිසා විශේෂයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයටත්, මහාමාර්ග අමාත්‍යාංශයටත් සිද්ධ වුණා අපේ රටේ මාර්ග පද්ධතියේ ඒ වේග සීමා පැහැදිලිව ලකුණු කරලා ඒ පිළිබඳව ගැසට් පත්‍රයේ පළ කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කිලෝමීටර 12,020ක් තිබෙනවා. ඒ කිලෝමීටර 12,020 තුළ තමයි අද මේ වේග සීමා නීතිගත කරන්නේ. ප්‍රාදේශීය සභා මාර්ගවල සහ පළාත් සභා මාර්ගවල වේග සීමා අද ඉදිරිපත් කරන නියෝගවලට අදාළ ගැසට් පත්‍රය තුළ සඳහන් වෙලා නැහැ.

අද ඉදිරිපත් කරන ගැසට් නිවේදන දෙක මඟින් සිද්ධ වන්නේ, අපේ රටේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කිලෝමීටර් 12,020 තුළ පැයට කිලෝමීටර් 50 වේගයට යා යුතු දුර ප්‍රමාණයන් කොපමණද, ප්‍රදේශ මොනවාද, පැයට කිලෝමීටර් 70 වේගයට යා හැකි සීමාවන් මොනවාද, ඒ දුර ප්‍රමාණයන් කොපමණද කියන එක පළ කිරීමයි. ලැබී තිබෙන තොරතුරු අනුව මේ මාර්ග කිලෝමීටර් 12,020න් කිලෝමීටර් 1,722ක ඒ සීමාව දක්වා තිබෙනවා. විශේෂයෙන්ම පැයට කිලෝමීටර් 50ක වේගයෙන්

තමයි ඒ සීමාවන් තුළ යන්න පුළුවන් වන්නේ. ඒ සීමාවන් තුළ පැයට කිලෝමීටර් 40ක වේගයෙන් ත්‍රිරෝද රථ සහ අනිකුත් සැහැල්ලු වාහන යා යුතුයි. ඒ සංශෝධනය තමයි මෙම ගැසට් නිවේදන දෙක තුළින් අනිවාර්යයෙන්ම සිද්ධ වන්නේ. මෙය තවත් වර්ධනය විය යුතුයි. අද ඉදිරිපත් කරන ලද ගැසට් නිවේදන දෙක මඟින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවල විතරයි, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

මට විනාඩි 13ක් තිබෙනවා.

අපි මේ ආකාරයෙන් යෝජනා කරන්නේ, විශේෂයෙන්ම පළාත් සභාවට අයත් මාර්ගවලත්, ඒ වාගේම කොළඹ නගර සීමාවට අයත්, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවලත් මේ කටයුත්ත සිද්ධ වෙලා නැති නිසායි. එම නිසා සමස්තයක් වශයෙන් අද අපේ රටේ ඇති වී තිබෙන මාර්ග සංවර්ධනයේ දියුණුවත් එක්ක මේ වැඩ පිළිවෙළ අනිවාර්යයෙන්ම කාලෝචිත අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම රිය අනතුරු ගැන බලන්න. සියයට 100ක්ම රිය අනතුරු පාලනය කරපු කිසිදු රටක් ලෝකයේ නැහැ. නමුත් රටක් විධියට අපට සතුටු විය හැකියි. 2004 - 2005 අවුරුදුවල අපේ රටේ වාහන ලක්ෂ 21යි තිබුණේ. අද ලක්ෂ 40කට ආසන්න වාහන ප්‍රමාණයක් තිබෙනවා. 2004 - 2005 අවුරුදුවල 2000කට ආසන්න පිරිසක් තමයි ජීවිතක්ෂයට පත් වුණේ. අද වන විට 2,300කට, 2,400කට ආසන්න පිරිසක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. එම නිසා වාහනවල වැඩි වීමත්, ජනගහනයේ වර්ධනයත් එක්ක බලන කොට මොනම ආකාරයකින්වත් අසීමිත ලෙස රිය අනතුරු සංඛ්‍යාවේ වැඩි වීමක් සිද්ධ වෙලා නැහැ. නමුත් මේ තත්ත්වයත් පාලනය කළ යුතුයි. එම නිසා තමයි මෝටර් වාහන පනතට 2009 රෙගුලාසි තුළින් නව සංශෝධන ගෙනැවිත්, විශේෂයෙන්ම රියැදුරු බලපත්‍ර නව ක්‍රමයකට හඳුන්වා දීලා, දුම් සහතික ක්‍රමය හඳුන්වා දීලා, වේග සීමාවන් හඳුන්වා දීලා වග කිව යුතු රජයක් විධියට ඒ සියලුම කටයුතු සිදු කරනු ලබන්නේ ජීවිත පිළිබඳව වග කීමක් තිබෙන නිසා රිය අනතුරු පාලනය කිරීම සඳහායි. එම නිසා විශේෂයෙන්ම අද අධිවේගී මාර්ග -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඔබතුමාට විනාඩි 8යි තිබුණේ. දැන් විනාඩි 10ක් ගත වෙලා තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

විශේෂයෙන්ම අද මේ ඉදිරිපත් කර තිබෙන නියෝග තුළින් වාගේම ඉදිරියේදී අනික් සියලුම මාර්ග පද්ධතිවලත් අවශ්‍ය ස්ථානවල මේ ආකාරයෙන් වේග සීමා ලකුණු කිරීමේ කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඊළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 3.28]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම රටේ මාර්ග නීති සම්බන්ධයෙන් අද ගෙනෙන මේ වේග සීමා ලකුණු කිරීම පිළිබඳව සංශෝධනයන් වැදගත් වන්නේ, රටේ තවත් සමාජ අර්බුදයක් බවට පත් වෙලා තිබෙන රිය අනතුරු මේ හරහා වළක්වන්න පුළුවන් නම් ඒවා වැළැක්වීමේ පරමාර්ථයෙනුයි. මා හිතන හැටියට ඒ යහපත් චේතනාවෙන් තමයි ඔබතුමන්ලාත් මේ කටයුත්ත සිද්ධ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දේවල් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න යන කොට මුහුණ දෙන ගැටලු ගණනාවක් තිබෙනවා. මේ හා බැඳුණු අනිකුත් ක්‍රියාවලියක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ප්‍රායෝගික උදාහරණයක් ගත්තොත්, ඔබතුමන්ලා දැන් යෝජනා කරනවා, පැයට කිලෝමීටර් 50, පැයට කිලෝමීටර් 70 අතර වේග සීමාව සලකුණු කරන්න. අදාළ මාර්ගවල මෝටර් රථ වාහනවලට හා මෝටර් කෝච් රථ වාහනවලටත් ඒ සීමාව අයිතියි. නමුත් දැන් ඇත්තටම වන දේ තමයි, මේ සම්බන්ධයෙන් පොලීසියේ නිලධාරි මහත්වරුන්ට දැනුම් දුන්නාට පස්සේ - [බාධා කිරීමක්] ඔව්, නගරවල.

ඒ සීමාව ලකුණු කිරීම, ක්‍රියාත්මක කිරීම, ඒ අනුව මාර්ග නීතිය රකිනවාද නැද්ද කියන එක තීන්දු කිරීමේ ඒ බලය පැවරෙන්නේ පොලීසියට නේ. පොලීසිය තමයි මෙහි නීත්‍යානුකූල පැත්ත ක්‍රියාවට නඟන්නේ. මේ නීතිය වාගේම තවත් මාර්ග නීති ගණනාවක් දැනටත් රටේ තිබෙනවා. හැබැයි, රිය අනතුරක් නිසා යම් කෙනෙක් මිය ගිහින්, ඒ පිළිබඳ පරීක්ෂණය පවත්වාගෙන යනකොට, සමහර අවස්ථාවල ඒ අනතුර සිදු කළ කන්ටේනරයක් වැනි විශාල බර වාහනයක් පදවා තිබෙන්නේ එම වාහනයේ driver නොවෙයි. Driver නිදාගෙන ඉන්නකොට එම වාහනය පදවා තිබෙන්නේ එහි cleaner විසින්. වාහනයේ සිටින අත් උදවු දෙන පුද්ගලයා තමයි වාහනය පදවා තිබෙන්නේ. ඔහුට licence නැහැ, එක්කෝ බීමතින් සිටි පුද්ගලයෙක්.

ඊයේ පෙරේදා දිනක "මවුබිම" පුවත් පතේ අම්ලා නැමැති මාධ්‍යවේදිනිය රිය අනතුරකට පත් වුණා. ඇත්තටම ඒක රිය අනතුරකට වඩා ඇයව ඝාතනය කිරීමක් වෙනවා. මොකද, ඇය ඝාතනයට ලක් වන්නේ, පළපුරුද්දක් නැති, licence නැති, එම වාහනයේ රියදුරු නොවන, සුදුසුකම් නැති වෙනත් පුද්ගලයකු විසින් බීමතින් එම රිය පැදවීම නිසායි. අවසානයේ තාප්පයත් කඩාගෙන ඒ මනුෂ්‍යයාව යට කරගෙන ගියා. බේරෙන්නවත් විධියක් නැහැ. එවැනි සිදුවීම් අනන්ත සිදු වනවා. එතකොට එවැනි දේවල් පාලනය කරන්නේ කොහොමද?

ඊළඟට, මේක පොලීසියට, පොලිස් නිලධාරි මහත්වරුන්ට තවත් ආදායම් මාර්ගයක්. මොකද, මේකෙන් සිදු වන දෙයක් තමයි දඩ ක්‍රියාවලිය වැඩි වන එක. ඊළඟට තව ප්‍රශ්නයක් තිබෙනවා. අපේ පී. දයාරත්න ඇමතිතුමාත් කිව්වා, 2011 අවුරුද්දේ විතරක් 5,25,000ක් අලුතෙන් වාහන පාරට දමලා තිබෙනවා කියලා. දැන් වාහනයක් පාවිච්චි කරන කෙනෙක් මේ ප්‍රශ්නය දකින්නේ කොහොමද? යම් කෙනෙක් වාහනයක් ගන්නේ, ඒ කෙනාට ඉතාම හදිසි තරගකාරී ජීවිතයක් තිබෙන නිසායි. උදේ පාන්දර නැඟිටපු වෙලාවේ ඉඳලා යුද්ධයක් වාගෙයි. ළමයා ඉස්කෝලේට දමන්න ඕනෑ, ඊළඟට තමන් රාජකාරි කරන තැනට යන්න ඕනෑ. ඒ ඔක්කොම කරන්න පාරට වාහනය දැම්මාම හතළිහක වේගයට යන්න සිදු වෙනවා නම්; පනහක වේගයට යන්න සිදු වෙනවා නම්, සාමාන්‍ය භාෂාවෙන් කියන්නේ "අපි වාහනය ගත්තේ මේකට නොවෙයි." කියලා යි ගරු ඇමතිතුමනි. මොකද, ලොකු වාහන තද බදයක් තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එතකොට මේ වේග සීමාව ඇතුළේ මෙන්න මේ වාහන තද බදය ඉවර කරන්න අපට පොදු වැඩ පිළිවෙළක් තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උදේ පාසල් වේලාවේම තමයි නගරවල මේ විශාල කන්ටේනර් ධාවනය වන්නේ. ඒ කන්ටේනර් එකට නගරයේ ධාවනය කරන්න වෙනත් වෙලාවක් නැහැ. කන්ටේනරය නගරයේ ධාවනය වන්නෙත් ළමයින් පාසල් යන වෙලාවේමයි. එතකොට ලොකු කන්ටේනරයක් පාර හරහා දමා ගත්තාට පසුව අන්න අර ළමයා පාසලට යන වෙලාව, අනෙක් අය රැකියාවලට යන වෙලාව ප්‍රමාද වෙනවා. මොකද, තව ලක්ෂ ගණනක් මුදල් දීලා ගත්තු වාහනත්, කෝටි ගණනක් මුදල් දීලා ගත්තු වාහනයත් අර කන්ටේනරය පිටුපසින් යන්නට ඕනෑ. ඊට පස්සේ ඒ කන්ටේනරය මහහැරුණු ගමන්ම ළමයාව උදේ හතහමාරට පාසලට බස්සවන්න, නැත්නම් තමන්ට වෙලාවට රාජකාරි ස්ථානයට යන්න තරගෙට වාහනය පදවන්න සිදු වෙනවා. අවසානයේ ඉතින් රිය අනතුරු සිදු වනවා. එතකොට මේ වේග සීමාව විතරක් නොවෙයි ප්‍රශ්නය වන්නේ. වේග සීමාව කඩාගෙන යන්න සිදු වන පරිසරයක් තිබෙනවා; වටපිටාවක් තිබෙනවා. ඒක ඇතුළේ වාහන සම්බන්ධයෙන්වත්, අන්න ඒ ක්‍රියාවලිය සම්බන්ධයෙන්වත් විනයක් නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා ඔබතුමන්ලාට මේකත් එක්ක තව සංශෝධන ගෙනෙන්නට තිබෙනවා කියලා මා විශ්වාස කරනවා.

මෙන්න මේ නියමිත වෙලාවල් අතරේ, විශේෂයෙන් නගරයක නම් උදේ හතහමාර වනකොට නගරයට එන්න පුළුවන් වාහන මොනවාද? කාර්යාල වේලාව තුළ දී විතරක් නගරයට එන්න පුළුවන් වාහන මොනවාද? මොකද, අපි දන්නවා කන්ටේනරයක් වාගේ දෙයක් උදේ පාන්දර හතහමාරට, අටහමාරට මේ නගරය මධ්‍යයේ යන්න ඕනෑ නැති බව. තෙල් බවුසරය ඒ වෙලාවට යන්න ඕනෑ නැහැ. ඒවා සවස 6.00න් පසුව මධ්‍යම රාත්‍රිය තුළ, වාහන තද බදය නැති වෙලාවල ධාවනය කරවන්න පුළුවන්කම තිබෙනවා.

එවැනි කළමනාකරණයක් නැතිව මේ නීති පැනවූවාට පසුව සිදු වන දෙය තමයි, එක පැත්තකින් මේ නීති කඩන ප්‍රමාණය වැඩි වීම. මේ නීති කඩන නිසා පගාව ගන්න ප්‍රමාණයක් වැඩි වනවා. ඒක නිසා මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ නැහැ. අපි මෙවැනි සිද්ධීන් අනන්තවත් දැකලා තිබෙනවා. පෞද්ගලිකව ගත්තොත් අපටත් ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ කියන්නේ මේ නීතිය බලපාන්නේ නැති අය ලංකාවේ සිටිනවා. මේ වේග සීමා නීතිය බලපාන්නේ නැති අය අනන්ත සිටිනවා. පොලිස් නිලධාරි මහත්වරුනුත් අර වේග සීමාව ලකුණු කරන ලයිට් එක අල්ලලා තමයි වාහනය නවත්වන්නේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලාටත් එහෙමයි. [බාධා කිරීමක්] ඒක තමයි. වාහනය නවත්වලා ඉවර වෙලා "ආ, කොහේද යන්නේ?" කියලා යි අහන්නේ. එහෙම නොවෙයිද කියන්න කෝ. [බාධා කිරීමක්] ඒක තමයි. අපිත් වාහනය නවත්වනවා. "කොහේද යන්නේ? කොහොමද යන්නේ?" කියලා දුක සැප අහන්නේ. ඒ අයට මාරු වීමක් හදා ගන්න ගියත් තමන්ගේ දුක් ගැනවිලි තමයි කියන්නේ. අපට නම් කියන්නේ දුක් ගැනවිලි. [බාධා කිරීමක්] ආණ්ඩුව වැඩක් නැහැ කියලා කියනවා, ජීවත් වෙන්න අමාරුයි කියලා කියනවා. බඩු මිල වැඩියි කියනවා.

ඕවා තමයි කියන්නේ. "වියදම සැරයිනේ මහත්තයෝ" කියනවා. "මොකද වෙන්නේ" කියා අහනවා. එතකොට අහන්නේ අවශ්‍ය ප්‍රශ්නය නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තව විනාඩියකින් කථාව අවසන් කරනවා. [බාධා කිරීම්] ඔව්."ශිරානි බණ්ඩාරනායක මහත්මියට මොකද වුණේ "කියා අහනවා. "ශ්‍රේෂ්ඨාධිකරණයට මොකද වෙන්නේ" කියා අහනවා. ඒවා තමයි අහන්නේ. අහලා යන්න කියනවා. [බාධා කිරීම්] එම නිසා ඇත්තටම නීතියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එක අතකින් නීතියක් නැති රටේ නීතියක් ක්‍රියාත්මක වන්නට විධියක් නැහැ තමයි. [බාධා කිරීම්]

විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම නිසා මේ වේග සීමා පිළිබඳව නියෝග ගරු වෙල්ගම අමාත්‍යතුමා ඉදිරිපත් කරනකොට මට හිනා ගියා. මොකද හේතුව, එතුමාම තමයි කිව්වේ, "අධිවේගී මාර්ගයේ මට සීමාවක් නැහැ"යි කියා. ප්‍රවාහන අමාත්‍යතුමා හැටියට ගරු වෙල්ගම ඇමතිතුමා තමයි කිව්වේ, එතුමාට වේග සීමා අදාළ නැහැ කියා. වේග සීමා අදාළ නැති ඇමතිතුමා ම වේග සීමා නියෝග ගේනවා. ප්‍රායෝගිකව මේක ක්‍රියාවට නඟන්න නම් ඇත්තටම ඇමතිතුමනි, මීට වඩා වැදගත් ක්‍රියාවලියක් සිද්ධ වෙන්නට ඕනෑ. සමස්ත ප්‍රවාහන අර්බුදයක් තිබෙනවා. මාර්ග නීතියට සමස්ත අර්බුදයක් තිබෙනවා. ඒක විනය. ඒක නීතියෙන් විතරක් රකින්න බැහැ කියන එක අවධාරණය කරමින් විශේෂයෙන් මේකෙන් පීඩාවට පත් වන අය ගැනත් සලකා බලන්නය කියා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ඊළඟට ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා.

මේ අවස්ථාවේදී ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යොජනා කරන්න.

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, " මේ අවස්ථාවේදී ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව*** **ගරු තලතා අතුකෝරල මහත්මිය** ***මූලාසනයෙන් ඉවත් වුයෙන්,*** **ගරු ජානක බණ්ඩාර මහතා** ***මූලාසනාරූඪ විය***

*அதன் பிறகு,* மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல அவர்கள் *அக்கிராசனத்திலிருந்து அகலவே,* மாண்புமிகு ஜானக பண்டார அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) THALATHA ATUKORALE *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

[අ.භා. 3.36]

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝග සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී එයට වචන ස්වල්පයක් එකතු කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. අද මේ රටේ මාර්ග පද්ධතිය ගැන කථා කරන විට මේ රටේ සිදු වන දැවැන්ත සංවර්ධන ක්‍රියාවලිය තුළ වේග සීමාව ගැන විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ. අප දන්නවා. මෙසේ වේග සීමාවන් නොමැති නිසා මේ රටට අහිමි වුණු ජීවිත සහ දේපළවල සීමාවක් නොමැති බව. නගරයක් හැටියට වේග සීමාවන් සටහන් කර තිබෙන ආකාරයට, නියෝගවල උප ලේඛනයේ සඳහන් "ඉදි කරන ලද ප්‍රදේශ " වශයෙන් ඇති මාර්ග ඔස්සේ ධාවනය වන මෝටර් වාහන සම්බන්ධයෙන් අදාළ වන්නාවූ වේග සීමාව පැයට කිලෝමීටර් 50 ක් වෙනවා. ඉන් ඔබ්බට - " ඉදි නොකළ ප්‍රදේශ" වශයෙන් හඳුන්වන මාර්ග කොටස්වල වාහන සඳහා පැයට කිලෝමීටර් 60ක සීමාව දක්වා තිබෙනවා. ඒ වගේම ත්‍රී වීලර් රථ, ඉඩම් වාහන, මෝටර් ට්‍රයිසිකල්, වෑන් රථ සහ විශේෂ කාර්ය වාහන සම්බන්ධයෙන් වේග සීමාව පැයට කිලෝමීටර් 40ක් වෙනවා. මේ විධියට වේග සීමාව යොදවා යම්කිසි මට්ටමකට ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කිරීම ඉතාමත්ම කාලෝචිතය, වැදගත්ය කියා අප හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වේග සීමාව නිසා අද රටේ ආර්ථිකයට බල පෑ කරුණු කිහිපයක් මම පැහැදිලි කරන්නට ඕනෑ. මේ අනතුරු දායක තත්ත්වය උඩ අද රෝහල් පද්ධතියට විශාල බලපෑමක් ඇවිත් තිබෙනවා. ඒ වාගේම රක්ෂණ ව්‍යාපාරයට ආර්ථිකයේ විශාල ගැටලුවක් මතු වී තිබෙනවා. ඒ වාගේම වාහන අලුත්වැඩියා කිරීමේ අංශය ගත්තාම මේ සඳහා විදේශ විනිමය විශාල මුදලක් යොමු කරන්නට වෙලා තිබෙනවා. එම නිසා වේග සීමා සටහන් කිරීමේදී මහා මාර්ගවල පමණක් එසේ නැත්නම් නගරවල පමණක්, ප්‍රසිද්ධ ස්ථානවල පමණක්, වේග සීමා නොකර, පළාත් මට්ටමෙන් ප්‍රාදේශීය මාර්ගවලට පවා මේ වේග සීමාවන් පැනවුහොත් විශාල හානිදායක තත්ත්වය අපට අවම කර ගන්නට පුළුවන් වෙනවාය කියන එකයි මා දකින්නේ.

අද අපේ පළාත්වල මාර්ග කාපට් කර තිබෙනවා. එම නිසා මාර්ග දියුණුවක් ඇති වී තිබෙනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් විශාල ආයෝජකයන් පිරිසක් මේ මාර්ග පද්ධතියත් එක්ක- ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන ගමනාගමනයත් එක්ක- සම්බන්ධ වෙලා කටයුතු කරනවා. එය අපේ ධීවර කර්මාන්තයට විශාල ශක්තියක් වෙලා තිබෙනවා. අපේ පාසල් පද්ධතිය දියුණු වෙලා තිබෙනවා කෘෂිකර්මාන්ත, ව්‍යාපාර, සංචාරක ආදි වශයෙන් ගත්තාම ප්‍රවාහනයයි, මහා මාර්ගයයි ඒකාබද්ධව කටයුතු කරනවා. ඒ වාගේම මේ සෑම අංශයක්ම පවතින්නේ මේ වේග සීමාව තුළයි.

මේ කාල පරිච්ඡේදය තුළ වාහන ලක්ෂ 50කට ආසන්න ප්‍රමාණයක් ලියා පදිංචි වෙලා එයින් ලක්ෂ 30කට එහා ප්‍රමාණයක් අද මේ රටේ ප්‍රවාහන කටයුතුවල යෙදෙනවා. පසු ගිය කාල පරිච්ඡේදය තුළ මේ රටේ ජනතාවගේ ඉල්ලුම අනුව වාහන විශාල ප්‍රමාණයක් ආනයනය කළා. මේ සෑම වාහනයක්ම ප්‍රවාහනයට යොදවනවා. ඒ වාගේම අද තුන් දෙනෙක් සිටින සමහර පවුල්වලට වාහන පහක් තිබෙනවා. එවැනි මට්ටමකුත් තිබෙනවා.

අපි රථවාහන අනතුරු අරගෙන බලමු. අපි දන්නවා, 2009 වර්ෂයේ රථවාහන අනතුරු නිසා 2,399ක් මරණයට පත් වී තිබෙනවා, 2010 වර්ෂයේ 2,630ක් මරණයට පත් වී තිබෙනවා කියා. 2011, 2012 වසරවලදීත් එවැනිම ප්‍රමාණයක් මරණයට පත් වෙලා තිබෙනවා. මේ කාලය තුළ වාහන අනතුරු 50,000කට ආසන්න ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයකුයි තිබෙන්නේ.

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කන්ටේනර් සම්බන්ධව ඉල්ලීමක් කරන්න තිබෙනවා. කන්ටේනර් මහා මාර්ගයට දමන වෙලාවක් නියම කළ යුතුයි. එසේ නොකළොත් ආර්ථික වශයෙනුත් පාඩුවක් සිදු වෙනවා. දවල් කාලයේ කන්ටේනර් එකක් මහ මඟ කඩා ගෙන වැටුණොත් දැඩි මාර්ග තදබදයක් ඇති වෙනවා. දිග වාහන පෝලිමක් ඇති වෙනවා. ඒ හේතුවෙන් රැකියාවලට යන අයට, තමන්ගේ ව්‍යාපාර කටයුතුවලට යන අයට නොයෙකුත් බාධා ඇති වෙනවා. මේ නිසා සමස්ත ආර්ථිකයම බිඳ වැටෙනවා. කන්ටේනර් ධාවනය, ඒ වාගේ බර වාහන ධාවනය, බඩු පැටවීම බඩු බෑම යන මේ සෑම දෙයක් ගැනම අධ්‍යයනය කරන්න ඕනෑ. ඒ කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. මේක මෝටර් රථ දෙපාර්තමේන්තුවට තනියම කරන්න පුළුවන්කමක් නැහැ. වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය ඒ වාගේම මහා මාර්ග අමාත්‍යාංශය සම්බන්ධ කර ගන්න වෙනවා. වේග සීමාවන් දමනවා වාගේම මේ හැම පැත්තක්ම එකතු කර ගෙන හොඳ වැඩ පිළිවෙළක් හැදුවොත් අපට මේ අනතුරු වළක්වා ගන්න පුළුවන්. කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ අඩුම තරමේ දවසකට දෙතුන් වතාවක් ගියොත් කන්ටේනර් දෙතුන් සියයකට වැඩි ප්‍රමාණයක් ගමන් කරන බව පෙනෙනවා. හැබැයි, එක පැත්තකින් ඒක රටේ ආර්ථිකයට විශාල ශක්තියක්. ඒ නිසා හැම පැත්තම තෝරා බේරා ගෙන මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත්.

පසු ගිය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබුණු සියලුම දේවල් වික්කා, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි. ප්‍රවාහන ක්ෂේත්‍රය කෑලිවලට කැඩුවා. පාරේ යන ගමන් CTB බස්වල කෑලි ගැලෙව්වා. ඒ දවස්වලත් වේග සීමාවන් තිබුණා. ඒවා නැති කර ගත්තා. සමහර වෙලාවට බස් එක හොරෙන් අරගෙන යනවා, ඒ වෙලාවට වේග සීමාවක් නැහැ. මිනිස්සු දෙතුන් දෙනා අරගෙන ගියා. සමහර විට ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ තෝරා ගෙනම අරගෙන ගියා. එහෙම යුගයක් තිබුණා.

එක්සත් ජාතික පක්ෂයත් ජනතා විමුක්ති පෙරමුණත් අපිත් ඔක්කොම එකතු වෙලා තමයි වේග සීමාව දමන්න මේ වැඩසටහන හැදුවේ. මම ඉදිරියෙන් ගියත් මෙතුමා පිටුපසින් ගියත් මේ වේග සීමාව ඉතා වැදගත් කියන එක මේ අවස්ථාවේ මතක් කරමින් මම නිහඬ වනවා.

[අ.භා. 3.43]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා වේග සීමාවන් සම්බන්ධයෙන් කථා කළා. සියලු පක්ෂ එකතු වෙලා රටේ උන්නතිය සඳහා, යහපත සඳහා

[ගරු සුජීව සේනසිංහ මහතා]

නීති අණපනත් ගෙනෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නැහැ. ඔබතුමාලා දන්නවා, අපේ පක්ෂය හොඳ දේවල්වලට හැම වෙලාවේම සහයෝගය දෙන පක්ෂයක් බව. විශේෂයෙන්ම 1948 ඉඳලාම එක්සත් ජාතික පක්ෂය නොයෙකුත් තීන්දු තීරණ ගත්තා. නායකයෝ අයින් කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂය මේ රටේ උන්නතියට, සංවර්ධනයට විශාල කාර්ය භාරයක් කළ පක්ෂයක්. එක්සත් ජාතික පක්ෂය කළ දේවල් තමයි අද මේ රටේ ඉතුරු වෙලා තිබෙන්නේ. අපිට පින් සිද්ධ වෙන්න තමයි විවෘත ආර්ථිකය, පළාත් සභා ක්‍රමය, ජනාධිපති ක්‍රමය ආදී මේ සියලු දේවල් අද ඔබතුමන්ලා ඉදිරියට කර ගෙන යන්නේ.

වේග සීමාව සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නැහැ, ගරු ඇමතිතුමනි. වේග සීමාවල් දමලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන්ද කියන දේ සම්බන්ධයෙන් අපට ගැටලුවක් තිබෙනවා. මේ රටේ වාහන සම්බන්ධයෙන් තිබෙන නීතිරීති ඒ වාගේම රියදුරන් සම්බන්ධයෙන් තිබෙන නීතිරීති ක්‍රියාත්මක කරන්නේ පොලීසිය සහ ප්‍රවාහන අමාත්‍යාංශයයි. බොහෝ වෙලාවට පොලීසිය තමයි මේ සම්බන්ධයෙන් වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ.

ගරු ඇමතිතුමනි, මේ පනවන නීති පොලීසිය සියයට සියයක්ම ක්‍රියාත්මක කරනවාද කියන එක සම්බන්ධයෙනුත් අපට ගැටලුවක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, බොහෝ විට මේ අනතුරුවලට හේතු වන්නේ වේගය නොව වාහන එළවන ආකාරය බව. ඒ වාගේම පාරවල් පිහිටලා තිබෙන ආකාරයත් මේ සඳහා බලපානවා. සිංගප්පූරුවේ මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර තිබෙනවා. ජපානයත් මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර තිබෙනවා. පාරවල් හරියට තිබෙනවා නම්, රියදුරන් හරියාකාරව විනීතව රිය පදවනවා නම් රිය අනතුරු සියයට 70ක්, 80ක් අඩු කර ගන්න පුළුවන් බව ඔප්පු වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මේ රිය අනතුරු අවම කර ගන්න ලංකාවේ නීති-රීති, සිරිත්-විරිත් රාශියක් තිබෙන බව. රියැදුරන් මෙන්ම පදික වේදිකාවේ ගමන් කරන සියලු දෙනාත් - සියයට 90ක් වැනි ප්‍රමාණයක්- අද මේ නීතිරීති පිළිපදින්නේ නැහැ. අපේ ගරු ඇමතිතුමා දන්නවාද දන්නේ නැහැ, පදික වේදිකාවේ ගමන් කරන අය සහ රියදුරන් අනුගමනය කළ යුතු රීති පද්ධතිය දක්වමින් 1987 දෙසැම්බර් 29වැනි දා ගැසට් නිවේදනයක් නිකුත් කළ බව. කාටත් තේරුම් ගත හැකි වන පරිදි මම එය සකස් කර තිබෙනවා. අද රියදුරන්ට, පාසල් දරුවන්ට මෙන්ම අවුරුදු 18 සම්පූර්ණ වෙලා රියදුරු බලපත්‍රයක් ගන්න අයට මේ නීතිරීති, සිරිත් විරිත් සම්බන්ධයෙන් කිසිම දැනීමක් නැහැ. ඒ ගැන ඔවුන්ගේ තැකීමක් නැහැ. ගරු ඇමතිතුමනි, රූපවාහිනිය, ITN නාලිකාව සහ පුවත් පත් මඟින් ඒ පුද්ගලයන්ට මේ සම්බන්ධව දැනුමක් ලබා දෙන්න පුළුවන් නම් ඉතාම හොඳයි. විශේෂයෙන්ම ඔවුන් අඳින ඇඳුම, පාරේ ගමන් කරන ආකාරය, පාරේ තෙතමනය තිබෙන අවස්ථාවකදී රිය පදවන ආකාරය ආදිය සම්බන්ධයෙන් අපේ රියදුරන්ට හරි දැනීමක් නැහැ ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

කොළඹ අවට ප්‍රදේශවල දැන් one-way traffic ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා. ගරු ඇමතිතුමනි, මේ traffic ක්‍රමය තුළ පවා රිය පදවන ආකාරය බොහෝ රියදුරන් දන්නේ නැහැ. එක track එකක යනවා. වංගුව පහු වෙන කොට තව track එකකට මාරු කරනවා. අපේ ඇමතිතුමා වාගේ දිගටම එක track එකක යන්න ඔවුන් දන්නේ නැහැ. මෙතුමා නම් දන්නවා එක track එකක යන්න. ඉඳලා හිටලා එහෙන් මෙහෙන් track මාරු කළාට සාමාන්‍යයෙන් මෙතුමා අනික් tracks ටික ඔක්කොම දන්නවා. ගරු ඇමතිතුමනි, මේක අපි කියලා දෙන්න ඕනෑ. රූපවාහිනියෙන් ඔවුන් දැනුවත් කරන්න ඕනෑ. පිට රටවල මේ මාර්ගවල ගමන් කරන්නේ කොහොමද? එක මාවතක ගමන් කරනවා නම් වංගුවක් ගත්තාට පස්සේ ඒ track එක මාරු කරන්න බැහැ. මෙවැනි බොහෝ නීති රීති තිබෙනවා. ඒ පිළිබඳ විස්තර කරන්න මට වෙලාව නැති නිසා මම ඒ ලේඛනය සභාගත කරන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාසල් දරුවන් පාරේ ගමන් කරන්න ඕනෑ කොහොමද, පාරවල් සකස් වෙන්න ඕනෑ කොහොමද, පදික වේදිකාව සකස් වෙන්න ඕනෑ කොහොමද කියලා මේකේ සඳහන් කර තිබෙනවා. මාර්ග නීති ඇතුළත් ඒ විස්තරය මම **සභාගත*** කරනවා.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, වේගය සම්බන්ධයෙන් රීති පනවන ගමන්ම මෙන්න මේ කාරණය ගැනත් අපේ අවධානය යොමු විය යුතුයි. අපේ රටේ රථ වාහන පොලීසිය එය ක්‍රියාත්මක කරන ආකාරයේ පොඩි වැරැද්දක් තිබෙනවා. හොරා පොලිස් වාගේ හැංගිලා ඉඳලා තමයි වාහනයක් එන කොට මේ පොලිස් නිලධාරින් පාරට පනින්නේ. ඒක දකින රියැදුරා භය වෙලා ඉස්සරහ වාහනයේ හප්පා ගන්නවා. පොලීසිය දැක්ක ගමන් ඔහු බය වෙනවා. යකා ගහනවා වාගේ නේ හිටි ගමන් පාරට පනින්නේ. ගරු ඇමතිතුමනි, පිට රටවල නම් පොලීසිය ක්‍රියාත්මක වන්නේ පේන්න ඉඳලායි. එහෙම නැත්නම් වේගය සම්බන්ධයෙන් අසවල් ගැන කැමරා එකක් තිබෙනවාය කියලා දිගටම පුවරු මඟින් දන්වා තිබෙනවා. එහෙම දන්වන්නේ ඒ සීමාව තුළ රියැදුරන්ගේ වේගය අඩු කරන්නයි. නැතිව හොරෙන් පැනලා අල්ලන්න නොවෙයි; භයියෙන් යන මනුස්සයා හොරෙන් පැනලා අල්ලන්න නොවෙයි. එංගලන්තය, ඇමෙරිකාව, සිංගප්පූරුව වැනි දියුණු රටවල පොලීසියේ මහත්වරු පාරට එන්නේ තදබදයක් තිබෙන විට ඒ රියැදුරන්ගේ වේගය අඩු කරන්නයි. ඒ පොලීසියේ රියැදුරු මහත්මයා හැතැප්ම දෙක තුනක් එක වේගයකට තමන්ගේ වාහනය ධාවනය කරගෙන යනවා.

එතකොට ඒ අවට කිලෝමීටර් දෙක තුනක් ඒ වේග සීමාවට එනවා. ලංකාවේ එහෙම දෙයක් දකින්න නැහැ. ගොඩක් වෙලාවට ඒ අය හැංගිලා ඉන්නවා. හැගිලා ඉඳලා යකා ගහනවා වාගේ එක පාරටම පාරට පනිනවා. ඔබතුමන්ලා මොකක් හරි නීතියක් ගෙනැත් මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, පොලීසිය පාවිච්චි කරන්න ඕනෑ ඒ වේගය වැඩි ස්ථානවල වේගය අවම කරන්නයි. ඒ වාගේම කැමරා සවි කරනවා නම් ඒ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කරන්න ඕනෑ. වාහනයට යන්න ඉඩ සලස්වලා හොරෙන් පනින එක නොවෙයි පොලීසිය විසින් කළ යුත්තේ. ඒ විධියට රිය අනතුරු වළක්වන්න බැහැ.

දුම් පරීක්ෂාව ගැන කථා කළා. දුම් පරීක්ෂාව සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න තිබෙනවා. අප කිව්වේ මේකෙන් පෞද්ගලික ආයතන විශාල ලෙස ලාභ ලබනවා කියලායි. කොම්පැනිකාරයෝ විශාල ලෙස ලාභ ලබනවා. එහෙම කරන්න එපා. මෙයින් ආණ්ඩුවට ආදායමක් ලබා ගන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම් ඒ අවශ්‍ය කටයුතු සූදානම් කරලා දූෂණය අවම කරලා ඔබතුමන්ලාට පුළුවන් ඒ දුම් පරීක්ෂාව ආණ්ඩුවේ යම් කිසි ආයතනයකින් කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට විනාඩි 11ක් තිබෙනවා නේ. ඒකත් කැපුවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ වෙලාවෙන් විනාඩි 4ක් ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා විසින් ලබා ගෙන තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට කියන්නේ නැතුව?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය හොරෙන් පනිනවා වාගේ මාගේ වේලාවත් හොරෙන් අරගෙන තිබෙනවා. කමක් නැහැ.

කෙසේ වෙතත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් RMV එක සම්බන්ධයෙන් වචනයක් කියන්න ඕනෑ. අමාත්‍යතුමා මේක අවධානයට ගන්න. බොහෝ වේලාවට රාජපක්ෂ මහත්තයාගේ නමක් සඳහන් නොකර, නැත්නම් වෙන යම් බල පුළුවන්කාරකමක් පෙන්වන්නේ නැතුව වැඩක් කර ගන්න අමාරු ස්ථානයක් මේ. හැබැයි සභාපතිතුමා හොඳයි. මෑත කාලයේදී හොඳ සභාපතිතුමෙක් පත් වෙලා තිබෙනවා. අපිට ගිහින් එතුමාට කථා කරන්න පුළුවන්. එතුමා දේශපාලනය පාවිච්චි කරන සභාපතිතුමෙක් නොවෙයි. හැබැයි අනෙක් උදවියගෙන් කිසිම වාහනයක් පගාවක් දෙන්නේ නැතුව පාස් කර ගන්න බැහැ. RMV එකේ සහකාර කොමසාරිස්වරු ඉන්නවා. මට තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබුණා. මම ඔවුන්ගේ නම් කියන්නේ නැහැ, ඒක සදාචාරාත්මක නොවන නිසා. හැබැයි, ඇමතිතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා. විශේෂයෙන්ම රුපියල් 20,000ක් 30,000ක් නොගෙවා RMV එකේ කිසිම වැඩක් කර ගන්න බැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට මේ තත්ත්වය යටතේ ඔබතුමන්ලා බලාපොරොත්තු වන නීතිය, ඔබතුමන්ලා බලාපොරොත්තු වන සංවර්ධනය රටේ ඇති වන්නේ නැහැ. අපි දන්නවා, මේ සිංගප්පූරුව නොවෙයි; එංගලන්තය නොවෙයි; ඇමෙරිකාව නොවෙයි; බටහිර රටක් නොවෙයි. අල්ලස් හා දූෂණ වෙන්න පුළුවන්. හැබැයි ඒවා අවම වෙන ආකාරයෙන්, සාධාරණ ආකාරයෙන් යම් වැඩක් අපට කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අවසන් කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අල්ලස් හා දූෂණ නැතිව සියයට 80ක් හෝ සියයට 70ක් කර ගන්න පුළුවන් නම් ඒකත් එකක්. හැබැයි අද සියයට දශමයක වැඩක්වත් පගාවක් නොදී කර ගන්න බැරි අවස්ථාවක් තිබෙනවා ගරු ඇමතිතුමනි. ඒ නිසා ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු විය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මේ ආයතනය කොහොමද ශුද්ධ කර ගන්නේ කියලා ඇමතිතුමාගේත් අවධානය යොමු කරලා තිබෙනවා. අමාරුයි. මම කියන්නේ සියලු නිලධාරින් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක කොටසක් සම්බන්ධයෙනුයි. මේ ආයතනය ඇතුළේ මාෆියාවක් තිබෙනවා. මේ මාෆියාව බිඳින්නේ නැතුව මේ මොන නීතිරීති ගෙනාවත්, පොලීසියේ අල්ලස් ගැනීම ඒ වාගේම මේ නිලධාරින් අල්ලස් ගැනීම ඔබතුමන්ලා නවත්වන්නේ නැතුව මේ වේග සීමා ගැන මොන නීති ගෙනාවත් ඒ කිසි දෙයක් බලපාන්නේ නැහැ. ඒ නිසා මෙය කථාවට පමණක් සීමා නොකොට ප්‍රවාහන ඇමතිතුමාත්, ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමාත් දෙදෙනාම උනන්දු වෙලා, මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වෙලාව හොරාගත් මන්ත්‍රීතුමාට කනගාටුව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.52]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
මූලාසනයේ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ විශේෂයෙන් මේ රටේ ඉතාම කාලීන වැදගත් අවශ්‍යතාවක් සම්බන්ධයෙන් වූ අණපනත්, නීතිරීති සම්බන්ධව මේ සභාව තුළ සාකච්ඡා කරන මේ වේලාවේ ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා.

මේ අවස්ථාවේදී මේ රටේ ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මුද්‍රිත මේ සෑම මාධ්‍යයකින්ම මම ඉල්ලන්න කැමැතියි, මේ පිළිබඳව වැඩි වැඩියෙන් සංවාදයේ යෙදෙන්න, ඔබ නියෝජනය කරන මාධ්‍ය තුළින් සංවාදයේ යෙදෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. මොකද, අද තිබෙන දත්ත සහ තොරතුරු අනුව සෑම තත්පර හයකට වරක්ම ලෝකයේ කොතැනක හෝ තැනක පුද්ගලයකු මාර්ග රිය අනතුරක් හේතුවෙන් අකාලයේ මිය යනවා. ඒ වාගේම එවැනි රිය අනතුරුවලින් දිනකට ලොව පුරා 3,500ක් දෙනා මිය යනවා; මිලියන ගණනක් තුවාල ලබනවා. දේපොළවලට සිදු වන අලාභ රුපියල් බිලියන ගණනක්. ලොව පුරා වසරකට ලක්ෂ 13ක් පමණ රිය අනතුරුවලින් මිය යනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නියෝජ්‍ය අමාත්‍යතුමනි, වැඩියෙන්ම රිය අනතුරු වන්නේ කොහේද?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
කටාර්වල. දෝහා කටාර්වල. ඒ සම්බන්ධව report එක මා ළඟ තිබෙනවා. මම හිතන්නේ රිය අනතුරුවලින් ලෝකයෙන් වැඩි ප්‍රමාණයක් එහි මිය යනවා. ඇමෙරිකාව සම්බන්ධයෙන් වාගේම ලෝකයේ දියුණු රටවලත් එලෙස මිය යනවා.

මේ සාකච්ඡාවේ කෙරුණු කරුණු කාරණා බලන කොට අපේ රට වේගයෙන් සංවර්ධනය කරා පිය මනින රටක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට දියුණු පාරවල් තිබුණේ නැති රටක්. සංවර්ධනය කරා යන ගමනේදී අපි කිලෝමීටර් ගණන් දුරට අධිවේගී මාර්ග අලුතින් හදලා තිබෙනවා. කොළඹ-මහනුවර අධිවේගී මාර්ගය, මහනුවර-යාපනය අධිවේගී මාර්ගය හදන්න සැලසුම්, feasibility reports සකස් කරමින් සිටින වේලාවක්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
යාපනය අධිවේගී මාර්ගයක් හැදෙන්නේ නැහැ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
හැදෙනවා. මම ඒක තමයි කියන්නේ. ඔබතුමන්ලා දකුණේ අධිවේගී මාර්ගයත් හැදෙන්නේ නැහැයි කියලා කිව්වා නේ මීට අවුරුදු දෙකකට විතර ඉස්සෙල්ලා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, -

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
මගේ වෙලාව ගන්න එපා ගරු මන්ත්‍රීතුමා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා වාඩි වෙන්න. නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාලය ලබා දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමා අවස්ථාව දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, එතුමා විරුද්ධ වනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
විශේෂයෙන් අද දකුණු අධිවේගී මාර්ගය පමණක් නොවෙයි, මේ රටේ උතුරු මාර්ගයත්, ඒ වාගේම මහනුවර මාර්ගයත් අධිවේගී මාර්ග ලෙස සකස් කරන්නට ඒ සඳහා සැලසුම් සකස් කරන වෙලාවක්. ඒ වාගේම එදා තිබුණු, ඒ,බී,සී,ඩී මාර්ග ලෙසට අරගෙන සංවර්ධනය කිරීම පැත්තකට තියලා මේ රටේ බොහෝ මාර්ග කාපට් කරලා සංවර්ධනය කරන වෙලාවක්; ගමේ පාරත් කාපට් කරන වෙලාවක්. මේ වාගේ වෙලාවක මහ ජනතාව විශේෂයෙන් පාසල් ශිෂ්‍යයෝ ඒ වාගේම තරුණ පිරිස රිය අනතුරුවලින් මිය යෑම අවාසනාවට කාරණයක්.

මේක ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ විහිදුණු, වඩාත් පැතිරුණු ක්‍රියාවලියක්.

විශේෂයෙන් අධික වේගය, handphones වාගේ දේවල් පාවිච්චි කරමින් වාහනය drive කිරීම නිසා රිය පාලනය කර ගන්නට නොහැකි වනවා. එවැනි කරුණු කාරණා රාශියක් රිය අනතුරු සම්බන්ධයෙන් බලපානවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට මේවා පාලනය කරන්න පාසල් මට්ටමේ ඉඳලා, -මේ අවස්ථාවේ පාසල් දරුවෝ ගැලරියේ ඉන්නවා- ක්‍රියාවලියක් අපි පටන් ගන්න ඕනෑ. ඒක අතිගරු ජනාධිපතිතුමාට පමණක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට හා ඇමතිතුමාට පමණක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ සඳහා අපි සියලුම මුද්‍රිත සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවලට ආරාධනය කරනවා. මේ වැදගත් මාතෘකාව සම්බන්ධයෙන් රටේ සංවාදයක් ඇති කරන්න කියලා අපි හැමෝටම කියනවා. සමහර විට රිය අනතුරු නිසා මිය යන ප්‍රමාණය ඩෙංගු රෝගයෙන් හෝ වෙනත් රෝග නිසා මැරෙන පිරිසට වඩා වැඩියි. ලෝකයේ රිය අනතුරුවලින් මැරෙන ප්‍රමාණය බැලුවාම කුමන හෝ හේතුවක් නිසා අපේ රට නවවැනි ස්ථානයේයි තිබෙන්නේ. දැන් ගණන් හදලා තිබෙන විධියට 2015 වන කොට අපේ රට පස්වන ස්ථානයට යනවා කියා උපකල්පනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ සංවර්ධිත රටවල්වල රිය අනතුරු නිසා මැරෙන ප්‍රමාණය හා බැලුවාම, ලෝකයේ දුප්පත් රටවල්වල -සංවර්ධනය වෙමින් පවතින රටවල්වල- මැරෙන ප්‍රමාණය හුඟක් වැඩියි. ඒ කියන්නේ කවදාකවත් වාහනයක් ගැනීමට හිතන්නවත් බැරි අය, වාහනයක අයිතියක් නැති අය මේ අනතුරුවලට ලක් වෙලා මිය යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාවලියේදී අපි වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කරනවා. එක පැත්තකින් රියැදුරු බලපත්‍රයේ -licence එකේ- ගුණාත්මකකම, වටිනාකම වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ කියන්නේ අලුත් තාක්ෂණයත් එක්ක, ලෝකයේ පිළිගත්ත නව ක්‍රමවේදයන් එක්ක, accidents අඩු කරන්න පුළුවන් විධියට රියැදුරු බලපත්‍රය ලබා දීම. දැන් අපේ තිබෙනවා "sleep, rest and drive" කියලා. නින්ද යාම නිසා, නින්ද නොමැතිකම නිසා රිය අනතුරු සිදු වීමෙන් විශාල වශයෙන් මිය යනවා අපි දැක තිබෙනවා. ඉතින් ඒ වාගේ දේවල්වලට අණ පනත් සකස් කළ යුතුයි කියා මා හිතනවා. සමහර වෙලාවට signboards බලන්නේ නැහැ. දැන් දුම්රිය අනතුරු දිහා බැලුවාම, signboard එක නොසලකා හැරීම නිසා ඒ අනතුරු සිද්ධ වෙලා තිබෙන බව පෙනෙනවා. ඔහු රියැදුරු බලපත්‍රය අරගෙන ගියාට කවදාවත් signboard එක දිහා බලලා නැහැ. එහෙම තත්ත්වයන් අපි දැකලා තිබෙනවා. ඒ නිසා මා හිතන්නේ අද වාගේ දවසකදී මේ වේග සීමාවන් ඇති කිරීම ඉතාම වැදගත් කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව විධියට මහා මාර්ගවල, නගරවල රාත්‍රී බඩු පැටවීම්, බඩු බෑම් -loading, unloading- කරනවා දැන් අපි දකිනවා. Containers ගමන් කරනවා. දැන් අපිට තිබෙන ගැටලුව තමයි, මේ සඳහා වූ මහා මාර්ග පද්ධතියක් අවශ්‍ය වෙලා තිබීම. අපි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් එක්ක තමයි මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා අද මේ ගෙනැවිත් තිබෙන අණපනත් තුළින් මේ රටේ ප්‍රවාහන පද්ධතියේ සංවර්ධනයක් ඇති කරන්න, රිය අනතුරුවලින් මිය යන ප්‍රමාණය අඩු කරලීම, ඒ වාගේම විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත ඉදිරි අවුරුදු 25ට මාර්ග ආරක්ෂක -road safety- වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළකට අපි යනවා. ඒකට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙන්න පුළුවන්, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙන්න පුළුවන්, වෙනත් අමාත්‍යාංශයක් වෙන්න පුළුවන්, අපි ඔක්කෝම එකතු වෙලා තමයි ඒ වගකීම ඉෂ්ට කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගෙනැවිත් තිබෙන අණපනත් තුළ, මේ වේග සීමාවන් ඇති කිරීමෙන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

එපමණක් නොව, මාර්ග සංවර්ධනයත් එක්ක මෙවැනි මරණ අනාගතයේදී පුළුවන් තරම් දුරට අඩු කරන්නත් අපි බලාපොරොත්තු වනවා. මේක නිහඬ මාරයෙක් හා සමානයි. ජනාධිපතිතුමා මේ බව ප්‍රකාශ කළා. ඒ තත්ත්වයෙන් මිය යන එක අඩු කරන්න නම්, අපි සංවර්ධනයත් එක්ක මේවා ඉතා හොඳින් තේරුම් බේරුම් කර ගෙන, මේ මාර්ග පහසුකම් වැඩි දියුණු

කරන්න ඕනෑ. Signboards වාගේ දේවල් වැඩි දියුණු කරලා ඒ කටයුත්ත කරන්න අපේ අමාත්‍යාංශයෙන් ගන්න ඕනෑ උපරිම වැඩ පිළිවෙළ අපි ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරනවා කියන එක මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන සියලුම නිලධාරින්ටත්, ගරු ඇමතිතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත් මා ස්තුතිවන්ත වන්ත වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

අද දින උදේ සම්මත කරන ලද යෝජනාව අනුව, අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2013 පෙබරවාරි මස 05වැනි අඟහරුවාදා රැස්වීමට නියමිතව තිබුණත්, අද දින පක්ෂ නායක රැස්වීමේදී ගන්නා ලද තීරණය අනුව මීළඟ පාර්ලිමේන්තුව 2013 පෙබරවාරි මස 06වැනි දා රැස්වීමට නියමිත බවට තීන්දු කළා.

'ඒ අනුව පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

" අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2013 පෙබරවාරි මස 06වැනි බදාදා අ. භා 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

සභාව කල් තැබීමේ යෝජනාව ගරු රන්ජන් රාමනායක මහතා.

## රිසානා නෆීක් මරණ දඬුවමට ලක් කිරීම
## றிஸானா நபீக் மரண தண்டனைக்காளானமை
## EXECUTION OF RIZANA NAFEEK

[අ. භා. 4.01]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂයයට අදාළ ඇමතිවරයා නැති බවයි පෙනෙන්නේ. ඒ කෙසේ වෙතත්, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "මුතූර්හි ඉපදුණු අවුරුදු 17ක පාසල් ශිෂ්‍යාවක් වූ රිසානා නෆීක් නැමති ශිෂ්‍යාව නොකළ වරදකට පසු ගිය 8වැනි දා මරා දමන ලදී.
>
> ඉදිරියේදී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා සුදුසු පියවරක් ගැනීමට සහ විදේශ ගතවන ශ්‍රමිකයන් දැනුවත් කිරීමටද පියවර ගන්නා ලෙස මම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය මදි නිසා මා මේ යෝජනාවට අදාළ කාරණය කථා කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසානා නෆීක් කියන මේ පාසල් ශිෂ්‍යාව 1988 පෙබරවාරි 4වැනි දින මුතූර්වලදී උපන් දැරියක්.

දැන් මේ සභා ගර්භයට විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා ආවා. බොහොම ස්තුතියි.

පසු ගිය 9වැනි දා හරියටම අරාබි වේලාවෙන් 9.35ට පෙර ඇයට මරණ දඬුවම ලබා දෙනු ලැබුවා; ම්ලේච්ඡ විධියට මරා දමනු ලැබුවා; ඉතාම දරුණු විධියට, අභිරහස් විධියට මරා දමනු ලැබුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇය සවුදි අරාබියට ගියේ 2005 වසරේදීයි. ඇය විදේශ ගත කිරීමේ කටයුත්ත මුල සිටම මුළුමනින්ම වංචා සහගතයි; from start to end වංචා සහගතයි. ඒ පාසල් ශිෂ්‍යාවගේ birth certificate එකේ උපන් දිනය විධියට තිබෙන්නේ 1988 පෙබරවාරි 4වැනි දායි. නමුත් Omar Travels කියන ඒ කූට ඒජන්සිය, බදූර්දීන් හා මුජර්දීන් තැරැව්කාරයන් දෙදෙනා, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය ඇතුළු සියලුම දෙනා එකතු වෙලා මේ පාසල් ශිෂ්‍යාවගේ උපන් දිනය වන 1988 පෙබරවාරි 4වැනි දා කියන එක 1982 පෙබරවාරි 4වැනි දා හැටියට වෙනස් කරලා ගෘහ සේවිකාවක් හැටියට සවුදි අරාබියට යැව්වා. එතැන ඉඳලාම මේ රජය කළේ, ප්‍රෝඩාවයි, වංචාවයි. මේ පාසල් ශිෂ්‍යාව පිළිබඳව 2010 දෙසැම්බර් 7වැනි දා මා මේ පාර්ලිමේන්තුවේදී කථා කරමින් අවශ්‍යාම ලියවිල්ලක් සභාගත කළා. 2010 දෙසැම්බර් 7වැනි දා මා කරපු කථාව හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. එහි මෙසේ තිබෙනවා:

> ඇත්තෙන්ම මාසයකට පමණ පෙර මම මූතූර්වලට ගිහින් රිසානා නෆීක් කියන දැරිවියගේ උප්පැන්න සහතිකය අර ගෙන ආවා. රිසානා නෆීක් අධ්‍යාපනය ලැබූ ඊ/ඉමාම් ෂාෆි විද්‍යාලයට ගිහිල්ලා විදුහල්පතිතුමාව හමු වෙලා ඇගේ ඇත්ත වයස සහිත, නියම වයස සහිත උප්පැන්න සහතිකය ලබා ගත්තා. මේ අවස්ථාවේදී මම එම උප්පැන්න සහතිකය **සභාගත*** කරනවා."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එය සභාගත කළේ 2010 දෙසැම්බර් 7වැනි දා. මේ සභාගත කරපු ලියැවිල්ල අද වෙන කොට අතුරුදහන් වෙලා; පාර්ලිමේන්තුවේ නැහැ. ඒ නිසා මගේ පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා. ඒ කාලය වන කොට ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේ තනතුරට පත් වෙලා බොහොම කෙටි කාලයයි. මා කිව්වා, පුළුවන් නම් සවුදියේ උසාවියට ගිහිල්ලා මේ අහිංසක දරුවාගේ නියම වයස සහිත මේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළොත් අපට බේරෙන්නට පුළුවන්, ඒ නිසා මේක අරගෙන යන්න කියලා. මා එහෙම කියලායි ඒ ලියැවිල්ල සභාගත කළේ. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සභාගත කරන ලියැවිලි අද පාර්ලිමේන්තුවේ නැහැ. මා අද පාර්ලිමේන්තුවේ Research Division එකට ගියා; හැන්සාඩ් දෙපාර්තමේන්තුවට ගියා. නමුත් ඒ ලියැවිල්ල නැහැ. ඒ නිසා ඒ ගැන කරුණාකරලා පරීක්ෂණයක් පවත්වන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, එම ලියවිල්ල සභාගත කළ බවට හැන්සාඩ් වාර්තාවේ තිබෙනවාද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
සභාගත කළා කියලා සටහන් වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හැන්සාඩ් වාර්තාවේ තිබෙනවාද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
සභාගත වුණා කියලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සභාගත වුණා කියලා තිබෙනවා?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔව්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු කථානායකතුමා ඒ ගැන සොයා බලයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
සභාගත කළොත් ඒක Library එකේයි තියන්නේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එහෙම නම්, Library එකේ තිබෙන්න එපා යැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ පිළිබඳව ගරු කථානායකතුමා සොයා බලා කටයුතු කරයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී මන්ත්‍රීවරයෙකු ලෙස මගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා.

මා නැවත මගේ කථාව කරගෙන යන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඊයේ රිසානා නෆීක් කියන දැරිවියගේ මව සහ පියා නුගේගොඩදී හමුවුණා. මා නැවත වරක් AGA's Office එකෙන් රිසානා නෆීක් කියන දැරියගේ අම්මාගේයි, තාත්තාගේයි විවාහ සහතිකය - marriage certificate එක- ලබා ගත්තා. විවාහ සහතිකයේ ඔවුන් විවාහ වුණු වර්ෂයේ ලෙස සඳහන්ව තිබෙන්නේ 1987 වර්ෂයයි. ඒ අම්මායි, තාත්තායි විවාහ වෙලා තිබෙන්නේ 1987 වසරේදී. රිසානා ඉපදිලා තිබෙන්නේ 1988 වසරේදී. ඒ ගොල්ලන් හරාම් වැඩ කරන්නේ නැහැ. ඔවුන් මුස්ලිම් ආගමට ගරු කරන හලාල් පවුලක්. ඒ අය බොහොම ගෞරවනීය විධියට විවාහ වෙලා තිබෙනවා. රිසානාගෙන් පස්සේ රිෆ්කාන් කියන දරුවාත්, ඊට පස්සේ රිසානාගේ අනෙක් සහෝදරියන් දෙදෙනාත් ඉපදිලා තිබෙනවා.

ඒ අනුවත් ඔප්පු වෙනවා රිසානා නෆීක් කියන දැරියගේ උපන් දිනය 1988 පෙබරවාරි 04 වැනිදා කියන එක. නමුත් මේ කිසිම ලියැවිල්ලක් -document එකක් - මේ රජය විසින් ඒ උසාවිවලට යවන්න කටයුතු කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සෞදි ෂරී-ආ නීතියේදී දඬුවම් දීමේ ක්‍රමවේදයට අදාළ චෝදනා රැසක් තිබෙනවා. මිනී මැරුම, සන්නද්ධ සොරකම, ස්ත්‍රී දූෂණය, මනුෂ්‍ය ඝාතනය සහ ඉස්ලාම් ධර්මයට එරෙහිව කටයුතු කිරීම වාගේ දේවල්. නමුත් ඒ අය 1996 දී රටවල් 140ක් එක්ක ලෝක ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් කරලා තිබෙනවා. එහිදී ඒ අය පිළිගෙන තිබෙනවා, කවදාවත් ළමා අපරාධකරුවකුගේ හිස ගසා මරා දමන්නේ නැහැ කියන එක. ඉතින්, අපේ රජයට බැරි වුණා රිසානා වැඩිහිටියෙක් නොව දරුවෙකු බව ඔප්පු කරන්න. එසේ බැරි වුණු හේතුව මොකක්ද? උවමනාවෙන් ඒක කළ හේතුව කුමක්ද? අපේ රජය දන්නවා, මේ සියලුම අපරාධවලට රජය වැරදියි කියලා. ඒ උසාවියේදී නීතිඥයන් සහ සියලුම නීතිවේදීන් ගෙනාපු තර්කය මොකක්ද? "අපි වැඩ කරන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය විසින් නිකුත් කරපු ගමන් බලපත්‍රය -passport - අනුවයි" කියන එක තමයි ඒ අයගේ තර්කය වුණේ. "මුජර්දීන් කියන ඒවා, බදූර්දීන් කියන ඒවා, Omar Travels කියන ඒවා, විදේශ සේවා නියුක්ති කාර්යාංශය කියන ඒවා අපට වැඩක් නැහැ, අපි මේ දඬුවම දීලා තිබෙන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයෙන් නිකුත් කළ ගමන් බලපත්‍රයේ සඳහන් කරුණුවලට අනුව, එහි ඇයගේ උපන් දිනය විධියට සඳහන් වෙන්නේ 1982 වර්ෂය" කියන එකයි ඒ අයගේ තර්කය. ඉතින්, මේ passport එක වැරදියි කියන එක මේ ඇමතිවරු කවදාවත් ඒ අධිකරණයට පෙන්වා දුන්නේ නැහැ. මේ අය හැම දාම හිටියේ වෙනම නඩු නිමිත්තක. මේ අය හැම දාම හිටියේ සමාව ඉල්ලන්න ඕනෑය කියන කාරණය මත. අපි ගිහිල්ලා සල්මාන් කුමාරයා හම්බ වෙන්න ඕනෑ, අබ්දුල්ලා රජතුමා හම්බ වෙන්න ඕනෑ, ගෝත්‍රික නායකයා හම්බ වෙන්න ඕනෑ, විදේශ ඇමති හම්බ වෙන්න ඕනෑ කියලායි මේ අය කල්පනා කළේ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ඒ අය එක්ක සාකච්ඡා කරන ඡායා රූපයක්වත් අපි කවදාවත් දැක්කේ නැහැ. මේ රජය බොහොම කැදරයි ප්‍රචාරයට. මේ අය ගිහිල්ලා King Abdullah හම්බ වුණා නම් ඒ සම්බන්ධ ඡායාරූප අපට දකින්න ලැබෙන්න ඕනෑ. මොකද, ඒක රාජ්‍යතාන්ත්‍රික හමුවක්නේ. ඒ නිසා ඒ සම්බන්ධ ඡායාරූපයක් හෝ වීඩියෝ පටයක් හෝ පෙන්වන්න ඕනෑ, රිසානා ගැන අපි කථා කළාය කියලා. මා දන්නා විධියට ඉස්ලාම් ධර්මය අනුව, ගැහැනු කෙනකු හම්බ වෙන්න යනවා නම් ඒ ගැහැනු කෙනාගේ ලේ ඥාතියකු, සහෝදරයකු හෝ සැමියා යන්න ඕනෑ. එහෙම නැතිව හම්බ වෙන්න බැහැ.

නබි නායකතුමා කියන්නේ ගරු අස්වර් මන්ත්‍රීතුමාගේ විතරක් නායකයා නොවෙයි, අපේත් නායකයෙක්. ගෞතම බුදුරජාණන් වහන්සේ, යේසුස් වහන්සේ, නබි නායකතුමා යන මේ සියලු දෙනා ලෝකයට කළේ හොඳ දේවල්.

නබි නායකතුමා කියලා තිබෙන්නේ, කම්කරුවකුගේ දාඩිය වෙලෙන්න ඉස්සෙල්ලා පඩි ගෙවන්න කියලායි. සියලු දෙනාට සමාව දෙන්න පුළුවන් නම් මෝක්ෂ රාජ්‍යයට යන්න පුළුවන් ඉහළම පරිත්‍යාගය ඒකයි කියලා එතුමා කියා තිබෙනවා. ඒ වාගේම එතුමා දේශනා කර තිබෙනවා, අම්මා කෙනකු තමන්ගේ දරුවා අවුරුදු දෙකක් යන තුරු මව් කිරි දීලා - breastfeed - රැකබලා ගන්න ඕනෑ කියලා. නමුත් සෞදියේ ඒ මිය දරුවාගේ අම්මා, ඒ කුට කාන්තාව, ඒ ගුරුවරිය, මිලේච්ඡ ගැහැනිය

තමුන්ගේ දරුවා ඒ ගෙදර සුමාන දෙකක් වැඩ කරපු අවුරුදු 17ක අපේ මේ ශිෂ්‍යාවට භාර දීලා shopping ගියා. අපේ ආණ්ඩුව කවදාවත් කිව්වාද ඒ කාන්තාවට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා? ෂරි-ආ නීතියට අනුව ඇයි සෞදි අරාබිය ඒ මවට විරුද්ධව නඩු දැම්මේ නැත්තේ?

ඒ වාගේම මා කියනවා මෙහේ ඉන්න රිසානා නෆීක්ගේ අම්මා නියම, වැදගත් මුස්ලිම් කාන්තාවක් බව. රජයට කොන්ද පණ නැති වුණාට ඒ අම්මා කිව්වා, "සෞදි අරාබියෙන් ගෙනෙන ශත පහක්වත් මට එපා" කියලා. මූතූර්, සාපි නගරයේ ඉන්න ඒ අම්මාට කොන්දක් තිබුණා, මේ රජයට වඩා. කවදාවත් සෞදියෙන් ගෙනෙන ශත පහක්වත් එපා කිව්වා. මේ රජය එතැනදීත් ඒ අය රැවැට්ටුවා. විදේශ රැකියා ඒජන්සිකරුවන්ගේ සංගමයෙන් ගත්ත ලක්ෂ 10ක මුදල

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ දුන්නා. ඒක දුන්නේ විදේශ සේවා-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා සම්පූර්ණයෙන්ම මේ ගරු සභාව නොමඟ යැවීමක් කරන්නේ. මෙතෙක් වේලා මා ඒවාට උත්තර දෙන්න ගියේ නැහැ. නමුත් මේ රුපියල් ලක්ෂ 10ක මුදල දුන්නේ ඒ විදේශ රැකියා ඒජන්සිකරුවන්ගේ සංගමයෙන් නොවෙයි. මේ රුපියල් ලක්ෂ 10ක මුදල දුන්නේ මේ රටේ රජයට අයිති- [බාධා කිරීම්] අනෙක් ඔක්කොම තිබෙන්නේ පෞද්ගලික අංශයේ රැකියා - [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමා පස්සේ පැහැදිලි කරන්න.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I am on a point of Order. මේ සම්පූර්ණයෙන් අසත්‍යයි කියන්නේ. ඒ මුදල දුන්නේ විදේශ රැකියා- [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
That is not a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදයට මම ඔබතුමාට ගරු කරනවා. හැම මාධ්‍යයකම වාර්තා වුණේ අතිගරු ජනාධිපතිතුමා රුපියල් ලක්ෂ 10ක් දුන්නා කියලායි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ කියන්නේ අසත්‍ය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට පසුව අවස්ථාව තිබෙනවා. ඔබතුමාගේ කාල වේලාව තුළ පැහැදිලි කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම මාධ්‍යයකම වාර්තා වුණේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දුන්නේ අතින්. කකුලෙන් නොවෙයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අස්වර් මන්ත්‍රීතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්. ගරු අස්වර් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, before acting in the cinema, he must study the Standing Orders. The Standing Orders are very clear that you cannot refer to the conduct of the President. The other thing is -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ සල්ලි දුන්නේ අතින් තමයි, කකුලෙන් නොවෙයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කථා කියනවාද මම දන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධයෙන් සඳහන් කරන්න එපා. එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
රටේ රාජ්‍ය නායකයා හැටියට අපි එතුමාට ගරු කරනවා. නමුත් මෙහේ සිටින මුස්ලිම් නායකයෝ සියලු දෙනා සවුදි අරාබියේ සල්ලිවලට රැවටිලා මේ අහිංසක ළමයාව අමතක කළා. සවුදි අරාබියෙන් ලැබෙන රියාල්වලට මෙහේ සිටින සියලුම දෙනා ඒ ළමයාව අමතක කළා. මම සිංහලයෙක් වෙලාත්, මේ මුස්ලිම් දරුවා ගැන කථා කළා. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්. ගරු අස්වර් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මේක බයිස්කෝප් මඩුවක් නොවෙයි. Standing Orders හරියට කියවන්න. මේ මන්ත්‍රීවරු, ඇමතිවරුන්ට ඔක්කෝටම-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he cannot refer to the conduct of the Hon. Members. We all went there and tried our best up to the last moment for two years. He is the man who went to Lebanon and took a wife - [*Interruption.*]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
කවුරුත් හම්බ වුණේ නැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. අනෙක් මන්ත්‍රීවරු කරුණාකර වාඩි වෙන්න. තමුන්නාන්සේලාට කථා කරන්න වෙලාව තිබෙනවා. ගරු අස්වර් මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අහිංසක පාසල් ශිෂ්‍යාව දණ ගස්වලා බෙල්ල කපලා මැරුවා. කවුද කථා කළේ? දැන් කෑ ගහනවා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා එක්ක මගේ කිසිම ප්‍රශ්නයක් නැහැ. එතුමා ළඟදියි ආවේ. එතුමාට හම්බ වුණේ දෙකොන ගිනි ගත් විලක්කුවක්. මේ 2005 දී වුණු සිද්ධියක්. මම එතුමාට දොස් කියනවා නොවෙයි. මේ ගැන කථා කළ මුස්ලිම් නායකයෝ කවුද? [බාධා කිරීම්] කවුරුත් කථා කළේ නැහැ. කථා කළා නම්, හැන්සාඩ් වාර්තාවල තිබෙන්න ඕනෑ. මම කථා කරද්දී මට නොයෙකුත්-

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Child Development and Women's Affairs)
අපි ඉස්සර ඉඳලා කථා කරනවා. අපි ගියා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමා ගියා නම් සාර්ථක වන්න එපායැ. ගියා නම්, ඇයගේ බෙල්ල කැපුවේ ඇයි?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, කරුණාකර බාධා කරන්න එපා. ගරු හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමා, කරුණාකර වාඩි වෙන්න. පිළිතුරු දෙන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම කියන්නේ අපේ රටේ මේ මුස්ලිම් අම්මාට ගරු කළ යුතුයි කියලායි. මුත්තූර්වල, සාපිනගර්හි මේ මුස්ලිම් අම්මා ඊයේ මට හම්බ වුණා. තාත්තාත් මට හම්බ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අම්මා කොච්චර ගෞරවනීය කාන්තාවක්ද කිව්වොත්, තමන්ගේ දරුවා මරපු සවුදි අරාබියේ අම්මාට සමාව දෙනවා කියලා ඇය කිව්වා. තමන්ගේ දුවව මරපු අම්මාට අල්ලා දෙවියන්ගේ නාමයෙන් සමාව දෙනවා කියලා ඇය කිව්වා. නමුත් සවුදි අරාබියේ ඒ අම්මාට හිතක් පපුවක් තිබුණේ නැහැ. තමුන්ගේ දරුවාගේ ප්‍රශ්නයට මැදි වුණු ඒ රිසානා නෆීක්ගේ ලේ බලන්නම ඕනෑය කියලා ඇය කිව්වා. උදේම ද්වාද්මි බන්ධනාගාරයට ඇවිල්ලා තිරිසන් ගැහැනියක් වාගේ ඒ දරුවාගේ හිස ගසා දමනකම් බලා ගෙන හිටියා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මට තව විනාඩි පහක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, ඔබතුමාගේ කාලය අවසන්. දැන් වෙලාව පස් වරු 4.15යි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමාට තව විනාඩි පහක කාලයක් ලබා දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාගෙන්ද වෙලාව දෙන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විපක්ෂයෙන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විපක්ෂයේ කාලයෙන් අඩු කරනවා. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා, ඔබතුමා තව විනාඩි පහක් ලබා ගන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු පාර්ලිමේන්තුවට මම මේ අවස්ථාවේදී බොහොම අවධාරණය කරනවා, මේ දරුවාව බේරා ගන්න ඕනෑ තරම් කාලයක් තිබුණු බවට. මේ නඩුවට පළමුවැනි වතාවේ නීති ගාස්තු වෙනුවෙන් රියාල් 5,000යි ගෙවන්න තිබුණේ. නමුත් දැන් රුපියල් ලක්ෂ 10ක් ගෙවනවා. මේගොල්ලන් legal facilities දුන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම්. ඉනාමුල්ලාහ් කියන හිටපු කොන්සල් ජනරාල්වරයා කියලා තිබෙනවා, "Legal facilities හරියට වෙලාවට හම්බ වුණේ නැති නිසා තමයි මේ තත්ත්වය උදා වුණේ" කියලා. මම ඒ ගැන කියන්නම්. කරුණාකරලා ඒ සඳහා මට කාලය දෙන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, ඔබතුමාට ළමයි මරන එක විහිළුවක්. ඒක මම දන්නවා. සෞදිවලින් එන සල්ලිවලට කහින්න එපා. [බාධා කිරීමක්] හිටපු කොන්සල් ජනරාල් කියපු එක මම ඉදිරිපත් කරන්නම්. "In Rizana Nafeek's case, the Embassy in Riyadh could not legally handle the matter due to non-availability of funds and allocations to support her case in the early stages. Mr. Lalith Kotelawala came forward to help the poor girl after the conviction was made", he said. ඇයි, ලලිත් කොතලාවලට සල්ලි ගෙවන්න සිද්ධ වුණේ? ඇයි, ලලිත් කොතලාවලට රුපියල් ලක්ෂ 40ක් ගෙවන්න සිද්ධ වුණේ? රජයෙන් ගෙව්වේ නැති නිසයි. රජය දැන් බොරුවට රුපියල් ලක්ෂ 10ක් දෙනවා. රවුෆ් හකීම් මැතිතුමා රුපියල් ලක්ෂ 4ක් ගෙනැල්ලා දීලා. රුපියල් ලක්ෂ 2ක් වටිනා චෙක් පත් dates දාලා ගෙනැල්ලා දීලා. එක චෙක් පතක් එකවර cash කර ගන්නත්, අනෙක් එක මාස 4ක් ඉදිරියට දින දාලා දින චෙක්පතක් තමයි දීලා තිබෙන්නේ කියලා ඇයගේ අම්මා කිව්වා. රවුෆ් හකීම් ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් ඒක බොරුවක් කියලා කියන්න. රුපියල් ලක්ෂ 2ක චෙක් පතක් විතරයි මාරු කර ගන්න පුළුවන් වුණේ. අනෙක් චෙක් පත මාස 4ක් ඉදිරියට date දාලා. ජනාධිපතිතුමා දුන් cheque එකෙන් ලක්ෂ 5ක් අම්මාට, ලක්ෂ 5ක් තාත්තාට. ඒක දුන්නේ කවුද? ඒක දුන්නේ මැද පෙරදිග වැඩ කරන මේ රටේ අහිංසක ශ්‍රමිකයාගේ සල්ලිවලින් ක්‍රියාත්මක වන insurance එකෙන්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අසත්‍යයක්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, මම අහනවා ඒක දුන්නේ ජනාධිපති අරමුදලෙන්ද - President's Fund එකෙන්ද - කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, උත්තර දෙන්න. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහනවානේ. [බාධා කිරීමක්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I do not want to disturb him. I will reply him later.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම ඇහුවේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, ඔබතුමා ඇහුවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
උත්තර අවශ්‍ය නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒකට අවස්ථාව දෙනවාද? [බාධා කිරීමක්]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙච්චර කෑ ගැහුවාට සියලු දේ,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගත් සාධාරණ ක්‍රියා මාර්ගය ගැන ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ප්‍රශ්න ඇහුවොත් ඒ වෙලාවේම උත්තර දෙන්නත් අවස්ථාව දෙන්න වෙනවා. ඒ නිසා ප්‍රශ්න අහන්නේ නැතුව කථා කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමා හැමදාම මූලාසනයේ ඉන්නවා නම් අපි හරි ආසයි. මොකද, ඔබතුමා හරිම ප්‍රජාතන්ත්‍රවාදීයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලුම අය කළේ බොරුව. රිසානා නෆීක් කියන පාසල් ශිෂ්‍යාව ද්වාද්මී බන්ධනාගාරයේදී රහසිගතව මැරුවේ සවුදි වෙලාවෙන් 09.35ට පෙර. එතකොට ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා විෂය භාර ඇමතිවරයා නොවෙයි. එතුමා තමයි කියන්නේ රිසානා නෆීක්ව ඝාතනය කරලා කියලා. මම අහන්න කැමැතියි, එතුමාද විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන ඇමති කියලා. එතකොට ඩිලාන් පෙරේරා මැතිතුමා ඇවිල්ලා මොනවාද කිව්වේ? "ඇයව බේරා ගන්න තවත් වේලාව තිබෙනවා, අපි ඇයව බේරා ගෙන එනවා" කියලා. විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන ඇමති කවුද? ඩිලාන් පෙරේරා මැතිතුමාද? නැත්නම් සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාද? මම අහන්නේ ඒකයි. මොකද, රිසානා නෆීක් දැරිය මැරුණා කියන එක පිළිබඳව පාර්ලිමේන්තුව තුළ විනාඩියක නිශ්ශබ්දතාවක් ඇති කරන්නේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමායි.

ගරු ඇමතිතුමා කියනවා, "අපි තවමත් ඇයව බේරා ගන්න වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා. ලංකාවේ සෞදි අරාබි තානාපති කාර්යාලයේ ඉන්න තානාපතිතුමා හරහා අපි කළ ඉල්ලීම සවුදි අරාබියේ රජතුමා පිළිඅරගෙන තිබෙනවා. ඒ හින්දා රිසානා නෆීක් ළඟදීම ගෙදර එනවා" කියලා. ඇයි මෙහෙම රවටන්නේ? ඊට පස්සේ කිව්වා, ඒකට punishment එකක් හැටියට සෞදි අරාබියේ ඉන්න අහමඩ් ජාවෙඩ්ව recall කරලා ලංකාවට ගෙන්වනවා කියලා. ඒකත් බොරුවක්. අහමඩ් ජාවෙඩ් මහත්මයා තවමත් වැඩ. ඔහු "The Guardian" පුවත් පත සමඟ සම්මුඛ සාකච්ඡාවකට ඉදිරිපත් වෙලා කියනවා, "මාව ඒ විධියට එළවන්න බැහැ, මම අවුරුදු 3ක් වැඩ කළා, තව මාස තුනක් වැඩියෙනුත් වැඩ කරලා තිබෙනවා, මම ශ්‍රී ලංකාවට යන්නේම නැහැ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දුනීසියාවේ ඉන්න ජනාධිපතිවරුන්ට කොන්ද තිබුණා. ඒ අය තමුන්ගේ පුරවැසියෙක් මරපු හැම වෙලාවේම කෙළින්ම ඒ රටේ තානාපති තනතුර අත් හිටෙව්වා. පිලිපීනය එහෙම කළා. ඉන්දුනීසියාව කළා, බංග්ලාදේශය කළා, මැලේසියාව කළා, ඉතියෝපියාව කළා, පාකිස්තානය කළා, ඒ වාගේම ඉන්දියාවත් එහෙම කළා. අපි විතරයි මෟග.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා හැම වෙලාවේම කියනවා, "අපේ උපයා ගැනීම් රුපියල් බිලියන 6 සිට බිලියන 10 දක්වා යනවා" කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ඇත්ත තත්ත්වය. තවමත් මේක ඉවර නැහැ. මීට දවස් 4කට ඉස්සෙල්ලා පුවත් පත් වාර්තාවක් තිබුණා, කින්නියාවල ඉන්න අවුරුදු 17ක පාසල් ශිෂ්‍යාවන් දෙදෙනෙක් ගෘහ සේවිකාවන් විධියට යවන්න තැරැව්කාරයෝ දෙදෙනෙක් විසින් රිසානා නෆීක්ට කළා වාගේ බොරු වයස දාලා කොළඹ අරගෙන එද්දී arrest කරලා remand බන්ධනාගාරගත කරලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)
කවුද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
තමුන්නාන්සේ පුවත් පත් බලන්නේ නැද්ද? කින්නියාවල පාසල් ශිෂ්‍යාවන් දෙදෙනෙක්.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
කවුද arrest කළේ?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Arrest කළේ කොළඹදී. [බාධා කිරීමක්] ඒක හොඳයි. මම නරකක් කියනවා නොවෙයි. ඒක හොඳයි. මේ රටේ නීතියක් නැති නිසා ඒ වාගේ වැඩවලට මිනිස්සු භය නැහැ. මොකද එදා ඩිලාන් පෙරේරා ඇමතිතුමාට "ෂරි-ආ" නීතිය ශිරානි බණ්ඩාරනායකට ක්‍රියාත්මක කරන්න තිබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාල වේලාව අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

එතුමා ගොඩක් busy වෙලා හිටියා. පාසල් දරුවන්ට මේ වාගේ හොර passport හදලා මේ විධියට දිගටම පිට රට යවන්නට මේ ආණ්ඩුව ක්‍රියා කළොත් අපිට තව රිසානාලා කී දෙනෙකුගේ ඝාතන ගැන අහන්නට ලැබෙයි ද කියන කාරණය තමයි මම අහන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, බොහොම ස්තුතියි. යෝජනාව ස්ථිර කිරීම ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[අ. භා. 4.20]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට විදේශ විනිමය ගෙන්වන, මේ ආණ්ඩුව විසින් "රට විරුවෝ" කියලා හඳුන්වා දෙන රිසානා වැනි අහිංසක දැරියක් ජීවිතක්ෂයට පත් වීම පිළිබඳව රන්ජන් රාමනායක මැතිතුමා ගෙනාපු ඒ ඉතාමත්ම කාලෝචිත, වැදගත් යෝජනාව ඉතාම සංවේගයෙන් වුවත් මම මේ අවස්ථාවේ දී ස්ථිර කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසානා ගැන අපිට පැය ගණනක් කථා කරන්න පුළුවන්. දවස් ගණනක් කථා කරන්න පුළුවන්. අවුරුදු ගණනක් කථා කරන්න පුළුවන්. නමුත් රිසානා ජීවිතක්ෂයට පත් වෙලා ඉවරයි. ආපසු කිසි කෙනෙකුට, කිසි ජගතෙකුට ඇයට ජීවිතය ලබා දෙන්නට බැහැ. මට පසුව කථා කරන අපේ කරීක මහත්ම මහත්මීන් රිසානාගේ මරණය පිළිබඳව කථා කරාවි. මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ රන්ජන් රාමනායක මැතිතුමාගේ යෝජනාවේ දෙවැනි කොටස පිළිබඳවයි. රිසානාට සිදු වුණා වැනි සිදු වීම් නැවත වරක් සිදු වීම අපි වළක්වා ගන්නේ කොහොමද කියන එක පිළිබඳවයි මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැද පෙරදිග අපේ ලක්ෂ සංඛ්‍යාත ශ්‍රමිකයන් පිරිසක් වැඩ කරනවා. අපේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා සංඛ්‍යා ලේඛන ගැන කියාවි. ලක්ෂ සංඛ්‍යාත අහිංසක අපේ ශ්‍රමිකයන් පිරිසක් මැද පෙරදිග වැඩ කරනවා. එයින් අවුරුද්දකට ඩොලර් බිලියන ගණනක් අපේ රටට විදේශ විනිමය ලැබෙනවා. අද ලංකාවට වැඩියෙන්ම විදේශ විනිමය ගෙනෙන්නේ මේ සංක්‍රමික සේවකයින්ගෙන්. ජාතික සේවක සංගමයේ සභාපතිවරයා හැටියට මම එක කාරණයක් කියන්න කැමැතියි. අපේ රටට මේ තරම් වූ විදේශ විනිමයක් -ඩොලර් බිලියන 6ක්- ගෙනෙන්නේ ඇඟලුම් කර්මාන්තශාලාවලින්වත්, වෙනත් අපනයනවලින්වත් නොවෙයි. අපේ රටේ මේ අහිංසක ශ්‍රමිකයන්ගේ ලේ දහඩියවලින් කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ අය අතරිනුත් වැඩි දෙනෙකු මැද පෙරදිග තමයි සේවය කරන්නේ. මැද පෙරදිග සේවය කරන සේවක සේවිකාවන්ගෙන් වැඩි දෙනෙකු කාන්තාවෝ. මේ කාන්තාවන්ගෙන් සියයට 60කට 70කට අධික ප්‍රමාණයක් විවිධ හිංසනවලට මුහුණ දෙනවා. පුච්චනවා; ඇණ ගහනවා; අමානුෂික ලෙස වධ දෙනවා. ඒ වාගේම දූෂණය කරනවා. ලිංගික අතවරවලට ලක් වෙනවා; මරනවා;. මේක රිසානාගෙන් පමණක් සීමා වෙන්නේ නැහැ. මේ ආකාරයට නිහඬව හිර ගෙවල්වල දුක් විඳින අපේ සේවක සේවිකාවන් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට මම කියන්නේ "modern-day human slavery" කියලායි. නවීන සමාජයේ වහල් මිනිස් වහල්කම තමයි අද මේ තුළින් සිදු වෙන්නේ. මෙන්න මේ නිසා ශ්‍රී ලංකාවත් සාමාජිකත්වය දරන ලෝක කම්කරු සංවිධානය 2011 ජූනි මාසයේ සියවැනි සැසි වාරයේ දී විශේෂ ප්‍රඥප්තියක් ඒකමතිකව සම්මත කර ගත්තා. ඒ ප්‍රඥප්තිය හඳුන්වා දෙන්නේ "සංක්‍රමික සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සඳහා වූ C 189 කියන ජාත්‍යන්තර ප්‍රඥප්තිය" යනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රඥප්තිය තුළින් මෙවැනි සංක්‍රමික සේවක සේවිකාවන්ට රැකවරණය ලැබෙනවා; ජාත්‍යන්තර රැකවරණය ලැබෙනවා. ඔවුන්ට ගෙවන පඩිය, ඔවුන් දවසකට වැඩ කරන පැය ගණන, ඔවුන්ට නිවාඩු ලැබිය යුතු ආකාරය, ඔවුන්ට හිංසනයක් නැතිව වැඩ කරන්න පුළුවන් වාතාවරණය ලැබීම, ඔවුන්ට කෙරෙන අපරාධවලට එරෙහිව ක්‍රියා කරන්නට පුළුවන් වන ආකාරයට ලෝක කම්කරු සංවිධානයේ ජාත්‍යන්තර ප්‍රඥප්තියක් -C 189 කියන ජාත්‍යන්තර ප්‍රඥප්තිය- අත්සන් කරලා සම්මත කර ගෙන තිබෙනවා. රන්ජන් රාමනායක මැතිතුමා සඳහන් කරපු ආකාරයට අපේ රට -ශ්‍රී ලංකාව- වාගේම මැද පෙරදිගට සංක්‍රමිකයෝ යවන තවත් වැදගත් රටක් තමයි, පිලිපීනය. මේ වන විට පිලිපීනය තමන්ගේ රටේ ශ්‍රමික සේවක සේවිකාවන්ගේ විශේෂ ආරක්ෂාව හා රැකවරණය තකා මේ ලෝක කම්කරු සංවිධානයේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය -C 189 වැනි ජාත්‍යන්තර ප්‍රඥප්තිය- අත්සන් කරලා තිබෙනවා.

අද වන තුරු ලංකාව ඒකට අත්සන් කරලා නැහැ. අපේ ශ්‍රමික සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රැකවරණය සහ සුභසාධනය වෙනුවෙන් ලෝක කම්කරු සංවිධනය ස්ථාපිත කර තිබෙන ජාත්‍යන්තර ප්‍රඥප්තියට අද වන තුරු ලංකාව අත්සන් කරලා නැහැ. අපි අපේ රට විරුවන්ට සලකන්නේ එහෙමද? ලංකාවට වැඩිම විදේශ විනිමයක් ගෙන එන විශේෂයෙන්ම මැද පෙරදිග සේවය කරන අපේ සේවක සේවිකාවන්ට මේ ආණ්ඩුව රැකවරණය දෙන්නේ මෙහෙමද කියන බරපතළ ප්‍රශ්නය මට අහන්න සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ යෝජනාවේ දෙවැනි පරිච්ඡේදයේ තිබෙන්නේ කුමක්ද? රිසානාගේ සිද්ධිය වැනි ඉතාමත්ම කනගාටුදායක මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට මේ ආණ්ඩුව පියවර ගත යුතුයි, මේ පාර්ලිමේන්තුව පියවර ගත යුතුය කියලායි. එහෙම නම් මේ ආණ්ඩුවට වහාම ලෝක කම්කරු සංවිධානයේ ජගත් ශ්‍රමිකයන් සඳහා වූ -සේවක සේවිකාවන් සඳහා වූ- ජාත්‍යන්තර ප්‍රඥප්තියට වහාම අත්සන් කරන්නට ඕනෑ. අන්න එවිට විශේෂයෙන්ම මැද පෙරදිග රටවල සේවය කරන ලක්ෂ සංඛ්‍යාත සේවක සේවිකාවන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට රැකවරණය ලැබෙනවා; ජාත්‍යන්තර ආරක්ෂාව ලැබෙනවා; ලෝක කම්කරු සංවිධානයේ රැකවරණය ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී ලංකා තානාපති කාර්යාල කීයක අපේ සේවක සේවිකාවන් වෙනුවෙන් අනාථාගාර පවත්වා ගෙන යනවාද? ලිංගික අතවරවලට ලක් වුණු, දූෂණය වුණු, දරුවන් පිළිසිඳ ගත්, ඒ රටවල හාම්පුතුන්ගේ බලහත්කාරකම් නිසා ගැබිනි බවට පත් වෙලා ඉන්න අය වෙනුවෙන්- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමාගේ වෙලාවේදී කියන්න- රැඳවුම් මධ්‍යස්ථාන හැටියට; සුරැකුම් මධ්‍යස්ථාන හැටියට අනාථාගාර කීයක් අපේ ඒ තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනවාද? මේක මානුෂික ප්‍රශ්නයක්. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. ජාති, ආගම්, කුල මල, දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. මේ පිළිබඳව ආණ්ඩු පක්ෂයට තිබෙන වගකීම විපක්ෂයටත් තිබෙනවා. අන්න ඒ නිසා තමයි හැමදාම මැද පෙරදිග සේවය කරන අපේ සේවක සේවිකාවන් වෙනුවෙන් කථා කරන මා මිත්‍ර ගරු රන්ජන් රාමනායක

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

මන්ත්‍රීතුමා අද මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා අපි මේ පිළිබඳව ද්වේෂ සහගතව, වෛර සහගතව බලන්න දෙයක් නැහැ.

අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඉන්නවා. පිළිතුරු කථාවේ දී එක ප්‍රතිඥාවක් මම එතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ලෝක කම්කරු සංවිධානයේ සංක්‍රමණික සේවක සේවිකාවන් වෙනුවෙන් 2011 ජුනි මාසයේ සම්මත කර ගත් ජාත්‍යන්තර ප්‍රඥප්තියට අත්සන් කිරීම පිළිබඳව- [බාධා කිරීමක්] නැහැ. ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේ දී අපට ඒ ප්‍රතිඥාව දෙන්න. මානව හිතවාදියකු හැටියට ඔබතුමා මේ සේවක සේවිකාවන් වෙනුවෙන් මෙන්න මේ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අත්සන් කරන්න. එතකොට ඔබතුමාට කියන්න පුළුවන් වේවි "රට විරුවන්ට මම අවංකවම ආදරෙයි. රට විරුවන් වෙනුවෙන් අපි අවංකවම සලකා තිබෙනවා"ය කියලා. හෘදය සාක්ෂියට එකඟව ඔබතුමාට ඒ ප්‍රකාශය කරන්න පුළුවන් වේවි. මට ලැබී තිබෙන තොරතුරු අනුව, පිලිපීනය 2011 ජුනි මාසයේ ලෝක කම්කරු සංවිධානයේ ජිනීවා සැසි වාරයේ දී මේ ප්‍රඥප්තිය අත්සන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි ඉන්නේ 2013 වසරේ. 2012 වසර සම්පූර්ණයෙන්ම තිබුණා. නමුත් අවාසනාවකට මේ ආණ්ඩුවට ඒ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අත්සන් කරන්න බැරි වුණා. ජාතික සේවක සංගමයේ සභාපතිවරයා හැටියට මට තිබෙන බරපතළ ප්‍රශ්නය මේකයි. පුරා අවුරුදු එකහමාරක් දෙකක් යන තුරු මේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය ගැන අබමල් රේණුවකවත් සැලකීමක් මේ ආණ්ඩුව කළේ නැහැ. හැබැයි, අපේ මේ විදේශ සංක්‍රමණික සේවක සේවිකාවන්ගේ දහදිය මහන්සියෙන්, දුකෙන්, වේදනාවෙන්, කඳුළින් ගෙන එන ඩොලර් බිලියනයකට වැඩි විදේශ විනිමයෙන් අපි යැපෙනවා; රජය යැපෙනවා. මේ අහිංසක රිසානා ගෘහ සේවිකාවක් හැටියට මැද පෙරදිග ගියේ ඇයි? දුප්පත්කම නිසායි. අපේ අම්මලා, අපේ සහෝදරියෝ මැද පෙරදිග රටවලට යන්නේ ඇයි? ඒ ගියාම අපා දුක් විඳින්න සිද්ධ වෙනවා කියලත් ඒ අය දන්නවා. නමුත් කරන්න දෙයක් නැති නිසා යනවා.

එතකොට තමන්ට සිදු වුණු දේ ගැන කියන්න, තමන්ගේ කථාව කියන්න බැරි නම් ඒක වලංගු පාපෝච්චාරණයක් නොවෙයි. අපට පෙන්වා දෙන්න තිබුණු පළමුවන කාරණය තමයි, ඇය දරුවෙක්, වයස අවුරුදු 18ට අඩුයි, ජාත්‍යන්තර ප්‍රඥප්තියෙන් ආරක්ෂාව ලබනවා කියන එක. මුල් අවස්ථාවේදී අදාළ උප්පැන්න සහතිකය ඉදිරිපත් කරන්න බැරි වුණා; ප්‍රමාද වුණා.

දැන් නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, මේ සම්බන්ධයෙන් Asian Human Rights Commission එක මැදිහත් වුණාය කියලා. ඇත්ත වශයෙන්ම එම කොමිසම ඉදිරිපත් කර තිබෙන නිවේදනයේ තිබෙනවා, මෙයට මැදිහත් වෙලා පිළිගත්, ප්‍රධාන පෙළේ නීතිඥයන් රඳවන්න ඔවුන් විසින් රජයෙන් මුදල් ඉල්ලා සිටියාම ආණ්ඩුව බැහැ යි කිව්වා කියලා. ආණ්ඩුව බැහැ කිව්වා කියලා සඳහන් වනවා. ඉතාමත්ම සුළු මුදලක් ආණ්ඩුව අන්තිමට දුන්නේ. ඉන් පසුව පෞද්ගලිකව වෙනත් අයගේ ආධාර ගන්න සිද්ධ වුණා. ඒ කටයුතු හරියට වුණේ නැහැ. මුල් අවස්ථාවේදී නැවත නඩු විභාගයක් ලබා ගන්න - retrial එකක් ලබා ගන්න- තිබුණු අවස්ථාව අහිමි වුණා. ඒ වාගේම ඇත්ත වශයෙන්ම නැවත වතාවක් ඒ මරණය ඝාතනයක්ද, නැද්ද කියලා පරීක්ෂා කරන්න තිබුණු අවස්ථාව අහිමි වුණා. සම්පූර්ණයෙන්ම වරද්දා ගත්තා. රිසානා නෆීක්ගේ මරණයට වග කිව යුතු වන්නේ මේ රටේ ආණ්ඩුව, මේ රටේ වග කිව යුතු නිලධාරින්, මේ විෂය භාර විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයයි. එක පුද්ගලයෙක් කියලා මම කියන්නේ නැහැ. මේ කාලය තුළම නිසි ක්‍රියාදාමය හරහා කිසි කෙනෙක් මේකට අවශ්‍ය කරන නියම ප්‍රවේශය ලබා ගත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කියන්නට අවශ්‍ය විශේෂ කාරණයක් තිබෙනවා. රිසානා නෆීක් මිය ගිය නිසා ඇති වුණු වේදනාවෙන් මම මේ කාරණය පිළිබඳව, මේ ප්‍රශ්නය පිළිබඳව කථා කරනවා නොවෙයි. ගරු ඇමතිතුමා දන්නවා, විශේෂයෙන්ම මැද පෙරදිග රටවලට යවන ගෘහ සේවිකාවන් විඳින දුක ගැන; ඔවුන්ට විඳින්නට වෙන ලිංගික අඩන්තේට්ටම් ගැන; ඔවුන්ට විඳින්නට වෙන දුක් වේදනා ගැන. ඒ සම්බන්ධයෙන් පැමිණිලි දස දහස් ගණනක් මේ රටේ තිබෙනවා. ඒ නිසා සත්‍ය වශයෙන්ම ගෞරවාන්විත ජාතියක් විධියට තවදුරටත් අපේ අම්මලා, අපේ සහෝදරියෝ මැද පෙරදිග ගෘහ සේවිකාවන් වශයෙන් යවනවාද කියන ප්‍රතිපත්තිමය තීරණය රජය ගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත වශයෙන්ම මෙහිදී වුණේ මේකයි. මේ ප්‍රශ්නය මතු වුණු වෙලාවේ රජයට මේ ඒජන්තවරුන්ගෙන් උපදෙස් ලැබුණා, ලක්ෂ 6ක් වාගේ ලොකු ගණනක් සවුදි අරාබියේ සිටිනවා; මොනවා හෝ ප්‍රශ්නයක් වෙලා සවුදියේ තිබෙන නීති ක්‍රමයේ දුර්වලතාව හෙළිදරවු වෙලා ගැටලුවක් වුණොත් ආණ්ඩුවට සවුදි අරාබියට රැකියා සඳහා යවන්නට තිබෙන අවස්ථාව නැති වෙයි; එහෙම වුණොත් ආණ්ඩුව දුෂ්කරතාවට පත් වෙයි කියලා. එම නිසා මේකට අත නොගසා ඉඳිමු; එක ළමයෙක් මැරුණාට කමක් නැහැ; ලක්ෂ 6කින් එන ආදායම මහ වටිනවාය කියන ඉතාම වැරදි සහගත උපදේශය මත ආණ්ඩුව කටයුතු කළා. අවසාන මොහොතේ උත්සාහ කරන්නට ඇති, මම නැහැයි කියන්නේ නැහැ. මේ නිලධාරින්, ඇමතිවරුන් උත්සාහ නොගත්තාය කියා මා කියන්නේ නැහැ. ඒ දැක් වූ ආකල්ප වැරදි නම්, උපක්‍රම වැරදි නම් අවසානයේදී අපට පරජයට පත් වන්නට සිද්ධ වනවා. ඒ වාගේම මේ දරුවා මරන්න ඔන්න මෙන්න කියා තිබෙද්දී ලංකාවේ පුවත් පත්වල පළ වුණේ රිසානා නෆීක් නිදහස් කරනවාය කියායි. කවුරු හෝ ලණුවක් දුන්නා. [බාධා කිරීමක්] ඒක තමයි කියන්නේ. ඒ කියන්නේ මරන්න දවස් ගණනකට කලින් රිසානා නෆීක් නිදහස් කරනවාය කියා සවුදි තානාපතිතුමා කිව්වාය කියලාද ඔබතුමා කියන්නේ? දැන් ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කියන්නේ සවුදි අරාබියේ ලංකා තානාපතිතුමා එහෙම කිව්වාය කියා? [බාධා කිරීමක්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

කිව්වා. සුමානයකට පෙර, රිසානා නෆීක් නිදහස් වෙනවාය කියා කිව්වා. [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

හොඳයි. [බාධා කිරීමක්] සවුදි අරාබියේ තානාපතිතුමා අපේ අධිකරණ ඇමතිතුමාට දිරච්ච ලණුවක් දුන්නාම ලංකාවේ ජනාධිපතිතුමා ලියුමක් යැව්වා සවුදි අරාබියේ රජ්ජුරුවන්ට. මොකද හේතුව? යම් හෙයකින්, මොනවා හෝ වාසනාවක් පැදිලා රිසානා ගෙදර එනවාය කියා ආරංචි වුණාම ඒකේ ලකුණු දමා ගන්න නිවේදනයක් නිකුත් කළා. සවුදි අරාබියේ රජ්ජුරුවන්ට ලියුමක් යැව්වා. අපේ වාසනාවට රිසානා නිදහස් වුණා නම් කියන්නේ, ගරු ජනාධිපතිතුමාගේ මහිමය පරිදි ඒක සිද්ධ වුණාය කියායි. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, Please! Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මේ ගරු මන්ත්‍රීතුමා අතිශයින්ම වැරදි, බොරු දේවල් කියන්නේ. ජනාධිපතිතුමා ලියුම යැව්වේ, Ambassador - [බාධා කිරීම්] නොවෙයි. ජනාධිපති-[බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

That is not a point of Order.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වැරදි උපක්‍රම මත රිසානා නෆීක්ගේ පිහිටෙන් සැප ගත් කෙනෙක් ගරු අස්වර් මන්ත්‍රීතුමා. එතුමා සවුදි අරාබියට ගියා බොරුවට. රිසානා නෆීක්ගේ නාමයෙන් බොරුවට ගියා. තමුන්නාන්සේ බොරුවට සංචාරය කළ කෙනෙක්.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟ ප්‍රශ්නය වුණේ, මේ ආණ්ඩුව දැනුවත්ව - [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, Please! Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමා බොරු ප්‍රචාරය කරනවා. අප හැඟීමකින් සවුදි අරාබියට ගිහින් ඒ වැඩ ටික කළේ. ඒක හරි ගියා ද නැද්ද කියන එක වෙනම දෙයක්. -[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ජනාධිපතිතුමා ආඩම්බරකාර තාත්තාය කියනවා. හැබැයි ආඩම්බරකාර තාත්තා මේ අහිංසක දැරිවියගේ ජීවිතය බේරා ගන්න ගත් උත්සාහය මොකක්ද කියා කියන්න අවශ්‍යයි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම කියන්න අවශ්‍ය කරන දෙයක් තිබෙනවා. අවුරුදු හතක් තිස්සේ මේ දැරිවියව බේරා ගන්නවා කියා ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු සංචාරවල යෙදුණා. මේ ප්‍රශ්නය සරල එකක් නොවෙයි කියා අප පිළිගන්නවා. මේ ප්‍රශ්නය බොහොම බරපතළ එකක්. රිසානාව බේරා ගන්න පුළුවන්කම තිබෙන්නේ සවුදි රජතුමාට නම්, ලංකාවේ රජතුමා සවුදි රජතුමාව හමු වන්නට ඕනෑ. ලංකාවේ රජතුමා සවුදි රජතුමාව හමු වුණා ද? ලංකාවේ රජතුමා ලියුම් දෙකක් යැව්වාම ඒ දැරිවිය ගෙදර යවනවා ද? එහෙම වන්නේ නැහැ. මේ දැරිවියගේ මරණය මෙච්චර හැඟීම් බර නම් , මේ දැරිවියගේ මරණය මෙච්චර බරපතළ නම් ලංකාවේ නායකයා සවුදි නායකයා හමු වන්නට ඕනෑ. ලියුම් යවලා හරි යන්නේ නැහැ. [බාධා කිරීම්] මුහුණට මුහුණ - face-to-face - කථා කරන්නට ඕනෑ. ඒක තමයි වැදගත් දෙය. ඒක තමයි ශක්තිය. එම නිසා උපක්‍රමිකව, නීතිමය වශයෙන් මේ ක්‍රියාවලිය වරද්දා ගත්තා වාගේම ඒ ගැන හැඟීමක් තිබුණේ නැහැ. රිසානා නෆීක් මැරිලා රට පුරාම ආවේගයක් ඇති වෙලා ජාති භේදයක් නැතිව, ආගම් භේදයක් නැතිව අප හැමෝගේම ඇස්වලින් කඳුළු වැටෙන කොට තේරුම් ගත්තා මේක බරපතළ ප්‍රශ්නයක්ය කියා. මොකද, ඒ විෂය සම්පූර්ණයෙන් අත හැරලායි තිබුණේ.

ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම සරල දෙයක් තිබුණේ. සවුදි රජතුමා රිසානාගේ බෙල්ල කපන්න ලැහැස්ති වනකොට විෂය භාර

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමා කල්පනා කළේ ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ බෙල්ල කපන්නේ කොහොමද කියායි. එතුමාගේ priority එක තිබුණේ එතැන. එතුමාගේ ප්‍රමුඛතාවය තිබුණේ එතැන. රිසානා නෆීක් බේරා ගන්න එක එතුමාගේ ජොබ් එක. එතුමාගේ ජොබ් එක පැත්තක තියලා එතුමා අග විනිසුරුතුමියගේ බෙල්ල කපන්නයි ලැහැස්ති වුණේ. අන්තිමට අපේ රටට එක දැරියක් අහිමි වුණා.

රිසානා නෆීක්ගේ ජීවිතය ගැන විතරක් නෙවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. අපේ රටේ ආඩම්බරකම ගැන, දුක් විඳින ලක්ෂ ගණනක් අම්මලා, අක්කලා, නංගිලා ගැන ප්‍රශ්නය තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ සංඛ්‍යා ලේඛනවල කියනවා මේ රටේ දුප්පත්කම සියයට 7යි කියා. මේ රටේ දුප්පත්කම තිබෙන්නේ සියයට 7 නම් නතර කරන්නකො රට යවන එක. අප ඔබතුමා එක්ක ඒ ප්‍රශ්නය ගැන කථා කරනවා. ගෘහ සේවය සඳහා රට යවන එක පුළුවන් නම් නතර කරන්න. ඒ තීරණය ගන්න. ඒක පිලිපීනයට කරන්න පුළුවන් වුණා නම්, ඒක බංග්ලාදේශයට කරන්න පුළුවන් වුණා නම්, අපේ රටට වඩා දුප්පත් රටවලට ඒක කරන්න පුළුවන් වුණා නම් ඒ ආඩම්බරකාර බරපතළ තීරණය ගන්න.සවුදි සල්ලිවලට යටත් වෙලා කයිවාරු ගහනවා, අවසානයේ මොනවාවත් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඉතාම වැදගත් කාරණයක් කියන්න අවශ්‍යයි. මේ සමස්ත ක්‍රියා දාමය පුරා රජය උපක්‍රමික විධියට ගත්තේ වැරැදි පියවරයි. මේ ප්‍රශ්නය ගැන නීතිමය වශයෙන් සලකා බලා කටයුතු කරන්නට තිබුණා. එම දරුවා මිය ගියේ හදිසි අනතුරකින්, ඒ දරුවා මිය ගියේ කිරි හිරවෙලා, ඒ නිසා රිසානා නෆීක් වරදක් කළේ නැහැ කියන පදනම මත නැවත නඩු විභාගයක් හෝ විධිමත් පරීක්ෂණයක් කරා යන්න කියලා ඉල්ලන්න තිබුණා. අර ඇමතිතුමාත් පිළිගත් ආකාරයට මිය ගිය දරුවාගේ අම්මාටත් දඬුවම් කරන්න කටයුතු කළා නම්, ඒ වාගේම රිසානාගේ උපන් දිනය වැරැදියට සඳහන් කරලා හොරට passport හදලා පිට රට යවපු ජාවාරම්කාරයන්ට ඉක්මනින් - පසුව කළා - දඬුවම් කරන්න කටයුතු කළා නම් මේ ප්‍රශ්නය මතු වන්නේ නැහැ. ඒ නිසා ඒක උපක්‍රමිකව වරද්දා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මේ රිසානා දැරිවියව මරන්න ඔන්න මෙන්න කියලා තිබෙන වෙලාවක ඔය කියපු විධියටම සවුදියෙන් දීපු ලුණු කාලා, ඒ වාගේම වැරැදි අවබෝධයක් අනුව ප්‍රමුඛතාව පසෙක තබලා කටයුතු කරමින්, මේ දැරිවියව මැරුවාට පසුවත් මේ දැරිවිය බේරා ගන්නවා කියලා කියපු නිසා, විෂය භාර ඩිලාන් පෙරේරා අමාත්‍යතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න එක්සත් ජාතික පක්ෂය තීරණය කර තිබෙනවා. අපි ඉදිරියේ දී ඩිලාන් පෙරේරා ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ තනි ප්‍රශ්නයක් නොවෙයි. ඩිලාන් පෙරේරා ඇමතිතුමාත් එක්ක කටයුතු කරන නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා හිතනවා නම් එතුමාට විරුද්ධවත් විශ්වාස භංග යෝජනාවක් ඕනෑයි කියලා, ඒත් දෙන්න වටිනවා. නමුත් අපි කල්පනා කළා -

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
එකක් නොවෙයි දාහක් ගෙනෙන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්, තුනෙන් දෙකක බලය තිබෙනකන් දිනන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ තුනෙන් දෙකක බලය පාවිච්චි කරලා වරදක් නොකරපු ශිරානි බණ්ඩාරනායකව එළවන්න පුළුවන්

වුණා නම්, තමුන්නාන්සේලාට ඔය විශ්වාස භංග යෝජනාව දිනන්නත් පුළුවන්. නමුත් එවැනි විවාදයක් තුළින් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තිබෙන දුර්වලකම, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තිබෙන වැරැදි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තුළ තිබෙන ප්‍රතිපත්තිවල දුර්වලකම, ඒ වාගේම අරාබි සල්ලිවලට වහල්වීමේ ඒ තරාතිරම, ලජ්ජා නැතිකම පෙන්නුම් කරන්නට අපට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම රිසානාව පෙන්නලා, පසු ගිය කාලය පුරා -වසර හතක් තිස්සේ- සවුදි අරාබියට trips ගිය කට්ටිය සිටිනවා. එක එක්කෙනා වෙන වෙනම ගිහිල්ලා ඒ අය මොනවාද කළේ, ඒ අය කාවද හමුවුණේ, මොනවාද කළේ කියන කාරණය අපට පෙන්නුම් කර දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රජය රිසානාගේ ජීවිතය බේරා ගන්න ප්‍රමාණවත් ලෙස කටයුතු කළේ නැහැයි කියලා මම කියනවා. මේ පිළිබඳව බලය තිබෙන්නේ සවුදි අරාබියේ රජ්ජුරුවන්ට කියලා කියනවා නම්, ලංකාවේ රජ්ජුරුවෝ ඒ රජ්ජුරුවන්ව හමු වුණේ නැහැ. ඒ වාගේම ලංකාවේ ඇමතිවරුන් ඒ ගැන ප්‍රමුඛතාවක් අරගෙන ක්‍රියා කළේ නැහැ. ඒ වාගේම නීතිඥ සහාය ප්‍රමාණවත් ලෙස ලබා දුන්නේ නැහැ. ඒ නිසා අවශ්‍ය දේ අවශ්‍ය වෙලාවට ලබා දුන්නා නම් ඒ දැරිවියව බේරා ගන්න තිබුණා. ඒ නිසා අපට අද කියන්න තිබෙන්නේ එක කරුණයි. ඒ තමයි, මේ රටේ අහිංසක දුක් විඳින මිනිසුන්ගේ වේදනාවන් ගැන මේ ආණ්ඩුවට සංවේදීකමක් නැහැයි කියන එක. මේ රටේ ආර්ථිකය දුවන්නේ මේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය හොඳ නිසා නොවෙයි. මේ රටේ අහිංසක මිනිසුන් ගැහැණු, පිරිමි භේදයක් නැතිව අවුරුද්දකට ඩොලර් බිලියන 7ක්, 8ක් විදේශ විනිමය මේ රටට එවනවා. ඒකෙ හයියෙන් තමයි මේ රට දුවන්නේ. හැබැයි, "රට විරුවන්" කියලා ඒකට නම් දෙනවා.

හැබැයි, රට විරුවන්ගෙන් කෙනෙක් මැරෙන්න යනකොට ඩිලාන් පෙරේරා ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ සිටින්නේ වෙනත් අරමුණකයි. ඒ රට විරුවන්ගෙන් කෙනෙක් මැරෙන්න යනකොට මේ රටේ

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සිටින්නේ වෙනත් අරමුණකයි. ඒ රට විරුවන්ගෙන් කෙනෙක් මැරෙන්න යනකොට විදේශ ඇමති ජී.එල්. පීරිස් ඇමතිතුමා සිටින්නේ වෙනත් අරමුණකයි. මොකක්ද ප්‍රමුඛතාව? මේ දරුවාගේ මරණය ඒගොල්ලන්ට ප්‍රමුඛතාවක් නොවෙයි. මේ දරුවාගේ ජීවිතය බේරා ගන්නා ඒක ඒ අයට ප්‍රමුඛතාවක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මරණයෙන් දුක් වන්නේ මේ රටේ කාන්තාවන් විතරක් නොවෙයි. මේ මරණයෙන් දුක් වන්නේ මුස්ලිම් ප්‍රජාව විතරක් නොවෙයි. මේ මරණයෙන් දුක් වන්නේ මේ මුළු රටමයි. ඒ වාගේම මුළු ලෝකයමයි.

බලන්න, අවසානයේ දී මේ දරුවාව මැරුවාට පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් නිවේදනයක් නිකුත් කළා. මා දැන ගන්න කැමැතියි, එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ තරම් උනන්දුවක් දක්වන මේ කාරණය ගැන ලංකාවේ ආණ්ඩුව කළ බලපෑම මොකක්ද කියලා. සවුදි අරාබිය ඔය නීති ක්‍රමය ගැන මහ ලොකුවට කථා කළාට, එක ඇමෙරිකන් කාරයෙක් එල්ලලා තිබෙනවාද? එක ඇමෙරිකන් කාරයෙකුගේ බෙල්ල කපලා තිබෙනවාද? එක යුරෝපීය ජාතිකයෙකුගේ බෙල්ල කපලා තිබෙනවාද? නැහැ. මේක ඉතාමත් බරපතළ විධියට අර පහත් තැනින් ජලය බැසයාමක්. මේ අහිංසක දුප්පත් රටවල සිටින මිනිසුන්ගේ විතරයි බෙල්ල කපන්නේ. එහෙම නැත්නම් සවුදි අරාබියේ සිටින දුප්පත් මිනිහාගේ බෙල්ල කපනවා. ඒක තමයි සිදු වන්නේ.

තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, මේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, මේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත වෙනුවෙන් පෙනී සිටින්න. විදේශ කටයුතු අමාත්‍යාංශයට බැරි වෙලා තිබෙනවා, අවංකව කාර්යක්ෂමව මේ රාජකාරිය කරන්න. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, විෂය භාර ඇමතිවරයා හැටියට මේ කාරණය තමන්ගේ ප්‍රමුඛතාවක් වශයෙන් හඳුනාගන්න. ඒක තමයි පරාජය. කරුණාකරලා වරද භාර ගන්න. ලජ්ජාවක් තිබෙනවා නම් ඉල්ලා අස්වන්න.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Madam Chairperson, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Yes, Hon. Neomal Perera?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ඉංග්‍රීසි එකට සිංහල translation එක කරන්න යන්නේ.

One Slaten, an American working for Aramco, had slaughtered a Sri Lankan women by the name of Munasinghe Muhandiramlage Amaralatha. -[*Interruption.*] So, this American, for slaughtering a Sri Lankan woman, has been sentenced to death; an American has been sentenced to death.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට කලින් මෙතුමා දීර්ඝ කථාවක් කළා. මොකක්ද, මේ කියන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු පූජ්‍ය අතුරලියේ රතන ස්වාමින් වහන්සේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එකම කාරණයට දෙවතාවක් කථා කරන්න බැහැ. [බාධා කිරීමක්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Madam Chairperson, I rise to a point of Order.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Point of Order කිව්වාට බොරුව නේ කරන්නේ අමාත්‍යතුමා. මොකක්ද, මේ කියන්නේ? ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමා එදා උදේ වන තුරු දැන ගෙන හිටියෙත් නැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

Madam Chairperson, I am only requesting that names and things mentioned against the Standing Orders be expunged.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Okay.

[අ.භා. 5.38]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින රිසානාගේ සිද්ධිය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කෙරෙන සාකච්ඡාවට සහභාගි වීමට ලැබීම ගැන මම විශේෂයෙන්ම සතුටු වෙනවා. මොකද, ජාතික වැදගත්කමක් ඇති තත්ත්වයට රිසානාගේ අනුවේදනීය සිද්ධිය අද පත් වෙලා තිබෙනවා. මෙහිදී කරුණු ගණනාවක් අනාවරණය වුණා. මැද පෙරදිග තත්ත්වය පිළිබඳ මූලික කරුණු ගණනාවක් මෙහිදී අනාවරණය වෙලා තිබෙනවා. මැද පෙරදිග ගිය ශ්‍රී ලංකා කාන්තාවන්ගේ ඉරණම පිළිබඳ කරුණු කිහිපයක් අපි සාකච්ඡා කරන්න කැමැතියි. කාන්තාවන් මැද පෙරදිග යවන්න පටන් ගත්තේ 1977න් පසුවයි.

විශේෂයෙන්ම එහි වැඩි වීම පටන් ගත්තේ 1980න් පසුවයි. ඊට පසු 1994, 1995 වන විට මැද පෙරදිග ගිය කාන්තාවන්ගේ ශ්‍රම බළ කාය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. අපේ ශ්‍රී ලංකාවේ කාන්තාවෝ මැද පෙරදිග යන්නේ කන්න නැති, වහල්, හිඟන ජාතියක් හැටියට නොවෙයි. ඒ ගැන විශේෂ අවධානය යොමු කළ යුතුයි. ඇයි මේ කාන්තාවන් මැද පෙරදිග යන්නේ කියන එක පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් අපි වෙනමම කර ගත යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සම්බන්ධයෙන් මම විශේෂ කරුණු කිහිපයක් ගැන අවධානය යොමු කරවන්න කැමතියි. මැද පෙරදිග ගිය කාන්තාවන්ගෙන් සියයට 30ක් අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා මැද පෙරදිග තානාපති කාර්යාලවල අද විශාල වශයෙන් පොදි ගැහිලා ඉන්නවා. ඒ වාගේම මැද පෙරදිග ගිය කාන්තාවන්ගේ තත්ත්වය කුමක්ද? මැද පෙරදිග ගිය කාන්තාවන්ගේ තොරතුරු අරගෙන බැලුවාම -අරාබි ඉස්ලාම් නීතිය අනුව අරාබි මනුෂ්‍යයෙකුට කාන්තාවන් කිහිප දෙනෙක් කසාද බඳින්න පුළුවන්.

නමුත් පළමුවන කසාදය බැඳපු අරාබි මනුෂ්‍යයාගේ පළමු බිරිඳ දෙවන බිරිඳ කසාද බඳිනවාට කැමැති නැහැ. -පිලිපීන හෝ ශ්‍රී ලංකා හෝ ගෘහ සේවිකාවන් අනියම් බිරිඳ හැටියට තියා ගැනීම සාමාන්‍ය ප්‍රතිශතයක් හැටියට සැලකිය යුතු ප්‍රමාණයක් තිබෙන බව පෙනෙනවා. රිසානාගේ ඝාතනය පිටුපස තිබෙන තවත් කරුණක් ගැන, ඒ කියන්නේ මාස හයක් වන මැරුණු දරුවාගේ පියාගේ අනියම් බිරිඳ බවට රිසානා පත් වෙලා හිටියද කියාත් අපි දන්නේ නැහැ. මොකද, ලිංගික මානසික විකෘතියත් එක්ක අඩු වයස් කාන්තාවන් යැවීමේ ප්‍රවණතාවයක් අද පැන නැඟී තිබෙනවා. මේවා පිළිබඳව වෙනම අධ්‍යයනයක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පසු ගිය අවුරුද්දේ ලියවිල්ලක් පළ කළා. ඒ ලියවිල්ලේ හැම රටක් ගැනම -ඉතියෝපියාව, පිලිපීනය ආදි රටවල් ගැන- තිබුණා. ලංකාව ගැන තමයි වැඩියෙන්ම සිද්ධි වාර්තා කර තිබුණේ. ඉතාම අනුවේදනීය සිද්ධි, මානව හිමිකම් කඩ කිරීම්, ඝාතනයට ලක් කිරීම්, ඇණ ගැසීම්, අත පය කැපීම් ඇතුළු විශේෂයෙන්ම කාන්තාවන්ගේ සිද්ධි ගණනාවක් වාර්තා කර තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට මැද පෙරදිග ගිය කාන්තාවන්ට ලැබෙන වැටුප ගැන බලමු. මෙහි භයානක මිනීමරු ජාවාරමක් කරනවා. ඒ කියන්නේ ඒජන්සිකරුවා විසින් එහෙ ඒජන්තකරුවාගෙන් විශාල මුදලක් ගන්නවා. ඒ මුදල ඉස්සෙල්ලාම ගෙදරට දෙනවා. කාන්තාවට ලැබෙන වැටුප මාසිකව රුපියල් 30,000, 40,000 වුණත් අන්තිමට රුපියල් 25,000ටත් අඩු වැටුපක් තමයි බොහෝ වෙලාවට ඔවුන්ට ලැබිලා තියෙන්නේ. ඒ අනුව අඩු වැටුප් ලබා දීම පිළිබඳව ඔවුන්ගේ සම කොල්ලයක් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට වැඩ කරන කාලය පිළිබඳව ගනිමු. උදේ 3ට පටන් ගෙන රෑ 12 වන තුරු මේ කාන්තාවන් වැඩ කරන්න ඕනෑ. ඒ කියන්නේ මුළු මැද පෙරදිග කලාපයම. සෞදි ආරාබියේ පමණක් නොව, එක්සත් අරාබි එමිරේට්ස්, බහරේන්, ලෙබනන් ඇතුළු බොහෝ රටවල අති අමානුෂික මානව හිමිකම් කඩ කිරීම් ගැන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අන්තර්ජාලයට ගිහින් තොරතුරු බලන්න පුළුවන්. එහි ලක්ෂ සංඛ්‍යාත තොරතුරු වාර්තා කර තිබෙනවා. ඒ අනුව මේ කාන්තාවන් විඳින අන්ත අසරණ තත්ත්වයේ එක සාධකයක් පමණයි රිසානා කියා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ලංකාවේ ඇති වී තිබෙන තත්ත්වය ගනිමු. මාස පහේ හයේ දහයේ දොළහේ දරුවෝ සිටින මව්වරුන් විදේශ ගත වෙනවා. එතකොට දරුවාට ආදරය අහිමි වෙනවා. අවුරුදු 15ක් 16ක් වෙලා දරුවා වැඩිවියට පත් වන විට තමන්ගේ අම්මා ලංකාවේ නැහැ. ඒ නිසා දරුවෝ නොමඟ යෑමේ ප්‍රවණතාවය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම අවුරුදු 14, 15, 16 පිරිමි දරුවෝ මවගේ සෙනෙහස නොමැති නිසා, තමන්ගේ ආත්තම්මාගේ රැකවරණය යටතේ සිටින නිසා ඔවුන් නොමඟ යෑමේ ප්‍රවණතාවය වැඩි වෙලා තිබෙනවා.

ඒ අනුව අද ග්‍රාමීය මට්ටමින් ගංජා සහ වෙනත් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු තරුණ පරම්පරාව ගත්තොත්, දෙමව්පියන් මැද පෙරදිග යෑමේ සාධකය ඒ ඇතුළේ තිබෙනවා. ඒ වාගේම පියවරු විසින් තමන්ගේ දරුවා දූෂණය කිරීම් වාර්තා වෙලා තිබෙනවා. අම්මා මැද පෙරදිග යෑවීම මේකට සෑහෙන්න මට්ටමකින් බලපා තිබෙනවා. ඒ වාගේම තමයි බේබදුකම. අතිවිශාල බේබදුකමක් අද ග්‍රාමීය සමාජයේ තිබෙනවා. තරුණ කාන්තාවක් කසාද බැඳලා ඉතා කෙටි කලකින්, සමහර විට දුප්පත්කම නිසා හෝ වෙනත් සමාජයීය සාධක නිසා හෝ තවත් කරුණු ගණනාවක් නිසා මැද පෙරදිගට යන්න පුළුවන්. මේ සාධක සියල්ල අරගෙන බැලුවාට පස්සේ අද අපේ රටේ බරපතළ අර්බුදයක් ඇති වෙලා තිබෙන බව පෙනෙනවා. මෙහි අවදානම් සහගත පැත්ත තමයි ලංකාවේ සමාජ රෝග පැතිරීම. දැනට ලංකාවේ 3,000කට වැඩි පිරිසකට ඒඩ්ස් වැලඳිලා කියලා හඳුනාගෙන තිබෙනවා. 10,000කට වැඩි ප්‍රමාණයකට ඒඩ්ස් වැලඳී ඇති බවට අනුමාන කරනවා. මේ ඒඩ්ස් රෝගය පිළිබඳ තොරතුරු මූලය හොයා බැලුවාට පස්සේ මොකක්ද හෙළි වන්නේ? එක්කෝ මැද පෙරදිග ගිය කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන්ට ඒඩ්ස් බෝ වෙලා. එහෙම නැත්නම් මැද පෙරදිග ගිය කාන්තාව මේ සමාජ රෝගවලට ගොදුරු වෙලා තිබෙනවා.

අපේ රටේ තිබෙන සංස්කෘතික ආවරණය නිසා මෙතෙක් කල් ඉන්දියාවට සාපේක්ෂව, තායිලන්තයට සාපේක්ෂව මේ සමාජ රෝග පැතිරීමේ අවදානමෙන් අඩු තත්ත්වයක අපේ රට තිබියා. සාපේක්ෂ වශයෙන් ගත්තොත් අදත් අපේ රටේ ඒ ප්‍රවණතාව අඩුයි. නමුත් මේ ලක්ෂ දහයකට -මිලියනයකට- අධික කාන්තාවන් ගෘහ සේවය නමින් වහල් සේවයේ යෙදීම හා එහි ගණිකා වෘත්තියේ යෙදීම නිසා අද බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා.

අප මෙන්න මේ කාරණයත් කියන්න ඕනෑ. ඉන්දියාව ග්‍රාමීය වශයෙන් අපට වඩා දුප්පත්කම, විෂමතාව, කුලහීනතාව, සමාජ, සංස්කෘතික ප්‍රශ්න විශාල වශයෙන් තිබෙන රටක්. නමුත් ඉන්දියාවේ කාන්තාවන් මැද පෙරදිග යවන්නේ නැහැ. පුරුෂයන් විතරයි මැද පෙරදිග යවන්නේ. බංගලිදේශයත් ආර්ථික වශයෙන් සංඛ්‍යාත්මකව අපට පහළින් ඉන්නේ. දකුණු ආසියානු කලාපයේ වෙනත් කිසිම රටක් කාන්තාවක් මැද පෙරදිග රැකියාවකට යවන්නේ නැහැ. එහෙනම් මේ ගෘහ සේවය නමින් පවතින අඩු වැටුපට කාන්තාවන් මැද පෙරදිගට යවන වහල් සේවය වහාම නතර කළ යුතුය කියන ස්ථාවරයට අපේ රටත් එන්න ඕනෑ.

මෙහිදී එක්සත් ජාතික පක්ෂය මොන ස්ථාවරයේ ඉන්නවාද කියලා අප දන්නේ නැහැ. නමුත් මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා ඔවුන් ඒ ස්ථාවරය දරනවාය කියලා. අප සන්තෝෂ වෙනවා පක්ෂ භේදයකින් තොරව ඔවුන් ඒ මතයේ සිටීම ගැන. මා ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගෙන් මේ ප්‍රශ්නය ඇහුවා. එතුමා කියන විධියට නම් සමාජවාදය ඇති වෙනකම් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. නැතිබැරිකම නැති කරන්න ඕනෑය කියනවා. එතුමා කියන විධියට සමාජවාදය ආවාම තමයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ. මා එතුමාගෙන් ඇහුවා ඔබලාගේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා. එතුමන්ලාට ප්‍රතිපත්තියක් නැහැ. නමුත් මැද පෙරදිගට කාන්තාවන් නොයැවිය යුතුය කියන ඒ දේශපාලන ස්ථාවරය එක්සත් ජාතික පක්ෂය ගත්තා නම් අප ඒ ගැන ආඩම්බර වෙනවා. මොකද, අභිමානවත් රටක ගරුත්වයක් අපට තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා බණ කියන්න විවිධ සංවිධාන හරහා මැද පෙරදිගට -ඩුබායිවලට- ගිහින් තිබෙනවා. සමහර වෙලාවට අපේ මිත්‍රයන් විශ්වවිද්‍යාල මට්ටමින් අපට හම්බ වෙලා තිබෙනවා. අප කථා කරලා ඉවර වෙලා ශ්‍රී ලංකාවේ කියලා කිව්වාම, "අපෝ, අර කාලකණ්ණි හිඟන ගෑනු ඉන්න රටද?"කියලායි ඔවුන් අහන්නේ. අපේ අභිමානය ඒ තරම් පහළට වැටිලා තිබෙනවා. හැම දාම කොළ පාටට තිබෙන මෙච්චර ලස්සන රටක්, මෙපමණ ගංගා ධාරා තිබෙන රටක්, මෙච්චර වටිනා ඉතිහාසක් තිබෙන රටක් මේ තරම් කාලකණ්ණි තත්ත්වයකට වැටෙන්න ඕනෑ නැහැ.

පෙරේදා අපේ ඇමතිතුමාත්, ජනාධිපතිතුමාත් සමඟ අප මේ ගැන විශේෂ සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී අනාවරණ කර ගත්තා වැදගත් තීන්දු, තීරණ ගණනාවකට එතුමන්ලා පැමිණෙන බව. ගෘහ සේවිකාවන් විධියට මැද පෙරදිගට යැවීම සම්පූර්ණයෙන් අහෝසි කිරීමේ වැඩ පිළිවෙළකට අප එළඹෙන්න ඕනෑය කියලා එහිදී කියා තිබෙනවා. එතුමන්ලා කිව්වා ඒ සඳහා විභාගයක් තියලා, දින 21ක පුහුණුවක් දීලා ඒ කටයුතු කරන බව. ගරු ඇමතිතුමාගේ කථාවේදී ඒ ගැන පැහැදිලි කරයි. ඒ ගැන එක්තරා දුරකට අපට සතුටු වෙන්න පුළුවන්. නමුත් මේ ආණ්ඩුවේ කොටසක් වන අපි කියන්න ඕනෑ, මෙවැනි තවත් සිද්ධියක් වාර්තා වුණොත් මේ ආණ්ඩුවට කොයි විධියට ඒක බලපායිද කියලා. ඒ ගැන දේශපාලනිකව අප කල්පනා කරන්න ඕනෑ. දැනටමත් ඒ විධියට සිරගත වුණු තවත් කී දෙනෙක් ඒ රටවල ඉන්නවාද? මේ ආණ්ඩුවේ ඉන්න අපට ආත්ම ගරුත්වයක් ඇතිව මේ ආණ්ඩුවේ ඉන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. ඒ නිසා අප මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, අපේ කාන්තාවන් මැද පෙරදිගට යවන මේ වහල් සේවය නවත්වන්න කියලා. ඩොලර් බිලියන 4.1ක් තමයි මේ හරහා අපට ලැබෙන ආදායම. අප ඉල්ලා හිටින්නේ ගෘහ සේවයට යැවීම නතර කරලා මැද පෙරදිග ඉන්න කාන්තාවන් ලක්ෂ 10ම ලංකාවට ගෙන්වන්න කියලා නොවෙයි. අවුරුදු 3ක් යන තුරු ඒ ඩොලර් බිලියන 4.1ක මුදල අපට හම්බ වෙනවා. මැද පෙරදිග ගෘහ සේවයට යැවීම අද නැවැත්තුවොත් අපට ඒ බලපෑම එන්නේ තව අවුරුදු තුනකින්. එහෙනම් ඒ අවුරුදු තුන ඇතුළතදී මැද පෙරදිගට හෝ වෙනත් රටකට පුහුණු ශ්‍රමිකයන් යවන්න අපට පුළුවන්කම තිබෙනවා. ඉතාලියට හෝ සිංගප්පූරුවට හෝ වෙන කිසිම රටකට කාන්තාවන් යවනවාට අප විරුද්ධ නැහැ. අප විරුද්ධ මැද පෙරදිගට කාන්තාවන් යවන එකටයි.

මෙහිදී ඉතා වැදගත් දෙයක් හෙළිදරව් වුණා. ඒක තමයි ෂරි-ආ නීතිය. උගත් මුස්ලිම් මිත්‍රවරු අපත් එක්ක කිව්වා, ඇත්ත වශයෙන්ම මැද පෙරදිග නීතිය ගැන අප කම්පා වෙනවා කියලා. නමුත් ඉස්ලාම් ආගමේ ඇතැම් අන්තවාදී පූජකයන් විසින් ප්‍රකාශ කළා මේ නීතිය සාධාරණයි කියලා. ඒ වාගේම ඒ අම්මාට බලපෑම් කළා මේ ගැන කථා කරන්න එපා කියලා. අද අපට ඒවා වාර්තා වෙලා තිබෙනවා. නමුත් ඉස්ලාම් ආගමේ ප්‍රබුද්ධ පිරිස්, උගත් පිරිස් අපත් සමඟ මේ ගැන සාකච්ඡා කළා. මැද පෙරදිග වහල් නීතිය, ෂරි-ආ නීතිය කොයි වාගේද කියලා මේ සිද්ධියෙන් ලෝකයට හෙළිදරව් වුණා. මුළු මැද පෙරදිග කලාපයේම -ඒ බොහෝ රටවල- අද තිබෙන්නේ වහල් නීතියක්. ලංකාවේ කාන්තාවක් බුදු පිළිමයක් ළඟ තබා ගත්ත වරදට ඇයගේ අත පය කපා තිබෙනවා; යකඩ ඇණ ගහලා තිබෙනවා.

කිසිම ආගමික නිදහසක් නැති රටක්. මේ රටේ ඉන්න ඉස්ලාම් බැතිමතුන් කල්පනා කරන්න ඕනෑ, මොකක්ද මේ මැද පෙරදිග තිබෙන ඉස්ලාම් ආගම කියලා. අද සමහර ඉස්ලාම් අන්තවාදී කල්ලි උත්සාහ කරනවා, මේ රට සවුදි අරාබියක් කරන්න. සමහර කල්ලි උත්සාහ කරනවා, ඒ වහල් නීති ටික මේ රටට ගෙනැල්ලා, කාන්තාවන්ගේ ඔළුව වහලා, මේ රටත් සවුදි අරාබියක් කරන්න. ඒ නිසා අපි කියන්න කැමැතියි, ඒ අන්තවාදී කල්ලිවලට කිසිම ඉඩක් නොදී අපි ආත්ම ගරුත්වයක් ඇතිව කෙළින් පෙනී සිට මේ තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑය කියලා.

ජනාධිපතිතුමා මේ සම්බන්ධ සාකච්ඡාවේදී ඉතාම යහපත් ප්‍රතිචාර දැක්වූවා. ඒ වාගේම විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන ඇමතිතුමාත් සාධනීය යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. ගෘහ සේවිකාවන් වෙනුවට වෘත්තීය මට්ටමේ සේවිකාවන් - හෙදියන් මෙන්ම විවිධ වෘත්තීය මට්ටමේ සේවිකාවන් - අපට යවන්න පුළුවන්. වාර්ෂිකව මැද පෙරදිග යන කාන්තාවන් හා පිරිමින්ගේ ප්‍රමාණය 2,50,000 හෝ 3,00,000ක් වුණා නම්, අපේ රජයේම වාර්තාවලට අනුව මේ අවුරුදු දෙක තුනේදී කාන්තාවන් එහි යෑමේ ප්‍රවණතාව සියයට 50කට අඩු වෙලා තිබෙන බව පෙනෙනවා. මේ මිනීමරු, ලේ උරා බොන, කාලකණ්ණි හොර ඒජන්සි, - මේ රිසානාගේ සිද්ධිය වාර්තා වෙලා තියෙද්දීත්- මුස්ලිම් ඒජන්සියක පුද්ගලයෙක් කින්නියා ප්‍රදේශයෙන් කාන්තාවන් දෙන්නෙක් පිට රට යවන්න අරගෙන ආවා. එක් කෙනෙකුගේ වයස අවුරුදු දහසයයි, අනෙක් එක්කෙනාගේ වයස අවුරුදු දහ හතයි. ඒ පුද්ගලයා මරදාන පොලීසියෙන් අත් අඩංගුවට ගත්තා.

ලංකාවේ සියලු ජනමාධ්‍ය රිසානාගේ සිද්ධිය ආවරණය කරලා තියෙද්දීත් මේ විධියට අපරාධ කරන තත්ත්වයට මේ ඒජන්සි පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ හොර ඒජන්සි සියල්ලම වසා දමන්න ඕනෑ. ඒ වාගේම මේවා සඳහා බරපතළ නීති රාමුවක් සකසන්න ඕනෑ. යම් කිසි ශ්‍රමිකයෙක් විදේශ රැකියාවකට යවනවා නම්, ඒ ශ්‍රමිකයා යැවීමට ඒ ආයතනය ලියා පදිංචි වෙන්න ඕනෑ කොහොමද, ඔවුන් සපුරන්න ඕනෑ කොන්දේසි මොනවාද කියන එක ගැන අපේ ජනතාවගේ දැනුම ඉතාම අඩු මට්ටමක

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

තිබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, මේ රැකියා ඒජන්සි සම්පූර්ණයෙන්ම ප්‍රතිශෝධනය කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපේ රටේ පුරවැසියෝ අයිති රාජ්‍යයට. ඒ නිසා රට යැවීම ඇතුළු කාර්යයන්වල සම්පූර්ණ වගකීම රාජ්‍යය ගන්න ඕනෑ. ඒ කියන්නේ ව්‍යාපාරිකයන් පෞද්ගලිකව මිනිස්සු රට යවන එක නවත්වන්න කියන එක නොවෙයි. නමුත් ඒ කටයුතු කොහොමද කරන්නේ, ලියා පදිංචිය ලබා දෙන්නේ කොහොමද කියලා රාජ්‍යයට අධීක්ෂණය කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබිය යුතුයි. ඒ නිසා අපි කල්පනා කරනවා, රිසානාගේ සිද්ධිය මෙතැනින් නවත්වන්න හොඳ නැහැ කියලා. අපි දන්නවා, පිලිපීනය මේ වාගේ සිද්ධි ගණනාවක් අන්තර්ජාතික මට්ටමට ගෙන ගියා කියලා.

මා විශේෂයෙන්ම සන්තෝෂ වනවා, එක්සත් ජාතික පක්ෂයේ රංජන් රාමනායක මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. ඒ වාගේම එතුමා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ස්වාමීන් වහන්ස, එක ප්‍රශ්නයක් තිබෙනවා.

තුංගසිරි කියලා පුද්ගලයෙක් සිය නිවසේ බුදුන් වන්දනා කළ වරදට කස පහර 600ක් දීලා සිරගෙදර තබා ගෙන ඉන්නවා. ඔබ වහන්සේලා එතුමා වෙනුවෙන් කිසිදු තීරණයක් ගන්නේ නැද්ද?

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අනිවාර්යයෙන්ම ගන්න තමයි අපි මේ කථා කරන්නේ. ඒ එක සිද්ධියක් පමණයි. කස පහර 600ක් දීම පමණක් නොවෙයි, මරලාත් තිබෙනවා. අද ඒවා වාර්තා වෙලා නැහැ. වෙසක් කාඩ් පතක් තබා ගැනීමේ වරදට, කඩදාසියක බුදු පිළිමයක් තිබීමේ වරදට, බෙල්ල කපලා මරන කාලකණ්ණි නීතියක්, මානව විරෝධී නීතියක් තමයි මේ රටවල තිබෙන්නේ. එවැනි සිද්ධි දස දහස් ගණනක් අද තිබෙනවා. අද මහ ලොකුවට සෞදි අරාබිය මහා කේතුමතී රාජධානිය කියලා, මැද පෙරදිග හරිම හොඳයි කියලා කථා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු ස්වාමීන් වහන්ස, වේලාව අවසන් වෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
තවත් තත්පර දෙක තුනක් මට දෙන්න.

මේ රිසානාගේ සිද්ධිය අනුවේදනීය සිද්ධියක් බවට පත් කර ගෙන, සිනමාව තුළින්, කලාව තුළින් ලෝකයට මේ කාරණය අරගෙන ගිහිල්ලා ලංකාවේ කාන්තාවන්ගේ ඉරණම වෙනුවෙන් - අපේ පමණක් නොවෙයි, අපි වැනි තුන්වන ලෝකයේ දුක් විඳින කාන්තාවන්ගේ ඉරණම වෙනුවෙන්- සංවිධානාත්මක හඬක් නැඟිය යුතුයි කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය.

[අ.භා. 5.51]

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 2013 ජනවාරි 09 වන දින මිය ගිය රිසානා නෆීක් දැරිය විදේශගත වුණේ දුප්පත්කම නිසායි. එම දැරියගේ දෙමාපියන්ට, සහෝදර සහෝදරියන්ට හොඳ දවසක් උදා කර දීමේ චේතනාවෙන් තමයි ඇය විදේශගත වුණේ. නමුත් එම දැරියගේ මරණය ගැනයි අවසානයේදී අපට අහන්නට සිදු වුණේ. ඒ නිසා පළමුවෙන්ම ඒ දෙමාපියන්ටත්, එම සහෝදර සහෝදරියන්ටත් මාගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මේ වේලාවේදී මා කියන්න ඕනෑ, අපේ රටේ නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියක් නොමැතිවීම හේතුවෙන් තමයි අද මේ රටේ දිළිඳුකම වැඩි වෙලා තිබෙන්නේ කියලා. මේ දිළිඳුකම වැඩිවීමේ හේතුවෙන් තමයි අපේ දුප්පත් පවුල්වල අහිංසක ජනතාවට විදේශගත වෙලා එවැනි විදේශ රැකියාවලට යන්නට සිදු වෙලා තිබෙන්නේ.

මේ රජය විදේශගතවන අයගෙන් ඩොලර් සොයා ගත්තාට, ඒ අයගේ අනාගතය ගැන, ආරක්ෂාව ගැන, ඒ වාගේම ඒ අයගේ පහසුකම් පිළිබඳව හරියාකාරව සොයා බලන්නේ නැහැ. ඒ ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඒ සම්බන්ධව අපි කනගාටු වනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

අපි දන්නවා, ඒ දැරිය සවුදි අරාබියට ගියේ 2005 මැයි මාසයේ 4වැනිදා කියලා. මේ සිද්ධිය සම්බන්ධයෙන් ඇයව අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ එම මාසයේම 22වැනිදා. ඇයව සවුදි අරාබියට යවා තිබෙන්නේ ගෘහ සේවිකාවක් හැටියටයි. ඇගේ උප්පැන්නය වෙනස් කරලා ගමන් බලපත්‍රය සකස් කර තිබෙනවා. ඒ දැරිය කිසිම දෙයක් නොදන්නා, හිත මිත්‍රයෙකු නැති, නෑදෑයෙකු නැති, මහක් තොටක් දන්නේ නැති ස්ථානයකට ගිහිල්ලා දමා තිබෙනවා. ඒ නිසා තමයි මෙවැනි ඛේදවාචකයකට ඇයට මුහුණ දෙන්නට සිදු වුණේ. මා හිතනවා, ඒ වාගේ වංචනික ක්‍රියාවක් කරපු ඒ ඒජන්සියට මීට වැඩිය තදින් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. පහු වෙලා හෝ නීතිය ක්‍රියාත්මක කර තිබෙනවා. නමුත් මා හිතන හැටියට මෙය බොහොම බරපතළ, ඒ වාගේම නීති විරෝධී, වංචනික ක්‍රියාවක්.

අපි දන්නවා රිසානා නෆීක් විදේශගත වුණේ ගෘහ සේවිකාවක් හැටියට බව. රවුෆ් හකීම් අමාත්‍යතුමාත් කිව්වා, ඒ දැරිවිය ගියේ ගෘහ සේවිකාවක් හැටියට වුණත් පසුව නිවසේ සේවය කරනවා වාගේම, ඒ කුඩා දරුවා බලා ගැනීමේ කටයුතුත් කරන්න සිදු වුණා කියලා. ඇමතිතුමා කිව්වා වාගේ, ගෙදරක වැඩ කරනවා කියන එකත්, දරුවෙකු බලා ගන්නවා කියන එකත් අතර බොහොම ලොකු වෙනසක් තිබෙනවා. දරුවෙකු බලා ගන්නවා කියන්නේ ලේසි පහසු කාර්යයක් නොවෙයි. එවැනි දෙයකට පිට රටකට යවන කොට ඒ පිළිබඳව මනා පුහුණුවක් ඇතිව ඒ අයව යවන්න ඕනෑ. එහෙම නැති වුණොත් ඒ අයට මේ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වනවා. අනෙක් කාරණය, රිසානා කියන්නේ බොහොම බාල වයස්කාර දැරියක්. එවන් දැරියකට පුහුණුවක් නැතුව ගිහිල්ලා ඒ වාගේ වැඩ කොටසක් කොහොමවත් කරන්න අපහසුයි. මා හිතන්නේ ඒ සිද්ධියෙන් පස්සේ විශේෂයෙන්ම මේ රජය කළ යුතුව තිබුණේ ඒ ආයතනවල බලපත්‍ර අත් හිටුවීමයි; blacklist කිරීමයි. එය අනිවාර්යයෙන්ම කළ යුතු බවයි.

අපි දන්නවා, ඒ සිද්ධිය නිසා 2013 ජනවාරි 9වැනිදා ඒ දැරිවිය ඒ රටේ ෂරී-ආ නීතිය අනුව ගෙල සිඳ මරා දැමූ බව. ජනවාරි මාසයේ 9වැනිදාට කලින්, -ඒ සිදුවීමට කලින්.- ඒ දැරිවිය සිර

අඩස්සියේ ඉන්න අවස්ථාවේදී මේ රජයේ මැති ඇමතිවරු අවස්ථා ගණනාවක් එහෙට මෙහෙට ගියා. ඒ පිළිබඳව සාකච්ඡා කළාය කිව්වා. නමුත් අපි අහන්න කැමැතියි, කාගෙත් එක්කද, මොනවාද සාකච්ඡා කළේ කියලා. මොකද, අධිකරණ අමාත්‍යතුමා එතුමාගේ කථාවේදී ෂරී-ආ නීතිය ගැන කිව්වා. ඒ බව දැන ගෙන සිටියා නම් අදාළ සිද්ධිය සම්බන්ධව හමු වුණ අයත් එක්ක සාකච්ඡා කරලා, මේ පිළිබඳව ප්‍රශ්න කරන්න තිබුණා. ෂරී-ආ නීතියට අනුව අම්මා කෙනෙකු අනිවාර්යයෙන්ම අවුරුදු දෙකක් තම දරුවාට මවු කිරි දෙන්න ඕනෑ.

එහෙම නම්, අපි දකින විධියට මෙතැනදී මුලින්ම වරදක් කරලා තිබෙන්නේ ඒ මියගිය කුඩා දරුවාගේ අම්මායි. එහෙම නම් ඒ දරුවාගේ මරණයට මුලින්ම මාර්ගය විවෘත කරලා තිබෙන්නේ ඒ කුඩා දරුවාගේ අම්මාය කියන කාරණය මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මොකද, ඒ කුඩා දරුවාට මවු කිරි නොදී, කිසි දෙයක් නොතේරෙන දැරියකට කිරි බෝතලෙන් ඒ කුඩා දරුවාට කිරි පොවන්න දීපු නිසායි මේ සිදුවීම වුණේ. එහෙම නම්, රිසානාට නොවෙයි පළමුවෙන්ම දඬුවම් කරන්න ඕනෑ, ඒ මියගිය කුඩා දරුවාගේ අම්මාටයි. සවුදි අරාබි රජයත් සමඟ ඒ පිළිබඳව මීට වැඩිය තදින් කථා කරලා රිසානාට සහනයක් ලබා ගන්න කටයුතු කරන්න තිබුණා. මම හිතන්නේ, එහෙම කළා නම් රිසානාට ජීවත් වෙන්න අවස්ථාවක් ලැබෙන්න තිබුණාය කියායි.

නමුත් ඒ විධියට සිදු වුණේ නැති එක ගැන අපි විශේෂයෙන්ම කනගාටු වෙනවා. මේ රිසානා දැරිය ආපසු මේ රටට එන්න ලොකු බලාපොරොත්තුවකින් සිටියා. ඒ රටේ ජීවත් වන ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරියක් වන කපියා ඉෆ්තිකාර් කියන මහත්මිය මේ දැරිවියට සිදු වුණු දේ ගැන පුවත් පත්වලින් දැකලා ඇයව හමු වෙන්න ගිහිල්ලා තිබෙනවා. ඊට පස්සේ නිරන්තරයෙන්ම ඇයව මුණ ගැහිලා කථා කරලා තිබෙනවා. ඒ ගිය අවස්ථාවකදී මේ රිසානා දැරිය ඇයට කියා තිබෙනවා, ආපසු ඇගේ දෙමවුපියන් ළඟට ගිහිල්ලා පුරුදු විධියට ජීවත් වෙන්න බලාපොරොත්තුවෙන් සිටිනවා කියලා. නමුත් අවසානයේදී සිදු වුණේ එහෙම දෙයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රමිකයන් පිට රට යැවීමේ ක්‍රමවේදය පිටුපස තිබෙන මාෆියාව සහමුලින්ම වළලා දමන්න ඕනෑ කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි. අපි දන්නවා, අපේ විදේශගත වන උදවියගේ මළ සිරුරු මේ වන විට කොයි තරම් ප්‍රමාණයක් අපේ රටට ඇවිල්ලා තිබෙනවාද කියලා. ඒ වාගේම අපි කවුරුත් දන්නවා, මේ වන විටත් කටාර් රටේ සුදේශ්කරන්ට මරණ දඬුවම නියම වෙලා තිබෙනවා කියලා. ඒක තවත් හේතුවක්. විදේශ රටවල තිබෙන නීති ගැන හරි අවබෝධයක් නැතුව ගිහින් ඒ කරලා තිබෙන සිදුවීමක් නිසා තමයි ඔහුට මරණ දඬුවම නියම වෙලා තිබෙන්නේ. කුමන මොහොතේ තමන්ගේ දරුවාට මරණය උදා වෙයිද කියලා ඒ අම්මා අද බොහොම දුකෙන්, හිතේ ලොකු ගින්දරක් ඇතුවයි ජීවත් වෙන්නේ. ඒ නිසා විදේශ රටවලට ශ්‍රමිකයන් යවන ඒජන්සි ගැන මීට වැඩිය සොයා බලන්න ඕනෑ. ඒ ඒජන්සි කරන අය මුදල් ගැන පමණක් හිතන්නේ නැතුව විදේශගත වන අයගේ සුදුසුකම් ගැනත් සොයා යා බලා -ඒ අය පුහුණු ශ්‍රමිකයන්ද කියලා සොයා බලා- කටයුතු කරන්න ඕනෑය කියන කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මොකද අද මේ වන විට අපේ රටේ හතු පිපෙනවා වාගේ ඒජන්සි ඇති වෙනවා. දිළිඳුකම නිසා පිට රට ගොස් මුදල් සොයා ගන්න, තමන්ගේ අතේ තිබෙන මුදල් ටික මෙවැනි ඒජන්සිවලට දීලා රට යනවා. ඒ ඒජන්සි බලන්නේ මුදල් ගන්න එක ගැන විතරයි. ඉන් එහාට ඒ රට යවන අයට වෙන්නේ මොකක්ද කියන එක ගැන සොයා බලන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට සති කිහිපයකට විතර පෙරදී අනුරාධපුර දිස්ත්‍රික්කයෙනුත් සවුදි අරාබියට ගිහින් ඉන්න කෙනෙක් ගැන මට දැන ගන්න ලැබුණා. මම ඒ ගැන ගරු ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කළා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම සවුදි අරාබියට කාන්තාවන් යැවීම තහනම් කරන්න ඕනෑය කියන ප්‍රතිපත්තිමය තීරණය අපි ගන්න ඕනෑ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
තහනම් කළා.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
බොහොම ස්තුතියි. නමුත් තවම ඒ කෙනාව ගෙන්වා ගන්න බැරි වෙලා තිබෙනවා. ඔබතුමා ඒ ගැනත්-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒ කෙනාව ගෙන්වා ගන්න උදවු කරන තුරු අපි ඒ තහනම අයින් කරන්නේ නැහැ.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
බොහොම ස්තුතියි. ඒ නිසා මම හිතන්නේ, ඒවා ගැනත් මීට වැඩිය අවධානයකින් කටයුතු කරන්න ඕනෑය කියලායි.

අපි දැක්කා පුවත් පත්වල සඳහන් වෙලා තිබෙනවා, රිසානාගේ මරණයෙන් පසුව විශාල මිල මුදල් ප්‍රමාණයක් ඒ පවුලට දීලා තිබෙනවා කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලැබී ඇති කාලය අවසන්.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

කොයි තරම් මුදල් දුන්නත්, කොයි තරම් පාරවල් ඒ දරුවාගේ නමින් නම් කළත් ඒ අම්මාට ඒ දරුවා නැවත ලැබෙන්නේ නැහැ. ඒ නිසා නැවත මෙවැනි මරණ ගැන අහන්න නොලැබෙන්න වහාම මීට වඩා ශක්තිමත් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නය කියන යෝජනාව කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle. Before she starts, will an Hon. Member propose Hon. Ajith P. Perera to the Chair?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா )
(The Hon. Dilan Perera)
Madam, I propose that the Hon. Ajith P. Perera do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව* ගරු තලතා අතුකෝරල මහත්මිය *මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ගරු අජිත් පී. පෙරේරා මහතා *මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல *அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு அஜித் பீ. பெரேரா *அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) THALATHA ATUKORALE *left the Chair, and* THE HON. AJITH P. PERERA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය.

[අ.භා. 6.01]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉතාමත් වැදගත් මාතෘකාවක් පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ජනවාරි 09 වැනිදා ඝාතනයට ලක් වුණු රිසානා නෆීක් නම් ශ්‍රී ලාංකීය දියණියගේ මවටත්, පියාටත්, පවුලේ සියලු දෙනාටත් අපේ කනගාටුව පළමුවෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ. එය ඉතාමත්ම ඛේදනීය තත්ත්වයක්. මා හිතන විධියට ශ්‍රී ලාංකිකයින් හැටියට පක්ෂ පාට, දේශපාලනයකින් තොරව, මේකෙන් දේශපාලන වාසි ලබා ගන්නේ නැතිව මේ සිදු වුණු ක්‍රියාදාමය හරහා තිබුණු ගැටලු සහ අවදානම් තත්ත්වයන් හඳුනා ගෙන ඉදිරියේදී තවත් කාන්තාවකට, තවත් අපේ ශ්‍රී ලාංකීය දියණියකට මෙය සිදු නොවෙන්න අපි වග බලා ගන්න ඕනෑය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ ගරුතර රතන ස්වාමීන් වහන්සේ කිව්වා, 1977න් පස්සේ තමයි මැද පෙරදිගට, පිට රටට ශ්‍රී ලාංකීය ශ්‍රමිකයන් යවන්න පටන් ගත්තේ කියලා. එතකොට 1980 තමයි කම්කරු අමාත්‍ය ගරු සී.පී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මුලින්ම කිසිම රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක්, රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම් නැතිවයි විදේශ රටවලට ශ්‍රමිකයන් යැවීම ආරම්භ කර තිබෙන්නේ.

1980 ජුලි 08 වැනි අඟහරුවාදා හැන්සාඩ් වාර්තාවේ ඇතුළත් එතුමාගේ ප්‍රකාශය අනුව, කම්කරු දෙපාර්තමේන්තුව මඟිනුත් වෙනත් agencies මඟිනුත් ඒ වෙන කොට 30,000ක් විතර යවා තිබෙනවා. එයින් 6,000ක් කාන්තාවෝ. ඒ 6,000න් 2,000ක්ම ගිහිල්ලා තිබෙන්නේ පෞද්ගලික වශයෙනුයි. රජයේ අවසරය ලබා ගෙන ඇති පෞද්ගලික ආයතන මඟින් 4,000ක් පමණ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම මුලින් තිබිලා තිබෙනවා agencies 55ක්. එය ඒ වෙන කොට 460 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වෙලාවේ එතුමාත් පිළිගෙන තිබෙනවා, මේ agencies වැඩි ප්‍රමාණයක් කටයුතු කරන්නේ සේවා දායකයකු පිට රට යවා යම් කිසි කොමිස් මුදලක් ලබා ගන්නය කියන එක. ඒ නිසා මේ රටේ කාන්තාවන්ට විශාල දුෂ්කරතා තිබෙනවා; අපි මේවා අවම කරන්න කටයුතු කරන්න ඕනෑය කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා මේක මේ හදිසියේ අපේ රජය යටතේ සිදු වුණු අසාධාරණයක් නොවෙයි.

ඊට පස්සේ 1985 විදේශ සේවා නියුක්ති කාර්යාංශය පාර්ලිමේන්තු පනතක් යටතේ ආරම්භ කරලා, 1994 තමයි මේ නීති-රීති හරියට නියාමනය කරලා ක්‍රියාත්මක කර තිබෙන්නේ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තිබුණු ඒ පනත ක්‍රියාත්මක කරලා, නියාමනය කරලා, මේ යවන ශ්‍රමිකයන් ලියා පදිංචි කරලා, ඔවුන්ව පුහුණු කරලා මේ ක්‍රමය විධිමත් කිරීමට කටයුතු කෙරුවේ එවකට කම්කරු අමාත්‍යතුමා හැටියට කටයුතු කළ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන එක මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි කථා කරන්නේ අවුරුදු 17යි, මාස ගණනක වයසේ සිටි ළමයකු ගැන. නැත්නම් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සහ ශ්‍රී ලංකා නීතිය අනුව අවුරුදු 18කට වඩා අඩු ළමයකු ගැන. එතකොට මේ ළමයකු තමයි වයස අවුරුදු 23යි කියලා passport එකේ සඳහන් කරලා පිට රටට යවා තිබෙන්නේ. මොකද, එවකට නීතිය අනුව වයස අවුරුදු 18ට වඩා අඩු කෙනකු පිට රට යවන්න බැහැ. මොකද, අවුරුදු 18කට වඩා අඩු කෙනකු කායිකව සහ මානසිකව සූදානම් නැහැ සමාජයේ අභියෝගවලට මුහුණ දෙන්න.

මේ දරුවා ඉගෙන ගන්නා වයසේ කෙනෙක්. නමුත් දරිද්‍රතාව හෝ සුඛෝපභෝගී ජීවිතවලට ප්‍රවේශයක් වෙන්න පුළුවන්ය කියන ඒ විශ්වාසයෙන් මේ දෙමව්පියන්ගේ නොදැනුවත්කම නිසා මේ දැරිවියගේ වයස අවුරුදු 23ක් ලෙස හදලා ඇයව පිට රට යැව්වා. ඒ ගැන අපි කනගාටු වනවා. එම දෙමව්පියන් දැනුවත්ව හෝ නොදැනුවත්ව එතැන ලොකු වරදක් වෙලා තිබෙනවා.

අපේ රටේ යම් කිසි කෙනෙක් පිට රට යන තීන්දුව ගන්න කලින්, පිට රට ගියාම ඇති වන තත්ත්වයන් පිළිබඳව දැනුවත් වනවා නම්, ගොඩක් හොඳයි කියලා මම හිතනවා. යම් කිසි කෙනෙකුට රැකියාවක් සඳහා පිට රට යන්න අවශ්‍ය වනවා නම්, වැඩිහිටියන්ට හෝ කිසිම රජයකට එය නැවැත්වීමට අයිතියක් නැහැ. කිසි කෙනෙකුට ඔවුන්ගේ නිදහස සීමා කරන්න බැහැ. නමුත් පිට රට යාමෙන් සිදු වන්න පුළුවන් ප්‍රතිවිපාක පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම ඉතාම වැදගත්.

විදේශ සේවා නියුක්ති කාර්යාංශය, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මේ පිළිබඳව කතිකාවතක් ඇති කරලා පුහුණුව සඳහා අවශ්‍ය කරන ඒ පොත්පත් හදලා වැඩ පිළිවෙළක් දියත් කළ බව මම දන්නවා. හුඟක් දුරට ඒ වැඩ කටයුතු සිද්ධ වුවත්, එය සියයට සියයක්ම සාර්ථක වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ දැරිවිය සවුදි අරාබියට ගිහිල්ලා සති දෙකක් ඇතුළත ඒ බලා ගන්න ගිය දරුවාට කිරි පොවන්න ගිහිල්ලා සිදු වූ අත් වැරැදීමකින් ඒ දරුවාගේ මරණය සිද්ධ වුණා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිව්වා, මේ සවුදි අරාබි කාන්තාව මවක් හැටියට තමුන්ගේ යුතුකම් පැහැර හැරලා තිබෙනවා කියලා. නීතියේ මොනවා තිබුණත්, මවක් විසින් තම දරුවාට අවුරුදු දෙකක් වනකම් -අනිවාර්යයෙන් දරුවාට මාස හයක් වන තුරු- මව් කිරි දෙන්න ඕනෑ. ඒ ගැන අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේදීත් කියනවා. ඒ වාගේම මවක් දරුවෙකු බලා ගන්න තව කෙනෙකුට දෙන කොට ඒ වැඩ කරන කෙනාට දරුවෙක් බලා ගැනීමේ පළපුරුද්ද තිබෙනවාද, හැකියාව තිබෙනවාද, දක්ෂතාව තිබෙනවාද කියන එක හොයා බලන්න ඕනෑ. මේ දැරිවිය ඒ රටට ඇවිල්ලා සති දෙකයි, කිසිම දෙයක් දන්නේ නැහැ, තමුන්ගේ දරුවාව ඇයට භාර දීලා ඒ මව ගිහිල්ලා තිබෙනවා. මෙවැනි අවස්ථාවක ඒ දරුවාට පමණක් ඒ වැරැද්ද, ඒ වගකීම පැවරීම ඉතාමත්ම කනගාටුදායකයි.

ඒ රටේ තිබෙන නීතිය ගැන අපි කනගාටු වනවා. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය උපරිම ලෙස කටයුතු කෙරුවා. මේ සඳහා අතිගරු ජනාධිපතිතුමා සෘජුව මැදිහත් වුණා. අපේ විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන ඇමතිතුමා ප්‍රමුඛ ඒ සියලු දෙනා මේ සඳහා මැදිහත් වුණත්, ඇයව

බේරා ගැනීම අපට කරන්න බැරි වුණා. එය ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. මට කලින් කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ, ඒ වෙලාවේ මාස හතරක් වයසේ සිටි තමුන්ගේ පවුලේ එකම දරුවා මේ වාගේ නොහැකියාව තිබෙන කෙනෙකුට බලා ගන්න දීම පිළිබඳව හරි නම්, ඒ මවටත් දඬුවම් කරන්න ඕනෑ. දරුවන් රැක බලා ගැනීම කියන්නේ ඉතාමත්ම වැදගත් භාරදූර කටයුත්තක්. මේ දැරිවිය ගියේ nanny කෙනෙක් හැටියටවත්, child carer කෙනෙක් හැටියටවත් නොවෙයි. ඇය පිට රට ගියේ ගෘහ සේවිකාවක් - housemaid - හැටියටයි. ඒ නිසා මෙතැනදී ඒ මවටත් මේ වග කීමෙන් ගැලවෙන්න බැහැ කියන එක අපි මතක් කරන්න ඕනෑ.

අද වෙන කොට අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය සවුදි අරාබියට යාම සඳහා සම්පූර්ණ කළ යුතු වයස් සීමාව වැඩි කරලා තිබෙනවා. 2011 දී අපේ ඩිලාන් පෙරේරා ඇමතිතුමා වයස අවුරුදු 18 තිබූ මේ වයස් සීමාව අවුරුදු 21 කළා. පසුව මේ අවුරුදු 21 සීමාව අවුරුදු 25 කළා. මේ තුළින් කරන්නේ ක්‍රමක්‍රමයෙන් පිට රට යන කාන්තාවෝ ටික අඩු කරන එකයි. එක පාරට ඒක නවත්වන්න බැහැ. එසේ කටයුතු කිරීම ගැන අපි සන්තෝෂ වනවා. එවකට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍ය ගරු සුමේධා ජී. ජයසේන මැතිතුමිය විසින් අවුරුදු පහට අඩු දරුවන් සිටින අම්මලා පිට රට යවන එක තහනම් කරන්න යනකොට, කාන්තා විමුක්තිය ගැන කථා කරන රාජ්‍ය නොවන සංවිධාන - NGOs - ගොඩක් ඊට හරහට හිටියා. අපි ඒ ගැන කනගාටු වනවා.

අපේ රටේ කාන්තාවෝ, අපේ රටේ දරුවන් ආරක්ෂා කර ගැනීමේ වගකීම අප සියලු දෙනාටම තිබෙනවා. පක්ෂ පාට දේශපාලනයෙන් තොරව අප සියලු දෙනාම එකතු වෙලා මේ වගකීම ඉෂ්ට කරමුය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[අ.භා. 6.09]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට අද මම ස්තුතිවන්ත වනවා. එතුමා විශේෂයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳවත්, මැද පෙරදිග ප්‍රශ්න පිළිබඳවත් දිගින් දිගටම කථා කරපු කෙනෙක්.

එතුමාට මම ස්තුතිවන්ත වන ගමන්ම, මේ අතපසු වීම ගැන සහ මේ ප්‍රශ්නයේදී නිවැරැදි ක්‍රියා මාර්ග නොගැනීම පිළිබඳව විශේෂයෙන් මම කියන්න කැමැතියි. දිගින් දිගටම ආණ්ඩුවට එල්ල වන දෝෂාරෝපණ පිළිබඳව ආණ්ඩුවට අද කථා කරන්න විධියක් නැහැ. ඒ වෙන හේතුවක් නිසා නොවෙයි. අවශ්‍ය වෙලාවේ නීති උපදෙස් දීලා, නීතිඥයින්ට පෙනී සිටින්න දීලා, ආණ්ඩුව විධියට සක්‍රිය ලෙස මේ ප්‍රශ්නයට මැදිහත් වුණා නම්, මේ දැරිවියව බේරා ගැනීම සඳහා අවශ්‍ය වාතාවරණය සකස් වෙන්න තිබුණා. අපි රිසානා නෆීක් ගැන කථා කළේ ඇය මුස්ලිම් කාන්තාවක් විධියට සලකා නොවෙයි.

ජාතිවාදී ලෙස හිතලා නොවෙයි. පොදුවේ මේ රටේ සාමාන්‍ය ගෘහ සේවිකාවක් විධියට ගිහිල්ලා වුණු සිද්ධියක් විධියට තමයි අපි මේක දකින්නේ. අපි දැකලා තිබෙනවා සිංහල කාන්තාවෝ ඇණ ගහලා එවනවා; සිංහල කාන්තාවෝ පුච්චලා එවනවා. ඒ විතරක් නොවෙයි, ඔවුන් විවිධ වධ හිංසාවලට භාජනය වෙනවා. අපේ ගෞරවණීය අතුරලියේ රතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ කිව්වා ගෘහ සේවිකාවන්ගේ අත පය කපලා තිබෙනවා කියලා. එවැනි නීති ක්‍රමයක් තිබෙන රටකට අපේ අය යවන කොට යම් කිසි ක්‍රමවේදයක්, නැත්නම් ඒ ගෘහ සේවිකාවන් බලා ගන්නා වැඩ පිළිවෙළක් තිබිය යුතුයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රශ්න ගැන සෞදි අරාබියේ, ජෝර්දානයේ තානාපතිවරුන්ගේ කාර්යාලවලට කථා කළාම සත පහකටවත් ගණන් ගන්නේ නැති තත්ත්වයක් තමයි තිබුණේ. ඔවුන් safe houses ගැන යම් කිසි විශ්වාසයක් තියා ගෙන වැඩ කරන්නේ නැහැ. දැන් යම් කිසි ප්‍රමාණයකට තත්ත්වය හොඳ වෙලා තිබෙනවා. ඊට කලින් තිබුණු තත්ත්වය ඔබතුමා දන්නවා. අපි දිගින් දිගටම මේ පිළිබඳව ප්‍රශ්න කළා. කාන්තාවෝ ගැන, වැඩ කරපු අය ගැන සත පහකටවත් ගණන් ගත්තේ නැහැ.

ගරු ඇමතිතුමනි, ජෝර්දානයේ තානාපති කාර්යාලයට මම දිගින් දිගටම කථා කළා. අඩුම තරමින් ඒ රටට පණිවුඩයක් යවලා හිංසාවලට ලක් වන අය බේරා ගන්න අවශ්‍ය කටයුතු ටිකවත් එම තානාපති කාර්යාලවලින් සිද්ධ වෙන්නේ නැහැ. ඒ දරු දැරියන් බලා ගැනීමේ වැඩ පිළිවෙළ කෙරෙහි ඇත්ත වශයෙන්ම ඔබතුමාට වඩා වැඩි වගකීමක් විදේශ කටයුතු අමාත්‍යාංශයට තිබෙනවා.

ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා අය වැය කථාවේදී ඔවුන්ව හැඳින්වූයේ "රට විරුවෝ" කියලායි. ඔවුන් අපේ රටට රුපියල් බිලියන 6ක ආදායමක් ගෙනෙනවා. දැන් රට විරුවෝ ඔටුවෝ වාගේ තැන් තැන්වල මරලා දානවා. ඒකයි අද සිද්ධ වෙලා තිබෙන්නේ.

මුස්ලිම් පූජකතුමෙක් කියලා තිබුණා, මේ සිද්ධිය පිළිගන්න කියලා. මම කබීර් හාෂිම් මන්ත්‍රීතුමාත් එක්ක මේ ගැන කථා කළේ වෙනත් විධියකටයි. අනෙක් මුස්ලිම් මන්ත්‍රීවරුන්ගෙන් මම ඇහුවා, රිසානා නෆීක් මරා දැමීම සම්බන්ධව ඔබතුමන්ලාට අමාරුවක් නැද්ද කියලා. ඒ අමාරුව අපට විතරද තිබෙන්නේ, ඔබතුමන්ලාට අමාරුවක් නැත්නම් අපි මොකටද කෑ ගහන්නේ කියලා එක පැත්තකින් මට අහන්න සිතුණා. මේක අපි සියලු දෙනාටම අදාළ වන කාරණයක්. මේ නීතිය ක්‍රෑර නීතියක්, මෙය නීතියක් විධියට ක්‍රියාත්මක වෙලා නිවැරදිව ඒ වැඩේ කෙරුණේ නැහැයි කියන කාරණය සාමාන්‍ය මන්ත්‍රීවරු විධියට අපි බොහොම පැහැදිලිව පෙන්වලා දුන්නා. මේක කාටවත් නොතේරෙන දෙයක් නොවෙයි.

ෂරී-ආ නීතිය අනුව අවුරුදු 18කට අඩු කෙනෙක්ව මරන්න බැහැ. ෂරී-ආ නීතිය හරියට ක්‍රියාත්මක කරන්නේ නැත්නම් අපට එතැන ප්‍රශ්නයක් තිබෙනවා. අඩුම තරමින් මුස්ලිම්වරුන් විධියට "අපි ෂරී-ආ නීතිය පිළිගන්නවා, හැබැයි ෂරී-ආ නීතිය අනුව මේ සිද්ධ වුණු කාරණය පිළිගන්නේ නැහැ"යි කියලා කියන්න තිබුණා. එහෙම කියන්න පුළුවන් කොන්දක් තිබෙන මුස්ලිම් ජනතාවක් මේ රටට වුවමනායි. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ජාතිවාදියෙක් නොවෙයි; ඩිලාන් පෙරේරා ඇමතිතුමා අන්තවාදියෙක් නොවෙයි. අද රට ඇතුළේ අන්තවාදී සංවිධාන දෙකක් තිබෙනවා. එක පැත්තක් බෞද්ධ අන්තවාදය, අනෙක් පැත්ත මුස්ලිම් අන්තවාදය. මේ දෙගොල්ලෝම අද කරන්නේ මේවා පාවිච්චි කර ගෙන රට විනාශ කරන වැඩ පිළිවෙළක්.

දැන් "හලාල්" කියලා එකක් ඇවිල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මට කෙනෙක් කථා කරලා කිව්වා, අද හාමුදුරුවරු පිරිසකුත් එකතු කර ගෙන ගිහිල්ලා, ඌරෙකුගේ photo එකක මුස්ලිම් වචන ටිකක් ලියලා තිබෙන පෝස්ටරයක් කුලියාපිටියේ නගරයේ අලවලා තිබෙනවාය කියා. කුලියාපිටිය නගරයේ ඒ විධියට පෝස්ටරයක් අලවලා මේ කාවද අවුස්සන්න හදන්නේ?

[ගරු දයාසිරි ජයසේකර මහතා ]

එතකොට අපට ඇඟිල්ල දිගු කරලා කියන්න පුළුවන්ද, ජාතික හෙළ උරුමයේ ගරු අතුරලියේ රතන හාමුදුරුවෝ මේ දැන් කිව්වා වාගේ මුස්ලිම් අන්තවාදයක් බිහි වෙලා තිබෙනවා කියලා. එතකොට සිංහල අන්තවාදය ගැන මොකද කියන්නේ? කවුද ඒවාට වග කියන්නේ? මෙන්න මේක තමයි අද ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. හලාල් කියන්නේ මොකක්ද? ආගම කියලා සතෙක් කපන්න කියන එකයි ඒකෙන් කියන්නේ. කුකුළෙක් කපනවා නම් ආගම කියලා කපන්න, පිරිසිදු විධියට ඒ කුකුළාගේ ලේ ඉවත් කරන්න කියන එක තමයි හලාල් කියන්නේ. ඉතින් මේ නැති හලාල් එකක් අල්ලා ගෙන කටයුතු කරනවා.

අද බලන්න, ලංකාවේ මැලිබන් බිස්කට් සමාගම ගත්තොත් මන්ච් බිස්කට් සමාගම ගත්තොත් බිත්තරවලින් හදපු එක එක නිෂ්පාදන පිට රටවලට යවනවා. ඒවායින් කාටද ආදායම එන්නේ? ලංකාවටයි ආදායම එන්නේ. අද ලංකාවේ Hettigoda Industries (Pvt) Limited හලාල් සහතිකය ලබා ගෙන තිබෙනවා. එතකොට මොකක්ද මේ වෙන්නේ? ඒක අරගෙන ගිහිල්ලා ලංකාවේ හලාල් විරෝධයක් කියලා අමුතුවෙන් එකක් හදා ගෙන, නැති මානසිකත්වයක් හදන්න තමයි මේ කටයුතු කරන්නේ. මේක පටන් ගත්තේ ජාතික හෙළ උරුමය. ඒකට අපි වග කියන්න ඕනෑ.

හලාල්වලට කලින් හෙළ උරුමය තමයි මේ සිංහල උත්තමවාදය පටන් ගත්තේ. මේ සිංහල උත්තමවාදය මහින්ද රාජපක්ෂ මහත්මයා පාවිච්චි කළා. සිංහල උත්තමවාදය පාවිච්චි කරලා යුද්ධය ජයග්‍රහණය කළා. අඩුම තරමින් තමන් පටන් ගත්ත වැරදි ක්‍රියා මාර්ගය එතැනින් පස්සේ නිවැරදි කරන වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවට තිබෙන්න ඕනෑ.

අද මොකද කරන්නේ? අද සිංහල අන්තවාදීන් ලවා මුස්ලිම් ජාතිකයෝ බය කරවනවා. බය කරලා මුස්ලිම් අන්තවාදයකට ඉඩකඩ හදනවා. ඊට පස්සේ ආණ්ඩුව බේරා ගන්න කියනවා. සිංහල උත්තමවාදය පාවිච්චි කරලා, සිංහල උත්තමවාදයෙන් නැවත මේ රටේ ප්‍රශ්නය වහලා දමන්න තමයි මේ හදන්නේ. මේකට අහුවෙන මිනිසුන් කවුද? සිංහල අන්තවාදීනුත් අහු වෙනවා. මුස්ලිම් අන්තවාදීනුත් අහු වෙනවා. ඒ ගොල්ලෝ ඒ ගොල්ලන්ගේ වැඩ ටික කර ගෙන යාවි. ඔය දැන් කෑ ගහනවාය කියපු මුස්ලිම් අන්තවාදීන්ට විවිධ රටවලින් තමන්ට අවශ්‍ය කරන මුදල් ටික හම්බ වෙනවා. බෞද්ධ අන්තවාදීන්ටත් කොහෙන් හරි මුදල් හම්බ වෙයි. සිංහල ලේ කකියවලා කොහොම හරි කියයි, මේක අපිට විතරයි තිබෙන්නේ කියලා.

මට SMS එකක් ආවා, කොළඹ මුස්ලිම් ජාතිකයෝ වැඩි වෙලා කියලා. ඒක කාගේ වැරැද්දක්ද? කොළඹ මුස්ලිම් ජාතිකයෝ වැඩි නම් සිංහල කට්ටිය එකතු වෙලා වැඩේ පටන් ගන්න ඕනෑ. අපි වැඩේ හරියට කරන්නේ නැතිව මෙතැන කෑ ගහනවා, මෙච්චර වැඩියි කියලා. ඊට පස්සේ තව e-mail එකක් එනවා, පසු ගිය අවුරුදු දහයේ ලංකාවේ මුස්ලිම් ජනතාව වැඩි වෙලා තිබෙනවාය කියලා. වැඩි වුණු ප්‍රමාණය පෙන්වනවා. ඒකට ඊර්ෂ්‍යා කරලා වැඩක් නැහැ. සිංහල මිනිහාගේ තිබෙන කුහකකම, සිංහල මිනිහාගේ තිබෙන ආත්මාර්ථකාමී බව, අනික් ආගම්වලට ගරු කරනවාද නැද්ද කියන එක ගැන සිංහල මිනිහාගේ තිබෙන අන්ධභාවය තමයි මේවාට හේතුව. අපි කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බලන්න ඕනෑ, වැරැද්ද වෙලා තිබෙන්නේ කොහෙන්ද, අපි අතින්ද කියලා. එහෙම කල්පනා කරන්නේ නැති එකේ ප්‍රතිඵලය තමයි මේ තිබෙන්නේ. ඒක පාවිච්චි කරන්නේ කවුද? ඒක පාවිච්චි කරනවා, සිංහල උත්තමවාදය පාවිච්චි කර ගන්න පුළුවන් ඔය හෙළ උරුමය වාගේ සංවිධාන. සිංහල බෞද්ධ ලේ කකියවලා, සිංහල බෞද්ධ ඡන්දයෙන් කොහොම හරි පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටේ නැවත අන්තවාදයක් හදන වැඩ පිළිවෙළකට තමයි අද යන්නේ.

මහනුවර ගිහිල්ලා බලන්න, මුස්ලිම් දේවස්ථානය කඩා විනාශ කර දමා තිබෙන ආකාරය. "නෝලිමිට්" ආයතනය බඩු විකුණන්න ඕනෑ. මුස්ලිම් මිනිහෙකුට බඩු විකුණන්න විධියක් නැද්ද? එහෙම නම් බඩු ගන්නවාද නැද්ද කියන එකයි තීරණය කරන්න ඕනෑ. හරි වැඩක් නේ මේක. හැම මුස්ලිම් ජාතිකයෙක්ම අන්තවාදියෙක් නොවෙයි. හැම සිංහල මිනිහෙකුම අන්තවාදියෙකුත් නොවෙයි. අපි මොකක්ද කරන්නේ? හාමුදුරුවරු ගිහිල්ලා "නෝලිමිට්" ආයතනය ඉස්සරහ පෙළපාළි යනවා. "සමාව ගනින්, බඩු විකුණන්න එපා" කියනවා. මේකද අපි මේ රටින් බලාපොරොත්තු වන දේ?

මමත් සිංහල බෞද්ධයෙක්. මම මේකට අත උස්සන මිනිහෙක් නොවෙයි, ඩිලාන් ඇමතිතුමා. ඔබතුමාත් ඒ වාගේ තමයි. අපිත් සුළු ජාතිකයින් සිටින ප්‍රදේශවල ජීවත් වන අය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ තමයි සිංහල බහුතරයක් ජීවත් වෙන්නේ. සිංහල බෞද්ධ නායකයෝ විධියට, මේ වැඩේ වැරැදියි; මේ වැඩේ කරන්න එපා කියලා අපිට කෙළින් කටින් ඉඳගෙන කථා කරන්න පුළුවන් නම් ඔන්න ඔතැන තමයි අපිට හරි යන තැන කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම කියනවා, කරුණාකරලා මේ අන්තවාදය පාවිච්චි කරන්න එපාය කියලා. මේ මුස්ලිම් අන්තවාදයත්, මේ සිංහල අන්තවාදයත් මේ රට විනාශ කරන තැනකට අරගෙන යන එක වැඩි ඈතක නොවන බව අපි හොඳට මතක තියා ගන්න ඕනෑ.

මොකද අපි දෙමළ අන්තවාදයෙන් බැට කාලා තිබෙන රටක්. දෙමළ අන්තවාදයෙන් දෙමළ ජනතාවත්, මුස්ලිම් ජනතාවත්, සිංහල ජනතාවත් බැට කාලා දැන් හොඳටම ඇති වෙලා තිබෙන්නේ. මේ දැරිය ගැන අපි කථා කරනවා වාගේම මේ සිංහල බෞද්ධ අන්තවාදයත්, මුස්ලිම් අන්තවාදයත් දෙකම පරාජය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ කරුණාකරලා සකස් කරන්න වෙයි. මැද පෙරදිග යවන අය සඳහා නීති ක්‍රමයකුත් අපිට මීට පස්සේ හදන්න වෙයි. නැත්නම් ලොකු විනාශයකට අපි පත් වෙනවා.

මේ දැරියගේ මරණය සම්බන්ධව මා ඇඩී කනගාටුවට පත් වෙනවා. පිට රට යවන සියලුම කාන්තාවන් වෙනුවෙනුයි මම මේ කථා කළේ. ඒ වාගේම සමස්ත රටේ මිනිසුන් වෙනුවෙනුයි මම කථා කළේ. කාන්තාවන් මැද පෙරදිග ගෘහ සේවය සඳහා යැම පිළිබඳව යම් කිසි ක්‍රමවේදයක් හදලා, මේ ක්‍රමය හරියට රට තුළ ස්ථාපිත කරලා අපේ රටේ කාන්තාවන්ගේ ගෞරවය ආරක්ෂා වන විධියට වැඩ කරන්නය කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

[6.20 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, listening to my good Friend, the Hon. Dayasiri Jayasekara, I think there is a new thinking developing. I am very happy about it.

Extremism, from whichever corner it emanates, we are opposed to. There is nothing called "Islamic

extremism" in Islam. Even in Buddhism and other religions, it is so. It is certain people who are making use of religion as a tool in order to exploit the situation for their own ends, maybe for political and other resons. I hope the Hon. Jayasekara would give his mind and influence the thoughts of the Members of his party also. I am happy to tell you that I happened to meet the Hon. Ranil Wickremasinghe, the Leader of the Opposition, today in the lift, and told him what is happening. He said they will also take a stand and issue statement.

*Halal* is not a new thing. On the day Islam came into being, *halal* had been prescribed on Muslims. No Muslim in the world would eat anything that is non-*halal*. Therefore, it is not a new thing; it is nothing to be afraid of. Anybody who wants to eat *halal* food, can eat it - you have been doing that - and anybody who does not want to, can eat whatever he wants. We have seen how pigs are being slaughtered. How? In a most pernicious, inhuman way. If you want to have pork, you can have it, but the doctors have said that millions of germs are there in that flesh. That way of slaughtering will only erase off the human race from the earth when they consume that.

I must also say that outside Parliament, they, including my good Friend, the Hon. Lakshman Kiriella, are blaming the Government for all the extremist activities that are taking place. What has the Government got to do with it? The Government is governing, which, under His Excellency Mahinda Rajapaksa, had won the war and defeated terrorism, the worst terrorism that was there on earth. After doing that, he is now building up the country economically, and he wants to build a united Sri Lanka. Would a President be so naive as to give in to these extremist elements? No. He is trying his best to do justice.

I must place on record that all the Muslim Ministers and other Members of Parliament met His Excellency the President at the Temples Trees this morning. He assured us that that they are taking all steps possible. They know the people who are behind this. These elements wanted to make an inferno of this country once again because these foreign elements led by Mossad - I accuse them - and certain other international organizations are trying to create differences, a rift between the Sinhalese and the Muslims. That will never happen, Sir, because the Sinhalese and the Muslims have lived together in this country for years. It was the Muslim leaders who, as commanders of the army of King Mayadunne of Sitawakan, drove back the Portuguese up to Thuththukkudi at this battle. It is Kunji Marikkar, Pitchai Marikkar and Ali Marikkar who fought at the battle.

Then, during the time we received Independence, it was that great national leader, the Hon. (Dr.) T.B. Jayah, who stood up in the State Council and said, "We, the Muslims, are national-minded. If it is for national freedom, we spare nothing and give our unconditional support. You, Britishers, can entrust things to the Sinhalese because we can trust them." Those are the words of a great statesman. Dr. Jayah said, "We can trust the Sinhalese leaders and will settle our own issues between us. We are brothers in this country. You, Colonial Master, leave this country!" The late Hon. S.W.R.D. Bandaranaike, at the Debate on the Dominian Bill, which he proposed in Parliament, said, "If the credit should go to any Member for the passage of this Bill, it should go to none other than the Hon. (Dr.) T.B. Jayah."

Sir, we are proud; we are a proud race. That is the way we have been living in Sinhalese villages. During the festival months, we give them *wattalappam.* You eat *wattalappam* and *biriyani*. During your Sinhala New Year Festival, we go for cycle races and other festivities and eat your *kevum, kokis, athirasa, asmi* and other sweetmeats.

Sir, that is the band of friendship we have cultivated throughout history.

Today, Sir, I want to speak on the main subject. But, I am so sorry to say that, in his true celluloid style, my Friend, the Hon. Ranjan Ramanayake, moved this Adjournment Motion. I do not know whether he considered this a "බයිස්කෝප් මඩුව". No, this is not a "බයිස්කෝප් මඩුව". You are a good actor; you are "One Shot" actor, but you do not know where to direct your shot. That is the problem. Your aim is missing. Direct the shot in the proper way.

By proposing this Motion, are you going to re-enact Rizana's case? No. Everything had been done. Sir, the Hon. Neomal Perera related the whole story from A to Z. No stone had been left unturned by the Government to obtain a pardon to Rizana. From President Mahinda Rajapaksa down to the Hon. Minister Dilan Perera, everybody took all steps in order to save the life of this child. We were very sorry to hear the Hon. Ajith Perera, not you, saying that we went for tamashas to Saudi. No. Hon. Member, after all, it was one of our lives. So, we went there; we spoke to them. Who led that delegation? It was sponsored by this Government. Who gave Rs. 1 million to Rizana's father and mother? It was the President who gave that money. අතින් දුන්නාලු. අතින් තමයි දුන්නේ, කකුලෙන් නොවෙයි. ඒක තමයි මම කිව්වේ. ඒක කවුරු දුන්නත් ආණ්ඩුවේ සල්ලිවලින් තමයි දුන්නේ.

Then, Sir, I must -

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Ranjan Ramanayake, what is the point of Order?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

Could you tell me whether the money was given from the Fund or -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

No, no. That is all right. Did you give them a single cent? Did your leader give a single cent?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

Whose money was it?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You went there to exploit the situation. You went and met Rizana Nafeek's parents in Nugegoda. Who brought them there? It was the Hon. M.S. Thowfeek, the Hon. Member for Trincomalee, who brought them there. We took them to the Temple Trees. On that occasion, Sir, there were tears in the eyes of His Excellency the President. He wanted to speak, but when Rizana's mother cried, he could not do anything. He was choked with emotion and told them that he wrote to the King of Saudi Arabia with affectionate love, as it was his own daughter. He wrote to the King twice. We met Prince Salman, the second-in-command of the Royal Kingdom, in Kuwait and the President also placed before him this case. I also went with him to Kuwait in that delegation.

The thing is, you should know the law. Why are you hiding it? According to the Islamic law, the aggrieved party must pardon the person who committed the crime. Then only clemency could be granted. Up to the last moment, that women, the mother of the dead infant - I am joining you in order to condemn that - did not have the mind to pardon Rizana.

Hon. Ranjan Ramanayake, you said in this House the other day, "මෘග නීතිය" කියලා. අත කපනවා, කකුල කපනවා, ඇඟිලි කපනවා, කෲර නීතිය; මෘග නීතිය; ම්ලේච්ඡ නීතිය - brutal law කියල කිව්වා You said, Sharia is a brutal law. You said that. I think the companion who went with you, Azam Ameen**,** explained the whole issue and put into you some wisdom. You went to **-** I know the whole thing - Nafeek's house in order to extract some more information in order to sling mud at our Government. But, I think Azam opened your eyes. You stand up now and say that you are sorry for what you said about Sharia Law in the House the other day. You withdraw that! Sharia Law is the God's law; Allah's law. That cannot be called a barbaric law.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Today, what is happening in this country? ළමා අපචාරය, තාත්තා දුවට, මාමා ලේලියට මේ වාගේ අපචාරයක්, මේ වාගේ ම්ලේච්ඡකමක් මේ ලෝකයේ කොහේවත් තිබෙනවාද? අන්න ඒක නවත්වන්නත් ඕනෑ. එක මිනිහෙක් Galle Face එකට ගෙනිහිල්ලා ගෙල සිඳ දමන්න. නැත්නම් මහර, වැලිකඩ සිර ගෙවල්වල දී එල්ලා මරා දමන්න. එතකොට මේ අපචාර ඔක්කොම නවතිනවා. අන්න ඒක කරන්න.

Sir, I have with me a book titled "Shari'ah in Britain: The biblical forbidden fruit?" written by Dr. M. Haris Z. Deen, Ph.D, MBA, B.Sc., FRICS, wherein he deals with Rizana's case also, which I **table*** to be placed in the Library, so that all Members can have an indepth knowledge of the subject.

Dr. Haris Deen has given a detailed and comprehensive report on all aspects of Sharia Law in this book. It was printed in Austria and has now found the bookshelves of the world.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, give me one more minute as this is such an important subject and then I will finish my speech.

Sir, Dr. Deen also had written an article to "The Island" of 12th January, 2013 titled "The Rizana Nafeek case, Did the Saudi Judges Act According to Islamic Law?" According to that, there are five categories of homicide, which you must know about, in Sharia: *Qatl amd* - intentional homicide; *Shibh amd* - quasi-intentional killing; *Qatl khata* - accidental homicide; *Majra'al-kha* - something similar to accidental homicide and then, *Qatl bi sabab* - indirect killing.

Then, Sir, another article written to the "The Island" of 23rd January, 2013 by Dr. M. Haris Z. Deen tititled

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

"The Rizana Nafeek case, In the Shades of Qur'an and Ahaadith", states, I quote:

> "It must also be clearly taken into account that although God gave the victim's family the 'carte blanche' right to demand Qisas, Allah in his absolute wisdom and mercy, urged them 'to move forward and forgive'. (Quran 2:178; 42:40)."

Sir, I would also ask your permission to **table*** the article of 23rd January, 2013 to be placed in the Library and the Arabic translation of that verse of Quran 2:178 to be **included**** in Hansard.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I will finish, Sir. This is very relevant. His article goes on to state, I quote:

> " Allah has beautifully described forgiveness as being better than revenge or punishment..."

Allah had said that. He is all powerful; he is the God; he is the Creator; he is the Supreme Divine Power! Sir, the article further states, I quote:

> " ...and have extolled the virtues of forgiveness extensively in the Holy Qur'an (42:40; 5:45; 2:37; 24:22; 2:109). Allah has promised a reward for those who forgive..."

Then, Sir, Dr. M. Haris Z. Deen continues to say in his article, I quote:

> "Another important gift of God under the Shari'ah is the alternative right of the family to seek monetary reward ..."

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Please, Sir, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා විනාඩි දෙකක් වැඩිපුර කථා කර තිබෙනවා. සෑහෙන්න ප්‍රමාද වෙලායි තිබෙන්නේ. මීළඟට ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I am only placing the aspects of the Sharia Law before the House.

Then, we went on the 11th of November, 2011 to Dawadmi and met the grandfather of the child and his tribal group and pleaded for clemency from the mother.

***සභාමේසය මත තබන ලද පරිච්ඡේදය:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட வாக்கியம் :*
*Verse tabled:*


S.2 A.178-180 J.2 الجزء الثاني سورة البقرة ٢

178. O ye who believe!
The law of equality[182]
Is prescribed to you
In cases of murder:[183]
The free for the free,
The slave for the slave,
The woman for the woman.
But if any remission
Is made by the brother[184]
Of the slain, then grant
Any reasonable demand,[185]
And compensate him
With handsome gratitude.
This is a concession
And a Mercy
From your Lord.
After this whoever
Exceeds the limits
Shall be in grave chastisement.

179. In the Law of Equality
There is (saving of) Life
To you. O ye men of
understanding;

يا أيها الذين آمنوا كتب عليكم القصاص في
القتلى الحر بالحر والعبد بالعبد والأنثى بالأنثى
فمن عفي له من أخيه شيء فاتباع بالمعروف
وأداء إليه بإحسان ذلك تخفيف من ربكم
ورحمة فمن اعتدى بعد ذلك فله عذاب
أليم ١٧٨

ولكم في القصاص حياة يا أولي الألباب
لعلكم تتقون ١٧٩

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය කථාව ආරම්භ කරන්න.

[අ.භා. 6.31]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසානා නෆීක්ට සිද්ධ වූ දේ ගැන අපි ඉතාම කනගාටු වෙනවා. මේ කාරණය ගැන කොච්චර කනගාටුවෙන් කථා කළත්, අපේ අස්වර් මන්ත්‍රීතුමා හැම තිස්සේම අල්ලා දෙවියන්ගේ පිහිට ප්‍රාර්ථනය කරමින් ජීවත් වන කෙනකු නිසා අල්ලාගේ නාමයෙන්වත් ඔය දහලන එක පොඩ්ඩක් අඩු කර ගන්න කියලා මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසානා නෆීක් දැරියගේ මරණය පිළිබඳව අපේ ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා

***** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

*****කථාව අවසානයේ පළ කර ඇත.*
*** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*** Produced at end of speech.*

[ගරු තලතා අතුකෝරල මහත්මිය ]

මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වන ගමන්ම, රිසානාගේ මරණය පිළිබඳව ඇයගේ දෙමවුපියන්ටත් නංගිලා දෙදෙනාටත් මල්ලීටත් අපි සියලු දෙනාගේම කනගාටුව මුලින්ම පුද කරන්නට කැමැතියි.

මේ වාගේ අවාසනාවන්ත සිද්ධීන් සිදු වන්නේ අපි වාගේ දුප්පත් රටක දිළිඳුකම උරුම කර ගත් අයටයි. අපේ දිළිඳුකම නිසා තමයි රිසානා වැනි අයට මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඇත්තටම කියනවා නම් ඒක ගරු පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේගේ කථාවේදී කිව්වා. ඒ අය අප හඳුන්වන්නේ හිඟන රටේ හිඟන කාන්තාවෝ හැටියට කියලා උන්වහන්සේ කිව්වා. මේක තමයි අපි මුහුණ දී තිබෙන යථාර්ථය. මැද පෙරදිග රටවල සේවය සඳහා කාන්තාවන් යැවීම පිළිබඳව, "මේ ගොල්ලොයි ඇරියේ, අර ගොල්ලොයි ඇරියේ, මේකයි කළේ, මෙහෙමයි වුණේ" කියලා වාද භේද කරනවාට වඩා, ඒ උදවියටත් මේ රටේ හොඳින් ජීවත් වන්න පුළුවන් වාතාවරණයක් නිර්මාණය කරනවා නම් අපි කවුරුත් කැමැතියි.

එදා 1977 පිහිටවූ එක්සත් ජාතික පක්ෂ රජයට පින් සිද්ධ වෙන්න අද ලක්ෂ ගණනක් තරුණියෝ මේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවය කරනවා. ඒකවත් මේ රටේ තිබුණේ නැත්නම් ඒ අයටත් සිද්ධ වන්නේ නන්නාඳුනන රටකට ගිහිල්ලා, නන්නාඳුනන ජනතාව අතර ඔය වාගේ විශාල දුක් කන්දරාවක් තුරුලු කර ගෙන, හැම වධ හිංසාවකටම මුහුණ දෙමින් දුකට පත් වුණු ජීවිත ගත කරන්නයි. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලා සිටින්නේ, මේ ආණ්ඩුව - මේ රජය - මීට වඩා වගකීමක් ඇතිව කටයුතු කරලා, නාස්තිය, දූෂණය, ප්‍රෝඩාව, කොමිස් ගැහීම, සල්ලි හම්බ කිරීම කියන මේ හැම එකක්ම නවත්වලා රටේ ජනතාවට මේ වාගේ ඉරණමකට මුහුණ දෙන්න සිද්ධ වන්නේ ඇයි කියන එක ගැන බොහොම හොඳින් කාරණා සොයලා බලලා, දුප්පත්කම නැති, අතට එන මුදලට අනුව වටිනාකමක් තිබෙන ජීවිතයක් ගත කරන්න පුළුවන් තත්ත්වයක් මේ රටේ නිර්මාණය කරන්නය කියලායි. කෙටියෙන් කියනවා නම් අපේ කාන්තාවන් මේ විධියට වධ හිංසා විඳින්න මැද පෙර දිග රටවලට නොවෙයි, මොන රටකටවත් යවන එක නවත්වන්න පුළුවන් නම් ඒක තමයි හොඳම කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසානා වෙනුවෙන් කටයුතු කළ ආකාරය සඳහන් කරමින් අපේ විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා දින වකවානු සහිතව බොහොම ලොකු කතන්දරයක් කිව්වා. හැබැයි, රිසානා නෆීක්ට මේ සිද්ධියට මුහුණ දෙන්න සිදු වුණත්, ඒ සිඟිති දරුවාගේ මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් කර තිබෙන බව අපි දැක්කේ නැහැ. මේ වාගේ මරණයක් සිද්ධ වුණාම ඒ සම්බන්ධයෙන් යම්කිසි මරණ පරීක්ෂණයක් සිදු විය යුතුයි කියලා නීතිඥවරයකු හැටියට, නීතිය හොඳින් හදාරපු කෙනකු හැටියට අපේ උගත් ඇමතිතුමා දන්නවා. මේ දරුවා ස්වාභාවිකව මැරුණාද, කිරි හිරවීමෙන් මැරුණාද, එහෙම නැත්නම් ඇත්තටම ඒ අම්මා දරුවාගේ බෙල්ල මිරිකලා මරලා තොට්ල්ලේ තියලා ගියාද කියන එකවත් අපි දන්නේ නැහැ.

මොකද, රිසානා නෆීක්ගේ කට උත්තරයේ හැටියට ඇය කියා තිබෙන්නේ, "ඒ දරුවාගේ අම්මා දරුවා තොට්ල්ලේ තියලා ගියා, ඉස්කෝලෙට ගිහින් ආපහු ඇවිල්ලා දරුවා ගෙනෙන්න කිව්වාම දරුවා ගෙනාවා, ඒ ගෙනෙනකොට සද්දයක්වත් කළේ නැහැ, දරුවා ඇහැරෙන්නේ නැහැ" කියපු බවයි. ඉතින්, ඒ ගැන මරණ පරීක්ෂණයක් පැවැත්වුවාද? ඒ වෙලාවේ සවුදි අරාබියේ පිහිටි අපේ තානාපති කාර්යාලයෙන් - අපේ Mission එකෙන්- ඒ ගැන ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය කථාව කර ගෙන යන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
අපි බොහොම හොඳට අහගෙන හිටියා, මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි. Post-mortem එකක් කළාද කියන එක නියෝජ්‍ය ඇමතිතුමා කිව්වාද නැද්ද කියන එක තමයි මා ඔබතුමාගෙන් අහන්නේ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
Post-mortem එකක් කළාද කියන එක ගැන ඔබතුමා උත්තරයක් දෙන්න. කවුරුවත් රට ගිය දවස්, ආපු දවස් අපට වැඩක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් ඔබතුමා කරුණාකරලා කියන්න මරණ පරීක්ෂණයක් කළාද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මරණ පරීක්ෂණය ගැන කියන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, this Hon. Member might be ignorant of the law of Saudi Arabia. I am asking her whether she is challenging the law of Saudi Arabia.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
That is not a point of Order. I am asking you whether there was a post-mortem done. Please, do not jump the gun. You sit down.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය කථාව කරගෙන යන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහොම තමයි අස්වර් මන්ත්‍රීතුමාට මා පෙනෙනකොටත් මොකක්ද වාගෙයි.

ඒ කෙසේ වෙතත්, අපි අහන්නේ මෙතැනදී රටක් හැටියට අපෙන් සිදු විය යුතු කාර්ය භාරය හරි හැටි සිද්ධ වුණාද කියන එකයි. මේ වන කොට අපේ තානාපතිවරයාගේ සේවය අවසන් කොට ආපසු කැඳවලා තිබෙනවා. තානාපතිතුමා ආපසු කැඳවන්න තීරණය කළේ මේ කටයුත්තේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය හරි හැටි කළේ නැති නිසාද? මේවා තමයි අපට අහන්න තිබෙන්නේ. ඒ රටේ භාෂාව දන්නේ නැති, ද්‍රවිඩ භාෂාව විතරක්

දැන ගෙන හිටපු, නැඟෙනහිර පළාතේ ඉතාම දුෂ්කර ප්‍රදේශයක ඉපදුණු, සිංහල වචනයක්වත් කථා කරන්න බැරි, ඉංග්‍රීසි භාෂාව හෝ අරාබි භාෂාව කොහෙත්ම නොදන්නා රිසානාට විරුද්ධව තිබුණු මූලික පරීක්ෂණයේදී නීතිඥ සහායක්වත් ලබා දෙන්න අඩුම තරමින් පුළුවන් වුණාද? මෙන්න මේවා තමයි අපි අහන්න ඕනෑ ප්‍රශ්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රිසානා ගියා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
රිසානා ගිහිල්ලා ඉවරයි. [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමා අපට කියන්න -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
උත්සාහ ගත්තා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
උත්සාහ ගත්ත එක වෙනම කථාවක්. නමුත් මේ වනකොට වෙන්න ඕනෑ දේ වෙලා ඉවරයි. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්න. අපි ඇමතිතුමා එක්ක කථා කරන්නම්. මේ ඇමතිතුමා 2005 දී මේ තනතුරේ හිටියේත් නැහැ; එතුමාට ඒ වෙලාවේ ඒ ගැන වගකීමක් තිබුණේත් නැහැ. නමුත් ඒ සවුදි දැරියගේ මරණය සම්බන්ධයෙන් රිසානා නෆීක් වැරදිකාරියක් කරනකොට ඒ පිළිබඳ කවුද අභියාචනයක් කළේ?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපි අභියාචනයක් කළා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
එහෙම නිකම් ලියුම් ලිව්වාට හරියන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අභියාචනයක් කළේ සිංගප්පූරුවේ -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, do not disturb her.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
Singapore-based ආසියානු මානව හිමිකම් කොමිසම තමයි ඒ සම්බන්ධයෙන් අභියාචනයක් කළේ. මේ රටෙන් නොවෙයි ඒ අභියාචනය කළේ. ඒ දීපු තීන්දුවට විරුද්ධව අභියාචනයක් කළේ ඒ අයයි. දැන් ඒ කථාවලින් වැඩක් නැහැ. වෙන්න තිබුණු දේ දැන් වෙලා ඉවරයි. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ එක දෙයයි. විශේෂයෙන්ම කාන්තාවක් හැටියට මාත් නිතරම කථා කරනවා මැද පෙරදිග රැකියා, ඇඟලුම් කර්මාන්තය සහ වතු ක්ෂේත්‍රය තුළින් මේ රටේ ආර්ථිකයට වැඩියෙන්ම දායක වෙන්නේ කාන්තාවන් කියලා. හැබැයි, ඒ කාන්තාවන්ගේ අසරණභාවය වෙනුවෙන්, කාන්තාවන් වශයෙන් අප ඒ අයට දිය යුතු රැකවරණය ලබා දෙන්නේ නැත්නම් අපට ඒ පිළිබඳව ලොකු අභිමානයකින් කථා කරන්න බැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, උගත් ඇමතිවරයකු වන, විශේෂයෙන්ම ජනතාවගේ දුක දන්නා ඇමතිවරයකු වන ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, පිට රට යවන කාන්තාවන් විතරක් නොවෙයි හැම කෙනෙකුගේම ආරක්ෂාව පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න කියලා. ගරු ඇමතිතුමා කිව්වා දැන් ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදනවා කියලා.

අවුරුදු 25ක්-30ක් තිස්සේම මේ රටේ උදවිය පිට රටවල ගිහින් රැකියා කරනවා. මේ වනකොට මෙවැනි සිද්ධීන් ගණනාවක් වෙලා තිබෙනවා. හැබැයි රිසානාට වුණු සිද්ධිය හැම කෙනෙකුටම හොඳ eye-opener එකක් වෙලා තිබෙනවා. දැන් කාලය ඇවිල්ලා තිබෙනවා, ඒ අයගේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය පිළිබඳව සැලකිල්ලට ගන්න. අපි මේ ගැන කරපු කථා අහගෙන හිටියා. ඒ වාගේම මේ ගැන විස්තර පුවත් පත්වලින් කියෙව්වා. තව විශාල පිරිසක් ඒ රටවල හිරගත වෙලා ඉන්නවා. ඒ අයට විවිධ දඬුවම් දෙනවා. අත් දෙක කපනවා. බුදු පිළිමයක් තියා ගෙන හිටියාය කියන තුංගසිරි නමැති අය මරන්න නියම කරලා තිබෙනවා. අපේ රටේ අය හැටියට අපි ඒ හැම කෙනෙක් වෙනුවෙන්ම කථා කරන්න ඕනෑ.

අපේ රටේ මුදල් වියදම් කරලා ඒ රටවල තානාපති කාර්යාල පවත්වා ගෙන යන්නේ අන්න ඒ අවශ්‍යතාව ඉෂ්ට කරන්නයි. ඒ වාගේම මා ඔබතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මේ රටේ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයක් තිබෙනවා. මේ රටෙන් විදේශ රැකියාවලට කාන්තාවන් යැවීමට අවශ්‍ය කටයුතු සැලසුනාට පසුව, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණයක් හා මැදිහත්වීමක් කරලා ඒ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුයි කියන නිර්දේශයක් ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය නීති රීති සකසන්න කියා මා ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුප්පත්කම නිසා, තමන්ගේ නංගිලා, මල්ලිලාට උගන්වන්න තිබෙන ඕනෑකම නිසා රිසානා මේ වාගේ රැකියාවකට යැව්වත්, මා අද ඒ රිසානාගේ අම්මාට ගරු කරනවා. එතුමිය මොන තරම් දුප්පත්කම, දිළිඳුකම තුරුලු කර ගෙන සිටියත් කාගේවත් මුදල්වලට රිසානා පාවා දෙන්න සූදානම් වුණේ නැහැ. සවුදි අරාබියේ රජය ඒ රටේ සියලුම දේ මෙහේට ගෙනත් දෙන්න සූදානම් වුණත් එතුමිය බොහොම කාරුණිකව ඒවා ප්‍රතික්ෂේප කළා. ඒ ගැන ලාංකික කාන්තාවක් හැටියට මා ආඩම්බර වෙනවා.

මා අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. ඕනෑම කාන්තාවක් තමන්ගේ දරුවාට පළමුවෙනි අවුරුදු දෙක තුළ මවු කිරි දිය යුතුයි කියන Sharia Law එක ගැන සවුදි ආරාබිය දැනුවත් කරලා, ඒ අම්මා සම්බන්ධවත් ඒ නීතිය ක්‍රියාත්මක කරවන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක සවුදි අරාබියේ ආණ්ඩුවට කියන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔබතුමා කියන්න කෝ.

[අ.භා. 6.41]

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී ඇති කාලය ඉතාම සීමිත බැවින් මා ප්‍රථමයෙන්ම මේ රටේ ජීවත් වන සිංහල බෞද්ධ ඇතුළු සියලුම ජාතීන්ට මගේ ස්තුතිය සහ ප්‍රශංසාව ප්‍රකාශ කරන්න ඕනෑ. රිසානා මරණයට කළාට පසුවත්, ඊට පෙරත් හැම වෙලාවේම මේ රටේ පුරවැසියන් රිසානා මුස්ලිම්ද, සිංහලද, දෙමළද කියා නොබලා ඇය වෙනුවෙන් විරෝධතා පවත්වමින්, කථා කරමින්, මුදල් එකතු කරමින්, උදවු පදවු කරමින් දිගටම ඒ සටන ගෙනිච්චා. ඒකෙන් අපට විශ්වාසයක් ඇති වෙනවා. අපි සියලු දෙනාටම ශ්‍රී ලාංකිකයන් හැටියට එකතු වෙලා අප ආරක්ෂා කර ගෙන ජීවත් වෙන්න පුළුවන් හැකියාව තිබෙනවාය කියන විශ්වාසය ඇති වෙනවා. පළමුවෙන්ම ඒ කාරණය පිළිබඳව මාගේ ප්‍රසංශාව හා ස්තුතිය පුද කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම කියන්නට ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. රන්ජන් රාමනායක මැතිතුමා ගෙන එන ලද මෙම කාලෝචිත යෝජනාව ඉතාම වැදගත්. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයෙන් කථා කළ මන්ත්‍රීවරු ඉදිරිපත් කළ කරුණු අනුව, රජය සතු වගකීම රජය පැහැර හැර තිබෙනවාය කියන එක සහතික කළා. සවුදි අරාබියට ගෘහ සේවිකාවන් යැවීම හරිද, වැරදිද කියලා අපි කථා කළා. අපේ මතය නම් එය තහනම් කළ යුතුයි කියන එකයි. ඒක ඉතා වැදගත්. සවුදි අරාබියේ ආගමික නිදහසක් නැත්නම්, සේවක නීති ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, නීතියේ අයිතිය ක්‍රියාත්මක කරන්නේ නැත්නම් අපේ සේවිකාවන් එහාට යැවීමේ වරද තිබෙන්නේ අපේ අතේයි. ඒ නිසා රජයක් හැටියට ඒ ගැන විශේෂ අවධානය යොමු කළ යුතුයි. මේ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුයි කියලා මාත් හිතනවා. විශේෂයෙන්ම රතන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා මැද පෙර දිග රටවල මේ නීතිය ක්‍රියාත්මක කරන අතර-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව* ගරු අජිත් පී. පෙරේරා මහතා *මූලාසනයෙන් ඉවත් වුයෙන්,* නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] *මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* மாண்புமிகு அஜித் பீ. பெரேரா *அவர்கள் அக்கிராசனத்திினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. AJITH P. PERERA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රතන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා මේ නීතිය ඉස්ලාම් ධර්මයේ නීතියක් කියලා. ඒක වැරදියි. සවුදි අරාබියේ ක්‍රියාත්මක නීතිය සවුදි අරාබියේ නීතියක් මිස ෂරී-ආ නීතිය නොවෙයි කියන කාරණය පැහැදිලි කිරීම තමයි මගේ ප්‍රධානම කාර්ය භාරය. මා දන්නේ නැහැ, මේ ආණ්ඩුවේ ඇමතිවරු එහේට ගිහින් ඒක පෙන්වලා දුන්නේ නැත්තේ ඇයි කියලා.

The tragic and shocking news of Rizana's death reverberates throughout the world. The Saudi Arabian government chose to ignore the appeal of our leaders, our people, civil society organizations. human rights groups and international groups.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! There is a point of Order being raised by the Hon. Alhaj A.H.M. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, my Friend, the Hon. Kabir Hashim, has been thoroughly misled. It is the law of Sharia that Saudi Arabia is following.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

That is not a point of Order. Hon. Azwer, you sit down. Hon. Kabir Hashim, you carry on with your speech.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

My colleagues from the Opposition clearly proved that our Government too has failed in allowing Rizana to be executed or may I put it as allowing Rizana to be killed. While I condemn the way that Saudi Law has been implemented and that there has been a serious miscarriage of justice by the Saudi Arabians, my intention today is to make it clear that the Saudi Judges have not followed the Sharia Law because a misconception has been created about the Islamic Sharia Law amongst our non-Muslim brothers here in Sri Lanka and the world over.

The Sharia Law does permit capital punishment such as hanging, beheading and electrocution for murder. This comes under the Quranic doctrine of Qisas. The doctrine of Qisas is the same as what comes in the Bible; Exodus 21.24, Leviticus 24.20 and Deuteronomy 19.20. Contemporary Egyptian Jurist Abu Zahrah holds the view that the purpose of Qisas is to preserve life. All Islamic Jurists such as Abu Hanifa, Shafi, Malik and Hanbal are of the consensus that the murderers' execution has the long-term effect of preserving the life of the community. This means that capital punishment acts as a deterrent to others who want to kill. That is the reason for a public killing. Permitting capital punishment does not mean that like in Saudi, they can do it in any way that they want. Islamic Law has its own checks and balances called

"Dhawabit". The punishment cannot be imposed if the due processes have not been observed in a fair trial and all extenuating circumstances fully considered. The Sharia law provides a special protection for the weak and the underprivileged. In criminal law context, it protects the interest of both the accused and the victim.

The presumption of innocence is the fundamental principle of the Islamic Law of criminal evidence. Prophet Muhammad - peace be upon him- has in many instances referred to this and said that the accuser has to present positive proof beyond any doubt. In criminal cases under Islamic Law, the prosecution has the overall burden of proof and it goes beyond the standard set out by common laws's "beyond reasonable doubt." Under the Islamic Law, not only the prosecution has to prove the charged offence beyond all reasonable doubt but, it has to be proven beyond all shadows of doubt.

Pieces of so-called evidence and the judgment in Rizana's case raise some serious issues and questions which need clear, unambiguous answers. The questions are:

1. Whether the said act attributed to Rizana is intentional or unintentional?
2. Was Rizana given the opportunity to refute her charges against her in a free and fair manner?
3. Why did the Saudi Courts not take Rizana's age into consideration before the death penalty was passed?

Under Islamic Law, crimes fall under two categories; intentional crimes and unintentional crimes. Under Islamic Law, no death penalty will be given for a killing which was done by mistake or without intention. Clearly, Rizana's case falls under this category. Did the Sri Lankan Government Ministerial delegation that went back and forth not realize this? Or was it only a fun trip?

In addition, according to Islamic Law, " confession must be made without any coercion or compulsion. It must be with free consent. The confession given under threat/inducement or promise is not admissible and moreover and importantly, it should be made in the open court and extra-judicial admission/confession carries no legal weight."

In Rizana's case, the confession was forced, not in courts but in a police station. What were the Sri Lankan Government advisers doing? The Quran differentiates between the two kinds of offenders clearly and says, "And there is no blame on you concerning that wherein you made a mistake, what counts is the intention in your hearts - Verse 33.5."

Prophet Muhammad, peace be upon him, said, "My people are not accountable for what they do by mistake and inadvertently".

There are exceptions for criminal liability such as insanity, self-defense, duress and also immaturity, which is for minors. Rizana was a minor and our Government had all the documents to prove it. Therefore, she could not be executed under the Islamic Law. Then, what law is Saudi Arabia following? Why did the Sri Lankan authorities not question these issues?

The Islamic adjective law excludes forced confession in *hadd* - capital punishment - and *Qisas* cases. The coerced or forced confession of guilt or confession taken under duress is not admissible and similarly, a forced compromise is not lawful. On the other hand, obtaining a confession under duress, coercion or any other kind of illicit pressure is a crime under Sharia. "The Rights of the Accused in Islam, Arab Law Quarterly, Vol. 10" speaks of this - the judge should permit a person who makes a confession or even admission to retract in case of doubt, based on the maxim of the Prophet, which said "set aside punishment when there is doubt".

According to the reports, her statement that she was born in February, 1988 was ignored on the basis that her passport indicated that she was born in February, 1982. Further according to the reports, the authorities did not do anything seriously to ascertain her real age. Under the Islamic Law, a child would not be given capital punishment for a crime committed by him or her. In the case of a child-offender, the judge has the restricted right to impose some restrictions on the offender, which would help to reform him or her or to prevent him or her from committing further crimes in future. Rizana's case raised a serious doubt whether all elements of "*Mens rea*" were proved or disproved. It has been said that the first statement made by Rizana was translated by a Malayali translator who had no fluency in Tamil.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I will wind up in a minute.

It is also said that Rizana had retracted her initial statement which, she said, she was made to make under duress and coercion. This was definitely not the Sharia or the Islamic Law. The Islamic Law would never have allowed this judgment. It was the barbaric Saudi Law that was implemented by the Saudis. I hope one can now see the distinction.

Sir, this is the heartbreaking story of the thousands of our women folk who go to the Middle-East due to abject poverty and the Government is talking about a per capita income of over US Dollars 2,000. What a joke! They should be held accountable. The Sri Lankan Government

[ගරු කබීර් හාෂිම් මහතා]

had also failed to present its case successfully, as you can see from the facts I have given. The delegation of Ministers and higher-ups, shockingly, had simply been either gallivanting in Saudi Arabia or are simply brainless and spineless. So, you are equally accountable. If you do not ban our workers from going to Saudi Arabia, then Rizana would have died in vain. Hon. Minister, I hope this pricks your conscience forever.

May Rizana's soul rest in eternal peace and attain the abode in Jennathul Firdhouse!

Thank you.

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසරයි! මට කොපමණ කාලයක් තිබෙනවාද කියලා දැනගන්න කැමැතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have 10 minutes.

[අ.භා. 6.51]

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන්ට සෘජුවම බලපාන ප්‍රශ්නයක් ගැන කාන්තාවක හැටියට හඬක් නඟන්න මට අවස්ථාවක් ලබා දීම ගැන ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. රිසානාට හිමිවූ ඛේදනීය මරණය ගැන මගේ කනගාටුවත් මම ප්‍රකාශ කරනවා. ඒ වාගේම, ගරු රන්ජන් රාමනායක මැතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න මෙවැනි අවස්ථාවක් ගෙනැවිත් දුන්නාට. මොකද, එමඟින් රජයටත් අවස්ථාවක් ලැබෙනවා රජය දරපු උත්සාහය මුළු රටටම දැනෙන්න ප්‍රකාශ කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගෙන් මා දැනගන්න කැමැතියි, සභාව කල් තැබීමේ යෝජනාව ගෙනෙන්න කලින් basic information හෙවත් මූලික තොරතුරු ලබා ගත්තේ නැත්තේ ඇයි කියලා. මොකද, එතුමා කිව්වා රිසානා මුණගැහෙන්න යන්න ඇගේ පවුලේ ඥාතියකු වන කවුරුන් හෝ සිටිය යුතුයි කියලා. Delegatesලා, මුස්ලිම් පූජකතුමන්ලා ඇතුළු සියලුදෙනා යද්දී ඒ දෙමාපියන් ඉඳලා තිබෙනවා. ඒ පවුල මුණගැහෙන්න අකමැති වූ එකයි ගැටලුව.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir. I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ranjan Ramanayake, what is the point of Order?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
සිරගෙට යන්න බැහැ ලේ ඥාතියකු නැතිව.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Please, let her speak.

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
කෙසේ වෙතත්, මුණ ගැහෙන්න ලැබුණේ නැති ලු. රිසානාට එවැනි ඉරණමක් අත්වන්න අවසාන වශයෙන් මොකක්ද බලපෑ හේතුව? ඒ තමයි, අර නැතිවූ දරු පැටියාගේ අම්මා සමාව දුන්නේ නැති එක. තාත්තා සමාව දුන්නා කියලා අපට ආරංචි මාර්ග තිබෙනවා. නමුත් අම්මා සමාව දීලා නැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එක්කෙනෙක් සමාව දුන්නත් ඇති. නමුත් වරද අම්මාගේ.

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
ඒ, ප්‍රශ්නයේ අවසානය නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අම්මා කිරි දෙන්නේ නැතිව- [බාධා කිරීම්] ඉස්ලාම් ධර්මයට අනුව අම්මා තම දරුවාට කිරි දෙන්න ඕනෑ අවුරුදු දෙකක්. [බාධා කිරීම්]

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
ඒ තමයි ප්‍රශ්නයේ අවසානය. නමුත් අපි මේ ප්‍රශ්නයේ මුලට යමුද? අප මේ ප්‍රශ්නයේ මුලට ගියොත්- [බාධා කිරීම්] සමා වෙලා පොඩ්ඩක් අහගෙන ඉන්න මන්ත්‍රීතුමා. කාන්තාවන් වෙනුවෙන් නේ මේ කථා කරන්නේ. මමත් කාන්තාවක්. කාන්තාවන්ගේ අයිතිවාසිකමක්. [බාධා කිරීමක්] අප මේ ප්‍රශ්නයේ මුලට ගියොත්, රිසානා මේ රටින් පිට වන්නේ තමන්ගේ පවුලේ අයගේ අනුමැතිය ඇතිවයි; සහයෝගය ඇතිවයි. රිසානාගේ අම්මා සහ තාත්තා කරපු වැරැද්ද ගැන මේ සභාවේ එක මන්ත්‍රීවරයෙක්වත් කථා කළේ නැහැ. ඇයි රිසානා යැව්වේ? ඒක නීති විරෝධී වැඩක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවේදී රිසානා සම්බන්ධයෙන් මේ රජය දරපු උත්සාහයට නිසි ගරුත්වය ලබා දෙමින් විස්තරාත්මකව කරුණු දක්වන්න බලාපොරොත්තුවෙන් සිටියත් මම එසේ කරන්නේ නැහැ, මොකද, ඒ සියලු දේ මෙතැන කථා වුණු නිසා. විපක්ෂය බොහොම බුද්ධිමත් ජනතා නියෝජිතවරුන් හැටියට ඒ සියලු දේට කන් දුන්නා කියලා මම විශ්වාස කරනවා. නමුත් ඒවාට පුංචි දෙයක් එකතු කරන්න මම උත්සාහ කරනවා.

අපේ ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමිය, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇතුළු බොහෝ මන්ත්‍රීවරු අද අදහස් දැක්වූවා. ගෘහ සේවයට යන කාන්තාවන් නිසා ශ්‍රී ලාංකිකයන් හැටියට අපට යම්කිසි අප්‍රසාදයක් ලැබිලා

තිබෙනවා, නුගත්, පහත් වර්ගයේ ජනතාවක් ඉන්න රටක් කියලා. මම නම් ඇත්තටම අපේ ගරු ඩිලාන් පෙරේරා මැතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අප එතුමා දරන උත්සාහය අගය කළ යුතුයි. එතුමා NVQ සහතිකය ලබා දෙන්න, ඒ කියන්නේ නිසි අධ්‍යාපනයක් ලබපු නැති අයට යම්කිසි පුහුණු සුදුසුකමක් ලබා ගෙන පුහුණු ශ්‍රමිකයන් හැටියට මේ රටින් පිටව යන්න අවස්ථාවක්, අවකාශයක් ලබා දීලා තිබෙනවා. දැන් මෙතැනදී පුනපුනා කියැවුණා agencies ගැන. රිසානා යවපු agency එක තහනම් කළා. මේ වන විට දෙදෙනෙක් සිරගත වෙලා ඉන්නවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අවුරුදු 4කට පස්සේ.

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
ඉතින් ඔබතුමා සතුටු වෙන්න, ඒ දේ කළා කියලා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අවුරුදු 4කට පස්සේ තමයි- [බාධා කිරීමක්]

**ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs) Upeksha Swarnamali)
ඉතින්? කොහොම හරි ඒක ක්‍රියාත්මක වුණා. [බාධා කිරීමක්] ලංකාවේ අද ලියා පදිංචි වෙලා තිබෙන 808ක් වූ agenciesවලින් පන්සිය ගණනක් තාවකාලිකව අත් හිටුවා තිබෙනවා. ඒ වාගේම, ගිය අවුරුද්දේ agencies විසි ගණනක් තහනම් කරලා තිබෙනවා. ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා agencies යම්කිසි standard එකකට ගෙන ඒම සඳහා -තරු ලබා දීලා, සම්මානයක් ලබා දීලා- යම් වර්ගීකරණයකට ලක් කරනවා.

ඒ දේ වුණත් ලබන්න agencies උනන්දු වන්නේ ඇයි? ඒ ලබා ගන්නා ජයග්‍රහණයෙන් තමන්ගේ agency එක market කරන්න පුළුවන්. එය දීර්ඝ කාලීනව හිතලා කළ කටයුත්තක්. මේ සියලුම දේ අගය කරන්න කියා විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මා බැගෑපත්ව ඉල්ලීමක් කරනවා. ආණ්ඩු පක්ෂයේ සමහර මැති ඇමතිවරුනුත් මේ දේවල් සම්බන්ධයෙන් කථා කරනවා මදිද කියලාත් මට වෙලාවකට හිතෙනවා. මා මේ පාර්ලිමේන්තුවේ වැඩිය කථා කරන කෙනෙක් නොවෙයි. නමුත් අහගෙන සිටින පොඩ්ඩෙන් මට නම් හිතෙන්නේ, ආණ්ඩුවට පක්ෂව සිටින සියලුම දෙනා ආණ්ඩුව කියන ඕනෑම දෙයක් හරියි කියා අත උස්සන අය හැටියට සහ විපක්ෂයේ සිටින සියලුම දෙනා ඕනෑම දෙයක් වැරැදියි කියා අත උස්සන අය හැටියටයි. නමුත් අපි වාසනාවන්තයි. ඒ රැල්ලට අහු වෙන්නේ නැතුව සෘජුවම තීරණ ගන්න මැති ඇමතිවරු අතළොස්සක් ඉන්නවා.

අපේ ඩිලාන් පෙරේරා මැතිතුමාගේ "රට විරුවන්" කියන සංකල්පය ගැන විශේෂයෙන් යම් කිසි දෙයක් මා සඳහන් කළ යුතුමයි. මෑතක දී මං පිට රට ගිය වෙලාවේ, ඩුබායි රාජ්‍යයේ අවුරුදු 32ක් රැකියාව කරපු සාලි කියලා සහෝදරයකු මට මුණ ගැසුණා. ඔහු මට සෘජුවම ප්‍රකාශ කළේ, විදේශ රැකියාවලට යෑම තහනමට ලක් කරන්න කියා ඉල්ලීමක් හෝ ප්‍රකාශයක් කරන්නේ නම් ඒ අදහස ප්‍රකාශ කරන්නේ රජයට පමණක් විරුද්ධව නොවෙයි කියලා. ඒ කෙනහිලිකම කරන්නේ රජයට විරුද්ධව නොවෙයි; අද මිලියන 1.6ක් පිට රට ගිහින් තමන්ගේ ජීවිතය සාර්ථක කර ගෙන, තමන්ගේ පවුල් ජීවිතය සාර්ථක කර ගෙන, රටට ශක්තියක් වන ඒ සියලුම දෙනාට විරුද්ධව කරන ප්‍රකාශයක් හැටියටයි ඒ මහතා එය දකින්නේ කියලා එතුමා මට කිව්වා. ඒක මා සම්පූර්ණයෙන් පිළිගන්නවා.

විදේශ රැකියාවලට යෑම තහනම් කළ යුතුයි කියා පක්ෂ, විපක්ෂ සියලුම දෙනා කිව්වත් මා නම් අවංකව කියන්නේ එහෙම විය යුතු නැහැ කියලායි. මොකද, මා පෞද්ගලිකව විශ්වාස කරන්නේ එහෙම තහනම් කිරීමක් කළොත් එය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් හැටියටයි. මොකද, ඔවුන් යන්නේ රැකියාවකටයි; නීති විරෝධී දෙයක් කරන්න නොවෙයි. ආයතනයක වුණත් යම් කිසි කෙනකුගෙන් යම් කිසි වැරැද්දක් වුණොත් ඒ වැරැද්දට නීතිමය ක්‍රියා මාර්ගයක් ගන්නවා මිසක්, ඒ රැකියාව තහනම් කරන එක සුදුසු නැහැ කියන එක තමයි මා නම් හිතන්නේ.

අපේ ගරු තලතා අතුකෝරල මැතිනිය සහ ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා කිව්වා, මේ case එක appeal කළේ නැහැ කියලා. නමුත් මා දැනුවත් විධියට නම් case එක appeal කළා. ඊට පස්සේ 2010 දී තමයි reconfirm වුණේ. [බාධා කිරීම්] ගරු ඩිලාන් පෙරේරා මැතිතුමාට මගේ හෘදයංගම ආශීර්වාදය හා සහයෝගය මා පළ කරනවා. විපක්ෂයෙනුත් මා ඉල්ලීමක් කරන්නේ -මගේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් මා ඉල්ලීමක් කරන්නේ- මේ සභාවට ඉදිරිපත් කරන හැම දෙයටම නිකරුණේ බැණබැණ ඉන්නේ නැතුව ඒකේ යම් කිසි හොඳක් තිබෙනවා නම් ඒකත් සඳහන් කරන්න කියායි. මේවා අසා ගෙන සිටින ජනතාවගෙන් සහ මාධ්‍යයෙන් මා අහන්නේ මේ බණින සියලුම දෙනා කියන දේවල් අපි විශ්වාස කරන්නේ කොහොමද කියලායි. මේ රජය තමයි මුළු රටක් පාලනය කරන්නේ. මේ රජය හොඳක් කරන්නේම නැද්ද? ඔබතුමන්ලා හැම දෙයම ප්‍රතික්ෂේප කරනවා. ඒක විහිළුවක්. එතකොට ඔබතුමන්ලා කියන හැම දෙයම අපි විශ්වාස කරන්නේ කොහොමද? හැම දෙයටම ඔබතුමන්ලා බණිනවා නේ.

අනික් කාරණය, ශ්‍රී ලාංකිකයන් බණින්න හරිම ආසයි, අගය කරන්න පසු බසිනවා. එය බොහොම ඛේදනීය කාරණයක්. අද විපක්ෂයේ ඉන්න බහුතරයක් මන්ත්‍රීවරු ජනතාව නොමඟ යවන විධියේ ප්‍රකාශ කරනවා. ඒ ගැන මං ඉතාමත් කනගාටු වනවා. විශේෂයෙන් රන්ජන් රාමනායක මැතිතුමාගේ කථාවේ කරුණුවලින් සියයට 90ක්ම අසත්‍ය කරුණු හැටියටයි මං දකින්නේ. එවැනි ප්‍රකාශ නොකර ජනතාවගේ උන්නතිය වෙනුවෙන් තමන්ගේ අවංක අදහස් ප්‍රකාශ කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Ajith Kumara. You have seven minutes.

[අ. භා. 7.01]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. රිසානා සහෝදරියට දඬුවම් නියම කිරීම පිළිබඳව මේ රටේත්, මේ ගරු සභාවේත් විශාල සංවාදයක් ඇති වුණා. නමුත් අවසාන ප්‍රතිඵලය වුණේ රිසානා ඝාතනය කිරීමයි. දෙවියන්ගේ නීතියේ හෝ බුදුන්ගේ දේශනයේ හෝ තිබෙන්නේ මිනිසුන් ජීවත් කරවීමද නැත්නම් මරා දැමීමද කියා මම දන්නේ නැහැ. එක අතකින් දෙවියන් වෙනුවෙන් පෙනී සිටින

[ගරු අජිත් කුමාර මහතා]

අය නැත්නම් මේ රටේ බුදුන් වෙනුවෙන් පෙනී සිටින අය බොහොමයක් කථා කරන්නේ මිනිස්සු ජීවත් කරවන්න නොවෙයි, මිනිස්සු මරන්නයි; මිනිස්සු මරන එක සාධාරණීකරණය කරන්නයි. ඒ ගැන මුලින්ම මගේ දැඩි විරෝධය හා අප්‍රසාදය පළ කරනවා. අප කථා කළ යුත්තේ මිනිසුන් ජීවත් කරවීම ගැනයි, මිනිස්සු මරන එක සාධාරණීකරණය කරන්න නොවෙයි.

රිසානා කියන්නේ ලොකු කථාවක අවසාන ප්‍රතිඵලයක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ රටේ ආර්ථික දේශපාලන ප්‍රතිපත්තිය මොකක්ද? ඒ ආර්ථික දේශපාලන ප්‍රතිපත්තියේ එක ප්‍රකාශනයක් තමයි රිසානාගේ ඝාතනය. අද අප රිසානා ගැන කථා කරනවා. හෙට අපට පියවතී කෙනෙක් ගැන කථා කරන්නට වේවි; එහෙම නැත්නම් සාලිය කෙනෙක් ගැන කථා කරන්නට වේවි; මේ රටෙන් බැහැරව විදේශයකදී තමන්ගේ ලේ, කඳුළු, දහඩිය කැප කරන මේ රටේ සිංහල හෝ දෙමළ හෝ මුස්ලිම් හෝ සහෝදරයෙක්, සහෝදරියක්, අම්මා කෙනෙක් ගැන කථා කරන්න වේවි. මේ විධියට කථා කරන්න ගියොත් අපට මේ වාගේ සභාව කල් තැබීමේ යෝජනා සිය ගණනක් ගෙනෙන්න වේවි.

අප හිතනවා, අප කථා කළ යුත්තේ මේ රටේ ආර්ථික දේශපාලන ප්‍රතිපත්තිය ගැනයි කියා. නමුත් ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රතිඵලයක් තමයි රිසානාගේ ඝාතනය. රිසානා ගැනත්, එවැනි කරුණු ගැනත් මේ සභාවේ අවධානය යොමු කළ නිසා මමත් ඒ කාරණය ගැන මතක් කරනවා. මේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය ගැන මේ සභාවේ කථා වුණා. 1977න් පස්සේ 1978 දී ව්‍යවස්ථාවක් හදලා බලහත්කාරයෙන් මේ රටට ගොඩ බැස්සූ ප්‍රතිපත්ති එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ක්‍රියාත්මක කළා. ඒවාට නීති හැදුවා. ඒකට මූලික වන ව්‍යවස්ථාදායකය, අධිකරණය ඇතුළු සියලු පද්ධතීන් සකස් කර ගත්තා. අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඒකේ ඊළඟ පියවර ගෙන යනවා. ආර්ථික ප්‍රතිපත්තියේ වෙනසක් වෙලා නැහැ. ඒ ප්‍රතිපත්ති ඉස්සරහට ගෙන යනවා.

අප මේ රටෙන් පිට රටට යවන්නේ මොනවාද? නිෂ්පාදනද? නැහැ. අප නිෂ්පාදන පිට රට යවන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අප යවන්නේ මේ රටේ මිනිස්සු. මේ රටේ මිනිස්සු නිෂ්පාදනය කළ වී, මාළු, එළවලු, එසේ නැත්නම් කර්මාන්තයකින් කෙරෙන නිෂ්පාදන අප පිට රට යවන්නේ නැහැ. ඒ වෙනුවට මේ රටේ ශ්‍රමිකයන් -මේ රටේ වැඩ කරන්නට පුළුවන් කාන්තාවන්, පුරුෂයන්- විශාල ප්‍රමාණයක් අප පිට රට යවනවා. ඒ ආර්ථික ප්‍රතිපත්තියේ ඛේදනීය ඉරණමට තමයි රිසානා, පියවතීලා වාගේ අම්මලා ඇතුළු මේ රටේ බොහෝ දෙනෙක් අද ගොදුරු වී ඉන්නේ. අද ලක්ෂ 16කට වැඩි පිරිසක් පිට රට සේවය කරනවා. එයින් වැඩිම ප්‍රමාණයක් සවුදි අරාබියේ සේවය කරනවා. මේ මොකක්ද කරන්නේ? මේක සම්පූර්ණ වහල් වෙළඳාමක්. මේ ආර්ථික දේශපාලන ක්‍රමයට පුළුවන් ද මේ වහල් වෙළඳාමෙන් ගැලවෙන්න?

ඔවුන්ගේ ආර්ථික ක්‍රමෝපායන් සකස් කර තිබෙන්නේ ඒ වහල් වෙළඳාම, ශරීර විකුණන සුදුව තවදුරටත් කර ගෙන යන්නට නොවෙයිද? මේ රට අද ම්ලේච්ඡත්වයට ගෙන යන රටක්. ඒ ම්ලේච්ඡත්වයට ගෙන යන එක ප්‍රකාශනයක් තමයි මේ වහල් වෙළඳාම. ඔවුන් රට ගිහින් හම්බ කරන සල්ලිවලින්, ඒ තුට්ටු දෙකෙන් ඔවුන්ගේ දරුවන්ට, ඔවුන්ගේ පවුලට, මේ රටේ ජනතාවට සේවයක් වෙනවාද? නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මතක තබා ගන්න. මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලා බාල් නටන්නේ, කාර් රේස් දුවන්නේ, නගර අලංකාර කරන්නේ, සංදර්ශන කරන්නේ, ලෝකයට ණය ගෙවන්නේ, ණයට පොලී ගෙවන්නේ, පොකුණු හදන්නේ, ලෝකයේ උසම කුළුණු හදන්නේ මේ රටේ අම්මලාගේ දරුවෝ, අපේ සහෝදර සහෝදරියෝ විදේශ රටකට ගිහින් ඇඟ විකුණලා වහල් මෙහෙයක් කරලා එවන සල්ලිවලින්. ඒ තිරස්චීන ආර්ථික ක්‍රමයේ ප්‍රතිපත්තිවලින් මේ රටට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ගේ ලේ, කඳුළු දහඩිය තමයි මේ රටේ මේ පාලකයෝ අද භුක්ති විඳින්නේ. ඔවුන්ට ඒ හැර වෙන විකල්පයක් නැහැ.

මේ රටේ තරුණ තරුණියන් මුහුදු හතක් තරණය කරලා ඉතාලියට, ඕස්ට්‍රේලියාවට යන්නේ ඇයි? ඒ යන්නේ මේ ජරා ජීර්ණ ආර්ථික ක්‍රමය නිසායි. තමුන්නාන්සේලා කල්පනා කරන්න. මේ රජයේ ප්‍රතිපත්තිය මොකක්ද? ඒ ආර්ථික දේශපාලන ක්‍රමය වෙනස් කරන එකද මේ රජයේ ප්‍රතිපත්තිය? නැහැ. දැන් බලන්න මේ ආණ්ඩුව කියනවා, අවුරුදු 25ට අඩු අය සවුදියට යන එක තහනම් කරනවාලු. අවුරුදු 25ට අඩු අය ගිය එකද ප්‍රශ්නය? රිසානා යවන කොට අවුරුදු දහහතේ අය යවන්න පුළුවන්කම තිබුණා ද? නැහැ. උප්පැන්න සහතිකය හොරට හදලා යැව්වේ ඇයි?

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මන්ත්‍රීතුමිය අහනවා, ඒ අම්මාට නේද වරද කියන්න ඕනෑ කියා. ඒ අම්මාටද වැරදි කියන්න ඕනෑ? රිසානාටද වැරදි කියන්න ඕනෑ? නැහැ. ඔවුන්ට රට යන්න සිද්ධ වෙච්ච මේ ක්‍රමය ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. කල්පනා කර බලන්න. ඒ සවුදි රජයට හෝ කාට හෝ දොස් කියන්න කලින් ඔවුන්ට විදේශගත වෙන්නට වුණේ ඇයි කියා කල්පනා කර බලන්නේ නැහැ. අවුරුදු 25ට අඩු අය සවුදියට යවන එක නවත්වලා මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවාද?

අර ඇණ ගහලා ලංකාවට එව්වේ වයස අවුරුදු 25ට අඩු අයද? නැහැ. අවුරුදු 40, 50 වයස්ගත අය පෙට්ටිවලින් ලංකාවට ආවා; ඇණ ගහලා ලංකාවට එව්වා. එහෙම නම් ඔවුන්ට විදේශගත වන්නට හදපු ප්‍රතිපත්තිය, මේ රටේ අම්මා තාත්තාව රට පටවන ප්‍රතිපත්තිය ගැනයි අපි ප්‍රශ්න කරන්නට ඕනෑ. දැන් නැඟෙනහිර පළාතේ ජනතාව පෙත්සමක් අත්සන් කරලා ජනාධිපතිතුමාට භාර දෙන්න හදනවා. එතුමාගේ ප්‍රතිපත්තිය මොකක්ද? ප්‍රතිපත්තිය තව තවත් පිරිස රට යවන එකයි. රට විරුවන් කියලා ඒ අයට බොරු ලේබල් ගහලා, ඒ අයව ආපසු රට යවන්න තමයි උනන්දු කරන්නේ. 2013 අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ජනාධිපතිතුමා කිව්වේ මොකක්ද? 2012 නොවැම්බර් 08 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 11 වැනි තීරුව කියවා බලන්න. එහි සඳහන් වනවා, "විදේශ රැකියාවලින් ලැබෙන ආදායම ඩොලර් බිලියන 10ක මට්ටමකට ගෙන ඒමට අපේක්ෂා කරනවා" කියලා. දැන් ලැබෙන ආදායම ඩොලර් බිලියන 6යි. ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 10ක් කරනවා කියලා කියනවා. ඒ කියන්නේ පිට රට යවන ශ්‍රමිකයන් ප්‍රමාණය තවත් සියයට 40කින් 50කින් වැඩි කරනවා කියන එකයි. එහෙම නම් මේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද? මේ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය පැහැදිලියි. ඒ මොකක්ද? මේ රටේ ආර්ථික ප්‍රතිපත්තිය තමයි -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
විශ්‍රාම වැටුප් දෙනවා, පුහුණු සේවකයන් යවනවා, රක්ෂණ වන්දි දෙනවා කියලා කිව්වා. හොර ඒජන්සි තහනම් කරනවා කියලා කිව්වා. ඇයි එවැනි ඒජන්සි තහනම් කරන්නේ නැත්තේ? හොර ඒජන්සිවලට පවතින්න ඉඩ දෙන්නේ ඇයි? මේ රටට වැඩිම විදේශ ආදායමක් ගෙන්වන ඔවුන්ව පවත්වා ගන්න ඕනෑ. මොකද, මේ රටේ ආර්ථික ප්‍රතිපත්තිවල තිබෙන්නේ කෘෂිකර්මය,

ධීවර කර්මාන්තය, කුඩා කර්මාන්ත, වැවිලි කර්මාන්තය සඳහා වියදම් කිරීම නොවෙයි; එම කර්මාන්ත නැංවීම නොවෙයි. ඒවා සඳහා අය වැයෙන් වෙන් කරලා තිබුණේ ඉතාම අඩු මුදලක්. රිසානා බේරා ගන්නට අවශ්‍ය මැදිහත් වීම නොකළේ ඒකයි. රිසානා බේරා ගැනීමට අවශ්‍ය මැදිහත් වීම නොකළේ, විදේශ රටකට අපේ සහෝදරියක් ගිහිල්ලා මැරිලා හරි කමක් නැහැ, අපේ රටට සල්ලි සොයලා දීපන් කියන මේ රටේ ආර්ථික ප්‍රතිපත්තිය නිසායි.

මම තව එක ප්‍රශ්නයක් අහන්න කැමැතියි, ඇමතිතුමනි. සවුදි අරාබියේ රජුගේ බිසවගේ ලේකම්වරයා හිස්බුල්ලා ඇමතිතුමාගේ අතට රුපියල් ලක්ෂ 10ක මුදලක් දුන්නා. මම අහනවා, ඒ මුදල භාර ගත්තේ ඇයි කියා. ඒ භාර ගත් මුදලට මොකද කළේ? එහෙම භාර ගන්න ලජ්ජා නැද්ද? රජය ඒකෙන් පෙන්නුම් කරන්නේ රිසානා ඝාතනය "හරි" කියන එකයි. එම මුදල භාර ගැනීමෙන් මේ රජය තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තියත්, රිසානා වරදක් කළා කියලාත් පිළිගෙන තිබෙනවා. ඒ නිසා මේ ක්‍රමය වෙනස් කරන්න කියලා අපි ඉල්ලනවා. සවුදි අරාබියෙන් ලබා දුන් එම රුපියල් ලක්ෂ 10ක මුදල භාර ගැනීමේ අවස්ථාවට අදාළ ඡායාරූප කිහිපයක් මම **සභාගත*** කරනවා.

[අ.භා. 7.09]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අජිත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් රජයට දුන් අභියෝගයෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන සතුටු වනවා. පැය තුනහමාරක් තිස්සේ මේ විවාදය සිදු කෙරුණා. මෙම විවාදය කොච්චර වැදගත්ද කියලා කියනවා නම්, අපේ සභානායකතුමා අද දවල් වරුවේ ඉල්ලීමක් කළා, Adjournment Motion විවාදයට ගන්නා අවස්ථාවල මාධ්‍යවේදීන් නැහැ, ඒ නිසා කරුණාකරලා ඒ අවස්ථාවටත් මාධ්‍යවේදීන් රැඳී සිට ඒ කටයුතු කරන්නය කියා. ඒ හරහා පෙනෙන්නේ, සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව විපක්ෂයෙන් ඉදිරිපත් කළ එකක් වුණත් ගරු සභානායකතුමාත්, රජයත් එයට වැදගත්කමක් ලබා දී තිබෙන බවයි. ගරු සභානායකතුමා මට කළේ ලොකු උදව්වක්. මොකද හේතුව, මේ අවස්ථාවේදී මට ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්නත් අවස්ථාවක් ලැබුණා. බොහෝ විට සභාව කල් තබන අවස්ථාවේ විවාදයකදී පැන නඟින ප්‍රශ්නවලට දෙන පිළිතුරු වාර්තා වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුලින්ම මේ කාරණය ගැනත් මා සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ කාරණය සම්බන්ධයෙන් විපක්ෂය සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් නොනැවතී මට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නට ඉදිරිපත් වීම පිළිබඳව ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එම විශ්වාස භංග යෝජනාව ගෙන එන තුරු මා බොහොම ඉවසීමෙන් බලා ගෙන සිටිනවාය කියන කාරණාවත් මා එතුමාට දන්වන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සිද්ධිය සම්බන්ධයෙන් අද පක්ෂ විපක්ෂව බොහෝ මත ඉදිරිපත් වුණා. සමහර අය ආදරණීය රිසානා සහෝදරියගේ මරණය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම මට, රජයට චෝදනා එල්ල කළා. සමහර අය එම කාරණයට අදාළව මිය ගිය බිළිඳු දැරියගේ මවට චෝදනා එල්ල කළා. මේ විවාදය තුළ දී සමහර අය, ජාතිවාදී කෝණවලින් ප්‍රශ්න දිහා බලන්නේ නැතිව, ජාතික සමඟිය වෙනුවෙන් අපි පෙනී සිටින්නට ඕනෑය කියන කාරණය ඉස්මතු කළා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාගේ උදවිය එහෙම ප්‍රකාශ කළා. කබීර් හෂීම් මන්ත්‍රීතුමා ජාතිවාදයට උඩ ගෙඩි දෙන සමහර කථාවලදී උඩ පැන පැන අත්පුඩි ගහනකොට, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කොන්දක් තිබෙන්නට ඕනෑ, නැඟිටලා ජාතිවාදයට එරෙහිව මේ ගරු සභාව තුළ අදහස් මතු කරන්නට. සාමාන්‍යයෙන් සුපුරුදු විධියට කෙරෙන ආණ්ඩුවට සුදු හුනු ගාන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්, විපක්ෂයට සුදු හුනු ගාන විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියන කාරණාවලට පරිබාහිරව පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මෙම ප්‍රශ්නය ප්‍රස්තුත කරගෙන, ප්‍රශ්නයට පිළියම් සොයන ආකාරය පිළිබඳව යෝජනා ගෙන එන්නට කිහිප දෙනෙකු හරි උත්සාහ කිරීම ගැන මා සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා රජයක් හැටියට විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා කරපු වැඩ කටයුතු රාශියක් ගැන කියන්නට යෙදුණු නිසා මා ඒවා ගැන නැවත නැවත කියන්නට යන්නේ නැහැ. හැබැයි, ඒවා කිව්වාට පසුවත් මතු වුණු සමහර කාරණා පිළිබඳව තමයි මගේ අදහස් ප්‍රකාශ කරන්න උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රිසානා නෆීක් සහෝදරිය හොර passport එකකින් තමයි ගියේ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා හොර passport එකක් හැදීම කියන කාරණයේදී වරද තිබෙන්නේ ශ්‍රී ලංකාව පැත්තේයි. රිසානා නෆීක් සහෝදරිය රස්සාවට යන විට මේ රටේ ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් නොවෙයි. රිසානා නෆීක් සහෝදරිය රස්සාවට යන විට ගියේ හොර passport එකකිනුයි. එතකොට මේ රටේ මැද පෙරදිග යන ගෘහ සේවිකාවන්ගේ අවම වයස් සීමාව හැටියට තිබුණේ අවුරුදු 18. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ඉඳලාම ගෘහ සේවිකාවන් විදේශ ගත වෙනවා. අවුරුදු ගණනක් තිස්සේ ගියා. රිසානා නෆීක් සහෝදරිය විදේශ ගත වන විටත් ගෘහ සේවිකාවන් හැටියට යන අවම වයස සීමාව තිබුණේ අවුරුදු 18. අවම වයස් සීමාව අවුරුදු 18 හැටියට තිබුණු නිසා හොර passport එකකින් අවුරුදු 17ක කෙල්ලක් යවන්නට හොර passport හදපු අයට පහසු වුණා. ඒ passport හැදීමේ කර්තව්‍යයට රිසානා නෆීක් සහෝදරියගේ නිවසේ සිට ග්‍රාම නිලධාරි මහත්මයාගේ සිට ප්‍රාදේශීය ලේකම්තුමාගේ සිට passport කන්තෝරුව සිට passport කන්තෝරුවෙන් ඔබ්බට සිට GAMCA කියන සංවිධානය පවා දායක වුණා. GAMCA කියා medical reports දෙන දොස්තරවරු සිටින සංවිධානයක් තිබෙනවා. ඒ GAMCA සංවිධානය medical reports දීමේදී විශාල ඒකාධිපති පාලනයක් ගෙන යනවා. මම ඒකට විරුද්ධව මේ දවස්වල විශාල සටනක් කරනවා. පසු ගිය අවුරුද්දේ සටන කරන විට GAMCA සංවිධානය වෙනුවෙන් පෙනී සිටියේ කවුද? එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ මැතිතුමායි. නමුත් මම ඒකට විරුද්ධව සටන් කරනවා. ඒ අය කරන්නේ medical එකක් දෙන එකයි. හරියට medical එක කරනවා නම් නිවැරදි වයස හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් අද නවීන තාක්ෂණයේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා පළමුවන කාරණය ඇය ගියේ හොර passport එකකිනුයි. ඒ නිසා හොර

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

passport එකකින් ගිය අය සම්බන්ධයෙන් කටයුතු කරන විට, හොර passport එකකින් යවන්නට සම්බන්ධ වූ මගේ අමාත්‍යාංශය යටතට ගැනෙන්නාවූ ඒ ඒජන්සිකරුවන්ට විරුද්ධව අධිකරණයේ නඩු දමා දඬුවම් කරන්න අපිට හැකියාව ලැබුණා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කියන්නේ කල් ගිහින් දඬුවම් කළාය කියායි. ඔව්. කල් ගිහින් දඬුවම් කළා. ස්ත්‍රී දූෂණ වරදට උසාවි දමා දඬුවම් කරන්නේ නැතුව අද ලංකාවේ කී දෙනෙක් සිටිනවාද? තමාගෙන් මාධ්‍යයකදී ප්‍රශ්න ඇසුවාම ඒ මාධ්‍යවේදීන්ට දුරකථනයෙන් කථා කර තර්ජනය කර දඬුවම් කරන්නේ නැතුව අද ලංකාවේ කී දෙනෙක් සිටිනවාද? අහිංසක තරුණියන්ට බොරු පොරොන්දු දීලා ඒ තරුණියන්ගේ මුළු ජීවිතයම කඩා වට්ටලා දඬුවම් කරන්නේ නැතුව අද ලංකාවේ කී දෙනෙක් සිටිනවාද? තමන් හිටපු ගුරු වෘත්තියෙනුත් අයින් කරලා යන එන මං නැතුව අතරමං වූ සමහර කාන්තාවන් අද අර්බුදයට ලක් වී සිටිනවා. එහෙම කර තිබෙන අය කී දෙනෙක් සිටිනවාද? ඒ අයගේ නම අල්පොන්සෝද අල් නැති පොන්සෝ ද කියන එක නොවෙයි ප්‍රශ්නය. එහෙම ඉන්න යුගයක, පරක්කු වෙලා හෝ ඒ වරද කළ ඒ ඒජන්සිකරුවන්ට දඬුවම් ලබා දෙන්න අපට හැකියාව ලැබුණා. අද ඒ ගොල්ලෝ හිරබත් කනවා. සමහර කාන්තාවන්ට අශෝභන ආකාරයෙන් කථා කළ, තර්ජනය කළ උදවිය, ස්ත්‍රී දූෂණ චෝදනාවට ලක් වුණු උදවිය හිරබත් කනවා වෙනුවට අද සියලු වරප්‍රසාද භුක්ති විඳිමින් සමහර වෙලාවට මේ ගරු සභාවටත් ඇවිත් කුඩු ගහපු අය වාගේ කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේ වෙලාවේ රජයක් හැටියට -

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Rajan Ramanayake, what is your point of Order?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අගමැතිතුමාගේ අත්සන හොරට ගහලා-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, it is not a point of Order. මන්ත්‍රීතුමා, කලබල වන්නේ ඇයි ද දන්නේ නැහැ. මම මොකුත් කිව්වෙත් නැහැ. කලබල වන්නේ jack-in-the-box වාගේ සමහර අය තොප්පිය හරියන විට නිකම් නැඟිටිනවාද දන්නේ නැහැ. මෙතුමා ගැන මම මොකුත් කිව්වේ නැහැ. මම මෙතුමා ගැන නොවෙයි කිව්වේ. මෙතුමාට ඒක බලපාන්නේ නැහැ. මම කිව්වේ අල්පොන්සෝ හෝ අල් නැති පොන්සෝ කෙනෙක් ගැනයි. [බාධා කිරීමක්] කලබල වෙන්න එපා. තොප්පිය දමා ගන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කවදාවත් ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට අපහාස කළේ නැහැ. මේ වැඩ පිළිවෙළේදී තවත් චෝදනාවක් එල්ල වුණා. තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය චෝදනා කළා, අපි ඇපෑලක් කළේ නැහැ කියා. අපි appeal එකක් කළා. Appeal එකක් කළා විතරක් නොවෙයි. අපේ එහේ තානාපති කාර්යාලයෙන් advance එකක් හැටියට මුදල් එවන්න කියා ඉල්ලීම් කර රජයට එවූ fax පණිවුඩය මම හැන්සාඩ් වාර්තාවේ පළ කිරීම සඳහා <u>**සභාගත**</u>*කරනවා.

මේ සඳහා ඉල්ලීමක් කර තිබෙනවා විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ රටේ සමහර නීතිඥ සමාගම් මේ නඩුවට පෙනී සිටින්න බැහැ කියා තිබෙනවා, මේක black case එකක් කියා. මම කියන්නේ එහෙන් කියපු එක. ඊට පසු නීතිඥ සමාගමක් අල්ලා ගෙන ඒකට අවශ්‍ය මුදල සඳහා ඉල්ලීමක් කළ ඒ fax පණිවුඩය සභාගත කරනවා විතරක් නොවෙයි, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු DGM (Foreign Relations), එල්.කේ. රුහුණගේ මහත්මයා විසින් රියාල් 5,000ක මුදලක් ඒ සඳහා ලබා දීමේ කාරණය පිළිබඳ ලිපියත් හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

ඒ සියලු කාරණා කළේ අර ඇපෑල පටන් ගන්නයි. ඒ ඇපෑලේදී අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කියපු කාරණා ඉදිරිපත් කළා. මේ සහෝදරිය බාල වයස්කාර දැරියක් කියන කාරණය, මරණ පරීක්ෂණයක් හරියට පැවැත්වුවාද කියන කාරණය, ඊළඟට පොලිසියේදී බලහත්කාරයෙන් ගත්ත ඒ පොලිස් ප්‍රකාශනය ගැනීමේදී නිවැරැදිව පරිවර්තනය කළාද කියන මේ සියලු කාරණා ඇපෑලේ ඇතුළත් කළා. නමුත් ඒ ඇපෑල පිළිගත්තේ නැහැ. ඒ නිසා තමයි මම කියන්නේ කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කියන විධියට මේ ෂරී-ආ නීතිය ක්‍රියාත්මක වුණා නොවෙයි, ෂරී-ආ නීතිය නිවැරැදිව ක්‍රියාත්මක නොවීම හරහා තමයි මේ පරීක්ෂණයේ සමහර අංග ක්‍රියාත්මක වුණේ කියලා.

ඔබතුමා නිවැරැදිව කිව්වා වාගේ, ඔබතුමාගේ වචනවලින්ම කියනවා නම්, මේක ෂරී-ආ නීතියේ එන හැටියට නොවෙයි - සමහර අයට - ඔබතුමාම කියපු විධියට "barbaric Saudi law" කියලා හඳුන්වන්න පුළුවන්. හැබැයි ඒ law එක එහේ ක්‍රියාත්මක වීම හරහා රිසානා සහෝදරියට දඬුවම් ලැබුණාට පස්සේ කරන්න තිබෙන්නේ මොකක්ද? අර appeal එක දමලා අර කියන කාරණා හරි ගියේ නැති කොට, ඊට පසුව කරන්න තිබෙන්නේ ඒ නීතිය යටතේම සමාව ගන්න පුළුවන් ඊළඟ කාරණා කටයුතු කරන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2010 නොවැම්බර් මාසයේ තමයි මම මේ අමාත්‍යාංශයේ ඇමතිවරයා වශයෙන් දිවුරුම් දුන්නේ. මම අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දීලා ඉන්න අතරේ මේ ප්‍රශ්නය මතු වුණාම, මේක විදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් විෂයක් වුණත් මම භාර ගත්තා. මේ විෂයයෙන් මිනී මැරුමක් සම්බන්ධව කෙනෙක් ආවොත් මම කියන්නේ, මිනියක් මරලා තිබෙනවා, මිනී මැරුම්, jail cases, අයිති වන්නේ Ministry of External Affairs එකට කියලායි.

හැබැයි මම හිතන හැටියට -මගේ හෘදය සාක්ෂියේ හැටියට- මේක මිනී මැරුමක් නොවෙයි. ඒ නිසා විදේශ කටයුතු අමාත්‍යාංශයට අයිති වුණත්, මම මේක කරට ගත්තේ ඇයි? මේක මිනී මැරුමක් නොවෙයි. මිනී මැරුමක් නම්, jail case එකක් නම් ඒක විදේශ කටයුතු අමාත්‍යාංශයටයි පවරන්නේ. නමුත් මම මේක භාර ගත්තේ මිනී මැරුමක් නොවන නිසායි. මේක මිනී මැරුමක් වෙන්න බැහැ. ඒ නිසා තමයි මම ඒ සියල්ල මගේ අමාත්‍යාංශයට භාර අරගෙන ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඒ විවිධ පාර්ශ්ව එකතු කරගෙන සමාව ගන්න විශාල උත්සාහයක් ගත්තේ. ඒ සමාව ගැනීම ඒ වෙලාවේ කළ යුතුයි. මොකද ඒ

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

වෙලාවේ වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. කරන්න තිබුණේ ෂරී-ආ නීතිය යටතේ සමාව ගැනීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළට යන එකයි. ෂරී-ආ නීතිය යටතේ ඒ වෙලාවේ තිබුණේ රජතුමාටවත් සමාව දෙන්න බැරි තත්ත්වයක්. ඔබතුමා ඒක පිළිගනීවි. ඒ යටතේ රජතුමා සමාව දෙන්න නම් ඒ මැරුණු බිළිඳියගේ අම්මාගෙයි, තාත්තාගෙයි කැමැත්ත ඕනෑ. ඒක තමයි හරි කතන්දරය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කියන barbaric Saudi law එක නොවෙයි, නමුත් barbaric Saudi law එක කියලා හඳුන්වන්නේ නැති, දෙවියන්ගේ නීතිය යටතේ තිබෙන Sharia law එකේ හඳුන්වන හැටියට ඇය වැරැදිකාරිය වුණාට පස්සේ රජතුමාට ඊට සමාව දෙන්න බැහැ. ඊට පස්සේ ඒ මැරුණු අයගේ පවුලේ කැමැත්ත ඕනෑ. අප උත්සාහ කළේ ඒකටයි. මේ කාරණයට විසඳුමක් ලබා ගන්න අලෙවි මවුලානා මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව අස්වර් මන්ත්‍රීතුමා ගියා. රිසානාගේ ගමේ ඉන්න තව්හීක් මන්ත්‍රීතුමා ගියා. රිසානාගේ ගමේ පල්ලියේ පූජකතුමා ගියා. රිසානාගේ අම්මා ගියා. රිසානාගේ තාත්තා ගියා. මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ගියා. ඒ මොකටද ගියේ? ඒ දෙමව්පියන් හම්බ වෙලා සමාව ඉල්ලන්න. ඒ දෙමව්පියන් හම්බ වෙන්නත් බැහැ කිව්වා. පසුව කිලෝමීටර් 400ක් දුර ඉන්න ඒ දෙමව්පියන්ගේ පියා -මැරුණු බිළිඳියගේ සීයා- හම්බ වුණා. ඒ ඥාතීන් හමු වුණා. මම මේ කියන්නේ අප මේ වෙනුවෙන් කළ කාර්ය භාරය. ඒ අය හම්බ වෙලා ඒ අය හරහා මේ දෙමව්පියන්ට ඉල්ලීමක් කළා, සමාව දෙන්න කැමැති වෙන්න කියලා. අප ඒ කාර්යය කළා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දන්නේ නැහැ මේ කාර්යයේදී පාර්ලිමේන්තුවේ ඉන්න මොළයක් තිබෙන මොන මිනිහාද සවුදි අරාබියට විනෝද ගමන් යන්නේ කියලා. විනෝද ගමන් යන්න තැන් තිබෙනවා. සවුදි අරාබියට විනෝද ගමන් යන්නේ කවුද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක තමයි අපත් අහන්නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ අසත්‍ය නේ කියන්නේ. සවුදි අරාබියට විනෝද ගමන් යනවාද? නැහැ. මේ ඇමතිතුමන්ලා, මේ මන්ත්‍රීතුමන්ලා, මේ නිලධාරීන් ගියේ ඒ වෙලාව වෙන කොට මේ ෂරී-ආ නීතිය යටතේ අපට එයාව බේරා ගන්න තිබුණු කාරණය සම්බන්ධයෙන් ඒ දෙමව්පියන්ගෙන් කැමැත්ත ගන්නයි. ඒ අය ඒකට ගියා. ඒ සඳහා ගිහින් අප උත්සාහයන් ගණනාවක් ගත්තා. ඒ උත්සාහයන් පිටුපස තිබුණු සාධාරණ කතන්දරය මම කියන්නම්.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Minister, can I ask you a question?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
No, I have no time. I have only ten minutes. - [*Interruption*.] I did not disturb you. I listened to you patiently. Be a sport, you are a Royalist.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He is a Trinitian.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
You were clapping when the Hon. (Ven.) Athuraliye Rathana Thero was speaking. So, listen.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයක් හැටියට රිසානා බේරා ගැනීම සඳහා අපි ගත්ත ක්‍රියා මාර්ගය සොයලා බලන්න. සාමාන්‍යයෙන් සවුදි අරාබිය තුළදී කෙනකු මරණ දණ්ඩනය නියම වෙලා, දෙවෙනි නඩුවේදීත් මරණ දණ්ඩනය නියම වුණාට පස්සේ අවුරුද්දකට වැඩිය තියා ගන්නේ නැහැ, මරණ දණ්ඩනය ක්‍රියාත්මක නොකර. නමුත් අවුරුදු හතක් රිසානාගේ මරණ දණ්ඩනය ක්‍රියාත්මක වුණේ නැහැ. ඇයි ඒ? රිසානා අතින් දරුවා මිය ගියාය කියලා උසාවියෙන් කිව්වත්, "රිසානා මිනී මරුවෙක් නොවේය, ඒ සිද්ධිය මිනී මැරුමක් නොවේය" කියන සැකය සවුදි අරාබියේ ඒ බලධාරීන්ට තිබුණා. සවුදි අරාබියේ රජු එකපාරක් නොවෙයි දෙපාරක් මේ රිසානා සේවය කළ ගෙදර පවුලේ උදවියගෙන් ඉල්ලීමක් කළා, සමාව දෙන්න කියලා. සමාව දෙන්න මෙච්චර ගණනක් දෙන්නම් කියලා, -ඒ රටෙන් රියාල් මිලියන 03ක්- ඒ රජු offer කළා, ඕනෑම වන්දියක් දෙන්න අපි -ලංකාව- සූදානම් කියන ප්‍රකාශය කරනකොට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ සම්බන්ධයෙන් ගත යුතු සියලුම ක්‍රියා මාර්ග ගත්ත නිසා තමයි, කෙනකුට මරණ දඬුවම නියම කරලා අවුරුද්දක් ඇතුළත ක්‍රියාත්මක වුවත්, රිසානා නෆීක්ට අවුරුදු හතක කාලයක් ලැබුණේ. ඒ කාලය තුළ අපි උත්සාහ කළේ ඇය බේරා ගැනීමට පමණයි. ඒක තමයි අපි ගත්ත උත්සාහය. ඒ උත්සාහය අසාර්ථක වුණා. ඒ උත්සාහය සාර්ථක වුණා නම් අද රිසානා නෆීක් ලංකාවට එනවා නේ. අපි ඒ උත්සාහය කළා. නමුත් උත්සාහ අසාර්ථක වුණා. උත්සාහ අසාර්ථකවීම පිළිබඳව සමහර අයට තිබෙන්නේ කාලකණ්ණි සතුටක්. ඒ කාලකණ්ණි සතුට කොච්චරද කියනවා නම් -

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමා අස් වෙන්න ඕනෑ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒ කාලකණ්ණි සතුට කොච්චරද කියනවා නම්, අපේ රිසානා නෆීක් සහෝදරියට මේ සිද්ධිය වුණු දවසේ මගෙන් රවි කරුණානායක මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා. ඇහුවේ රිසානා නෆීක් ගැන නොවෙයි, වෙන කරුණක් ගැන. අහලා තුන්වන අතුරු ප්‍රශ්නයේදී එතුමා මගෙන් මෙහෙම ඇහුවා.

I quote Column 267 of the Hansard dated 09th January, 2013 which states:

"ගරු ඇමතිතුමනි, රිසානා නෆීක් සම්බන්ධයෙන් ඔබතුමා මැදිහත් වෙලා කටයුතු කර තිබෙනවා. අද පත්තරවල ඇය ගැන වාර්තාවෙලා තිබෙනවා. පරස්පර මතයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ... අද කියනවා, 'Imminent hanging will take place' කියා."

ඔබතුමා ඒ ගැන මොනවාද දන්නේ කියලා අහනවා. මා උත්තර දෙනවා මෙහෙම:

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

"ගරු මන්ත්‍රීතුමා, මේක විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ වුණත් මා ඒ කාරණය පැහැර හරින්නේ නැහැ. මොකද, අපේ අමාත්‍යාංශය යටතේ ලියා පදිංචි වෙලා ගිය කෙනෙක් නිසා."

මා එහෙම අපේ වැඩ පිළිවෙළ කියලා අවසානයේ මේ විධියට කියනවා.

"ලංකාවේ ඉන්න සවුදි තානාපතිතුමා පුවත් පත්වලට කියලා තිබුණා, සවුදි අරාබි රජතුමා රිසානාට සමාව දෙනවා කියලා, ගරු රවුෆ් හකීම් අධිකරණ ඇමතිතුමා හම්බ වුණු වෙලාවේ"

එහෙම කියලා මා කියනවා,

"සමහර websites වල මීට ප්‍රතිවිරුද්ධ වාර්තාවක් තිබුණා. හැබැයි අපි බලාපොරොත්තු වනවා, සවුදි අරාබියේ තානාපතිතුමා එසේ කියපු නිසා රිසානාට සමාවක් ලැබේවි" .

අද අපෙන් අහනවා, සවුදි අරාබියේ තානාපතිතුමා කියන දේ අහන්නේ ඇයි කියලා. සවුදි අරාබියේ සිදු වෙන වැඩක් ගැන කුවේට් තානාපතිගෙන් අහලා හරියනවාද? සවුදි අරාබියේ සිදු වෙන වැඩක් ගැන චිත්‍රපට නළුවකුගෙන් අහලා හරියනවාද? සවුදි අරාබියේ සිදු වෙන වැඩක් ගැන ඇමෙරිකාවේ තානාපතිගෙන් අහලා හරියනවාද? අපි දන්නා විධියට සවුදි අරාබියේ සිද්ධියක් සම්බන්ධයෙන් ගන්න පුළුවන් හොඳම ප්‍රවෘත්තිය, ආරංචිය ගන්න තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ඉන්න සවුදි අරාබියේ තානාපතිතුමාගෙන්. ඒ නිසා අපි එතුමාගෙන් ඇහුවා. අපි එතුමා කියපු දේ පිළිගන්නේ නැතුව වෙන කට්ටිය කියන ඒවා පිළිගන්න බැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
තානාපතිතුමා ඇමතිතුමාට බොරු කිව්වා කියලා ගත්ත පියවර මොකක්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අනෙක් පැත්තට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉතා නිවැරදිව කිව්වා, මේ රටේ සමහර අය අද මුස්ලිම් ජාතිවාදය අවුස්සන්න හදනවා, සිංහල ජාතිවාදය අවුස්සන්න හදනවා කියලා. කොන්ද කෙළින් තියා ගෙන කථා කළ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්ව දේ ඇත්ත. මේ සිද්ධිය විතරක් නොවෙයි, සෑම සිද්ධියක්ම අල්ලා ගෙන විවිධ ජාතිවාදී කොටස් අවුස්සන්න හදනවා.

දැන් මේ ළඟදී, නීති විද්‍යාලයේ results සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් වුණා. එතැනට ගිහිල්ලා ජාතිවාදී ප්‍රශ්නය මතු කරන්න උත්සාහ කළා. හැබැයි, ඒ ප්‍රශ්නයේ මුලින් ඉන්නේ කවුද? මේ රටේ නීති විද්‍යාලයට ඇතුළු වන ළමයින්ගේ නීති ප්‍රවේශ විභාගයට උගන්වන tuition mastersලා ඉන්නවා. සමහර tuition mastersලාගේ ශිෂ්‍යයන් හොඳට pass වෙනවා. සමහර අයගේ ශිෂ්‍යයන් fail වෙනවා.

එක tuition master කෙනෙකු ඉන්නවා. මේ පාර එතුමාගේ class එකේ අයගෙන් භාගයක් fail. ඒ නිසා මොකක්ද කළේ? එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයේ වරප්‍රසාදය අරගෙන තමන්ගේ පක්ෂය වෙනුවෙන් නිවේදන නිකුත් කරනවා කියලා, Law College results ගැන නිවේදනයක් නිකුත් කළා. ඒ නිවේදනය අල්ලා ගෙන තමයි නීති විද්‍යාලයේ ප්‍රශ්නය ජාතිවාදයක් හැටියට පැතිරුවේ. ඒක කළේ වෙන කවුරුත් නොවෙයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්] එතුමා Law Entrance classes කරනවා. එයාගේ ශිෂ්‍යයෝ fail වුණාම ඒ පිළිබඳව-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා නීති විද්‍යාල විභාගයේ වුණු අසාධාරණ ගැන CID එක පරීක්ෂණයක්-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I am sorry, Hon. Member, that is not a point of Order. Hon. Dilan Perera, you carry on with your speech. ඔබතුමාට විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හැම කෙනාටම තිබෙන්නේ තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රයක්. ඒ න්‍යාය පත්‍රය උඩ තමයි රිසානා නෆීක්ගේ සිද්ධිය සම්බන්ධයෙනුත් කටයුතු කරලා තිබෙන්නේ.

මා කියන්නම් ඊළඟට,- [බාධා කිරීමක්] නැහැ, ඔබතුමාත් කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2000, 2001, 2002 ඉඳන් පිට රට ගිය ගෘහ සේවිකාවන්ගේ විස්තර මා ළඟ තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ, 2000 දී සියයට 67ක් පිට රට ගියා. 2001 දී කාන්තාවන් සියයට 67.5ක් පිට රට ගියා. 2002 දී ගියා සියයට 65.39ක්. 2003 දී ගියා සියයට 64.49ක්. 2005 දී ගියා සියයට 59.4ක්. හැබැයි ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට 2011, 2012 වසරවල තමයි අපි කාන්තාවන්ට වඩා පිරිමින් මේ රටින් පිට රටට යැවුවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ නම කියැවුණා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේක Law Entrance class එකක් නොවෙයි නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒ විතරක් නොවෙයි, අපි මේ වෙලාව වෙන කොට පිට රට යන ගෘහ සේවිකාවන් සඳහා අවම වයස තීරණය කර තිබෙනවා. අද උදේ කැබිනට් මණ්ඩලය අනුමත කළා සවුදි අරාබියට යන ගෘහ සේවිකාවන්ගේ අවම වයස අවුරුදු 25ක් විය යුතුයි කියලා. ඒ විතරක් නොවෙයි, NVQ අනිවාර්යයෙන් pass වෙන්න ඕනෑ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මා කියනවා, මේ විවාදයට අදාළ නැතිව පෞද්ගලිකව මගේ නම සඳහන් කරපු සියලු කාරණා කපා හරින්න කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that will be expunged. You carry on, Hon. Member.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අද උදේ කැබිනට් මණ්ඩලය මගේ යෝජනාවක් අනුව, සවුදි අරාබියට යන ගෘහ සේවිකාවන්ගේ අවම වයස් සීමාව අවුරුදු 21 සිට 25ට ගෙනාවා. අවුරුදු 18 සිට 21ට ගෙනාවේත් අපි. අවුරුදු 21, 25ට ගෙනාවේත් අපි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, now wind up please.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Please give me one more minute.

ඒ විතරක් නොවෙයි, සවුදි අරාබියාට යන ගෘහ සේවිකාවන්ගේ අවම වයස අවුරුදු 25 වුණාට මදි. NVQ Level 3 පාඨමාලාව හදාරලා සහතිකය ගන්නත් ඕනෑ. නැත්නම් යවන්නේ නැහැ. ඒ වාගේම සවුදි අරාබිය නොවන අනෙකුත් රටවලට යන අයගේ අවම වයස අවුරුදු 21 සිට 23ට ගෙනාවා. කොහොමටත් හොංකොං සහ සයිප්‍රස්වලට යන අවම වයස් සීමාව අවුරුදු 21 හැටියට තමයි තිබුණේ. ඒ සියලු කාරණා කරපු නිසා තමයි ඉතිහාසයේ ප්‍රථම වතාවට අපට හැකියාව ලැබුණේ 2011 සහ 2012 කියන වර්ෂවල කාන්තාවන්ට වඩා පිරිමින් පිට රට යවන ප්‍රමාණය වැඩි කර ගන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ කොරියාවේ. කොරියාවේ හා මැලේසියාවේ. මැද පෙරදිග නොවෙයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
නැහැ, කොරියාවට යැවුවේ 20,000යි. දන්න දෙයක් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dilan Perera, please wind up now. Your time is over.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවසාන වශයෙන් තව එක කරුණක් කියන්න අවස්ථාව ලබා දෙන්න.

රවි කරුණානායක මන්ත්‍රීතුමා එදා, නව වැනිදා, රිසානා ගැන ප්‍රශ්නය අහන කොට ලංකාවේ වෙලාව පස්වරු 1.50යි. [බාධා කිරීම්] රිසානා නෆීක් නව වැනිදා ඝාතනය වුණේ සවුදි අරාබියේ වෙලාවෙන් 11.40ට. එතකොට ලංකාවේ වෙලාව පස් වරු 2.10යි. [බාධා කිරීම්]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මැරුවාට පස්සේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒක නිසා රිසානා නෆීක්ගේ මරණය සිද්ධ වුණේ,- [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මැරුවාට පස්සේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මා කථා කළාට පස්සේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dilan Perera, please wind up now. Your time is over.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
013.01.11 වැනිදා "ලක්බිම" පත්තරය මගේ ළඟ තිබෙනවා. වෙනින් කවුරුත් නොවෙයි, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාම අන්තිමට කියනවා, "11.40ට තමයි රිසානා නෆීක් ඝාතනය වුණේ" කියලා. දැන් කියනවා වෙන කතන්දරයක්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ඒ ලංකාවේ වෙලාවෙන්. ලංකාවේ වෙලාවයි සවුදි අරාබියේ වෙලාවයි අතර difference එක පැය දෙක හමාරයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

11.40ට රිසානාගේ මරණය සිදු වුණා. එවිට ලංකාවේ වෙලාව පස් වරු 2.10යි. ඒ නිසා ඒක දැන දැනම කරුණු වටහා ගෙන මඩ ගහන්න කරන ප්‍රකාශයක්. ඕනෑම මඩක් ගහන්න. හැබැයි රිසානා නෆීක් පාවිච්චි කරලා දේශපාලන වශයෙන් අයුතු වාසි ගන්න එපාය කියන කාරණය මේ වෙලාවේ මතක් කරනවා. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද ලියවිලි:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*

:17 00966 1 4608846 EMBASSY OF SRILANKA #0485 P.001

**FAX**

**EMBASSY OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**Tel. 4608232,4608235,4608689,4606906, Fax. 4608846**
**P.O. BOX 94360, RIYADH 11693, K.S.A**

24

| | | |
|---|---|---|
| ADDRESSED TO | : | Chairman/SLBFE |
| | Attn.: | Mr. L.K. Ruhunage<br>DGM(FR) |
| YOUR REFERENCE | : | FR/GEn/06/06 |
| COPY TO | :<br>Attn.: | Secretary/FA<br>DG/ Consular Affairs – e/118<br>Your Ref.: FR/CONS/B2/MC/05 |
| SIGNATURE & DESIGNATION | : | P.R.L. Wickramasinghe<br>Second Secretary(Labour)<br>For Ambassador |
| DATE | : | 19.03.2007 |
| PRIORITY | : | Most Urgent |
| NO OF PAGES INCLUDING THIS PAGE | : | 02 |

MSG No. 255 My No : SARB/LAB/SSL/35/28

**Ref.: Sri Lankan Housemaid Miss. Rizana Nafeek Detained on Murder Charges.**

i) This has reference to your fax message dated 01.03.2007, received by this mission on 17th March 2007, on the above subject.

ii) This mission has consulted 03 law firms in Riyadh and checked with them about the charges involved to retain a lawyer on the above case. (Detailed report attached.-Annex I)

iii) Regret to inform that the two of those law firms have totally rejected to under take this case due to seriousness of the crime.

iv) However, a law firm known as Kateb Bin Fahed Al Shammery, has agreed, after our much persuasion, to study this case first and then to decide on our request.

v) For the purpose of preliminary study of this case, the above law firm has quoted a sum SR. 5000/=(Saudi Riyal Five Thousand) as the charge.

vi) Grateful, If you could send your early views and advise on the same. (Ends)

.17 00966 1 4608846 EMBASSY OF SRILANKA #0485 P.002 /002

Annex - I 2/2

19th March 2007

25

Second Secretary(Labour)

**Report on Visit to Law Firms.**

As per your instruction, I visited the following law firms in order to get the quotation with regard to the charges to retain a lawyer to provide legal assistance to Miss. Rizana Nafeek, who has been charged for a murder case.

**Al Suwailum Law Office.**

I met Mr. Osama Al Hassan, the legal consultant of Al Suwailum law office and checked with him about the terms and conditions to retain a lawyer from them.

After checking the nature of the case from me, in consultation with his law firms owner, rejected my request stating that the case is serious and they can't under take it.

**Al Hazzaa and Mutaq Law Firms.**

When I visited this law firm also, my request was rejected stating that the case is serious.

**Visit to Kateb Bin Fahad Al Shammery Law Firm.**

I visted the above law office and met Mr. Azhary Ba Bakar, the Secretary and Mr. Mohammed Kamil the legal consultant of the above law firm. Mr. Kamil informed me that, this case will be undertaken only after the thorough study.

For this study this law office will charge SR. 5000/=(Saudi Riyal Five Thousand)

The exact amount of charges for this case will be decided only after the above study.

M.T.M. Niyas
Translator.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்
SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT

(1985 ஆம் ஆண்டின் 21 ஆம் இல. சட்டத்தின்கீழ் கூட்டிணைக்கப்பட்டது) (Incorporated by Act. No. 21 o

කාර්යාලය / அலுவலகம் / Office } +94 11 2864101-5
ෆැක්ස් / பெக்ஸ் / Fax } +94 11 2864136, +94 11 2864137
ඊ-මේල් / ஈ மெயில் / E-mail } chmn@slbfe.lk
මගේ අංකය / எனது இல / My No. } FR/GEN/
දිනය / திகதி / Date } 21.03.2007
ඔබේ අංකය / உங்கள் இல / Your No. }

H.E.The Ambassador,
Sri Lanka Embassy
Riyadh /K.S.A.

Attn. Mr. P.R.L.Wickramasingha
2nd Secretary (Labour)

Your Excellency,

**RE - SRI LANKAN HOUSEMAID MS. RIZANA NAFEEK DETAINED ON MURDER CHARGERS**

This refers to your fax message of SARB/LAB/SSL/35/28 dated 19.03.2007 on the above subject.

Approval is hereby conveyed for SR 5000/- (Saudi Riyal Five Thousand Only) as the charges for the Kateb Bin Fahad Al Shammery Law Firm to handle the above case as requested by you.

Thanking you,
Yours faithfully,

**L.K. RUHUNAGE**
**DGM (FOREIGN RELATIONS)**
**FOR CHAIRMAN – SLBFE**

*එකල්හි වේලාව අ. භා. 7.30 වුයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී. පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මුතිය අනුව, 2013 පෙබරවාරි මස 06 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේ ය.*

*அப்பொழுது, பி.ப.7.30 மணியாகிவிடவே* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2013 பெப்ரவரி 06, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.30 p.m.,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.00 p.m. on Wednesday, 06th February, 2013 pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.